# ත්‍රිපිටක ධර්මය

## පළමුවන ශ්‍රේණිය

මූලික පිරිවෙන

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
**www.edupub.gov.lk** වෙබ් අඩවියට පිවිසෙන්න.

ප්‍රථම මුද්‍රණය 2013
දෙවන මුද්‍රණය 2014
තෙවන මුද්‍රණය 2015
සිව්වන මුද්‍රණය 2016
පස්වන මුද්‍රණය 2017
සයවන මුද්‍රණය 2018
සත්වන මුද්‍රණය 2019
අටවන මුද්‍රණය 2020

සියලු හිමිකම් ඇවිරිණි

ISBN 978-955-25-0434-1

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
නො. 327/A/1 බියගම පාර, නාගහමුල, කැලණිය දරන ස්ථානයේ පිහිටි
හැපි සොලුෂන්ස් පුද්ගලික සමාගමෙහි
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදි.

Published by : Educational Publications Department
Printed by : Happy Solutions (pvt) Ltd, kelaniya.

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා - ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති - අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ - අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ - අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නො ව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

ආනන්ද සමරකෝන්

**පෙරවදන**

සියවස් ගණනාවක කීර්තිමත් ඉතිහාසයකට උරුමකම් කියන්නා වූ පිරිවෙන් අධ්‍යාපන සම්ප්‍රදාය වූ කලී සිරිලක අධ්‍යාපනයේ ස්වර්ණමය සලකුණකි. මහින්දාගමනයත් සමඟින් වඩාත් ශිෂ්ට සම්පන්න සංස්කෘතියක් වෙත අප ගමන් කළේ සුවිශේෂ වූ ශාස්ත්‍රීය දියුණුවක් ද අත්පත් කරගනිමිනි. එහිදී භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වණක් පිරිස වෙතම ප්‍රභාෂ්වර ශාස්ත්‍රාලෝකය දායාද කළ ප්‍රදීපස්තම්භය වූයේ පිරිවෙනයි.

අපේ සම්භාව්‍ය පිරිවෙන් අධ්‍යාපනය, ත්‍රිවිධ ශාසනයේ ආරක්ෂාව හා අභිවෘද්ධිය වෙනුවෙන් කැපවන සුපසන් යතිපරපුරක් නිර්මාණය කරන අතර සම්භාව්‍ය භාෂා මෙන්ම අනේක ශිල්ප ශාස්ත්‍ර පිරිසිඳ දත් වියතුන් ලොවට දායාද කිරීමෙහිලා මූලික වූ බැව් සිහිපත් කළ යුතු ය. එසේම මෙරට විවිධ උවදුරු පිරි අඳුරු සමයන්හි පිරිහී ගිය පිරිවෙන් අධ්‍යාපනය යළි නඟා සිටුවීමට දිවිහිමියෙන් ඇප කැප වූ, වැලිවිට අසරණ සරණ සරණංකර සඟරජ මාහිමිපාණන්ගේ අපරිමිත සේවාව ද කෘතවේදීත්වයෙන් යුතුව මේ මොහොතේ සිහිපත් කළ යුතු ය.

අතීත සම්භාවනීය අධ්‍යාපන උරුමය ද එකලෙසින් සුරකිමින් නව ලොවට අනුගත වූ පිරිවෙන් විද්‍යස්ථාන නිර්මාණය කිරීමේ කාර්යය වෙත අපි සැම අවතීර්ණ වී සිටින්නෙමු. විශ්ව ගම්මානයෙහි හුදකලා නොවී වර්තමාන පිරිවෙන් ශිෂ්‍ය ගණයා දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කරගනිමින් අධ්‍යාපන සයුරෙහි කිමිදෙමින් සිටිනු දැකීම සන්තුෂ්ටිය උපදවන්නකි. විවිධ ගැටලු හේතුවෙන් විධිමත් පාසල් පද්ධතියෙන් බැහැර වූ ඇතැම් සිසුන් ද යළි පිරිවෙන් විදුබිම් වෙත පැමිණ ස්වකීය දිවිමඟ යළි එළිය කරගත් අවස්ථා සඳහා නිදසුන් අපමණ බව සඳහන් කළ යුතු ය. සැමට අධ්‍යාපනය ලබාදීමේ උත්කෘෂ්ට කර්තව්‍යය වෙනුවෙන් පිරිවෙන් විද්‍යස්ථාන ද ඇප කැප වී සිටින බවට එය කදිම සාක්ෂ්‍යයකි.

මෙම පොත් මැනවින් පරිශීලනය කරමින් ඒ ඔස්සේ තව තවත් පුළුල් දැනුම් අවකාශ පිරි ඉසව් වෙත පිවිසෙන්නට ද ඔබ සැමට ඇරයුම් කරමි. මනා ඉගෙනුමක් ලැබූ හා ආධ්‍යාත්මික සුවපත් භාවයෙන් පිරිපුන් සුපසන් සිසු පරපුරක් බිහිවනු දැකීම රජයේ ඒකායන අරමුණයි. ඒ සඳහා ඇප කැපවන්නට හැකිවේවායි සියලු දෙනා වෙත ආශීර්වාද කරමි. මේ සත්කාර්යය වෙනුවෙන් නොමසුරු දායකත්වයක් සැපයූ සියලු පිරිවර වෙත ද මාගේ ප්‍රණාමය පුද කර සිටිමි.

**පී. එන්. අයිලප්පෙරුම**

අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ඉසුරුපාය

බත්තරමුල්ල

**නියාමනය හා අධීක්ෂණය :-**

| | |
|---|---|
| පී.එන්. අයිලප්පෙරුම | - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

**මෙහෙයවීම :-**

| | |
|---|---|
| පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි | - අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| ඩබ්ලිව්. ඒ. නිර්මලා පියසීලි | - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

**සම්බන්ධීකරණය :-**

| | |
|---|---|
| පූජ්‍ය රංවල පඤ්ඤාවාස හිමි | - පිරිවෙන් අධ්‍යාපන සම්බන්ධීකරණ නිලධාරී<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| ඩී. එම්. ජේ. පුෂ්පකුමාර | - නියෝජ්‍ය කොමසාරිස් (පාලන)<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

**උපදේශක මණ්ඩලය :-**

| | |
|---|---|
| පූජ්‍ය වලස්වැවේ ඤාණරතන හිමි | - අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| පූජ්‍ය වාච්චේ ධම්මරක්ඛිත හිමි | - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය<br>හෝමාගම |
| පූජ්‍ය දීවෙල මහින්ද හිමි | - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)<br>(විශ්‍රාමික)<br>අධ්‍යාපන අමාත්‍යාංශය |

**ලේඛක මණ්ඩලය :-**

| | | |
|---|---|---|
| පූජ්‍ය බුලත්ගම උපනන්ද හිමි (සභාපති) | - | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| පූජ්‍ය ඉඹුල්පේ ධම්මකුසල හිමි | - | පරිවේණාචාර්ය<br>ශ්‍රී පඤ්ඤානන්ද මහ පිරිවෙන<br>මහරගම |
| පී. එල්. ලලිත් අබේසේකර | - | ගුරු උපදේශක (පිරිවෙන්) මධ්‍යම පළාත<br>මහ/ ශ්‍රී සංඝරාජ පිරිවෙන<br>මහනුවර |
| ආර්. එම්. තේමිය චන්ද්‍රරත්න | - | පරිවේණාචාර්ය<br>මහ/ ශ්‍රී සංඝරාජ පිරිවෙන<br>මහනුවර |

**සංස්කරණය :-**

| | | |
|---|---|---|
| පූජ්‍ය මාදෝවිට වජිරබුද්ධි හිමි | - | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)<br>අධ්‍යාපන අමාත්‍යාංශය |

**සෝදුපත් කියවීම :-**

| | | |
|---|---|---|
| පූජ්‍ය රංවල පඤ්ඤාවාස හිමි | - | පිරිවෙන් අධ්‍යාපන සම්බන්ධීකරණ නිලධාරි<br>අධ්‍යාපන අමාත්‍යාංශය |

**චිත්‍ර, රූප සටහන් :-**

| | | |
|---|---|---|
| චාල්ස් රණතුංග | - | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය) (විශ්‍රාමික)<br>බස්නාහිර පළාත් අධ්‍යාපන කාර්යාලය<br>කොළඹ |

**පිට කවරය :-**

| | | |
|---|---|---|
| කේ. පී. ජනිත් හර්ෂාන් සිල්වා | - | පරිගණක අංශය<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

**පරිගණක තාක්ෂණය :-**

| | | |
|---|---|---|
| කේ. පී. ජනිත් හර්ෂාන් සිල්වා | - | පරිගණක අංශය<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

# පටුන


| | | |
|---|---|---|
| 01 | බුදුබව පතන මහබෝසතාණෝ | 01 |
| 02 | පෙරුම් දම් පුරා බුදුවන්නට ඇරයුම් ලබති | 05 |
| 03 | අප මහ බෝසතුන්ගේ අවසන් උපත සිදු වූ වගයි | 08 |
| 04 | බෝසතුන්ගේ කුමරවිය හා රජසිරි | 13 |
| 05 | ජීවිතයේ සැබෑ තතු හෙළිකළ පෙර නිමිති | 21 |
| 06 | බෝසතාණෝ නිවන් සුව ළඟා කරන පැවිදි බිමට පිවිසෙති | 26 |
| 07 | අප වෙනුවෙන් බෝසතාණන් සය අවුරුද්දක් විඳි දුක් | 32 |
| 08 | උතුම් වූ බුදුබව පසක් කළ සේක | 36 |
| 09 | රාහුල පොඩි හාමුදුරුවෝ | 47 |
| 10 | මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය | 54 |
| 11 | අනාථ පිණ්ඩික සිටුතුමා | 60 |
| 12 | විශාඛා මහෝපාසිකාව | 65 |
| 13 | හොඳට නරකට දෙකට ඇසුර ය | 71 |
| 14 | මව්පියන්ට සැලකීමත් මහඟු කමකි (සාම ජාතකය) | 78 |
| 15 | අප වඩා සිටුවන වැඩිහිටියෝ (තිත්තිර ජාතකය) | 84 |
| 16 | නමස්කාරය හා සරණාගමනය | 90 |

| | | |
|---|---|---|
| 17 | තෙරුවන් වැඳීම | 97 |
| 18 | පන්සිල් | 104 |
| 19 | අෂ්ටාංග සීලය හා දස සීලය | 107 |
| 20 | ආජීව අට්ඨමක සීලය | 115 |
| 21 | වන්දනා ගාථා | 119 |
| 22 | සිව්පස පරිභෝගය | 126 |
| 23 | කල්‍යාණ මිත්‍ර සම්පත්තිය සහ පාප මිත්‍ර විපත්තිය (සච්චංකිර ජාතකය) | 134 |
| 24 | පැවිදි සුවය සොයා යමු (දසධම්ම සූත්‍රය) | 142 |
| 25 | උතුම් පින් කෙතට බැඳෙන නියර (හෙරණසික්ඛා) | 147 |
| 26 | වළාකුලෙන් මිදෙන හෙරණ සඳ (බාල සික්ඛා) | 156 |
| 27 | සැලසුම් කරගෙන දවස ගෙවමු (දින චරියාව) | 164 |
| 28 | බුදුගුණ මෙනෙහි කොට ශ්‍රද්ධාව උපදවා ගනිමු | 170 |
| 29 | මෙත් වඩා සිත් වඩමු | 175 |

# 01 බුදුබව පතන මහබෝසතාණෝ

> දුල්ලභඤ්ච මනුස්සත්තං බුද්ධුප්පාදො ච දුල්ලභො
> දුල්ලභා ඛණ සම්පත්ති සද්ධම්මො පරම දුල්ලභො

මෙලොව ඉතා දුර්ලභ කාරණා සතරක් තිබෙනවා. මිනිසෙකු වී ඉපදීම දුර්ලභ ය. බුදුරජාණන් වහන්සේ ගේ පහළ වීම දුර්ලභ ය. ක්‍ෂණ සම්පත්තිය හෙවත් පින්දහම් කරගත හැකි තැනක පිනක් දහමක් කරගත හැකි කෙනෙකු විදියට ඉපදීම දුර්ලභ ය. මේ හැම දේටමත් වඩා සද්ධර්මය ඉතා ම දුර්ලභ ය.

අද අපට මේ දුර්ලභ කාරණා සතර ම ලැබී තිබේ. අප මේ සියලු විපත්වලින් මිදී සිටින ඉතා ම වාසනාවන්ත පිරිසක්. එසේ තිබිය දී මහණ වෙන්නත් ලැබීම, කියා නිම කරන්නට බැරි තරම් වාසනාවක්.

මේ සියලු දේවල් අතරින් අගනා ම සම්පත්තිය නම් මෙය බුද්ධෝත්පාද කාලයක් වීම ය.

" බුදු කෙනෙකුන් මේ ලොව නූපන් වර
අඳුරෙක් ම ය සදහම් නැති මේ සසර
ඉඳුරා නො දනෙයි පව් පින් තොරතුර
සිදු නො කළැකි ඉන් සග මොක් සිරිසර "

-ලෝවැඩ සඟරාව-

ඒ උතුම් වූ බුදුරජාණන් වහන්සේගේ පහළ වීමේ පුවත යි අප මේ කියන්නට සැරසෙන්නේ.

## පළමු විවරණ ලැබීම

අප මහා බෝසතාණන් වහන්සේ මීට අසංඛ්‍ය කල්ප ලක්‍ෂ හතරකට පෙර දඹදිව අමරවතී නුවර ධනවත් බමුණු පවුලක එක ම පුත්‍රයා වී උපන්නා.

එතුමාගේ නම සුමේධ. මෙතුමා බමුණෙකු ඉගෙන ගත යුතු ත්‍රිවේදයේ ම පරතෙරට ගිය කෙනෙක්. එහෙත් එතුමාට කම් සැප ගැන ආශාවක් තිබුණේ නැත. මව්පියන් මිය පරලොව ගිය පසු තමාට හිමි වූ කෝටිගණන් ධනය දුගී මගී යාචකයන්ට දන් දී තවුස් පැවිද්දෙන් පැවිදි විය. බණ භාවනා කළ එතුමා ධ්‍යාන වඩා ඍද්ධිබල සම්පන්න තාපසයෙක් බවට පත් විය.



මේ කාලයේ දීපංකර සම්බුදුපියාණන් වහන්සේ ලොව පහළ වී වැඩ සිටි සේක. මෙම නගරයේ මිනිස්සු උන්වහන්සේට දනට ආරාධනා කොට වඩින මග සරසන්නට පටන් ගත්හ. එතැනින් අහසින් යන සුමේධ තාපස තුමා එය දැක බිමට බැස මිනිසුන්ගෙන් කරුණු විමසී ය. බුදුරජාණන් වහන්සේ වඩින නිසා මග සරසන බව මිනිස්සු කීහ. "බුදු" යන නම ඇසූ පමණින් තාපසතුමා තුළ මහත් ශ්‍රද්ධාවක් ඇති විය. එතුමාත් දීපංකර සම්බුදු පිය ාණන් වඩින මග, කොටසක් ඉල්ලාගෙන තනියම සරසන්න පටන් ගත්තේ ය. එය මඩ ගොහොරුවකි.

බුදුහාමුදුරුවන් වඩිනතුරුත් එතුමාට පාරේ වැඩ ඉවර කර ගන්නට නොහැකි විය. තමන්ගෙන් සිදු වූ අතපසු වීම පිරිමසන්නට බුදුහාමුදුරුවන්

වෙනුවෙන් ජීවිතය පරිත්‍යාග කරන්නට එතුමා තීරණය කළේ ය. තමන් පොරවාගෙන සිටි අඳුන් දිවි සම මඩ ගොඩේ එලා එතුමා ඒ මත මුනින්තලා විය. බුදුහාමුදුරුවන් ළඟට වැඩම කළ විට "ස්වාමිනී, මඩ නොපාගා මහ සඟරුවනත් සමග මගේ පිටින් වඩිනු මැනවැයි" ඉල්ලා සිටියේ ය.

බුදුරජාණන් වහන්සේ එතුමාගේ හිස අද්දර නැවතී

"පස්සථ ඉමං තාපසං
ජටිලං උග්ගතාපනං
අපරිමෙය්‍ය ඉතො කප්පෙ
බුද්ධො ලොකෙ හවිස්සති"

දැඩි තපස් ඇති ජටා දරන මේ තාපසතුමා දෙස බලන්න. මෙතුමා මෙයින් අපමණ කල්ප ගණනකට පසුව ඒකාන්තයෙන් ම බුදු වන්නේ යැයි වදාළහ. විවරණ දීම යැයි කියන්නේ එයට යි. ඒ මොහොතේ එතුමාට අවශ්‍ය නම් බුදුරජාණන් වහන්සේ වෙත පැවිදි වී රහත් වන්නට ඉඩ තිබුණි. එනමුත් මෙතරම් අපමණ සත්ත්වයන් සසර දුක් විඳිද්දී තනිව ම එතෙර වන්නේ කෙසේ ද යි සිතා බුදුවන අදහසින් සසරට එකතු වුණා.

### ක්‍රියාකාරකම 1.1

සුදුසු වචන තෝරා පහත සඳහන් වාක්‍යවල හිස්තැන් පුරවන්න.

(සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකට, දීපංකර, දන් දී, ධ්‍යාන, අමරවතී, ශ්‍රද්ධාවක්, අඳුන් දිවිසම, පාරමිතාවෝ ය, සතර, බුදුරජාණන් වහන්සේ)

1. බෝසතාණන් වහන්සේ පළමු විවරණ ලැබුවේ .................................... නම් බුදුරජාණන් වහන්සේගෙනි.
2. සුමේධ තාපස තුමා උපන්නේ .................................... නම් නුවර ය.
3. බෝසතාණන් වහන්සේ .................................... පෙර බුදුබව පතා පෙරුම් පුරන්නට වූහ.
4. සුමේධ තාපසතුමා මඩ ගොඩේ මුනින් තලා වූයේ .................................... එලා ගෙන ය.
5. සුමේධ තාපසතුමාට සෘද්ධි බලය ලැබුණේ .................................... වැඩීම නිසා ය.

6. දීපංකර බුදුරදුන් දැකීමෙන් තාපසතුමාට මහත් ......................................... ඇතිවිය.
7. බුදුබව පතා සසර පුරා පිරිය යුත්තේ .................................... ය.
8. සුමේධ කුමරු තමාට උරුම වූ සියලු ධනය දුගී මගී යාචකාදීන්ට .................................... පැවිද්ද සඳහා පිටත් විය.
9. තාපසතුමා තුළ මහත් ශ්‍රද්ධාවක් ඇති වූයේ ".................................." ගේ නම ඇසීමෙනි.
10. ලොව දුර්ලභ කාරණා .................................... කි.

## ක්‍රියාකාරකම 1.2

"අනුන්ට උපකාර කිරීම බෝසත් ගුණයකි" මේ ගැන වාක්‍ය 6 ක් නිර්මාණය කරන්න.

### පුහුණුවට

බෝසත් උතුමෙකුගේ පළමු විවරණය ඉටුවීමට අංග අටක් සම්පූර්ණ විය යුතු වේ.

මනුස්සත්තං ලිංගසම්පත්ති
හෙතු සත්ථාරදස්සනං
පබ්බජ්ජා ගුණසම්පත්ති
අධිකාරො ච ඡන්දතා
අට්ඨධම්ම සමොධානා
අභිනීහාරො සමිජ්ඣති.

මිනිසත් බව ය. පුරුෂයෙකු වීම ය. රහත් වන්නට තරම් හේතු සම්පත් තිබීම ය. බුදුවරයෙකු මුණ ගැසීම ය. පැවිදිව සිටීම ය. ධ්‍යාන සමාපත්ති ගුණයෙන් යුතු වීම ය. ජීවිත පරිත්‍යාගයෙන් කළ විශිෂ්ට පූජාව ය. පෙරුම්දම් පිරීමෙහි මහත් කැමැත්ත ය. යන කරුණු අට එකතු වීමෙන් බුදු බව පිළිබඳ ප්‍රථම ප්‍රාර්ථනාව ඉෂ්ට වන්නේ ය.

# 02 පෙරුම් දම් පුරා බුදුවන්නට ඇරයුම් ලබති

අප මහා බෝසතාණන් වහන්සේ දීපංකර බුදුරදුන්ගෙන් පටන්ගෙන කාශ්‍යප බුදුරජාණන් වහන්සේ දක්වා බුදුවරු විසිහතර නමකගෙන් විවරණ ලැබූහ. එය සූවිසි විවරණය නම් වේ. සාර අසංඛ්‍ය කල්ප ලක්ෂයක් තිස්සේ දාන, ශීල, නෛෂ්ක්‍රම්‍ය, ප්‍රඥා, වීර්ය, ක්ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෛත්‍රී, උපේක්ෂා යන දස පාරමිතා පිරූ අප මහා බෝසතාණන් වහන්සේ අවසන් වතාවට වෙස්සන්තර නමින් රජ කෙනෙකු ව උපන්නේ ය. බෝසත් ගුණ පුරුද්ද නිසා රජ සැප ගැන කලකිරුණු එතුමා රජකම අතහැර තවුස් දිවියෙන් පැවිදි විය. එතුමා වනගත වෙද්දී තමාට අයත් සියලු දේ දන් දුන්නේ ය. මේ ආකාරයෙන් දාන පාරමිතාව පුරමින් ගතකළ වෙසතුරු රජතුමා මියපරලොව ගොස් තුසිත දෙව්ලොව සන්තුසිත නම් දිව්‍යරාජයා වී උපන්නේ ය.

බුදු කෙනෙකුන් පහළවන කාලය ළංවන විට ලෝකයේ බුද්ධ කෝලාහලයක් ඇති වෙයි. දෙවියන්, බඹුන්, මිනිසුන් යන මේ හැම දෙනා අතර ම කවුද, කවුද, බුදුවන්නේ? යන සැකය ඇති වෙයි. සියලු දෙනා ම ඒ ගැන සොයන්නට පටන් ගනිති. බුද්ධ කෝලාහලය යනු එය යි. අන්තිමේ දී බුදුවන බෝසතාණන් වහන්සේ සන්තුසිත දිව්‍යරාජයා බව දෙවිවරුන්ට දැනගැනීමට ලැබිණ. සියලු දෙවිවරු එතුමා වටා රැස්වී එතුමාට බුදුවන්නැ'යි මෙසේ ආරාධනා කළහ.

> "කාලො'යං තෙ මහාවීර
> උප්පජ්ජ මාතු කුච්ඡියං
> සදෙවකං තාරයන්තො
> බුජ්ඣස්සු අමතං පදං"

"වීරයන් වහන්ස, ඔබ වහන්සේට බුදුවන්නට දැන් කාලය පැමිණ තිබේ. මිනිස් ලොව මව් කුස ඉපිද නිවන් අවබෝධ කොට දෙව් මිනිසුන් සසරින් එතෙර කරනු මැනවි."



දෙවිවරුන්ගේ ආරාධනාව පිළිගත් සන්තුසිත නම් බෝසත් දිව්‍ය රාජයා මිනිස් ලොව ඉපදීමට තීරණය කළා. බුදු වන ආත්ම භාවයේ බෝසත්වරුන් මිනිස් ලොව උපදින්නට පෙර කරුණු පහක් ගැන සොයා බලනවා. අපේ බෝසතාණන් වහන්සේ ද ඒ කරුණු පහ ගැන සෙවූහ. **කාලය, ද්වීපය, දේශය, කුලය, මව** යනු ඒවා යි. පස්මහ බැලුම් යනු මේවා යි. පස්මහ බැලුම් බැලූ බෝසත් දෙව්රජතුමා මිනිස් ලොව උපදින කාලය, ස්ථානය හා මවුකුසත් තීරණය කර ගත්තේ ය.

### ක්‍රියාකාරකම 2.1

පහත සඳහන් වැකි නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

1. බෝසත් දිව්‍ය රාජයාගේ නම සන්තුසිත ය. (   )
2. මෛත්‍රිය දස පාරමිතාවලට අයත් නොවේ. (   )
3. බුදු කෙනෙකු පහළවන කාලය ළංවන විට ලෝකයේ බුද්ධ කෝළාහලයක් ඇති වේ. (   )
4. වෙස්සන්තර රජුගෙන් දරුවන් ඉල්ලා පැමිණියේ ජූජක බමුණා ය. (   )
5. ක්‍රිෂ්ණජිනා ජාලියගේ නැගණිය යි. (   )
6. බෝසතාණන් වහන්සේ බුදු බව පතා බුදුවරුන් විසිහතර නමකගෙන් විවරණ ලැබූහ. (   )

7. වෙස්සන්තර රජු වනගත වෙද්දී මන්ද්‍රී දේවිය මාළිගයේ නතර වූවා ය. (   )
8. වෙස්සන්තර ආත්මභාවයේදී බෝසත් තුමා පුරන ලද්දේ දාන පාරමිතාව යි. (   )
9. අප මහා බෝසතාණන් විවරණ ලැබීම ආරම්භ කළේ කාශ්‍යප බුදුරදුන්ගේ කාලයේදී ය. (   )
10. බුදුවීම පිණිස දෙවිවරුන් කළ ආරාධනාව බෝසතාණෝ එකවර ම පිළිගත්හ. (   )

## පැවරුම

බෝසතාණන් වහන්සේ බුදුබව පතා විවරණ ලැබූ සූවිසි බුදුවරයන් වහන්සේලා සහ ඒ ඒ ආත්මභාවවල බෝසත් නාමයන් සහ ඒ සඳහා කරන ලද පුණ්‍ය කර්මයන් සොයා වගුවක් සකස් කරන්න.

| විවරණ දුන් බුදුරජාණන් වහන්සේ | බෝසතුන්ගේ නාමය | කරන ලද පුණ්‍ය කර්මය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

## පුහුණුවට

**කාලං දීපඤ්ච දෙසඤ්ච**
**කුලං මාතරමෙව ච**
**එතෙ පඤ්ච විලොකෙත්වා**
**උප්පජ්ජන්ති තථාගතා**

බුදුරජාණන් වහන්සේලා කාලය, ද්වීපය, දේශය, කුලය සහ මව යන කාරණා පහ බලා මෙලොව උපදිති.

# 03 අප මහ බෝසතුන්ගේ අවසන් උපත සිදු වූ වගයි

ජම්බුද්වීපය හෙවත් දඹදිව යනු අප අසල්වැසි රට වන ඉන්දියාවට යෙදුණු පැරණි නාමය යි. එහි අද උතුරු ඉන්දියාවට අයිති මධ්‍ය දේශයේ ශාක්‍ය නම් ජනපදයක් විය. එහි අගනුවර වූයේ රෝහිණී ගඟබඩ පිහිටි කපිලවස්තු හෙවත් කිඹුල්වත් නුවර යි. මේ අවධියේ එහි රජකම් කළේ සුද්ධෝදන මහ රජතුමා ය. එතුමාගේ අග බිසව වූයේ මහාමායා දේවිය යි.

## ඇසළ සැණකෙළිය


ඇසළ පුන් පෝ දිනය පැරණි දඹදිව උත්සව, සැණකෙළි, පෙරහර ආදිය පැවැත්වෙන දිනයකි. ඒ දිනට සතියකට පෙර සැණකෙළි ඇරඹේ. එය අවසන් වන්නේ පෝද පැවැත්වෙන මහා උත්සවයකිනි. කිඹුල්වත් නුවර ද එකල ඇසළ උළෙල මහා ඉහළින් පැවැත්විණ.

## අපූරු සිහිනය

මහාමායා දේවිය දින හතක් පුරා උත්සව සිරි වින්දා. සත්වන ද උදෑසන පිබිදී, සුවඳ පැනින් නා, දවස පුරා පෙහෙවස් සමාදන් වී, මහා දන් දෙමින් කල් ගෙව්වා ය. රාත්‍රියෙහි නින්දට ගිය එතුමියට මෙබඳු සිහිනයක් පෙනිණ.

සතර වරම් දෙවිවරු ඇය සයනය පිටින් ම ඔසවාගෙන හිමාලයට ගෙන ගියහ. එහි සිරියල් ගල්තලාවක් මත මහා සල්රුකක් යට සයනය තබා ඔවුහු පසෙකට වූහ. අනතුරු ව ඔවුන්ගේ අග බිසෝවරු සතර දෙනා මහාමායා දේවිය අනවතප්ත විලට ගෙන ගොස් නහවා, දිවසළු හඳවා, සුවඳ විලවුන් ගැල්වූහ. එම විල අසල රිදී පර්වතයක් තුළ රන් විමනක් විය. ඒ තුළ පෙරදිගට හිස ලා දිව්‍යමය යහනක් පනවා දේවිය එහි සතපවන ලදී. මේ මොහොතේ සුදු ඇත් පැටියෙක් අසළ වූ රන් පර්වතයක ඇවිද එයින් බැස රිදී පර්වතයට නැගී

උතුරු දෙසින් දේවිය වෙත පැමිණියේ ය. සුදු නෙළුමක් සොඬින් ගත් ඇත් පැටියා කුංචනාද කොට රන් විමනට පිවිස මව් යහන වටා තෙවරක් පැදකුණු කොට දකුණු ඇලයෙන් ඇගේ කුසට පිවිසියේ ය. ඒ මොහොතේ උතුරුසල නම් නැකත උදා වී තිබුණි. ඒ මහා බෝසතාණන් වහන්සේ තුසිත දෙව් ලොවින් චුත වී මව්කුස පිළිසිඳ ගැනීම යි. ඒ මොහොතේ දස දහසක් සක්වල කම්පා විය. මහා ප්‍රීති ඝෝෂාවක් පැතුරුණි. සක්වල අසිරිමත් සිදුවීම් රැසක් ම සිදු විය.



පසුදින උදෑසන මහාමායා දේවිය සුදොවුන් රජතුමාට ඒ සිහිනය ගැන දන්වා සිටියා ය. රජතුමා උගත් බමුණන් හැට හතර දෙනෙකු මාළිගාවට කැඳවා ගරු සරු ඇතිව වඩා හිඳුවා රසමසවුළෙන් සංග්‍රහ කළේ ය. ඉන්පසු සිහිනය ගැන දන්වා එහි ඵලවිපාක කෙසේ වේ දැයි විමසා සිටියේ ය. එවිට බ්‍රාහ්මණවරු;

“මහරජ බිය නොවනු මැනවි. ඔබගේ දේවියගේ කුස දරු ගැබක් පිළිසිඳගෙන ඇත. ඔහු උතුම් පුත් රුවනකි. ඒ පුත් රුවන ගිහි ගෙහි සිටියහොත් සක්විති රජ වන්නේ ය. පැවිදි වුවහොත් බුදුවන්නේ යයි.” කියා සිටියෝ ය.

එතැන් සිට අප මහ බෝසතාණෝ මව්කුස තුළ සුවසේ වැඩුණහ. දේවිය ද කිසිදු රෝග පීඩාවකින් තොරව සුවෙන් කල් ගෙව්වා ය.

## මහාමායා දේවිය මව්පියන් වෙත යයි.

දරු ගැබට දස මසක් පිරෙන්නට ලං වෙද්දී මහාමායා දේවියට තම මව්පියන් දකින්නට දෙව්දහ නුවරට යන්නට සිත් විය. ඒ බව සුදොවුන් රජුට සැළකළ විට එතුමා කිඹුල්වත් නුවර සිට දෙව්දහ නුවර දක්වා මග දෙපස සරසවා මහ පෙරහරින් ඇය පිටත් කර යැවී ය.

## ලුම්බිණි සල් උයනේ අසිරිය

මේ නගර දෙක අතර ලුම්බිණි නම් සල් උයනක් තිබුණි. ඒ වෙසක් සමයේ උයනේ ගහකොළ මලින් පිරී පලබරවී නැවුම් සිරියක් ඉසිලී ය. මල් රොන් ගන්නා බඹරුන්ගේ ගුමු ගුමු නාදයෙන් ද ගසින් ගසට සැරි සරන කුරුල්ලන්ගේ කිචි බිචි හඬින් ද අවට පරිසරය අපූරු සිරියක් දැරී ය. මේ සොඳුරු උයන් සිරි දුටු මහාමායා දේවියට උයනට යාමට ආසාවක් ඇති විණ. ඒ බව දැනගත් ඇමතිවරු දෝලාව පිටින් ම දේවිය සල් උයනට කැඳවාගෙන ගියහ. රන්සිවි ගෙයින් බිමට බැස්ස මහාමායා දේවිය උයනේ සිරි විඳ විඳ රජපවුලේ උදවියට වෙන්වුණු මඟුල් සල් රුක අබියසට පැමිණියා ය. ඕතොමෝ එහි පෙරදිග බලා සිටගෙන දකුණතින් මලින් පිරි සල් අත්තක් අල්වා පහතට නවා ගත්තා ය. මොහොතකින් දේවියට දරුවෙකු බිහිවීමේ ප්‍රසව වේදනාව දැනෙන්නට විය. ඒ බව වටහාගත් ඇමතිවරු සල්ගස් වටා තිර ඇද්දේ ය. බෝසත් කුමරු බිහිවන මොහොත උදා විය. වෙනත් දරුවන් බිහිවන විට මවුකුසින් පළමුව බිහිවන්නේ හිසයි. එහෙත් බෝසත් කුමරු අත් පා දිග හැර ධර්මාසනයකින් බසින ධර්ම කථිකයෙකු සේ මව් කුසින් බිහි විය. පළමුවෙන් ම බ්‍රහ්මයෝ සතරදෙනෙක් රන් දැලකින් කුමරු පිළිගත්හ. ඔවුනතින් සතරවරම් රජවරු අතටත් ඔවුන්ගෙන් ඇමතිවරු අතටත් පත් විය. ඔවුන් අතින් බිමට බට කුමරු සදිසාව ම හොඳින් බලා අන්තිමේ දී උතුරු දිශාව බලා පියුම් පිට සත් පියවරක් ඉදිරියට ගමන් කළේ ය. මහා බ්‍රහ්මයා එතුමාට සේසත් දැරී ය. සත්වන පියවර තබා සිටගත් කුමරු,

"අග්ගො හමස්මි ලොකස්ස
ජෙට්ඨො හමස්මි ලොකස්ස
සෙට්ඨො හමස්මි ලොකස්ස
අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවො"

"මම ලොවට අග්‍ර වෙමි.
මම ලොවට ජ්‍යේෂ්ඨ වෙමි.
මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි.
මේ මගේ අවසාන උපත යි.
මාගේ මින් මතු ඉපදීමක් නැත."



යන අභීත සිංහ නාදය කළේ ය. ඒ මොහොතේ ලොව පුරා පෙරනිමිති දෙතිසක් පහළ විණි. එතුමා ලොවට බිහිවන මොහොතේ ම යශෝධරා දේවිය, ඡන්න ඇමති, කාලුදායි ඇමති, අජානීය හස්තිරාජයා, කන්ථක අශ්වයා, මහාබෝරුක සහ සතර මහා නිධාන පහළ විය. අනතුරු ව කිඹුල්වත් නුවර හා දෙව්දහ නුවර ඥාති පිරිස මහත් සොම්නසට පත් ව මහා පෙරහරින් දේවියත් බෝසත් කුමරුත් ආපසු කිඹුල්වත් නුවර රජමාළිගාවට කැඳවාගෙන ගියෝ ය.

## ක්‍රියාකාරකම 3.1

"අ" කොටසේ කරුණු සම්බන්ධතාව අනුව "ආ" කොටසට ඉරකින් යා කරන්න.

| "අ" | "ආ" |
|---|---|
| 1. මහාමයා දේවිය උපත ලද නගරය | රෝහිණී ය. |
| 2. මව් කුසින් බිහිවුණු සිදුහත් කුමරු පළමුව පිළිගත්තේ | හිමාලයේ ය. |
| 3. ශාක්‍ය ජනපදය පිහිටියේ ඉන්දියාවේ | ජම්බුද්වීපය යි. |
| 4. කිඹුල්වත්පුරය අසල පිහිටි නදිය | ලුම්බිණිය යි. |
| 5. ඇතෙකු නාද කරන හඬ | බ්‍රහ්මයන් ය. |
| 6. අනවතප්ත විල පිහිටියේ | ඇසළ. |
| 7. ඉන්දියාවට අතීතයේ භාවිත කළ නම | බෝසතාණන් ය. |
| 8. සල් උයනක් ලෙස ප්‍රසිද්ධ වූයේ | දෙව්දහ ය. |
| 9. දඹදිව එදා පැවති අසිරිමත් උත්සවයකි | කුංචනාදය යි. |
| 10. මහාමායා දේවිය දුටු සිහිනයේ සුදු ඇත් පැටවාගෙන් පෙන්වූයේ | මධ්‍ය දේශයේ ය. |

### ජීවිතයට ඔවදනක්


න පරෙසං විලොමානි
න පරෙසං කතාකතං
අත්තනොව අවෙක්ඛෙය්‍ය
කතානි අකතානිච

අනුන් කී නොකී දේ හා කළ
නොකළ දේ නො සොයන්න.
තමන් කී නොකී හා කළ
නොකළ දේ පමණක් සොයන්න.

# 04 බෝසතුන්ගේ කුමරවිය හා රජසිරි

## බෝසත් කුමරු අසිත තවුසාණන්ට පෙන්වීම

සුද්ධෝදන රජතුමාගේ පියා සිංහහනු රජු ය. එතුමාට පුරෝහිත වූ **අසිත** හෙවත් **කාලදේවල** නමින් බමුණෙක් විසී ය. තවුස් පැවිද්දෙන් පැවිදි වූ එතුමා **අෂ්ට සමාපත්ති ලාභී** තාපසයෙක් විය. බෝසත් කුමරු උපදින විට එතුමා තව්තිසා දෙව් ලොවට වැඩම කොට සිටියේ ය. දෙවියන් ප්‍රීති ඝෝෂා පවත්වනු දුටු එතුමා ඒ මන්දැයි විචාළේ ය. එවිට දෙවිවරු සුදෙවුන් රජමාළිගාවේ මතු බුදුවන බෝසත් කුමරෙකු බිහිවීමේ පුවත සැළ කළෝ ය. එයින් මහත් සතුටට පත් අසිත තවුසාණෝ වහා ම රජ මාළිගාවට සැපත් වූහ. රජතුමා තවුසාණන් ගරු සරු ඇතිව පිළිගෙන අසුනක වඩා හිඳුවීය.



එවිට අසිත තාපසතුමා "රජතුමනි ඔබේ මැදුරේ පුත් කුමරෙකු උපන් බව දැන ගන්න ලැබුණා. අපිත් ඒ කුමරුන් දකින්න කැමැත්තෙමු'' යි කීය. රජතුමා කුමරු සරසවා ගෙන්වා ගෙන තවුසාණන්ට වන්දවන්නට එතුමා වෙත ළං කළේ ය. එවිට බෝසත් කුමරුගේ සිරිපතුල එසවී තවුසාණන්ගේ ජටාව මත පිහිටියේ ය. බෝසත් කෙනෙකු බුදුවන ආත්ම භාවයේදී එතුමාගෙන් වැඳුම් ගන්නට සමතෙක් ලොව නැති බව තාපසතුමාට සිහි විය. වහාම අස්නෙන් නැගී සිටි තාපස තුමා බෝසත් කුමරුට නමස්කාර කළේ ය. මේ අපූරු සිදු වීම දුටු සුදොවුන් රජතුමා මහත් පුදුමයටත් සතුටටත් පත් විය. මහත් ආදරයෙන් පුත් කුමරුගේ සිරිපතුල් තම නළල මත තබාගත් පිය රජතුමා ද පුතුට වැන්දේ ය. මෙය පිය රජතුමාගේ පළමු වැඳීම යි.

අසිත තාපසතුමාට කල්ප ගණනක් අනාගතය බලන්නට හැකි නුවණක් තිබිණි. මේ පින්වත් කුමරු ඒකාන්තයෙන් බුදුවන බව දුටු එතුමාට සිනහ පහළ විය. තමන්ට එතෙක් ජීවත් වන්නට නොහැකි බවත් ඒ නිසා මේ භවයේ දී බුදුන් දැක නිවන් දකින්නට නොලැබෙන බවත් දැක එතුමාට ඇඬිණ. සුදොවුන් රජතුමා තාපසතුමා හඬනු දැක ''ස්වාමිනි, මගේ පුතුට කුමක් හෝ විපතක් ද'' යි ඇසී ය. එවිට තාපසතුමා සිනාසුණ කාරණයත් හැඬූ කාරණයත් පැහැදිලි කොට ''කුමරුන්ට විපතක් නැත. මොහු ඒකාන්තයෙන් ම බුදුවන්නේ යැ'' යි කියා රජතුමා සැනසී ය.

### නාලක කුමරු පැවිදි වීම

අසිත තාපසතුමාට තමා වෙනුවෙන් බුදුන් දැකීමට කෙනෙකු යොදවන්නට සිතිණි. තම නැගණිය සොයා ගිය එතුමා ඇයගේ පුත් නාලක කුමරු අමතා ''දරුව සුද්ධෝදන රජතුමාගේ නිවසේ පුතෙක් උපන්නේ ය. හෙතෙම බෝධිසත්ත්වයෙකි. තවත් වසර තිස්පහකට පසු බුදු වන්නේ ය. මට එතුමන් දකින්නට නොලැබේ. එහෙත් ඔබට දකින්නට ලැබෙන්නේ ය. අද ම ගොස් පැවිදි වන්න'' යැයි ඉල්ලා සිටියේ ය. පින් ඇති නාලක කුමරු ද මයිලණුවන්ගේ උපදෙස් පරිදි එද ම ගිහිගෙය අත්හැර පැවිදි විය. අපේ බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් මුලින් ම පැවිදි වූයේ එතුමා යි. හිමාල වනයෙහි මහණදම් පුරමින් සිටි උන්වහන්සේ අප බෝසතාණන් බුදු වූ පසු පැමිණ බණ අසා රහත් වූහ. උන්වහන්සේ **මෝනෙය්‍ය ප්‍රතිපදාව** (කිසිවෙකු සමග කථා නොකිරීමේ ප්‍රතිපත්තිය) පුරමින් වන වැදී හත් මසක් දිවි ගෙවා පිරිනිවන් පෑහ.

### නම් තැබීම

බෝසතාණන් වහන්සේ ඉපදී දින පහකින් නම් තබන දිනය උදා විය. සුදොවුන් රජතුමා සියලු සිරිත් විරිත් පිළිපදිමින් නම් තබන උළෙල පිළියෙල කරවී ය. එතුමාගේ ඇරයුම පරිදි ලක්‍ෂණ ශාස්ත්‍රයේ පරතෙරට ගිය **රාම, ධජ, ලක්ඛණ, මන්ති, කොණ්ඩඤ්ඤ, භෝජ, සුයාම, සුදත්ත** යන බමුණු ඇදුරන් අට දෙනා ප්‍රධාන කොට ඇති එකසිය අටක් බමුණෝ රජගෙදරට සැපත් වූහ. ඔවුන් මිහිරි බොජුනෙන් සතපවා මහත් සේ සත්කාර කොට මේ කුමරුවාගේ සිරුරු ලකුණු අනුව අනාගතය කෙසේ වන්නේදැයි රජතුමා විමසා සිටියේ ය. එයින් බමුණන් සත් දෙනෙක් ම කුමරුගේ සිරුරෙහි පිහිටි මහා පුරුෂ ලක්‍ෂණ දැක ඇඟිලි දෙකක් ඔසවා මෙබඳු කෙනෙකු ගිහිගෙයි විසුවොත් සක්විති රජ වන්නේ ය. පැවිදි වුවහොත් බුදුවන්නේ යැයි පැවසූහ. එහෙත් කුමරුගේ ඌර්ණ රෝමය දකුණට කරකැවී තිබෙනු දුටු සියල්ලන්ට ම බාල වූ කොණ්ඩඤ්ඤ බමුණා මේ කුමරුගේ ගිහිගෙයි විසීමක් නම් නැත. ඒකාන්තයෙන් ම සියලු කෙලෙස් නසා බුදුවන්නේ යැයි එක ඇඟිල්ලක් ඔසවා පැවසී ය. අනතුරුව ඔවුහු මේ කුමරු ලොවට මහත් අර්ථයක් සිදුකරන්නේ යැයි සලකා **සිද්ධාර්ථ** යන නම තැබූහ.


සුදොවුන් රජතුමා මගේ පුතණුවන් කුමක් දැක කළ කිරී පැවිදි වන්නේ දැයි බමුණන්ගෙන් විමසී ය. මහල්ලෙකු, ලෙඩෙකු, මළමිනියක් සහ පැවිදි රුවක්, යන සතර පෙර නිමිති දැක මේ කුමරු පැවිදි වන්නේ යැයි බමුණෝ කීහ. පුත් කුමරුන් මුළු ලොවට ම බලසම්පන්න සක්විති රජවනු දැකීම රජතුමාගේ අදහස විය. ඒ නිසා කුමරුන්ට නගරය තුළ සතර පෙර නිමිති නොපෙනෙන සේ රැකවරණ සලස්සන්නට රජතුමා ඉටා ගත්තේ ය.

### මහාමායා දේවිය කලුරිය කිරීම

බෝසතාණන් උපන් මොහොතේ පටන් මහාමායා දේවිය ඉතා සුවෙන් කල් ගෙව්වා ය. බමුණන්ගේ අනාවැකි එතුමිය ඉතා සතුටට පත් කළේ ය. එහෙත් ඇගේ ආයුෂ ඉතිරි වී තිබුණේ දින හතකට පමණි. බෝසතුන් බිහි වී සත් වන දිනයෙහි කලුරිය කළ ඕතොමෝ තුසිත දෙව්ලොව උපන්නා ය. එහිදී එතුමිය දිව්‍ය පුත්‍රයෙක් ව **"මාතෘ දේව පුත්‍ර"** නමින් සියලු දෙවිවරුන් අතර ගෞරවය ලැබුවා ය. එතැන් පටන් මහාමායා දේවියගේ නැගණිය වූ මහාප්‍රජාපතී ගෝතමිය රජතුමාට අගමෙහෙසිය වූවා ය. ඕතොමෝ තමාගේ ම

පුතෙකු සේ බෝසත් කුමරු හදවඩා ගත්තා ය. ඒ සමග ම රජතුමා ක්ෂත්‍රිය වංශයට අයත් රූමත් ගුණවත් කිරිමව්වරුන් රැසක් බෝසත් කුමරුගේ රැකවරණයට සහ පෝෂණයට පත් කළේ ය.

## වප්මඟුල් උළෙල





සිදුහත් බෝසත් කුමරු ඉතා ඉහළ රජසිරි විඳිමින් වැඩෙයි. ක්‍රමයෙන් කුමරු ඉපදී පස් මසක් ගත විය. කිඹුල්වත් නුවර වාර්ෂික සී සෑමේ මංගල්‍යය උදාවිය. මුළු නගරය ම දෙව් විමනක් සේ සරසන ලදී. සුදු වතින් හා මල්මාලාවලින් සැරසුණු ජනයා වප්මගුල නරඹන්නට වෙල් යාය වටා රොක් වූහ. රජතුමා පුත් කුමරුවන් ද රැගෙන මහ පෙරහරින් එහි සැපත් විය. උත්සව භූමිය තුළ හතර අතට විහිදුණු සෙවණ ඇති මහා දඹ රුකක් විය. ඒ සෙවණෙහි කුමරුවාට සයනයක් පනවා, උඩ වියන් බැඳ, වට තිර අද්දවා, කුමරුවන් එහි සතපවා, රැකවරණයට කිරිමව්වරු රඳවන ලදී. රජතුමා රාජාභරණයෙන් සැරසී මැති ඇමතිවරු ද පිරිවරා ගෙන සී සෑම ඇරඹී ය. බෝසත් කුමරුගේ රැකවරණයට සිටි කිරි මව්වරු ද වටතිරවලින් පිටතට අවුත් වප් මගුල් සිරි නරඹන්න වූහ. මේ මොහොතේ අපූරු දෙයක් සිදු විය. බෝසත් කුමරුට තමන් ළඟ කිසිවෙකු නැති බව දැනිණ. හෙතෙම නැගිට

සයනයේ පළක් බැඳ ගත්තේ ය. අනතුරුව ආනාපාන සති භාවනාව වැඩූ කුමරු සසර පුරුද්දට ප්‍රථම ධ්‍යානය උපදවා ගෙන වැඩහුන්නේ ය. මේ අතර රුක් සෙවණ නොසැලී ගස මුලට ම වැටී තිබුණේ ය. අවට ගස්වල සෙවණ ද එය පිරිවරාගෙන පැවතුණි. හදිසියේම කුමරු සිහි වී එහි පැමිණි කිරිමව්වරු මේ අසිරිමත් සිදුවීම දුටුවෝ ය. ඔවුහු දිවගොස් රජුට ඒ බව දැන්වූවෝ ය. වේගයෙන් එහි පැමිණි රජතුමාට මේ අසිරිය දැක ප්‍රීතිය නිම්හිම් නැතිව ගියේ ය. පුතණුවනි, මේ මාගේ දෙවැනි වැඳීම යැයි කියා එතුමා බෝසත් කුමරුට වැන්දේ ය.

## තරුණ විය

බෝසත් කුමරුට කිසිදු සැප සම්පතක අඩුවක් නොවී ය. හේමන්ත ඍතුවෙහි වාසය සඳහා ''රම්‍ය'' නමින් ද ග්‍රීෂ්ම ඍතුවෙහි වාසය සඳහා ''සුරම්‍ය'' නමින් ද වර්ෂා ඍතුවේ වාසය සඳහා ''සුභ'' නමින් ද මාළිගා තුනක් කරවා තිබුණි. ඒ ඒ මාළිගාවේ ඒ ඒ ඍතුව පුරා පිටතට නොබැස සියලු පහසුකම් විඳිමින් වාසය කළේ ය. එම රජ මාළිගාවේ දැසි දස්සන් සිටියත් ඔවුන් වහලුන් සේ නොව මිතුරන් සේ සැලකිණි. ඔවුන්ට ද රසමසවුළෙන් පිරි රාජභෝජන ම ලැබිණ.






මේ වන විට සොළොස්වන වියට පා තබා සිටි තරුණ පුතුට සුදුසු කුමාරියක ආවාහ කර දීමට පියරජතුමා කල්පනා කළේ ය. ඒ සඳහා ශාක්‍ය රජවරුන්ට පණිවුඩ යැවී ය. මේ අවස්ථාවේදී "සිද්ධාර්ථ කුමාරයෝ රූපසම්පන්න වුවත් කිසිදු ශිල්ප ශාස්ත්‍රයක් නොදනියි. යුධ තත්ත්වයක් ඇතිවන අවස්ථාවක කුමක් කරන්න ද? එවන් කුමරෙකුට අපේ දූවරු විවාහ කර දෙන්නේ කෙසේද'' යි කියමින් රජවරු මේ පණිවුඩය නොසළකා හැරිය හ. පියරජතුමා මේ බව පුත් කුමරුට දන්වී ය. කුමරු එය අසා මා උගත් ශිල්ප ශාස්ත්‍රයන්හි තරම දන ගැනීමට කැමති නම් මෙයින් සත්වන දිනයෙහි රාජාංගනයට රැස්වන්නැයි අණබෙර වැයී ය. නියමිත දින එතුමා තම නෑයන් ඉදිරියෙහි ශිල්ප දක්වීය. එයින් විස්මයට පත් ශාක්‍යකෝලිය රජවරු තම දූවරුන් සිදුහත් කුමරුට ආවාහ කර දෙන්නට උනුන් පරයා ඉදිරිපත් වූහ.

### විවාහ මංගල්‍යය

ස්වයංවර විවාහ දිනය උදාවිය. ශාක්‍යකෝලිය රජවරු තම දූවරුන් සරසවා කිඹුල්වත් නුවරට එවූහ. කුමරු ඒ කුමාරිකාවන් අතරින් කෝලිය රට දෙව්දහනුවර සුප්‍රබුද්ධ රජුගේ දූ යශෝධරා නම් රූමත් උගත් දියණිය තම අගමෙහෙසිය ලෙස තෝරා ගත්තේ ය.



සුද්ධෝදන රජතුමා දෙදෙනාට ම එකවර ඔටුණු පළඳවා රාජ්‍යය ද භාරදුන්නේ ය. ඥාති රජවරුන් විසින් එවන ලද රූමත් කුමාරිකාවන් ඇතුළු හතළිස් දහසක් පමණ කුමාරිකාවෝ යශෝධරාවට පිරිවර වූහ.

මෙතැන් සිට අවුරුදු දහතුනක් මුළුල්ලෙහි සිදුහත් රජතුමා යශෝධරා දේවිය සමග සතුටින් රජය කරවී ය. එහෙත් එම රජසැපට දෙදෙනාගේ ම ඇල්මක් තිබුණේ නැත. ''යම්කිසි දවසක ගිහිගෙය හැර යා යුතු ය. එතෙක් අනගාරික ජීවිතයක් ගත කළ යුතු ය'' යන්න දෙදෙනාගේ ම අදහස විය.

### ක්‍රියාකාරකම 4.1

පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

1. අසිත තාපසතුමන් හැඳින්වුණු අනෙක් නම කුමක් ද?
2. අසිත තාපසතුමාගේ සොහොයුරියගේ පුතා කවු ද?
3. සිදුහත් කුමරු වප් මගුල් දින වැඩූ භාවනාව කුමක් ද?
4. මහාමායා දේවිය කලුරිය කොට ඉපදුනේ කොහි ද?

5. සිදුහත් කුමරු විවාහ වූයේ කාගේ කවුරුන් සමග ද?
6. සිද්ධාර්ථ යන්නෙහි අර්ථය කුමක් ද?
7. සිදුහත් කුමරු ඒකාන්තයෙන් ම බුදුවන බව කීවේ කවු ද?
8. සිදුහත් කුමරුගේ සුළු මව වූයේ කවු ද?
9. සිදුහත් කුමරුගේ මාළිගා තුන මොනවා ද?
10. මොනෙයාා ප්‍රතිපදව යනු කුමක් ද?

## ක්‍රියාකාරකම 4.2

පහත සඳහන් වැකි නිවැරදි නම් (✓) ලකුණත් වැරදි නම් (✗) ලකුණත් ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

1. සුද්ධෝදන රජතුමා සිදුහත් කුමරු සක්විති රජ වනු දැකීමට කැමති විය. ( )
2. සිදුහත් කුමරු ශිල්ප නූගත් අයෙකු ලෙස ඥාතීන් ප්‍රකාශ කළේ ඔවුන් කුමරු ශිල්ප ඉගෙන ගත් අයුරු නොදුටු නිසා ය. ( )
3. සිදුහත් කුමරු ශිල්ප දක්වීම සඳහා කිඹුල්වත පිහිටි ක්‍රීඩාංගනයට රැස්වන ලෙස නෑයන්ට දන්වී ය. ( )
4. සිදුහත් කුමරු මතු බුදුවන විට තමන්ට දක ගැනීමට නොහැකි වන නිසා අසිත තාපසතුමා කඳුළු සැලී ය. ( )
5. වප් මඟුල් දින සුද්ධෝදන රජු සිදුහත් කුමරුට වඩින ලද්දේ දෙවන වතාවට ය. ( )
6. සිදුහත් රජතුමා මාළිගාවේ සියලු දැසි දස්සන් සිය හිත මිතුරන් සේ සැලකී ය. ( )
7. සිදුහත් කුමරුත් යශෝධරා දේවියත් විවාහයෙන් පසු රජ සැප කෙරෙහි ඇල්මෙන් කල් ගෙවූහ. ( )
8. බමුණන් විසින් සිදුහත් කුමරු සක්විති රජ හෝ බුදුවන බව ප්‍රකාශ කළේ මහා පුරුෂ ලක්ෂණ දැකීමෙනි. ( )
9. අසිත සහ කාලදේවල යනු බමුණු පඬිවරු දෙදෙනෙකි. ( )
10. බෝසත් කුමරු පෝෂණය කිරීමට පත්කරගත් කිරිමවුවරු ක්ෂත්‍රිය වංශයට අයත් වූවෝ ය. ( )

# 05 ජීවිතයේ සැබෑ තතු හෙළිකළ පෙර නිමිති

රාජකාරි කටයුතුවල යෙදී ගත සිත වෙහෙසවන රජවරුන් බොහෝ විට විවේක සුවය විඳීම සඳහා රජ උයනට යාම සිරිතකි. සිදුහත් රජතුමා ද මෙසේ දිනක් උයන්සිරි විඳිනු පිණිස ඡන්න ඇමති ද සමග සුදු අසුන් සිවු දෙනෙකු යෙදූ මනහර රියක නැගී රජමාළිගයෙන් නික්මුණේ ය. අතරමගදී මෙතෙක් කිසි දිනයක නොදුටු දසුනක් නෙත ගැටිණ. ඒ සැරයටියකට වාරු වී වෙව්ලමින් ගමන් කරන, ඇඟ රැළි වැටුණ, කුදු ගැසුණු හිසකෙස් පැසුණු සුදු රැවුලකින් යුතු මහල්ලෙකි. මේ දුටු සිදුහත් කුමරුන්ගේ සිත කැළඹී ගියේ ය. රියදුරු ඇමතූ බෝසතාණෝ ''ඡන්න මේ කවුද? මොහුට සිදු වී ඇති විපත කුමක්ද'' යි ඇසූහ. ''රජතුමනි, මේ මහල්ලෙකි. අප වගේ තරුණ වයසේ සිට දැන් මෙසේ මහලු වී දුක් විඳී'' යැයි ඡන්න පැවසීය. මේ විපත අපටත් වේදැයි සිදුහත් රජ ඡන්න ඇමතිගෙන් විමසී ය. ''එසේ ය ස්වාමීනි'' යි ඡන්න පැවසී ය. ඒ ගැන සිතුවිල්ලට වැටුණු සිදුහත් රජතුමාට කලකිරීමක් ඇති විය. උයන් ගමන එපා විය. රථය හරවාගෙන ආපසු මාළිගයට ගියේ ය. එහිදී යශෝධරාවන් සමග ද මේ සිදුවීම ගැන කතාබහ කළේ ය. දෙදෙනාට ම රූපයේ නිසරුකම වැටහුණි. දෙදෙනාගේ ම යෞවන මදය ඉන් පහව ගියේ ය. මෙසේ සිදුහත් රජතුමාට ජීවිතයේ සැබෑ තතු හෙළිදරව් වීම ගැන රජගෙදර තුළ ද මහා කැළඹීමක් ඇති විය.

තවත් දවසක මඟුල් රියට නැගී නගරවැසියන්ගේ පිළිගැනීම්, ඔල්වරසන් මැද උයන බලා යන රජතුමාට මහා පිළිකුල් දසුනක් නෙත් ගැටිණ. ඒ තමාගේ ම මලමුත්‍රා ගොඩේ වැතිර සිටින දැඩි ගිලන් බවට පත් රෝගියෙකි. තමාටත් මේ ඉරණම අත්වන බව වැටහී තවදුරටත් කළ කිරුණු සිදුහත් රජු එදින ද උයන් ගමන අතහැර පෙරළා රජමැදුරට ගියේ ය.

තවත් දවසක එතුමාට අතරමගදී දකින්නට ලැබුණේ රෙදි කඩකින් ඔතා මැස්සක් මත තබාගෙන යන මළ කඳකි. තව පිරිසක් ඒ පිටුපසින් හඬා වැළපෙමින් ගමන් කරමින් සිටියෝ ය. මොවුන් මේ හඬමින් ගෙන යන්නේ

කුමක් දැයි රජතුමා රියදුරුගෙන් විමසී ය. ''ඒ ජීවිතය කෙළවර වී මියගිය කෙනෙකුගේ මළකඳක් යැ'' යි ඡන්න පැවසීය. තමාගේ ජීවිතය ත් මෙසේ කෙළවර විය හැකි බව වටහාගත් සිදුහත් රජුට මහත් තිගැස්මක් ඇති විය. මෙය විනෝද වන්නට සුදුසු තත්ත්වයක් නොවේ යැයි සිතූ එතුමා එදා ද ආපසු හැරී මාළිගයට ගියේ ය.




සුද්ධෝදන රජතුමා කොතරම් රැකවල් යොදා තිබුණත් බුදුවන ආත්මභාවයේ සිටි සිදුහත් රජුට මේ තොරතුරු වසන් කිරීම කිසිසේත් නො කළ හැකි විය. දෙවියන්ගේ මැදිහත් වීමෙන් ඒවා පෙරමග පහළ විය. මේ නිසරු ජීවිතය පිළිබඳ කළකිරී මීළඟට ගත යුතු පියවර කුමක්දැයි සිතමින් එතුමා දවස් ගෙවී ය. මේ අතර නැවතත් දවසක සිත සනසාගන්නට උයන බලා පිටත් විය. එදා මහමග දක්නට ලැබුණේ සන්සුන් ඉරියව් ඇති ශාන්ත ගමනින් වඩිනා පැවිදි උතුමෙකි. රියදුරාගෙන් ඒ කවුදැයි විමසී ය. ''මහරජ මේ පැවිද්දෙකි. ජීවිතයේ සියලු කම්කටොලුවලින් මිදී නිවීමක් සොයන උතුමෙකි'' ඡන්න පිළිතුරු දුන්නේ ය. සිදුහත් රජුගේ සිත එය ඇසීමෙන් කිසිදා නොවූ තරම් ප්‍රබෝධවත් විය. සිත පහන් විය. මහත් සැහැල්ලුවක් දැනුණි. උයනට ගොස් කාලයකින් නොවිඳි තරම් ප්‍රීතියකින් උයන්සිරි වින්දේ ය. දහවල්

කාලය මෙසේ ගතකළ සිදුහත් රජු සවස් කාලයෙහි මැනවින් සැරසී ආපසු මාළිගාවට යාමට රියට නැගුණේ ය.

ඒ මොහොතේ ම ''යසෝදරාව පුතකු බිහිකළා'' යයි සුදොවුන් රජතුමාගෙන් පණිවිඩයක් ලැබිණි. ඒ ඇසූ බෝසත් සිදුහත් රජුට එක්වර ම ''රාහුලයෙක් උපන්නා බන්ධනයක් ඇතිවුණා (රාහුලො ජාතො බන්ධනං ජාතං)'' යයි කියවිණ. කුළුඳුලේ පුතකු ලැබීම ප්‍රීතිය උපදවන්නෙකි. එහෙත් ජීවිතය පිළිබඳ කළකිරීමෙන් පසුවූ සිදුහත් රජුට එය දනුණේ බන්ධනයක් ලෙසිනි. පණිවිඩකරු පෙරළා ගොස් සිදුහත් රජතුමා කී වදන් සුදොවුන් රජතුමාට දන්වීය. ඒ ඇසූ මහරජතුමා තම මුනුබුරු කුමරුට රාහුල යැයි නම් තැබී ය.

### නිබ්බුත පද ඇසීම

සිදුහත් රජතුමා මඟුල් රියේ නැගී මහ පෙරහරින් මාළිගාව බලා පිටත්විය. මග දෙපස සිටි ජනයා එතුමා ගමන් ගත් රිය පෙරහර දැක මහත් හරසරින් ඔල්වරසන් දුන්හ. අතරමග මැදුරක ඉහළ මාලයෙහි සිටි කිසාගෝතමී නම් ඥාති රාජ කුමාරිකාවක් සිදුහත් කුමරුන් යන අභිමානවත් ගමන දෙස බලා සිටියා ය. එදා එතුමාගේ මුහුණේ දක්නට ලැබුණු ශාන්ත විලාසය දැක ප්‍රමෝදයට පත් ඕ තොමෝ මෙසේ කීවා ය.

නිබ්බුතා නූන සා මාතා
නිබ්බුතා නූන සො පිතා
නිබ්බුතා නූන සා නාරි
යස්සායං ඊදිසො පති

''මෙවන් පුතකු බිහිකළ මව නිවුණා ය. ඒ පියා ද නිවුණෙකි. මෙවන් සැමියෙකු සිටිනා බිරිය ඒකාන්තයෙන් ම නිවුණා ය''. කම් සැප කෙරෙහි කල කිරුණු සිදුහත් රජතුමාට එම කියමන අසා මෙසේ සිත් විය. ''මැය නිවීමක් ගැන කියයි. නිවීම නම්, රාග ගින්න, ද්වේෂ ගින්න, මෝහ ගින්න නිවීම යි. මම ඒ නිවීම සොයමින් යන කෙනෙක් වෙමි. අද ම ගිහිගෙය හැර ඒ නිවන සොයා යා යුතු ය. මේ මොහොතේ මැයගෙන් මට අසන්නට ලැබුණේ ඊට රුකුල් දෙන වදනකි. ඒ සඳහා ඇයට තුටු පඬුරු යැවිය යුතුයැ'' යි සිතා ලක්ෂයක් අගනා මුතුහර ගෙලෙන් මුදා කිසා ගෝතමිය වෙත යැවී ය.

උයන් කෙළි නිමවා පැමිණි බෝසත් සිදුහත් රජතුමා සිරියහනේ සැතපුණේ ය. මේ මොහොතේ එතුමා පිරිවරාගත් දෙවඟනන් සේ සැරසුණු රූමත් නළඟනෝ එතුමන් පිනවීමට නැටුම්, ගැයුම්, වැයුම් දක්වන්නට පටන් ගත්හ. ඒ කිසිවකින් වෙනදා තරම්වත් සතුටක් නොලැබිණි. ඒ කිසිවක් එතුමාට රුචි නොවී ය. ඒ නිසා ම සිදුහත් රජතුමා නින්ද ගියා සේ වැදහොත්තේ ය.

තමන්ගේ සියලු උත්සාහයන් පලක් නැතැයි කම්පාවට පත් නාටිකාංගනාවෝ වෙහෙස නිවාගනු පිණිස සංගීත භාණ්ඩ තැන තැන දමා බිම හිඳ ගත්හ. නොබෝ වේලාවකින් ඔවුන්ට ඒ ඒ තැන්වල ම නින්ද ගියේ ය.

මඳ වේලාවකට පසු බෝසතාණෝ සිරියහන මත පළක් බැඳ හිඳ ගත්හ. සියලු දෙනා වැටුණු වැටුණු තැන නිදති. පහන් දැල්වෙයි. ඇතමෙකුගේ මුවින් කෙළ වැගිරේ. ඇතැමෙක් දත්කුරු කති. තව කෙනෙක් ගොරවති. තවත් කෙනෙක් වැළපෙති. තව කෙනෙකුගේ මුව විවරව ගොස් ය. බොහෝ දෙනෙකුගේ ඇඳිවත් ඉවත්ව ගොස් ය. කෙස් අවුල්ව ගොස් ය. සිරියහන් ගබඩාව පුරා දක්නට ලැබුණේ මහා බිහිසුණු පෙනුමකි. බෝසතුන්ගේ කළකිරීම තවත් වැඩි විය. පෙරයමෙහි දෙවඟනන් මෙන් පෙනී සිටි මොවුන් දැන් මළකඳන් බඳු ය. දෙව් විමනක් මෙන් පැවති මාළිගාව දැන් අමු සොහොනක් වැනි ය. සිත තවදුරටත් පැවිද්ද දෙසට ම නැමී ගියේ ය. අද ම ගිහිගෙය හැර යා යුතුයැයි එතුමා සිත දැඩිකර ගත්තේ ය.

නිහඬව සයනෙන් නැගී සිටි බෝසතාණෝ දොරටුව ළඟට ගොස් එහි කවුදෝ සිටිනු දැක ''මේ කවුද'' යි විමසීය. ''දේවයන් වහන්ස මම ඡන්න වෙමි'' යි හේ පිළිතුරු දුන්නේ ය. ''ඡන්න අද මම ගිහිගෙයින් නික්මෙන්නට තීරණය කළෙමි. ඒ ගමනට සුදුසු අශ්වයෙකු වහා සූදානම් කරන්නැ'' යි එතුමා පැවසීය. මැනැවැයි පිළිගත් ඡන්න, කන්ථක නම් මඟුල් අසු වහා සරසා ගෙනාවේ ය.

අවසන් මොහොතේ පුත් කුමරු දැකගත්තොත් මැනවැයි සිදුහත් රජුට සිතිණ. එතුමා යශෝධරාවගේ යහන් ගැබ වෙත පියනැගී ය. සෙමෙන් දොර එළියෙන් විවර කළේ ය. යහන් ගැබ පහන් එළියෙන් එළිය වැටී ඇත. සිරියහන සමන් මලින් අතුරා තිබිණ. කුඩා කුමරුවන් තුරුලේ හොවාගත් යශෝධරාවෝ

නින්දට වැටී සිටියහ. දොර එළිපත්තට පය තැබූ බෝසතාණෝ "දැන් දේවියගේ අත මැත් කොට පුත් කුමරු වඩාගතහොත් ඕ තොමෝ අවදි වන්නී ය. එය මගේ ගමනට බාධාවක් වෙයි. එනිසා දැන් පිටත්ව ගොස් බුදු බව ලබා පැමිණ කුමරු දකින්නෙමැ" යි සිත සනසා ගත්හ. තම එකම පුතුට ත් යශෝධරා දේවියටත් යොමු විය යුතු ආදරය, කරුණාව මුළු ලෝකය දෙසට හැරවූහ.

එළිපත්ත මත තැබූ පය ආපසු ගත් බෝසත්තුමා දේවියගේ යහන් ගැබෙන් නික්මුණේ ය. කිසිවෙකුටත් නොදැනෙන සේ රජ මැදුරෙන් ද නික්මුණේ ය. මේ වන විට ඡන්න ඇමති සහ කන්ථක අසු ගමනට සූදානමෙන් සිටියෝ ය. අසු පිට නැගගත් සිදුහත් බෝසතාණෝ පිටුපසින් ඡන්න ඇමති ද හිඳුවාගෙන නුවර ගිණිකොණ දෙසින් වූ මාවත ඔස්සේ ගමන් කළේ ය. එසේ සිදු වූයේ අප මහා බෝසතාණන්ගේ මහාබිනික්මනයි. එය සිදුවූයේ ඇසළ මස පුන් පොහෝදාක ය. ඒ වන විට සිදුහත් බෝසත්තුමා විසිනව වන වියේ පසු විය.

### ක්‍රියාකාරකම 5.1

පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

1. සතර පෙර නිමිති නම් කරන්න.
2. රාහුල කුමරු ඉපදුණු බව ඇසූ සිදුහත් රජු කළ ප්‍රකාශය කුමක් ද?
3. නිබ්බුත පද කීවේ කවුරු ද?
4. නිබ්බුත පද ඇසීමෙන් පසු සිදුහත් කුමරුට සිතුණේ කුමක් ද?
5. සතර පෙර නිමිතිවල පැවිදි රූපය බලා සිදුහත් බෝසතාණන්ට සිතුණේ කුමක් ද?
6. පැවිදි රුව දැකීමෙන් පසු සිදුහත් බෝසතාණන් තුළ ඇතිවුණු වෙනස්කම් මොනවා ද?
7. සිදුහත් බෝසතාණන් තව තවත් කළකිරීමට හේතුවක් වූ නාටිකාංගනාවන්ගේ විකාර යනු මොනවා ද?
8. බුද්ධත්වය පතා සිදුහත් කුමරු ගිහිගෙයින් නික්මීමට කියන නම කුමක් ද? එය සිදුවූයේ කිනම් පොහෝ දිනයකදී ද?
9. ගිහිගෙයින් නික්මීමට පෙර සිදුහත් බෝසතාණන් රාහුල කුමරුව වඩා නොගත්තේ ඇයි?
10. රජවරු බොහෝවිට උයන්සිරි නරඹන්නට යන්නේ ඇයි?

# 06 බෝසතාණෝ නිවන් සුව ළඟා කරන පැවිදි බිමට පිවිසෙති

සිදුහත් බෝසතාණන් වහන්සේගේ පුණ්‍ය මහිමයේ හැටියට ගිහි ගෙයි රැඳී සිටියේ නම් මුළු ලොවට අගරජ වන සක්විති රජ පදවිය ලැබෙන්නට තිබුණේ ය. එසේ අත ළඟ තිබූ සක්විති සැපත අලුයම ලූ කෙළ පිඩක් සේ අතහැර දමා දෙවියන්ගේ ගරු බුහුමන් මැද නගරයෙන් පිටත් වූ සේක. උන්වහන්සේ ශාක්‍ය රට කෝලිය රට හා මල්ල රට යන රාජ්‍ය තුනම එක රැයකින් පසු කොට තිස් යොදුන් මග ගෙවා අලුයම අනෝමා ගං තෙරට සැපත් වූහ. එහි දී කන්ථක අසුට විලුඹින් සංඥා කොට ගඟෙන් එතෙරට පැන්නවූහ. එහි රිදී සළුවක් බඳු සුදු වැලි තලාව මත වැඩ සිට ඡන්න අමතා මෙසේ පැවසූහ.

"යහලු ඡන්නය, ඔබ මගේ මේ ආභරණත් මේ කන්ථක අශ්වයාත් රැගෙන පෙරලා නුවරට යන්න. මම පැවිදි වන්නෙමි." එවිට, "මමත් පැවිදි වෙමි" යි ඡන්න පැවසී ය.

"ඡන්න මේ ඔබට පැවිදි වීමට සුදුසු වේලාව නොවේ. මගේ පිය රජතුමාත්, සුළු මවත්, දේවිය යසෝදරාවත් මා ගැන කිසිදු තොරතුරක් නොදනිති. දූනටමත් කලබලයටත්, විමතියටත් පත් ව ඇතැයි සිතමි. ඔබ වහා ගොස් මා ගැන සියලු තොරතුරු ඔවුන්ට දන්වන්න. ඔබටත් පසුව පැවිදි වීමට ලැබෙනු ඇතැ යි" බෝසතාණෝ පැවසූහ.

අනතුරු ව තමාගේ සියලු ආභරණ ඡන්න ඇමතියා අත තැබූ උන්වහන්සේ මංගල අශ්වයා ද ඔහුට ම භාර කළේ ය. වමතින් කෙස්වැටිය අල්ලාගත් එතුමා දකුණතින් මගුල් කඩුව ගෙන එය සිඳ දැමුවේ ය. කෙස් වැටිය අතට ගත් උන්වහන්සේ "මා බුදුවන්නේ නම් මෙය අහසේ රැඳේවා යි" අහසට විසි කළහ. එය යොදුනක් පමණ අහසෙහි නැගී නැවතුණේ ය.

මෙය දුටු සක් දෙව් රජතුමා එය රන් කරඬුවකින් පිළිගෙන තව්තිසා දෙව් ලොවට ගෙන ගොස් සෑයක තැන්පත් කරවී ය. එය සිළුමිණි සෑය නම් විය. තමා හැඳි කසී සළු තමාගේ පැවිදි බවට නොගැළපේ යැයි උන්වහන්සේ ට සිතුණි. එය දැනගත් සටිකාර මහා බ්‍රහ්මයා උන්වහන්සේට අට පිරිකර පූජා කළේ ය. බෝසතාණන් වහන්සේ ඒ අරහත් ධජය හැඳ පොරවාගෙන උතුම් වූ පැවිදි වෙස් ගත්හ. නැවත ඡන්න ඇමතූ උන්වහන්සේ "ඡන්නය, මාගේ මව්පියන්ට මා සුවසේ වෙසෙන බව කියන්නැ" යි පැවසූහ. ඡන්න ද බෝසතුන් වැඳ කන්ථක අසු සමග යන්නට පිටත් විය. ඒ මොහොතේ තම ස්වාමියාගෙන් වියෝවන්නට සිදුවන බව දැන කම්පාවට පත් කන්ථක අසුට උන්වහන්සේගෙන් වෙන් වී ඈතට යන්නට යන්නට ශෝකය ඉවසාගත නොහැකි විය. ඒ වේදනාවෙන් ම හදවත පැලී ඇද වැටුණු අසු මිය ගොස් තව්තිසා දෙව්ලොව කන්ථක නමින් දිව්‍ය පුත්‍රයෙක් ව උපන්නේ ය. ස්වාමියා අහිමි වීමෙන් ඡන්නට ඇති වූ ශෝකය කන්ථක මිය යාමෙන් දෙගුණ විය. හෙතෙම හඬමින් වැලපෙමින් ආපසු කිඹුල්වත් නුවර බලා ගියේ ය.

## රජගහනුවරට සැපත්වීම

උතුම් වූ පැවිදි බව ලැබූ සිදුහත් තාපසතුමා අනෝමා ගං තෙරින් පිටත් වී ඊට නුදුරෙහි තිබුණු අනුපිය නම් අඹ වනයට පැමිණ එහි සත් දිනක් පමණ පැවිදි සුවය විඳිමින් විසුවේ ය. අටවන දිනයේ දී එතැනින් පිටත් ව ගංගා නම් ගඟින් එතෙර ව තිස්යොදුනක් මග පා ගමනින් වැඩම කොට රජගහනුවරට පිවිසියේ ය. මෙතෙක් රජ සැප විඳිමින් ගත කළ ඉතා සියුමැලි පෙනුමක් ඇති මේ තාපසතුමා රජගහනුවර වැසියන්ට අපූරු දසුනක් විය. සාමාන්‍යයෙන් සිඟා නොයන කෙනෙක් මෙසේ ගෙපිළිවෙලින් පිඬු සිඟා යනු දැක මුළු නුවර ම කැළඹී ගියේ ය. රාජ පුරුෂයෝ බිම්බිසාර රජු බැහැ දැක ''දේවයන් වහන්ස, අමුතු කෙනෙක් නුවර පිඬු පිණිස හැසිරෙයි. මිනිසෙක් ද, දෙවියෙක්දැයි සිතාගත නොහැකි යැ'' යි දන්වා සිටියහ. රජතුමා ප්‍රාසාදයේ සී මැදුරු කවුළුවෙන් බලා, මහා පුරුෂයාණන් දැක පුදුමයට පත්ව රාජපුරුෂයින් ඇමතී ය. ''දරුවෙනි, මේ අමුත්තා ගැන විමසිල්ලෙන් සිටිව්, අමනුෂ්‍යයෙක් නම් නගරය පසු කොට අතුරුදහන් වන්නේ ය. දෙවියෙක් නම් අහසින් යන්නේ ය. නාගයෙක් නම් පොළොවේ කිමිදෙන්නේ ය. මිනිසෙක් නම් කොතැනක හෝ හිඳ ගෙන බත වළඳනු ඇත.''

බෝසත්තුමා ද ලැබුණු ආහාර තමන්ට යැපීමට ප්‍රමාණවත් යැයි දැනුණු විට ආපසු හැරී නගරයෙන් පිට වී පාණ්ඩව පර්වත සෙවණේ නැගෙනහිර බලා වැඩ හිඳ වළඳන්නට සැරසුණේ ය. මෙතෙක් කල් රසමසවුලෙන් යුතු සුවඳැල් සහලේ බත් වැළඳූ එතුමා මෙබඳු කලවම් ආහාරයක් ඇසින්වත් දැක නොතිබිණි. වළඳන්නට බත් පිඬු මුවට ලංකරද්දී එතුමාට අතුණු බහන් මුවින් පිටවන තරම් පිළිකුලක් ඇති විය. ඒ ගැන තමාට ම අවවාද කරගත් එතුමා සිත දැඩි කරගෙන ඒ ආහාර වැළඳුවේ ය.

## බිම්සර රජ හමුව

මහබෝසත් තුමා පසුපස විමසිල්ලෙන් හැසිරුණු රාජපුරුෂයෝ වහා රජු බැහැදැක මේ සියලු පුවත් දන්වා සිටියෝ ය. බිම්බිසාර රජතුමා සැණෙකින් පිටත්ව බෝසතාණන් වහන්සේ වෙත ගොස් වැඳ තොරතුරු විමසී ය. එවිට බෝසතාණෝ, තමන් කවුරුද' යි හඳුන්වාදෙමින්,

"මහරජ, මේ ඉදිරියෙන් ඇති හිමාලය පර්වතයේ පසෙක කෝසල ජනපදයට අයත්, පුරාණයේ සිට පැවත එන, මහ රජ පරපුරකට අයත් ජනපදයක් වේ. ඔවුන්ගේ ගෝත්‍රය ආදිත්‍ය නම්. ජාතියෙන් ශාක්‍ය නම් වෙති. මහරජ, මම එම කුලයෙන් කම්සැප හැර පැවිදි වූවෙක්මි" යි පැවසී ය.

ඒ තොරතුරු ඇසූ බිම්බිසාර රජතුමා මේ තමා මෙතෙක් නොදුටු මිතුරු වූ සුද්ධෝදන මහරජ පුත් සිදුහත් රජතුමා බව දැන හැඳින ගත්තේ ය. මේ තරම් හද්‍ර යෞවනයක පසු වෙමින් තවුස්දම් පිරීමට සිතීම ගැන රජතුමා මවිතයටත්, කම්පාවටත් පත් විය. තමා සතු අංග, මගධ දෙරටෙන් ඇති තරම් රජසැප පවරාදීමට කැමති බවත් තමා සමග එක්ව රජකම් කරන ලෙසත් ඉල්ලා සිටියේ ය. ඊට පිළිතුරු දෙන බෝසතාණන් වහන්සේ,

"මහරජ, මම කිසිසේත් කම්සැප සොයන්නෙක් නොවෙමි. පස්කම් සැපයෙහි ආදීනව හඳුනාගතිමි. ඉන් මිදීමට නියම මග පැවිද්ද බව දැනගෙන එය තෝරා ගතිමි. දැන් මගේ සිත ඇලී තිබෙන්නේ නිවන අවබෝධ වන තුරු (ප්‍රධන්) වීර්යය වැඩීම පිළිබඳව ය. මම ඒ සඳහා පිටත්ව යමියි" පැවසූහ. එවිට බිම්බිසාර රජතුමා "ස්වාමීනි, ඔබ වහන්සේගේ අදහස එසේ ම ඉටුවේවා. ඔබ ඒකාන්තයෙන් බුදුවනු ඇත. බුදුබව ලබා පළමුකොට ම මගේ නුවරට වඩිනු මැනවැ" යි ඇරයුම් කොට සමුගෙන පෙරළා මාළිගය බලා ගියේ ය.

## ආචාර්යවරුන් සොයා යාම

සිදුහත් තාපසතුමා **කිං කුසල ගවේසී ව** (කුසලය කුමක්දැයි සෙවීම) ජාති, ජරා, ව්‍යාධි, මරණ ආදී දුක් නිවන මග සොයන්නට පිටත් විය. උන්වහන්සේ පළමුකොට ආළාරකාලාම නම් තාපස ඇදුරුතුමන් වෙත ගියේ ය. එතුමා ආකිඤ්චඤ්ඤායතන නම් තුන්වන අරූපධ්‍යානය ලබා සිටි බලවත් තවුසෙකි. විශාල ශ්‍රාවක පිරිසක් එතුමා ළඟ තවුස්දම් පුරමින් සිටියහ. ආළාරකාලාම තුමාගේ පිළිවෙල ගැන පැහැදුණු බෝසත්තුමා එතුමාගේ දර්ශනය ඉක්මනින් උගත්තේ ය. වෙර වැඩූ එතුමා නොබෝ දිනකින් ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයට පත් විය. තමන් පත් වූ ධ්‍යානයට ම තම ශ්‍රාවකයා ද පැමිණි බව දැනගත් ආළාරකාලාම තුමා අපි මේ ශ්‍රාවක පිරිස සම සමව බෙදාගෙන පාලනය කරමු යි යෝජනා කළේ ය. එහෙත් එය සසර දුකින් මිදීමට මග නොවේ ය. ආකිඤ්චඤ්ඤායතන නම් බඹලොව ඉපදීමට පමණක් හේතු වන්නේ යැයි වටහාගත් බෝසත් තුමා ආළාරකාලාම ඇදුරුතුමන්ගෙන් සමුගෙන පිටත් විය.

දෙවනුව එතුමන් ගියේ මිනිසුන්, දෙවියන්, බ්‍රහ්මයන් සහිත තුන් ලෝකයේ ම ඉහළ ම ධ්‍යානය වන නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ සිටි උද්දකරාමපුත්‍ර තුමා වෙතට ය. එතුමාගේ දර්ශනය ද ඉතා ඉක්මනින් ඉගෙන ගත් බෝසත්තුමා නොබෝ දිනකින් ම වෙර වඩා නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය අවබෝධ කළේ ය. ඒ ගුරුතුමා ද පෙර සේම තමාගේ පිරිස පාලනය භාර දී සියලු ගරු සැලකිලි කරන්නට පටන් ගත්තේ ය. නමුත් එය ද නිවන නොවේ. නෙවසඤ්ඤානාසඤ්ඤායතනය බඹලොව ඉපදීමට ප්‍රමාණවත් ධ්‍යානයකි. ඒ බඹලොව ආයුෂ ගෙවා අවසන් වූ පසු නැවතත් එම සසර දුකට ම වැටෙන බව බෝසතාණන්ට වැටහිණි. එහෙයින් උද්දකරාමපුත්‍ර තුමාගෙන් ද සමුගෙන පිටත්ව ගියේ ය. එතැනින් ගුරුවරුන් සෙවීම අවසන් විය. ඉන් ඔබ්බට ඉගැන්වීමට සමත් ගුරුවරයෝ ද මේ මිහිපිට එදා නො සිටියහ. එබැවින් මෙතැන් සිට ස්ව උත්සාහයෙන් ම සත්‍යය සොයා ගත යුතුයයි එතුමා අදිටන් කරගත්තේ ය.

## ක්‍රියාකාරකම 6.1

පහත සඳහන් ප්‍රකාශ කවුරුන් විසින් කා හට ප්‍රකාශ කරන ලද්දේ දැ යි දක්වන්න.

| ප්‍රකාශය | කවුරුන් විසින් | කාහට |
|---|---|---|
| 1. දරුවෙනි, මේ අමුත්තා ගැන විමසිල්ලෙන් සිටිවු. | | |
| 2. ඔබටත් පසුව පැවිදි වීමට ඉඩ ලැබෙනු ඇත. | | |
| 3. දැන් අපි දෙදෙනාම විමුක්තියෙන් සමාන වෙමු. | | |
| 4. මහරජ, මම කිසිසේත් කම්සුව සොයන්නෙක් නොවෙමි. | | |
| 5. දේවයන් වහන්ස, අමුතු කෙනෙක් නුවර පිඬු පිණිස හැසිරෙති. | | |

## ක්‍රියාකාරකම 6.2

දී ඇති වචන ඇසුරෙන් පහත සඳහන් ඡේදයේ හිස්තැන් පුරවන්න.

(අනෝමා, අෂ්ටසමාපත්තිලාභි, ආළාරකාලාම, කළකිරෙන්නට, පැවිද්ද, ජීවිතය, විමුක්ති, නාටිකාංගනාවන්ගේ, ධ්‍යාන, ගිහිගෙයින්, ගුරුවරුන්, රාහුල)

සතර පෙර නිමිති දැකීමෙන් .................................... පිළිබඳ කළකිරී සිටි සිදුහත් බෝසතාණන්ට .................................... විකාර දැකීම තවත් ජීවිතය ගැන .................................... හේතුවක් විය .................................... කුමරුගේ ඉපදීම ද තවත් බන්ධනයකි. මේ සියල්ල ගැන සිතූ බෝසත් තුමා ...................... .............. නික්මෙන්නට සිතා ඡන්න ඇමතියාගේ ද සහය ඇතිව කන්ථක අසු පිට නැගී රජවාසලින් නික්මුණේ සසර දුකින් මිදී බුදුබව පතාගෙන ය.

.................................. ගං තෙරට ගොස් තවුස් .................................. ලැබුවේ එහි පළමු පියවර ලෙස ය. දුකින් මිදීමේ මග දැනගන්නට නම් .................................. සොයා යා යුතු යැයි සිතූ සිදුහත් තාපස තුමා පළමුව පියනගන ලද්දේ .................................. නම් ගුරුවරයා වෙත ය. එතුමා ළඟ පැවති මාවත වූයේ ආකිඤ්චඤ්ඤායතනය දක්වා වූ .................................. මාර්ගය යි. එය තමන් සොයන මාවත නොවන බව වටහා ගත් සිදුහත් තාපස තුමා උද්දකරාමපුත්ත නම් .................................. ආචාර්යවරයා වෙත පිය නැගුවේ ය. එහෙත් එතුමා ළඟ ද තමන් සොයන .................................. මාවත නොමැති බව තේරුම් ගත් සිදුහත් තාපස තුමා එය තමා ම සොයාගත යුතු යැයි සිතී ය.

### ජීවිතයට ඔවදනක්

**"අත්තානමෙව පඨමං
පතිරූපෙ නිවෙසයේ"**

පළමුව තමා ම සුදුසු ගුණයෙහි පිහිටිය යුතු ය.

### පුහුණුවට

**උජුං ජානපදො රාජා - හිමවන්තස්ස පස්සතො
ධන විරියෙන සම්පන්නො - කොසලෙසු නිකෙතිනො
ආදිච්චා නාම ගොත්තෙන - සාකියා නාම ජාතියා
තම්හා කුලා පබ්බජිතොම්හි රාජ - න කාමෙ අභිපත්ථයං**

(සු.නි. පබ්බජ්ජා සූත්‍රය)

# 07 අප වෙනුවෙන් බෝසතාණන් සය අවුරුද්දක් විඳි දුක්


තමා ම තමාගේ උත්සාහයෙන් උතුම් වූ නිවන සොයා යන අප මහ බෝසතාණන් වහන්සේ මගධ රට සැරිසරමින් ගොස් උරුවෙල් දනව්වේ සේනානි නම් නියම්ගමට සැපත් වූහ. එම නියම්ගම අසලින් ගලාබසින නේරංජනා ගං තෙර වන පෙදෙස සිදුහත් තවුසාණෝ වාසස්ථානකොට ගත්හ. මේ වනවිට **කොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම හා අස්සජි** යන, එදා නම් තැබීමට පැමිණි බමුණෝ පස්දෙනා පැවිදි ව සිටියහ. සත්‍යය සොයා යද්දී ඔවුන් ට සිදුහත් බෝසතාණන් හමු විය. එතුමන් හඳුනාගත් ඔවුහු දුෂ්කර ක්‍රියා කිරීමට තීරණය කිරීම ගැන අතිශයින් පැහැදී උන්වහන්සේ ට උපස්ථාන කළෝ ය.

උරුවෙල් දනව්වේ සේනානි ගම ඇසුරු කරමින් ඒ ගමෙන් සිඟාගත් අහරින් එතුමා යැපුණේ ය. වන වැදී තනිව ම සිටින විට තැතිගැනීම් ඇති කරන බියකරු හඬ ඇසෙයි. ඒවා ගැන සොයා බලන විට එක්කෝ සතෙකුගේ නාදයක්, සුළං හැමීමක් හෝ ගස් ඇතිල්ලීමක් වැනි දෙයක් බව පැහැදිලි විය. එයින් බිය දුරු විය. බිය, තැති ගැනීම් ඇතිවන්නේ පව්කම් කළ වැරදි සහිත අයට ය. තමා ළඟ එවැනි වැරදි නැත්නම් කුමට බිය වෙම්දැයි සිතා උන්වහන්සේ මෛත්‍රී භාවනාව වඩන්නට පටන් ගත්හ. එයින් ඉතා බියකරු තැන්වල දී පවා උන්වහන්සේ ට නොබිය ව නොසැලී සිටීමට හැකි විය.

## කෙළෙස් තැවීම

බෝසතාණන් වහන්සේ ට ඊළඟ ගැටලුව වූයේ කාමයන් පිළිබඳ ආශාව, පිපාසය දුරු කිරීම ය. කොතෙක් භාවනා කළත් තෘෂ්ණාව යටපත් කළ නොහැකි වූ තැන උන්වහන්සේ දිව තල්ලට තද කරගෙන දත් සපාගෙන සිතින් සිත මැඩගෙන කෙලෙස් මතුවීම වැළැක්වීමට වෑයම් කළේ ය. මෙසේ දැඩි වීර්යයෙන් භාවනා කරන විට දහඩිය වැගිරෙන්නට විය. එහෙත් වීර්යය දිගට ම පවත්වාගෙන ගියේ ය. සිහිය අවුල් නොවී ය. එනමුත් සිතේ සන්සුන්කමක් ඇති නොවී ය.

## අප්‍රාණක ධ්‍යානය වැඩීම



සිදුහත් තාපසතුමා මුඛයෙන් හා නාසයෙන් ආශ්වාස, ප්‍රශ්වාස කිරීම ද නවතා දැමී ය. හුස්ම ශරීරය තුළ නතර කරගත්තේ ය. එය **අප්‍රාණක ධ්‍යානය** වැඩීමයි. සිරුර තුළ වූ වාතය දෙකන් සිදුරුවලින් නික්මෙන්නට විය. දෙකන් සිදුරුවලින් හුස්ම පිටවීම නවතා දැමී ය. එවිට වරපටකින් බඳිනා කලෙක මෙන් හිසට තව තවත් වේදනා ඇති විය. මෙසේ මුඛයෙන්, නාසයෙන්, දෙකනින් හුස්ම පිටවීම වැළකුණු විට හිර වූ වාතය නිසා කුසට මහත් වේදනා ඇති විය. ක්‍රමයෙන් මුළු ශරීරයෙහිමත් මහත් වේදනා ඇති විය. දැඩි දැවිල්ලක් දැනෙන්නට විය. මේ නිසා බෝසතාණන් වහන්සේ සිහ සුන්ව සක්මන් මලුවෙහි ඇද වැටුණාහ. මේ දුටු ඇතැම් දෙවි කෙනෙක්, ''සිදුහත් තවුසා මළේ'' යැයි සුදොවුන් රජුට දැන්වූහ. එවිට පියරජතුමා මාගේ පුතු බුදුබව ලබා මළේ ද? බුදුබව නොලබා මළේ ද'' යි ප්‍රශ්න කළේ ය. ''බුදුබව නොලබා මළේ'' යැයි දෙවිවරු කීහ. බුදු බවට පත් නොවී මගේ පුත් කලුරිය නොකරන්නේ'' යැයි රජතුමා දෙවියන්ගේ වදන් නොපිළිගත්තේ ය.



නොමිලේ බෙදා හැරීම පිණිසයි.

### ආහාර සීමා කිරීම

මුලදී සේනානි නියම්ගම ඇසුරු කොට සිඟා ගත් අහරින් යැපුණු බෝසතාණෝ ක්‍රමයෙන් පිඬු පිණිස යාම අත් හළහ. **පවත්තඵල භෝජී** වී (අතේ දුරට වැටෙන කොළ, ගෙඩි ආදිය ආහාරයට ගෙන) තමා විසූ වන ලැහැබෙන් සොයාගත හැකි අල වර්ග, පලවැල පමණක් ආහාර කොට ගත්හ. තවත් ටික කලක් යන විට සහමුලින් ම ආහාර ගැනීම නැවැත්වීමට තීරණය කළහ. එය දැනගත් දෙවියෝ එසේ නොකරන ලෙස ඉල්ලා සිටියහ. එවිට බෝසතාණන් වහන්සේ ආහාර ගැනීම සහමුලින් ම නවතනු වෙනුවට ටිකෙන් ටික අඩු කරන්නට පටන් ගත්හ. එයින් සිරුර වැහැරී ගියේ ය.

මෙසේ ආහාර හිඟයෙන් කෘශ වී ගිය ශරීරයෙන් යුතුව නිවන් සුවය අවබෝධ කිරීම පහසු නැත. කම් සැපයෙන් නිවන් (සැප) ලැබීම නොහැකි ය. එසේම (දුෂ්කර ක්‍රියා) දුකින් ද නිවන් සැප ලැබීමට නොහැකි ය. මෙයට මැදුම් පිළිවෙතක් තිබිය යුතු යැයි උන්වහන්සේ නැවතත් පිණ්ඩපාතයෙන් යැපෙන්නට පටන් ගත්හ. ඒ දුටු මෙතෙක් උවටැන් කළ පස්වග තවුසෝ ''ශ්‍රමණ ගෞතමයන් වහන්සේ වීර්යය අත්හැර දැන් නැවත කම්සැප විඳීමට පටන්ගෙන ඇත. ඉතින් මෙතුමා බුදු නොවනු ඇතැයි කියා උන්වහන්සේ තනිකොට බරණැස ඉසිපතනය බලා ගියෝ ය. ටිකෙන් ටික ආහාර ගැනීම නිසා බෝසතාණන් වහන්සේට පහසුවක් දැනෙන්නට විය. දින කීපයක් විවේකයෙන් පසු වූ උන්වහන්සේට පියරජතුමාගේ වප් මඟුල් උළෙලේ දී දඹ ගස් සෙවණේ හිඳගෙන වැඩූ ප්‍රථම ධ්‍යානය ත්, එය වැඩීමට යොදාගත් ආනාපානසති භාවනාව සිහියට ආවේ ය. නිර්වාණයට මග එයම විය යුතු යැයි උන්වහන්සේ තීරණය කළහ.

**ක්‍රියාකාරකම 7.1**

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. පස්වග තවුසන් නම් කරන්න.
2. සේනානි නියම්ගම අසළින් ගලා ගිය රමණීය ගංගාව කුමක් ද?
3. ආශ්වාසප්‍රශ්වාස නතර කිරීමෙන් වඩන ධ්‍යානය කුමක් ද ?

4. ''සිදුහත් තවුසා මළේ ය'' මෙය කවුරුන් විසින් කාට ප්‍රකාශ කරන ලද්දක් ද?
5. පවත්තඵලභෝජී යනු කුමක් ද?
6. ආහාර සීමා කළ විට සිදුහත් තාපසතුමාගේ ශරීරයට වූ දේ කුමක් ද?
7. පස්වග තවුසන් සිදුහත් තාපසතුමා වෙතින් ඉවත් වූයේ ඇයි?
8. සිදුහත් තාපසතුමා බිය දුරු කර ගැනීම සඳහා වැඩූ භාවනාව කුමක් ද?
9. මෙම වාක්‍ය හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.
   i. තියුණු මුවහත් බුරුමයකින් හිස සිදුරු කරන්නාක් මෙන් සිදුහත් තවුසාට දැනුනේ ආහාර සීමා කළ නිසා ය. (  )
   ii. කාමපිපාසාව බුදුබව ලැබීමට බාධා කරන කරුණක් ය. (  )

**ක්‍රියාකාරකම 7.2**

''උත්සාහයෙන් තොරව ජය ලැබිය නොහැක'' යන මාතෘකාවට අනුව රචනයක් ලියන්න.

**පැවරුම**

උත්සාහය පිළිබඳ ව සිංහල, පාලි, සංස්කෘත භාෂාවල හා ත්‍රිපිටක පොත්වල සඳහන් විවිධ ආදර්ශපාඨ රැස් කොට කුඩා පොතක් නිර්මාණය කරන්න.

**ජීවිතයට ඔවදනක්**

''අත්තනා කුරුතෙ ලක්ඛිං
අලක්ඛිං කුරුතත්තනා''

තමාගෙ භාග්‍යයයත් අභාග්‍යයත්
සලසා ගන්නේ තමාම ය.

# 08 උතුම් වූ බුදුබව පසක් කළ සේක

අසිරිමත් වෙසක් පොහෝ දිනයට පෙරදින උද විය. සුපුරුදු පරිදි ආනාපානසති භාවනාව වඩා සැහැල්ලුවෙන් දහවල් දවස ගෙවූ බෝසතාණන් වහන්සේ මධ්‍යම රාත්‍රියෙහි සැතපෙන්නට වන්හ. අලුයම උදවිය. ලොව අන් කිසිවෙකුට නොපෙනෙන ආකාරයේ සිහින පහක් බෝසතාණන් වහන්සේට පෙනිණ ඒවා මෙසේ ය.

| සිහිනය | අර්ථය |
| --- | --- |
| බෝසතාණන් වහන්සේට මහ පොළොව යහනක් විය. හිමාල පර්වතය එහි කොට්ටය විය. එම යහනෙහි නිදා සිටි උන්වහන්සේගේ දකුණත අපරදිග මහසයුර මත ද වමත පෙරදිග මහසයුර මත ද දෙපා දකුණ සයුර මත ද පිහිටියේ ය. | උන්වහන්සේ ලොවුතුරා බුදුවන බව. |
| බෝසතාණන් වහන්සේගේ නාභියෙන් රත් පැහැති ඊ තණ ගසක් පැන නැගී අහස් කුස පුරා පැතිර ගියේ ය. | වටහා ගත් ආර්ය සත්‍යය ලොවට හෙළි කරන බව |
| කලුපැහැති හිස් ඇති සුදු පැහැති පණුවෝ බෝසතාණන්ගේ දෙපා වෙතින් පැන නැගී දණ හිස දක්වා වසා පැතිර සිටියහ. | ගිහි ශ්‍රාවකයන් බොහෝ දෙනෙක් තමන්ට සිටින බව |
| විවිධ පැහැති ලිහිණියෝ සතර දෙනෙක් සතර දෙසින් පියඹා ආහ. එසේ පැමිණ උන්වහන්සේගේ දෙපා ළඟ වැටී සුදු පාට වූහ. | සිව් කුලයට ම අයත් වූවන් ද තම පැවිදි ශ්‍රාවකයන් බවට පත්වන බව |
| විශාල අශුචි පර්වතයක් විය. ඒ අශුචියෙහි නොගැවී, බෝසතාණෝ ඒ මත සක්මන් කළහ. | අපමණ සිව්පස ලැබෙන නමුත් ඒවාට ගිජු නොවන බව |

## සුජාතාවගේ කිරි පිඬු දනය

වෙසක් පුන් පොහෝ දිනට ඉරු උද විය. මේ අවදියේ උරුවෙල් දනව්වේ සේනානි නියම්ගම සේනානි කෙළෙඹියාගේ සුජාතා නම් දියණියක් වුවා ය. වැඩිවියට පත් ඕ තොමෝ ඒ අසළ නුග ගසක් මුල දෙවියන්ට පුද පූජා පවත්වා භාරයක් වූවා ය. එනම් සම කුලයකට දීග යන්නට ලැබී කුළුඳුලේ ම පුතෙකු ලැබෙන්නේ නම් වසරක් පාසා නුගරුකට අරක් ගත් දෙවියන්ට ලක්‍ෂයක් වැය කොට පූජා පවත්වන බව ය. ඇගේ බලාපොරොත්තුව සඵල විය. ඇයගේ භාරය ඔප්පු කිරීම එදිනට යෙදී තිබිණි.

සුජාතාව දේව පූජාව සූදනම් කිරීමට යාමේ දී අසිරිමත් සිදුවීම් රැසක් සිදුවිය. එයින් කලබල වූ සුජාතාව උදෑසන ම පුණ්ණා නම් දසිය අමතා "පුණ්ණාවෙනි, අද දෙවියන් අප කෙරෙහි බොහෝ සේ පහන් වී ඇති බව පෙනේ. මෙතෙක් මෙබඳු පුදුම දේ නුදුටුවෙමි. ඉක්මනින් ගොස් දෙවොල් බිම පිරිසිදු කරන්නැ'යි නියම කළා ය.

පුණ්ණා ද ''යහපතැ'' යි පිළිගෙන නුගරුක මුලට වහා දිව ගියා ය. බෝසතාණන් වහන්සේ ද පෙර ද රෑ ඉහත කී අපූරු සිහින පහ දැකීමෙන් තමා නොවරදවා ම බුදුවන්නේ යැයි නිගමනය කළහ. රෑ පහන් වූ කල්හි, පිරිසිදු වී ඒ නුගරුක මුලට ම වැඩම කොට පිඬු පිණිස වඩනා වේලාව එනතුරු වැඩ උන්හ. එහි දිව ආ පුණ්ණා නුගරුක මුල නැගෙනහිර බලා වැඩ හිඳිනා බෝසතුන් දුටුවා ය. රන්වන් පැහැයෙන් බබළන උන්වහන්සේගේ සිරුර දුටු පුණ්ණා අද අපේ දෙවියෝ ගසින් බැස සියතින් ම පූජාව පිළිගැනීමට වැඩ හිඳිති'යි සිතා ආපසු දිව ගොස් සුජාතාවට ඒ බව දැන්නුවා ය. එය අසා සතුට නිම් හිම් නැතිව ගිය සුජාතා, පුණ්ණා අමතා, "නුඹ අද පටන් දසියක් නොව මාගේ වැඩිමහලු දියණිය වන්නේ යැයි කියා දුවකට ගැලපෙන සියලු ආභරණ, ඇඳුම් ඇයට දී වහල් කමින් මුදවා දුවකගේ තැන තැබුවා ය.

බෝසතාණන් වහන්සේගේ පින් මහිමය නිසා සුජාතාවට වටිනා රන් පාත්‍රයක කිරි පිඬු ගෙන යන්නට සිතිණ. දිය නුමුසු කිරිපිඬු පිළියෙල කළ ඕ තොමෝ රන් පාත්‍රයෙහි එය බහා තවත් රන් පාත්‍රයකින් එය වසා සළුවකින් වෙලා ගෙන සියලු අලංකාරයන්ගෙන් සැරසී කිරිපිඬු පාත්‍රය හිස තබා ගෙන

මහ පෙරහරින් නුගරුක බලා පිටත් වූවා ය. දුර දීම බෝසතාණන් වහන්සේ දුටු සුජාතා මහත් සොම්නසට පැමිණ මේ රුක් දේවතාවා යැයි සිතා නැමී නැමී උන්වහන්සේ වෙත ගියා ය. හිසින් පාත්‍රය දෑතට ගෙන පළමු කොට රන් කෙණ්ඩියෙන් බෝසතුන්ගේ අතට පැන් වත් කළා ය. ඉන්පසු රන්තලිය උන්වහන්සේට පිළිගැන්වූවා ය. පිළිගන්වා ''ස්වාමිනි, මේ පාත්‍රය ඔබ වහන්සේ ට පූජා කරමි. කැමති තැනකට රැගෙන යනු මැනවැ'' යි කියා වැඳ, මගේ බලාපොරොත්තු ඉටු වූවා සේම ඔබ වහන්සේගේ ද බලාපොරොත්තු සඵල වේවා'යි පවසා පිරිවර සමග පිටත්ව ගියා ය.



බෝසතාණන් වහන්සේ ද එතැනින් නැගී සිට ඒ ගස වටා ප්‍රදක්ෂිණා කොට රන්තලිය ද රැගෙන ඒ අසල වූ නේරංජනා ගං ඉවුර වෙත වැඩම කළහ. එහි සෑම බුදුවරයෙක් ම බුදුවන දවසේ බැස ස්නානය කරන **සුප්පතිට්ඨික** නම් තොටුපලක් විය. රන්තලිය ඉවුරේ තබා බැස නහා සිවුරු හැඳ පොරවාගෙන නැගෙනහිර බලා වැඩ උන්හ.

රන්තලිය අතට ගත් උන්වහන්සේ එහි වූ දිය නුමුසු කිරිබත පිඬු හතළිස් නවයක් කොට වැළඳූහ. එම ආහාරය උන්වහන්සේ එතැන් සිට ගතකළ සත්

සතියට ම ප්‍රමාණවත් ආහාරයක් විය. කිරිපිඬු වැළඳූ පාත්‍රය ද රැගෙන ගං ඉවුරට වැඩම කළ උන්වහන්සේ ''යම් හෙයකින් අද මම බුදුවන්නේ නම් පාත්‍රය උඩුගම් බලා යේවා. බුදුනොවන්නේ නම් මේ යටිගම් බලා යේවා'' යි ඉටා ගඟ දියට දැමූහ. තලිය ද සැඩ පහර සිඳගෙන ගඟ මැදින් ඉහළට ගමන් කොට අසූරියනක් තරම් දුර ගොස් දිය සුළියකට හසු වී ගිලී ගියේ ය. එයින් ද බෝසතාණන් වහන්සේ තමා අද බුදුවන බව නිගමනය කළහ. ගිලී ගිය රන්තලිය නාග භවනය ට පිවිස මේ කල්පයේ පහළ වූ බුදුවරුන් සිව් නමගේ පාත්‍රා තිබූ තැනට ම එකතු විය.

බෝසතාණන් වහන්සේ ඒ ගං ඉවුරේ තිබූ මල් පිපිණු සල්වනයෙහි දිවා විහරණය කොට සවස් වරුවේ ඇසතු බෝරුක බලා වැඩම කළහ.


මේ අතර කුස තණ රැගෙන යන **සොත්ථිය** නම් බමුණෙකු බෝසතාණන් වහන්සේට අතරමග දී හමු විය. බෝසතුන්ගේ මේ ආනුභාව සම්පන්න ස්වරූපය දුටු සොත්ථිය කුස තණ මිටි අටක් උන්වහන්සේට පිදී ය. බෝසතාණන් වහන්සේ එය ද රැගෙන බෝමැඩ බලා වැඩම කළහ. එහි කුස තණ එළාගත් උන්වහන්සේ සිත දැඩි කරගෙන ''මගේ සම ද, නහර ද, ඇට ද, ඉතිරි වේවා. මුළු සිරුරේ ම ඇති මස්, ලේ වියළී යේවා. එහෙත් සම්මා සම්බුද්ධත්වයට පැමිණ මිස මේ ආසනයෙන් නොනැගිටිමි'' යි චතුරංග සමන්නාගත වීර්ය අධිෂ්ඨාන කරගෙන නැගෙනහිර බලා බද්ධ පර්යංකයෙන් වැඩ හුන් සේක.

එහිදී බෝසතාණන්ට දෙවියෝ, නාගයෝ, යක්ෂයෝ, ආදී සියල්ලෝ මලින් ගඳින් පුදමින් තුති ගී ගයන්නට වූහ. මුළු දසදහසක් සක්වල එක ම සාදුකාරයක් පැතිර ගියේ ය.

### මාර පරාජය

මේ මොහොතේ වසවර්ති මාර දිව්‍ය පුත්‍රයා ''සිදුහත් තවුසා, මගේ අණසක ඉක්මවා යන්නට සැරසේ. මම ඊට ඉඩ නොදෙමි'' යි තීරණය කොට දස බිම්බරක් මාර සෙනග පිරිවරාගෙන ගිරිමේඛලා නම් ඇත් රජු පිට නැගී සියලු ආයුධයෙන් සන්නද්ධ ව අවුත් බෝසතාණන් වහන්සේ වටකර ගත්තේ ය. බෝසතුන්ට තුති ගීතිකා ගයමින් සිටි දෙවියෝ සක්වල ගලින් එපිටට පලා

ගියෝ ය. බෝසතාණන් වහන්සේ තමා වටකර ගත් මාර සෙනග දැක ''මෙතරම් සෙනඟක් තනි මට එරෙහිව මහ සටනකට සැරසී සිටිති. මෙතැන මට මාගේ පියා හෝ වෙනත් නෑදෑයෙක් නැත. මා විසින් කාලාන්තරයක් තිස්සේ පිරූ දස පාරමිතා ධර්ම අද මට සිටින පිරිවර ජනයා බඳු ය. එහෙයින් පාරමී පළිහක් කරගෙන පාරමී අවියෙන් ම පහර දී මේ සේනාවේ බලය සිඳිය යුතු යැ'' යි සිතා දස පාරමිතාවන් මෙනෙහි කරමින් වැඩ හුන්හ. මාරයා පළමු කොට ම මහා සුළඟක් මැවී ය. එය ගස් මුල් උදුරා දැමීමට, පර්වත මුදුන් සිඳ දැමීමට තරම් බලවත් විය. එහෙත් බෝසතුන්ගේ සිවුරු කොණක්වත් සෙලවීමට එය සමත් නොවී ය. දෙවනුව පොළොව සිදුරු කරන තරම් බලවත් වැස්සක් මැවී ය. එය උන්වහන්සේට පිණිබිඳක් තරම්වත් නොදැනුණේ ය. තෙවනුව මහ ගල් වැස්සක් වැස්සවී ය. ඒවා දිව්‍යමය මල් මාලා වැස්සක් විය. සතර වෙනුව ආයුධ වැස්සක් වැස්සවී ය. ඒවා දිව්‍යමය මල් වැස්සක් මෙන් දිස්විය. පස් වෙනුව මහා උණු අළු වැස්සක් වැස්සවී ය. එය බෝසතුන් පාමුල සඳුන් සුණු සේ විසිර ගියේ ය. හය වෙනුව අඟුරු වැස්සක් වැස්සවී ය. සත් වෙනුව වැලි වැස්සක් වැස්සවී ය. ඒවා ද දිව්‍ය මල් සේ පාමුල වැටිණි. අට වෙනුව



මඩ වැස්සක් වැස්සවී ය. එය උන්වහන්සේගේ පාමුල දිව්‍යමය විලවුන් වී ඇද හැලිණි. නව වෙනුව මහා අන්ධකාරයක් මැවී ය. එය බෝසතුන් වෙත එන විට සූර්යාලෝකයක් සේ ආලෝකමත් විය.

මෙසේ නව විධ වර්ෂාවකින් උන්වහන්සේට කිසිදු අනතුරක් නොවූ විට තමාගේ සේනාවට ''මේ සිද්ධාර්ථ කුමාරයා පළවාහරිමු'' යයි අණකොට තම චක්‍රායුධය ගෙන ගිරිමේඛලා ඇතු පිට නැගී බෝසතුන් වෙත පැමිණ සිද්ධාර්ථය, ''නැගිටිනු, ඔය පර්යංකය ඔබේ නොවේ මගෙයි'' කීය. එවිට බෝසතාණන් වහන්සේ ''මාරය, ඔබ දස පාරමිතා පිරුවේ නැත. උප පාරමිතා පිරුවේ ද නැත. පරමත්ථ පාරමිතා පිරුවේ ද නැත. ඥාතත්ථ චර්යාව, ලෝකත්ථ චර්යාව හෝ බුද්ධි චර්යාව ද පිරුවේ නැත. ඒ සියල්ල පිරුවේ මා ය. එහෙයින් මේ පර්යංකය නුඹට අයත් නොවේ. එය මට ම අයත් වේ යැ'' යි වදළහ. මෙසේ පවසද්දීත් මාරයා චක්‍රායුධයෙන් උන්වහන්සේට දමා ගැසී ය. එය ද මල් වියනක් සේ අහසේ රැඳුණේ ය. එවිට බෝසතාණන් වහන්සේ මාරය, මේ පර්යංකයට අයිතිය කීමට ඔබ පාරමිතා පිරූ බවට සාක්ෂි තිබේදැයි ඇසූහ. මාරයා තම සේනාව වෙත අත දිගු කොට මේ සියලු දෙනා ඊට සාක්ෂි යයි කියද්දි ''අපි සාක්කි, අපි සාක්කි'' යයි මාර සෙන් නැගූ නාදයෙන් මහ පොළව ගිගුම් දෙන්නට විය.

''සිද්ධාර්ථය, ඔබට පාරමිතා පිරූ බවට කවුරු සාක්ෂි ද'' යි මාරයා විමසී ය. එවිට බෝසතාණන් වහන්සේ ''ඊට සාක්ෂි දීමට පණ ඇති කිසිවෙක් මට මෙහි නැත. එහෙත් වෙනත් දුන් දන් තිබියේවා. වෙස්සන්තර ආත්ම භාවයේ දී සත්සියයක් මහ දන් දුන් බවට මේ මහ පොළොව සාක්ෂි දරනු ඇතැ'' යි දකුණු අත මහ පොළොවට දිගු කළහ. මොහොතකින් "මම එයට සාක්ෂි" යැයි කියන්නාක් මෙන් මහ පොළොව මහ හඬින් කම්පා වෙන්නට පටන් ගත්තේ ය. බියට පත් මාර සෙනග හිස් ලූ ලූ අත පලා ගියෝ ය. පරාජයට පත් වසවර්ති මරු තම ලොව බලා ආපසු ගියේ ය. පැරදී පලා යන මාර සෙනග දුටු දෙවියෝ, ''අපි ජයග්‍රහණය සඳහා ජය පූජාව කරමු'' යි කියා නාග, දේව, සුපර්ණ, බ්‍රහ්ම ආදී සියලු දෙනා එක්ව බෝ මැඩ රැස්ව මෙසේ ජයඝෝෂා නගන්නට වූහ. මාරයා පරාජයට පත් විය. සිදුහත් තවුසාණන්ට ජය අත් විය.

"ජයො හි බුද්ධස්ස සිරිමතො අයං - මාරස්ස ච පාපිමතො පරාජයො"

"මෙය ශ්‍රීමත් බුදුරජාණන් වහන්සේගේ ජයග්‍රහණය යි. පවිටු මාරයාගේ පරාජය යි."

## අසිරිමත් බුදුබව ලැබීම



මෙසේ හිරු බැස යන්නටත් පෙර මාර බලය පැරද වූ බෝසතාණන් වහන්සේ ආනාපානසති භාවනාවෙහි යෙදෙමින් ප්‍රථම ධ්‍යානය ද උපදවා ගත්හ.

ඉන්පසු රාත්‍රියේ ප්‍රථම යාමයෙහි තමන් පෙර විසූ ජාති මේ යැයි සිහි කළ හැකි නුවණ හෙවත් පුබ්බේනිවාසානුස්සති ඥාණය උපදවා ගත්හ.

දෙවන යාමයේ දී සත්වයා උපදින මැරෙන හැටි, කර්මානුකූලව සැපදුක් විඳින හැටි පෙනෙන චුතූපපාත ඥාණය හෙවත් දිබ්බචක්ඛු ඥාණය උපදවා ගත්හ.

අලුයම් වේලාවේ අප මහ බෝසතාණන් වහන්සේ පටිච්ච සමුප්පාදයට සිත් යොමු කළ සේක. ඒ අනුව 'අවිජ්ජා පච්චයා සංඛාරා.......' ආදී වශයෙන් දෙළොස් ආකාර වූ පටිච්ච සමුප්පාදය අනුලෝම (මුල සිට අගටත්) ප්‍රතිලෝම (අග සිට මුලටත්) වශයෙන් මෙනෙහි කරද්දී දස දහසක් සක්වල මහ මුහුද දක්වා දෙළොස් වාරයක් ම කම්පා විය.

මෙසේ දසදහසක් සක්වල ගිගුම් දෙවමින් ගෞතම බෝසතාණන් වහන්සේ වෙසක් පුන් පෝද අරුණ නැගෙනවාත් සමග ම උතුම් **සර්වඥතාඥනය** හෙවත් සම්මා සම්බුදු නුවණ උපදවා ගත් සේක.

ඒ මොහොතේ දස දහසක් සක්වල එකම උත්සව සිරියකින් බැබලුණේ ය. යොදුන් අසූ හාරදහසක් ගැඹුරු මහ මුහුදේ කරදිය වෙනුවට මිරිදිය පහළ විය. එද සියලු අන්ධයෝ රූප දුටුවාහ. උපතින් බිහිරෝ හඬ ඇසුවෝ ය. අත්පා කොර වූවෝ පයින් ඇවිද ගියෝ ය. සිර වී බැඳී සිටි සියලු සත්ත්වයෝ ඒ බැම්වලින් මිදුණෝ ය.

මෙසේ අපමණ පුදුම සහගත අසිරිමත් දේ සිදු වෙද්දී බුදුරජාණන් වහන්සේ, සෑම බුදුවරයන් වහන්සේ නමක් ම බුදු බව ලැබූ සැණින් ප්‍රකාශ කළ උදනය මෙසේ ප්‍රකාශ කළ සේක.

අනෙක ජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරකං ගවෙසන්තො - දුක්ඛා ජාති පුනප්පුනං
ගහකාරක දිට්ඨොසි - පුන ගෙහං න කාහසි
සබ්බා තෙ ඵාසුකා භග්ගා - ගහකූටං විසංඛිතං
විසංඛාර ගතං චිත්තං - තණ්හානං ඛයමජ්ඣගා

අර්ථය : නැවත නැවත ඉපදීම දුකකි. පඤ්චස්කන්ධය නමැති ගෙය තනන වඩුවා සොයමින් මෙතෙක් සසර පුරා ඇවිද්දෙමි. තණ්හා වඩුව, මා විසින් තා දක්නා ලදී. නැවත තා මට ආත්ම භාව නමැති ගෙය නොසාදන්නෙහි ය. තාගේ කෙලෙස් නමැති පරාළ හා අවිද්‍යා නමැති කැණිමඬල ම විසින් විනාශ කරන ලදී. මාගේ සිත නිවනට පැමිණියේ ය. තණ්හාව දුරුකිරීම නම් වූ අර්හත් ඵලයට පත් වීමි.

## ක්‍රියාකාරකම 8.1

පහත සඳහන් ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. බෝසතාණන් වහන්සේ සිහිනෙන් රන් පැහැති ඊතණ ගසක් දුටුවේ.......
   i. තෙවන සිහිනයේදී ය.
   ii. සිව්වන සිහිනයේදී ය.
   iii. දෙවන සිහිනයේදී ය.

2. සුජාතා සිටු දියණියගේ කිරිපිඩු පූජාව සිදුවූයේ,
   i. උපන් දිනයක් නිමිත්තෙනි.
   ii. ප්‍රාර්ථනාවක් ඉටුවීම නිමිත්තෙනි.
   iii. පින් අනුමෝදන් කිරීමක් නිමිත්තෙනි.

3. සුජාතාව විසින් පුණ්ණා දාසිය පසුව,
   i. දියණියක් කොට සලකන ලදි.
   ii. මෙහෙකාරියක් කොට සලකන ලදි.
   iii. සොයුරියක් කොට සලකන ලදි.

4. කිරිපිඩු පාත්‍රය පිළිගත් බෝසතාණන් සැපත් වූයේ,
   i. අනෝමා ගඟ අසලට ය.
   ii. අචිරවතී ගඟ අසලට ය.
   iii. නේරංජනා ගඟ අසලට ය.

5. බෝසතාණන් වහන්සේ කිරිපිඩු දානය වළඳන ලද්දේ,
   i. පිඩු හතළිස් නවයක් වශයෙනි.
   ii. පිඩු හතළිස් පහක් වශයෙනි.
   iii. පිඩු තිස් පහක් වශයෙනි.

6. චතුරංග සමන්නාගත වීර්යයට අයත් වන්නේ,
   i. සම, නහර, කෙස්, මස් හා ලේ ය.
   ii. සම, නහර, ඇට, මස් හා ලේ ය.
   iii. සම, කෙස්, ඇට මස් හා ලේ ය.

7. ''සිදුහත් තවුසා මාගේ අණසක ඉක්මවා යන්නට සැරසේ'' මෙම ප්‍රකාශය,
   i. ගිරිමේඛලා ඇතාගේ ය.
   ii. ආලවක යක්ෂයාගේ ය.
   iii. වසවර්ති මාරයාගේ ය.

8. ''සිදුහත් බෝසතාණන් පටිච්ච සමුප්පාදය මෙනෙහි කරන ලද්දේ,
   i. රාත්‍රී ප්‍රථම යාමයේදී ය.
   ii. රාත්‍රී දෙවන යාමයේදී ය.
   iii. රාත්‍රී අලුයමදී ය.

9. බුදු උපතේදී අසිරිමත් දෑ බොහෝ සිදු විය. එසේ සිදු නොවුවකි.
   i. අත් පා කොර වූවෝ පයින් ඇවිද යාම.
   ii. අන්ධයෝ රූප දැකීම.
   iii. මුහුදේ දිය සිඳී යාම.

10. සිදුහත් බෝසතාණන් ගයා පෙදෙසේ නේරංජනා ගඟ අසලට වැඩමවද්දී මගදී මුණ ගැසී කුස තණ අට මිටක් පිළිගන්වන ලද්දේ,
   i. සොත්ථිය නම් බමුණා ය.
   ii. උපක ආජීවකයා ය.
   iii. පුණ්ණා දාසිය ය.

## ක්‍රියාකාරකම 8.2

''සුඛො බුද්ධානං උප්පාදො''

"බුදුවරුන්ගේ උපත සුව ගෙන දෙන්නේ ය". මේ ගැන ඔබට හිතෙන දේවල් වාක්‍ය දහයකින් ඉදිරිපත් කරන්න.

## ක්‍රියාකාරකම 8.3

පටිච්ච සමුප්පාදය ඇසුරෙන් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| | | |
|---|---|---|
| අවිජ්ජා | පච්චයා | |
| | පච්චයා | විඤ්ඤාණං |
| විඤ්ඤාණ | පච්චයා | නාමරූපං |
| | පච්චයා | |
| සළායතන | පච්චයා | |
| | පච්චයා | වේදනා |
| | පච්චයා | තණ්හා |
| | පච්චයා | උපාදානං |
| | පච්චයා | භවො |
| භව | පච්චයා | |
| | පච්චයා | ජරා මරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති |

### පුහුණුවට

**ඉමස්මිං සති ඉදං හොති**
**ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති**
**ඉමස්මිං අසති ඉදං න හොති**
**ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති**

මෙය ඇති කල්හි මෙය ඇති වේ. මෙය ඉපදුණ කල්හි මෙය උපදී.
මෙය නැති කල්හි මෙය නැති වේ. මෙය නූපදින කල්හි මෙය නූපදී.

# 09 රාහුල පොඩි හාමුදුරුවෝ

''සීයේ......! සීයේ......! අද අපට සීයාගෙන් කරුණු ටිකක් දැනගන්න තියෙනවා......'' හේරත් හාමි සීයා සමීපයට පැමිණි නිලිණිත්, ජයනිත්, කවිඳුත්, සවිඳුත් යන දරු දැරියෝ එක හඬින් පැවසූහ.

''හොඳයි...... හොඳයි...... මගේ දරුවනේ, ඔහොම වාඩිවෙලා මට කියන්නකෝ මොනවා ගැන ද දැනගන්න ඕනේ කියලා......''

''අපට දැනගන්න ඕනේ රාහුල පොඩි හාමුදුරුවෝ ගැනයි......'' නිලිනි පිළිතුරු දුන්නා ය.

''දරුවනේ, ඔය, රාහුල කුමාරයා කියලා කියන්නේ යශෝදරා දේවියගේත්, සිද්ධාර්ථ කුමාරයාගේත් එකම පුතා. සුද්ධෝදන රජ්ජුරුවන්ගේ මුණුපුරා.''

''සීයේ රාහුල කුමාරයාට ඒ නම ලැබුණු විදියත් අපට පහදලා දෙන්නකෝ......'' කවිඳු පුතා කීවේ ය.

''අන්න හොඳ ප්‍රශ්නයක් මගේ පුතා ඇහුවෙ, සිද්ධාර්ථ කුමාරයා, ඒ කියන්නේ අපේ සිදුහත් බෝසතාණන් සතර පෙර නිමිති දැකලා, ජීවිතය පිළිබඳ කළකිරීමෙන් හිටියා කියලා මේ දරුවෝ අහලා ඇති නේ? සිද්ධාර්ථ කුමාරයා ඇසළ පුරපසළොස්වක පෝය දවසක තමයි ගිහිගෙය අතෑරලා ගියේ. ඒ කියන්නේ **'අභිනිෂ්ක්‍රමණය'** කළේ. අන්න එදා ම තමයි යශෝදරා දේවියට පුත් කුමරෙක් ලැබුණේ. ඉතින් මාළිගයෙන් පිටවෙලා යන්න තීරණය කරලා හිටි සිද්ධාර්ථ කුමාරයාට පුතකු උපන්නාය යන ආරංචිය ලද හැටියේ ම ඉබේටම කියවුණා,

**''රාහුලො ජාතො - බන්ධනං ජාතං''**

කියලා. ඒ කියන්නේ,

''රාහුලයෙක් උපන්නා, බැඳීමක් හටගත්තා'' කියලා.

ඉතින් එදා ඉඳලා ''රාහුල'' නමින් මේ කුමාරයා ප්‍රසිද්ධ වුණා කියලා සඳහන් වෙනවා.

''ඉතින් සීයේ, එදා මාළිගාවෙන් පිටවෙලා ගියාට පස්සේ සිද්ධාර්ථ කුමාරයා, පුංචි රාහුල කුමාරයා බලන්න මාළිගාවට ආවේ නැත්ද?......'' ජයනි දුව ප්‍රශ්නයක් මතු කළා ය.

''දරුවනේ, එදා මාළිගාවෙන් පිටවෙලා නේරංජනා ගංතෙරෙන් එගොඩ වුණ සිද්ධාර්ථ කුමාරයා අවුරුදු හයක් තිස්සෙ ම සිරුරට දැඩි දුක් දෙමින් සත්‍යය සෙව්වා. ඒත් එසේ දුෂ්කර ක්‍රියා කිරීමෙන් පළක් නැති බව වටහා ගත් සිද්ධාර්ථ කුමාරයා **''මධ්‍යම ප්‍රතිපදාව''** ඒ කියන්නේ **''ආර්ය අෂ්ටාංගික මාර්ගය''** අනුගමනය කරලා තමයි ලොව්තුරා බුද්ධත්වයට පත්වුණේ. මේ බව දැනගත් සුද්ධෝදන රජු මහත් සතුටට පත්වෙලා කිහිපවතාවක් ම උත්සාහ කළා බුදුරජාණන් වහන්සේව තමන්ගේ රාජ්‍යයට වැඩමවා ගන්න. අවසානයේ දී කලින් සුද්ධෝදන රජතුමාගේ ඇමතියෙකු වූ ''කාළුදායි'' හාමුදුරුවෝ තමයි බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් පුරයට, ඒ කියන්නේ කපිල වස්තු නුවරට වැඩමවාගෙන ආවේ......''

''සීයේ, මම අහලා තියෙනවා කිඹුල්වත් නුවරට වඩින ගමනේ දී, බුදුරජාණන් වහන්සේ සමග විසිදහසක් මහ සඟරුවන වැඩියා කියලා, ඒක ඇත්ත ද?'' කවිඳු පුතා ප්‍රශ්න කළේ ය.

''ඔව් පුතේ, බෞද්ධ සාහිත්‍යයේ එහෙම සඳහන් වෙනවා. ඒ විතරක් නෙවෙයි, වෙසක් පුන් පොහෝ දිනක, පා ගමනින් ම තමයි කිඹුල්වත් පුරයට මේ පිරිස ළඟා වන්නේ......''

''එතකොට සීයේ, බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් නුවරට වැඩම කරලා බොහෝ කලක් එහි වැඩ විසුවා ද? කොහොමද රාහුල කුමාරයා උන් වහන්සේට මුණ ගැහෙන්නේ......'' නිලිනි දුව ඇසුවා ය.

''දරුවනේ, මාළිගාවේ දානයට වඩින බුදුරජාණන් වහන්සේ දුටු යසෝදරා දේවිය සඳළුතලයේ සිට රාහුල කුමාරයාට නරසීහ ගාථාවලින් බුදුහාමුදුරුවන්ගේ මහා පුරුෂ ලක්ෂණත්, මහා බුද්ධානුභාවයත් විස්තර

කොට, ''පුතේ, අර විසිදහසක් භික්ෂූන් වහන්සේ පිරිවරා රත් පැහැයෙන් බබළමින් මහ මග වඩින්නේ ඔබේ පියා යි. එතුමන්ගෙන් දායාද ඉල්ලාගෙන එන්නැයි'' තම පුතු පිටත් කොට හැරියා. කුමාරයාත් දිවගොස් බුදුරජාණන් වහන්සේගේ අතේ එල්ලී දායාද ඉල්ලමින් විහාරයට ම ගියා......''

''ආනේ......! සීයේ ඉතින්, බුදුරජාණන් වහන්සේ රාහුල කුමාරයාට දායාද දුන්නා ද?'' යි ජයනි දුව කුතුහලයෙන් යුතුව ඇසුවා ය.

''ඔව්, ඔව්, දුවේ, බුදුරජාණන් වහන්සේට දෙන්න පුළුවන් ලොකු ම දායාදය උන්වහන්සේ රාහුල කුමාරයාට දුන්නා...... ඒ තමයි පැවිද්ද......!''

''එතකොට සීයේ, බුදුරජාණන් වහන්සේ අතින් ම ද රාහුල කුමාරයා පැවිද්ද ලැබුවේ......?'' සවිඳු පුතා ඇසුවේ ය.

''නැහැ, නැහැ...... පුංචි රාහුල කුමාරයාගේ හිසකෙස් ගාලා, කසාවත් හැන්දවූයේ සැරියුත් මහරහතන් වහන්සේ, රාහුල පොඩි හාමුදුරුවන්ගේ උපාධ්‍යායන් වහන්සේ බවට පත්වූයේ සැරියුත් මහරහතන් වහන්සේ යි. ආචාර්යවරයන් වහන්සේ බවට පත්වූයේ මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ යි......''

ඒ තමයි බුද්ධ ශාසනයේ ළමයෙකු මහණ කළ පළමු වතාව. ඒ වගේ ම ශ්‍රාවකයන් වහන්සේලාට අනුන් මහණ කරන්න අවසර ලැබුණෙත් එදා තමයි. තිසරණ සමාදන් කරවීමෙනුයි ඒ මහණකම සිදු වුණෙත්.

''සීයේ රාහුල පොඩි හාමුදුරුවෝ, තමන්ගේ ගුරු හාමුදුරුවන් වහන්සේලාට ගොඩාක් ගරු කළා ලු නේද?.......'' නිලිනි දුව ඇසුවා ය.

''ඔව්, දරුවනේ සියලු වැඩිහිටි හාමුදුරුවන් වහන්සේලාට උන්වහන්සේ එක සේ ගරු කළා. ඒ විතරක් ද? මනා ලෙස හික්මීමෙන් යුක්ත වුණා. බුදුරජාණන් වහන්සේ තම පියාණන් වූවා කියා කිසිදු අහංකාර කමක් ඇති කරගත්තේ නෑ. හරිම නිහතමානියි. හොඳ ඉවසීමෙනුත් කටයුතු කළා. මං කියන්නම් අපූරු කතාවක්''

රාහුල පොඩි හාමුදුරුවන්ගෙ නිහතමානි කම බලන්න හාමුදුරුවරු පොඩි හාමුදුරුවො අතුගෑ මිදුලට ආයෙත් කුණු ගෙනත් දමනවා. අනේ, රාහුල පොඩිහාමුදුරුවො කිසි කතාවක් නැතුව සිනාමුසු මුහුණින් ආයෙත් අතුගාල කුණු අරන් දමනවා.

ඇයි සීයෙ, අර වැසිකිළියෙ රෑ ගත කරපු කතාව? ජයනි ඇසුවා ය.

ඔව්, ඔව්, දුවේ. බුදුහාමුදුරුවෝ උපසම්පදා හාමුදුරුවරුන්ට සාමණේර හාමුදුරුවරුන් සමග එක වහලයක් යට රැයක් ගත කිරීම තහනම් කරල නීතියක් පණවල තිබුණා.

දවසක් රාහුල පොඩි හාමුදුරුවෝ ජේතවනාරාමයට ගියා. බුදුහාමුදුරුවන් වහන්සේට වඳින්න. අර නීතිය නිසා හාමුදුරුවරු කවුරුවත් රාහුල පොඩි හාමුදුරුවන්ට ආවාසෙ ඉන්න දුන්නේ නැහැ. රාහුල පොඩි හාමුදුරුවෝ කිසි කතාවක් නැතුව බුදුහාමුදුරුවන්ගේ වැසිකිළියෙ රැය ගත කළා. පසුව මේක දැන ගෙන බුදුහාමුදුරුවෝ ඒ නීතිය වෙනස් කරලා රැයක් දෙකක් ගත කරන්න අවසර දුන්නා.

අනේ පව්! ඒ වගේ ම රාහුල හාමුදුරුවෝ අවවාද ලබන්න ආසයි කියලත් මම අහලා තියෙනවා.'' සවිඳු පුතා කීවේ ය.

''අන්න හරි, දරුවනේ මේ රාහුල පොඩි හාමුදුරුවෝ දිනපතා ම උදෙන් ම අවදි වී මළු පෙත් අමදිනවා. ඒ වගේ ම වැලි දෝතක් උඩ දමා ''අද දින මට මේ වැලිකැට ගණනට අවවාද ලැබේවා!'' යි ප්‍රාර්ථනා කරනවා. බලන්න, මේ දූලා පුතාලටත් කොච්චර ආදර්ශ ගන්න පුළුවන් ද, රාහුල පොඩි හාමුදුරුවන්ගේ චරිතයෙන්......''

''ඔව් සීයේ, ඒක නම් ඇත්ත, මේ ගතිගුණ නිසා ම නේ ද රාහුල පොඩි හාමුදුරුවෝ ශික්ෂාකාමීන් අතර අග තැන්පත් වෙන්නේ......'' සවිඳු පුතා ඇසුවේ ය.

''ඔව් පුතේ, ළපටි වයසේ සිටි රාහුල පොඩි හාමුදුරුවන්ට, දවසක් අප ලොව්තුරා සම්බුදුරජාණන් වහන්සේ අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය දේශනා කළා. ඒ සූත්‍රයේ තියෙන්නේ බොරුකීමේ ආදීනව. බුදුරජාණන්වහන්සේ

තමන්ට පා සෝදන්න ගෙනා වතුර භාජනය මුනින් නවා පෙන්වලා, ''රාහුල, දැන් මේ භාජනය හිස් වගේ ම දැන දැන බොරු කියන ලැජ්ජ නැති කෙනාගේ මහණකමත් හිස් '' යැයි දේශනා කළා. ඒ වගේ ම සටන් බිමට යන ඇතෙක් නිතර ම සටන් කරන්නෙ සොඬය සඟවාගෙන යි. උං සොඬෙන් පහර දෙන්නෙ ජීවිතාශාව අත්හැරියාම යි. අන්න ඒ වගේ කෙනෙකුට දැන දැන බොරු කීමෙන් ලැජ්ජාවක් නැති නම් ඔහුට කරන්න බැරි පවක් නැහැ. ඒ නිසා විහිළුවටවත් බොරුවක් නොකියන්නැ'යි ඒ සූත්‍රයේදී රාහුල හාමුදුරුවන්ට අවවාද කළා. ඊළඟට තරුණ වයසට එන විට තරුණ මදය නැති වෙන්න මහාරාහුලෝවාද සූත්‍රය දේශනා කළා. චූල්ලරාහුලෝවාද සූත්‍රය අහලා තමයි රාහුල හාමුදුරුවන් වහන්සේ රහත් භාවයට පත්වන්නේ. පසුව තමයි ශික්ෂාකාමී භික්ෂූන් වහන්සේලා අතර අගතැන්පත් වන්නේ......''

''සීයේ, ඒ වුණාට රාහුල කුමාරයා පැවිදි කළායින් පස්සේ, යශෝදරා දේවියටයි, සුද්ධෝදන රජතුමාටයි ගොඩාක් දුක හිතෙන්න ඇති නේද?......'' නිලිනි ඇසුවාය.

''අන්න, මගේ දුව, හොඳ ප්‍රශ්නයක් ඇහුවේ......'' සිද්ධාර්ථ කුමාරයා මාළිගයෙන් පිටවෙලා ගියාට පස්සේ කණස්සල්ලෙන් හිටපු සුද්ධෝදන රජතුමා මඳක්වත් සිතට සහනයක් ලබාගත්තේ රාහුල කුමාරයා නිසා. යසෝදරා දේවියත් එහෙම යි. ඉතින්, පුංචි රාහුල කුමාරයා පැවිදි කළායින් පස්සේ සුද්ධෝදන රජතුමා ඉතා අසරණ වුණා. රජතුමා බුදුරජාණන් වහන්සේ සමීපයට ඇවිල්ලා කාරුණික ඉල්ලීමකුත් කළා, දෙමාපිය අවසරයක් නැතිව කුල කුමරුවන් පැවිදි නොකරන ලෙසට. බුදුරජාණන් වහන්සේ ඒ ඉල්ලීම පිළිගත්තා...... හොඳයි, දැන් මේ දරුවන්ට රාහුල කුමාරයා ගැනත් රාහුල පොඩි හාමුදුරුවෝ ගැනත් කරුණු ගොඩාක් දැනගන්න ලැබුණා නේ, මේ දරුවනුත් රාහුල පොඩි හාමුදුරුවන්ගේ චරිතයෙන් උතුම් ගුණ ධර්ම ආදර්ශයට ගන්න. මේ දරුවන් ට උතුම් ත්‍රිවිධ රත්නයේ සරණයි!'' හේරත් හාමි සීයා දරුවන්ට කරුණු කියා දීම අවසන් කළේ ය.


හැමෝ ම සීයාගේ දෙපා නැමද සමුගත්තේ හද පිරි සතුටිනි.

## ක්‍රියාකාරකම 9.1

1. රාහුල පොඩි හාමුදුරුවන් පිළිබඳව කියැවෙන කවියක් නිර්මාණය කරන්න.
2. රාහුල පොඩි හාමුදුරුවන්ගේ චරිතයෙන් අපට ලද හැකි ආදර්ශ කිහිපයක් ලියා දක්වන්න.
3. රාහුල පොඩි හාමුදුරුවන්ගේ චරිත කතාවේ ඔබ සිත් ගත් තැනක් චිත්‍රයට නගන්න.

## ක්‍රියාකාරකම 9.2

දී ඇති උපකාරක පද ඇසුරෙන් පහත දක්වෙන ප්‍රහේළිකාව පුරවන්න.




**හරහට :**

1. බෝසතුන් ගිහිගෙය අතහැර යාම මෙ නමින් හැඳින්වේ.
3. පැවිදි වූ තැන් සිට රාහුල පොඩි හාමුදුරුවෝ මෙය ගරු කළ බව කියැවේ.
5. කුඩා රාහුල පුතු බුදුරදුන් පසු පස ගියේ මෙය ඉල්ලා ගැනීමට ය.
7. රාහුල හිමියන් අගතැන්පත් වූයේ මේ ගුණයටයි.

පහළට :

1. බුදුරජාණන් වහන්සේ රාහුල හිමියන් උදෙසා දේශනා කරන ලද සූත්‍රයකි.
2. බුදුරජාණන් වහන්සේ තුළ පැවති කරුණාව හැඳින්වීමට මෙම විශේෂණය ද මුලට යොදයි.
3. බුදුරදුන් කිඹුල්වත් පුරට වැඩියේ භික්ෂූන් වහන්සේ මෙපමණක් පිරිවරාගෙන ය.
4. කපිල වස්තුව හඳුන්වන තවත් නමකි.
6. රාහුල හාමුදුරුවන්ගේ උපාධ්‍යායන් වහන්සේ.

**ජීවිතයට ඔවදනක්**

**"න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිද්ධිමත්තනො"**

අධර්මයෙන් තමන්ගේ වැඩිදියුණුව නොපතනු මැනවි.

# 10 මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය

සුමංගල පොඩි හාමුදුරුවෝ ශ්‍රී සංඝරාජ පිරිවෙනේ පළමුවන වසරේ ඉගෙනුම ලබති. පන්තියේ දී ඉගෙනීමට නියමිත පාඩම් කලින් කියවා අවබෝධ කරගෙන, ඒවායේ ඇතුළත් කරුණු ධාරණය කරගෙන, පන්තියට පැමිණීම උන්වහන්සේගේ සිරිතකි. එපමණක් නොව ඒවායින් තම ජීවිතයට ලද හැකි ආදර්ශ චරිතායනය කර ගැනුම නිසා උන්වහන්සේ අනෙකුත් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා අතර ද, ගුරුවරුන් අතර ද, ප්‍රසාදයට පත් වූ සාමණේර හිමි නමක් වෙති.



මෙහි, මතු දැක්වෙන්නේ ත්‍රිපිටක ධර්මය විෂයයට අදාළ ''චරිත කතා'' අතර ඇති ''මහා ප්‍රජාපතී ගෝතමී'' පාඩම කියවා අවබෝධ කර ගැනීමටත්, කරුණු මතක තබා ගැනීමටත් උන්වහන්සේ අනුගමනය කළ ක්‍රමවේදය යි.

ඒ සඳහා පාඩම කියවීමෙන් අනතුරුව සුමංගල පොඩි හාමුදුරුවෝ ප්‍රශ්න කිහිපයක් සකස් කරගත්හ. ඒවා මෙසේ ය.

1. මහා ප්‍රජාපතී ගෝතමිය නමින් හැඳින්වූයේ කවුද?
2 එතුමිය තුළ පැවති උදර ගුණ ධර්ම මොනවාද?
3. භික්ෂුණී ශාසනයේ ආරම්භය උදෙසා ඇයගෙන් සිදුවූ මෙහෙය කුමක්ද?
4. මහා ප්‍රජාපතී ගෝතමිය ඇතුළු පැවිදි බව පැතූ කාන්තා පිරිසට බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ ගරු ධර්ම අට සඳහන් කරන්න.

5. මහා ප්‍රජාපතී ගෝතමී චරිතයෙන් අපට ලද හැකි ආදර්ශ පෙන්වා දෙන්න.
6. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ පිරිනිවීම සිදුවූයේ කෙසේද?

මෙම ප්‍රශ්න සඳහා සුමංගල පොඩි හාමුදුරුවෝ කරුණු සංවිධානය කරගත් ආකාරය මෙසේ ය.

## 1. මහා ප්‍රජාපතී ගෝතමිය නමින් හැඳින්වූයේ කවුද?

කෝලිය රට දෙවුදහ නුවර අංජන රජුට යසෝදරා හෙවත් සුලක්ඛණා නම් බිසවගෙන් උපන් දූවරු දෙදෙනෙක් වූහ. එනම්, මහාමායා ගෝතමී සහ ප්‍රජාපතී ගෝතමී යන දෙදෙනා ය. මේ දෙදෙනා ම සක්විති රජවීමට තරම් පින් ඇති දරුවන්ට මවු වන බව ඔවුන්ගේ ග්‍රහචාරයේ සටහන්ව තිබිණ. එ නිසා ශාක්‍ය රටේ රජකම ලැබූ සුද්ධෝදන කුමරා මේ දෙදෙනා ම සිය බිසෝවරුන් කර ගත්තේ ය.

සිදුහත් කුමරුගේ මව වූ මහාමායා දේවිය, කුමරු ඉපදී සත් දිනකින් කලුරිය කළා ය. එතැන් සිට මහා ප්‍රජාපතී ගෝතමිය රජුගේ අග මෙහෙසිය මෙන් ම සිදුහත් කුමරුගේ මව බවට ද පත්වූවා ය. සුද්ධෝදන රජුට දව ඇයට ද නන්ද නම් පුත් කුමරෙකු හා නන්දා නම් දූ කුමරියක් වූහ.

## 2. එතුමිය තුළ පැවති උදාර ගුණ ධර්ම මොනවා ද?

මහා ප්‍රජාපතී ගෝතමිය කිසිවිටෙකත් සිදුහත් කුමරුන්ට මවු නැති අඩුව නොදනෙන ලෙසට, වැදූ මව හා සමානව ම සිය තනයෙන් කිරි පොවා කුමරු රැක බලා ගත්තා ය. එය ඇයගේ උතුම් මවු ගුණය හෙළි කරන්නකි. කුමරු අභිනිෂ්ක්‍රමණය කළ අවස්ථාවේ ඇය වේදනාව ඉවසා දරා ගත්තේ දැඩි අපහසුවෙනි. එසේ ම උන්වහන්සේ බුද්ධත්වය ලැබූ බව අසා දැඩි සතුටට ද පත්වූවා ය. ඒ දරු සෙනෙහස බුදුවීමෙන් පසුවත් අඩු නොවී ය. ඇය කලකින් ඇඳුමක් අන්දවන්නට නොලැබුණේ යැයි කියා සියතින් ම නූල් කැට, රෙදි වියා, සිවුරක් මසාගෙන වුත් බුදුරදුන්ට පිදුවා ය. උන්වහන්සේ ලෝකයාට ආදර්ශයක් දීමට "ගෝතමිය, මෙය සංඝයාට පුදන්න. එවිට මා පිදුවා වන්නේ යැයි වදාරා එය සංඝ රත්නයට පූජා කරන ලෙස සුළු මවට උපදෙස් දුන්හ.

### 3. භික්ෂුණී ශාසනයේ ආරම්භය උදෙසා ඇයගෙන් සිදු වූ මෙහෙය කුමක්ද?

බුදුරජාණන් වහන්සේගේ කිඹුල්වත්පුර ගමනේදී බණ අසා මහා ප්‍රජාපතී ගෝතමිය සෝවාන් වූවා ය. ඇයගේ පුතණුවන් වූ නන්ද කුමරුත්, මුණුබුරා වූ රාහුල කුමාරයාත් පැවිදි බවට පත්වූ හ. කල් ගතවත් ම සුද්ධෝදන රජතුමා ද මහ රහත් භාවයට පත්වී පිරිනිවන් පෑවේ ය. මහා ප්‍රජාපතී ගෝතමියට ද පැවිදි වීමේ අවශ්‍යතාව දැඩිව දැනෙන්නට විය. නිග්‍රෝධාරාමයේ වැඩ විසූ බුදුරජාණන් වහන්සේ වෙත එළඹ මහා ප්‍රජාපතී ගෝතමිය ද පැවිද්ද ඉල්ලුවා ය. එහෙත් ඉඩ නොලැබිණි. තෙවරක් ම මෙසේ අයැද සිටිය ද ස්ත්‍රීන් පැවිදි කිරීමට බුදුරජාණන් වහන්සේ කැමති නොවූහ. ඇය ඉන් මහත් වේදනාවට පත් වූවා ය. මෙකල රෝහිණී ගඟෙහි ජලය බෙදා ගැනීමේ ප්‍රශ්නයක් මත ශාක්‍ය හා කෝලිය වංශිකයන් අතර යුද්ධයක් ඇවිළී ගියේ ය. බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කොට දෙපිරිස සමගි කළ හ. දහම් ඇසූ ශාක්‍ය කුමාරවරු පන්සියයක් පැවිදි වූ පසුව ඔවුන්ගේ භාර්යාවෝ ද හිස මුඩු කොට, මහා ප්‍රජාපතී ගෝතමිය ද පෙරටු කොට ගෙන විශාලා මහනුවරට පාගමනින් ම ගොස් ආනන්ද හාමුදුරුවන් වහන්සේ ලවා බුදුරජාණන්වහන්සේ වෙතින් පැවිද්ද ඉල්ලූහ. බුදුරජාණන් වහන්සේ ගරු ධර්ම අටක් ඉදිරිපත් කොට ඒවා පිළිගන්නේ නම් භික්ෂුණී පැවිද්ද ලබා දෙන බව දැන්වූහ. ඒවා හිස් මුදුනින් ම පිළිගත් මහා ප්‍රජාපතී ගෝතමිය පළමුව පැවිද්ද හා උපසම්පදාව ලබා භික්ෂුණී ශාසනයේ ආරම්භය සනිටුහන් කළා ය. එතුමිය "චිරරාත්‍රඥ" (සසුනේ පැවිදි වී වැඩි කාලයක් ගෙවූ) භික්ෂුණීන් අතර අගතනතුර ද ලැබුවා ය.

### 4. බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ ගරු ධර්ම අට සඳහන් කරන්න.

1. උපසම්පදාවෙන් වස් සියයක් ඉක්මවූ මෙහෙණිය වුව ද එදින ම උපසම්පදාව ලැබූ භික්ෂුව දැක වැන්ද යුතු ය. ගරු කළ යුතු ය.
2. භික්ෂූන් නොමැති පෙදෙසක මෙහෙණිය වස් නොවිසිය යුතු ය.
3. මසකට දෙවරක් මෙහෙණිය විසින් භික්ෂූන්ගෙන් පොහොය විචාළ යුතු ය. අවවාද දීම සඳහා එන භික්ෂුවක ගේ පැමිණීම බලාපොරොත්තු විය යුතු ය.
4. වස් අවසානයේ දී භික්ෂුභික්ෂුණී උභතෝ සංඝයා හමුවේ දී මෙහෙණිය වස් පවාරණය කළ යුතු ය.
5. ගරු ඇවතකට පත් මෙහෙණිය භික්ෂු භික්ෂුණී උභතෝ සංඝයා වෙත මානත් පිරිය යුතු ය.

6. අවුරුද්දක කාලයක් ශික්ෂා මානවිකාවක ව සිට මෙහෙණිය උපසම්පදව ලද යුතු ය.
7. මොන ම කරුණක් නිසා වත් මෙහෙණිය භික්ෂුවකට ආක්‍රෝශ පරිභව නොකළ යුතු ය.
8. මෙහෙණිය භික්ෂූන් ට අවවාද නොකළ යුතු ය. භික්ෂූන් විසින් දෙනු ලබන අවවාද මෙහෙණිය පිළිගත යුතු ය.

යන කරුණු අට ''අෂ්ට ගරු ධර්ම'' නමින් හැඳින්වේ.

### 5. මහා ප්‍රජාපතී ගෝතමී චරිතයෙන් අපට ලද හැකි ආදර්ශ මොනවාද?

මහා ප්‍රජාපතී ගෝතමිය කිසිදාක පා ගමනින් දුරක් නොගිය සියුමැලි කාන්තාවකි. යසෝදරාව ඇතුළු එවැනි ම කතුන් පන්සියයක් සමග ඇය කිඹුල්වත් පුර සිට විශාලා මහනුවර දක්වා දුරු මග ගියේ පාවහන් පවා නැතිව ය. එහි සැපත් වන විට ඔවුන්ගේ යටි පතුල් වල දිය පට්ටා නැගී තිබුණි. අව්වට හා දූවිල්ලට ඔවුහු කලු වී දුර්වර්ණ වී සිටියෝ ය. ආනන්ද තෙරුන් වහන්සේ මෙහෙණිසස්න පිහිටුවීම සඳහා අවසර ලබා දෙන තුරු ම බුදුරදුන්ට නොයෙක් කරුණු කියමින් ආයාචනා කළේ මේ මහා වීර්යවන්ත කාන්තාවන්ගේ ජීවිත පරිත්‍යාගය දැක ඇති වූ සංවේගය නිසාම ය. මෙහෙණසස්නට ඉඩ දීම නිසා බුදු සසුනේ ආයු කාලය අඩකින් ම පිරිහෙන බව එදා බුදුරජාණන් වහන්සේ අනඳ තෙරුන්ට වදාළහ. එසේ විශාල පාඩුවක් සිදු වෙද්දීත් උන්වහන්සේ මේ අවසරය දුන්නේ, සසර පෙරුම් පුරා ගෙන අවුත් මේ කාන්තාවන් ඔප්පු කළ මහා වීර්යය සඵල විය යුතු නිසා ය.

එසේ ම එතුමියගේ මවු සෙනෙහස ලොව සියලු මවුවරුන්ට ආදර්ශයකි. එතුමිය සිය සොයුරියගේ පුත් සිදුහත් කුමරුන්ටත් තම කිරි පොවා ඇති දැඩි කළා ය. වසර එකසිය විස්සක් ආයු විඳි මහා ප්‍රජාපතී ගෝතමී මහරහත් මෙහෙණිය භික්ෂුණීන් දහස් ගණනක් පැවිදි කොට නිවන් මග යවමින්, තමන් ආරම්භ කළ මෙහෙණි සස්න දියුණු කිරීමට ද කැප වූවා ය.

සමමෙත් ගුණය, නොසැලෙන වීර්යය, නායකත්වය, ඉවසීම හා කැපවීම ආදී ගුණාංග එතුමියගේ චරිතයෙන් ලද හැකි උතුම් ආදර්ශයන් ය.

### 6. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ පිරිනිවීම සිදුවූයේ කෙසේද'යි පහදන්න.

බුද්ධ මාතා යන ගෞරව නාමයෙන් පිදුම් ලැබූ මහා ප්‍රජාපතී තෙරණියෝ බුදු සසුනේ බලවත් මහ රහතුන්ට පමණක් ලැබිය හැකි ත්‍රි විද්‍යා, සිවුපිළිසිඹියා ආදී සියලු ඥාණබල හා ඍද්ධිබල ලබා සිටියෝ ය. ලොවුතුරා සම්බුදුරජාණන් වහන්සේ පිරි නිවීමට තීරණය කොට විශාලා මහනුවර කූටාගාර ශාලාවේ වැඩ වෙසෙන බව දැනගත් ඇය, උන්වහන්සේ හමුවී තමාට පළමුව පිරිනිවීමට අවසර ඉල්ලා සිටියා ය. ඒ සමග ම තමා මෙහෙණි සස්න පිහිටු වීමට උනන්දු වීමෙන් යම් වරදක් සිදුවී නම් ඊට ද සමාව ගත්තා ය.

ඒ මොහොතේ බුදුරජාණන් වහන්සේ, ස්ත්‍රීන්ට පුරුෂයන්ට මෙන් ඥාණබල නැත යන වැරදි මතය දුරු කරන ලෙස එතුමියගෙන් ඉල්ලා සිටි සේක. ඊට එකඟ වී අහසට පැන නැගුණු බුද්ධ මාතාව නොයෙක් විස්මය ජනක ප්‍රාතිහාර්ය පා මිනිසුන්ගේ සැක විමති දුරු කළා ය.

අනතුරුව පන්සියයක් පිරිවර තෙරණියන් සමග බුදු පාමුල වැඳ වැටී, මේ බුදුන් දකින අවසන් මොහොතයැ'යි කියා සමුගත්තා ය. ඉන් පසු සිය මෙහෙණ වරට ගිය එතුමිය වටා විශාල උපාසිකා පිරිසක් රොක් වී හඬා වැලපෙන්නට වූහ. එවිට ''දරුවනි, සියලු සංස්කාර ධර්ම අනිත්‍යය. වෙන්වීම කෙළවර කොට ඇත්තේ ය. වෙනස් වන සුලු ය. මාරයාට හසුවීම ගැන හඬා පලක් නැතැ'යි කියා ඔවුන් සනසා ලූ බුද්ධමාතාවෝ චතුර්ථ ධ්‍යානයට සම වැදී තෙල් සිඳී ගිය පහන් සිලක් සේ පිරිනිවන් පා වදාළහ. එතුමිය සමග තවත් පන්සියයක් තෙරණියෝ ද පිරිනිවන් පෑහ. ඒ මොහොතේ මහ පොළොව ගුගුරා ගියේ ය.

බුදුරජාණන් වහන්සේ එහි වැඩමවා යම්කිසි කෙනෙකු තුළ බුදුන් කෙරෙහි ශ්‍රද්ධාවක් ඇත්නම්, බුදුන්ට යමෙක් ප්‍රිය නම් ඒ බුද්ධපුත්‍රයෝ බුද්ධ මාතාවට ගරු කරත්වා'යි වදාරා, මහසඟන පිරිවරාගෙන මවු සිරුර පසුපස වැඩම කොට ගෞරව දක්වා ආදාහන කරවූ හ.

**ක්‍රියාකාරකම 10.1**

1. මහා ප්‍රජාපතී ගෝතමියගේ උදාර ගුණ ඇසුරෙන් කවියක් නිර්මාණය කරන්න.

2. ''මහා ප්‍රජාපතී ගෝතමී'' චරිතය පිළිබඳව පන්තිය ඉදිරියේ කෙටි කතාවක් ඉදිරිපත් කරන්න.

### ක්‍රියාකාරකම 10.2

අෂ්ට ගරු ධර්ම වනපොත් කරන්න.

### ක්‍රියාකාරකම 10.3

හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

1. මහා ප්‍රජාපතී ගෝතමිය .................................... ගේ (යශෝදරාව/ මහාමායා දේවිය) සොහොයුරිය යි.
2. ............................. (නන්ද කුමරු/ රාහුල කුමරු) මහා ප්‍රජාපතී ගෝතමියගේ පුත්‍රයා යි.
3. ශාක්‍ය හා කෝලිය වංශිකයන් අතර ගැටුමක් ඇතිවූයේ ............................ (නේරංජනා/ රෝහිණී) නදියේ ජලය බෙදා ගැනීම සම්බන්ධව යි.
4. භික්ෂුණී ය, භික්ෂූන් ........................... (වෙසෙන/ නොවෙසෙන) පෙදෙසක වස් විසිය යුතු ය.
5. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය .................................. (අවුරුදු 120 ක්/ අවුරුදු 100 ක්) ආයු වැළඳුවා ය.

**ජීවිතයට ඔවදනක්**

**''චිත්තස්ස දමථො සාධු**
**චිත්තං දන්තං සුඛාවහං''**


සිත දමනය කිරීම යහපත් ය.
දමනය වූ සිත සැප ගෙන දෙයි.

# 11 අනාථ පිණ්ඩික සිටුතුමා

අන්තර් පළාත් සාහිත්‍ය දින තරගාවලියේදී ප්‍රාථමික අංශයේ රචනා තරගය නියෝජනය කරමින් ප්‍රථම ස්ථානය දිනාගත් ශිෂ්‍යයෙකු ''අනේ පිඬු සිටුතුමා'' මැයින් තරගයට ලියා ඉදිරිපත් කළ රචනාවක් පහත දැක්වේ.

''ඉදං හි තං ජේතවනං
ඉසි සංඝං නිසෙවිතං
ආවුත්තං ධම්ම රාජේන
පීති සංජනනං මම............''

'' බුදුරජාණන් වහන්සේ වැඩ වෙසෙන, භික්ෂු සංඝයා නිතර ගැව සෙන මේ ජේතවන විහාරය මට නිතර ප්‍රීතිය දනවයි................''



මේ එක්තරා දිව්‍ය පුත්‍රයෙකු නිතර නිතර ජේතවනාරාමය පැදකුණු කරමින් ගයන ලද ගීයකි. ඒ දිව්‍ය පුත්‍රයා'' අන් කවරෙකුවත් නොව ''අනේ පිඬු සිටුතුමා'' නමින් බුදු සසුනේ දායකයන් අතර අගතැන්පත් ''සුදත්ත'' සිටුතුමා යි.

සැවැත් නුවර විසූ ''සුදත්ත'' සිටුතුමා, අනාථ අසරණ දුගී ජනතාවට මහත් කරුණාවෙන් ආහාරපානාදියෙන් සංග්‍රහ කිරීමට පුරුදු වී සිටියේ ය. එනිසා ම ඔහු ''අනාථ පිණ්ඩික'' යන විරුද නාමයෙන් ද හඳුන්වන ලදි.

රජගහනුවර සිටුතුමා සුදත්ත සිටුතුමාගේ හිතවතෙක් විය. දිනක් ඔහු හමුවීමට එහි ගිය අවස්ථාවේදී රජගහනුවර සිටුතුමාට සුදත්ත සිටුතුමා සමඟ කතා කිරීමට තරම් වත් විවේකයක් නොවී ය. මේ කාර්යය බහුලත්වය කුමක්දැ'යි විපරම් කළ සුදත්ත සිටුතුමාට දැනගන්නට ලැබුණේ, පසු දින බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝයා වහන්සේ රජගහ නුවර සිටුතුමාගේ මැදුරට දානයට වඩින බවයි. 'බුද්ධ' යන නම ඇසුණු පමණින් ම ප්‍රීතියෙන් පිනා ගිය සුදත්ත සිටුතුමා බුදුරජාණන් වහන්සේ බැහැ දැකීමේ ආශාවෙන් රැය පහන් කළේ මහත් නොඉවසිල්ලෙනි. අලුයම් වේලෙහි සීත වනයට පිවිසි සිටුවරයාට එහි සක්මන් කරමින් සිටි බුදුරජාණන් වහන්සේ මුණ ගැසිණි.

අනේපිඬු සිටුවරයාව ඇතදී ම දුටු බුදුරජාණන් වහන්සේ 'සුදත්ත මෙහි එන්න' යැයි පැවසූහ. සිය නමින් ම ඇමතීම ගැන ප්‍රීතියෙන් ඉපිල ගිය සිටුතුමා සමඟ බුදුරජාණන් වහන්සේ කෙටි පිළිසඳරක යෙදුණ හ. එයින් ම සුදත්ත සිටුතුමා සෝවාන් විය. රජගහනුවර සිටුතුමාගේ නිවසේදී ම බුදු පාමොක් මහ සඟනට දන් පිළිගැන්වූ සුදත්ත සිටුතුමා ඉදිරි වස් තුන් මස සැවැත් නුවර වස් වසන ලෙස ආරාධනා කළේ ය. බුදුරජාණන් වහන්සේ එම ආරාධනාව ඉවසා වදාළහ.

සැවැත් නුවරට පැමිණි අනේපිඬු සිටුතුමා පළමුවෙන් ම කහවණු දහඅට කෝටියක් බිම අතුරා ජේත නම් කුමාරයාගේ උයන මිල දී ගත්තේ ය. එහි විහාර, උපස්ථාන ශාලා, සක්මන් මලු, ආදි ආරාමික අංග සපුරාලීමට තවත් කහවණු දහඅට කෝටියක් වැය කළේ ය. 'ජේතවනාරාමය' යනුවෙන් අප හඳුන්වන්නේ මේ ආරාමය යි. 'ජේතවනාරාමය' බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නයට පූජා කිරීම සඳහා අනේපිඬු සිටුතුමා තවත් කහවණු දහ අට කෝටියක් වැය කළේ ය.

අනේපිඬු මහ සිටුතුමා දවසට තෙවරක් දෙවුරම් වෙහෙරට යයි. එතුමා දකින කුඩා සාමණේරයන් වහන්සේලා ගෙනාවේ මොනවාදැ'යි සිටුතුමාගේ දැත් දෙස බලති. එනිසා එතුමා කිසිවිටෙක හිස් අතින් නොයයි. උදේ යන විට කැඳ අවුළුපත් ද, දවල් දානයෙන් පසුව යනවිට ගිතෙල්, වෙඬරු, සකුරු ආදී චතුමධුර ද රැගෙන යයි. සවසට යන්නේ තෙල්, මල්, පහන්, සුවඳ ආදිය රැගෙන ය.

සිටුතුමා තුළ බුදුරදුන් පිළිබඳව පැවතුණේ එතෙක් මෙතෙක් කිසිදු උපාසකයකු තුළ නොතිබූ තරම් ගෞරවයකි. ආදරයකි. උන්වහන්සේ වෙහෙස වේ යැයි සිතා කිසිදිනක ධර්ම කාරණාවක්වත් ඇසුවේ නැත. එනිසා ''අනාථ පිණ්ඩික මා නොරැකිය යුතු තැන රකී'' යයි බුදුරජාණන් වහන්සේ ම වදාළ සේක. එසේ වුවත් උන්වහන්සේ සිය කැමැත්තෙන් ම එතුමාට ධර්ම දේශනා කරන සිරිතක් තිබුණි.

අනේපිඬු සිටුතුමාගේ නිවසේ දිනපතා පන්සිය නමකට දානය සූදානම් ව තිබුණි. එහෙත් ඒ දන් පිළිගැන්වීමට එතුමාට නිවසේ රැඳීමට ලැබෙන්නේ කලාතුරකිනි. සැවැත් නුවර කොතැනක හෝ දානමය පින්කමක් පැවැත්වේනම්, එය හරිහැටි කෙරෙන්නට නම් එතුමා හෝ විශාඛා උපාසිකාව එහි මුල්තැන ගත යුතුයැයි නුවර වැසියන්ගේ පිළිගැනීමක් තිබූ නිසා ය.

එතුමන් නැති දිනවල නිවසේ දන් පිළිගැන්වීම කළේ එතුමාගේ දූ දරුවන් ය. මහ සිටුතුමා ට, මහා සුභද්‍රා, චූල සුභද්‍රා, සුමනා යයි දූවරුන් තිදෙනෙක් ද කාල නම් පුතෙක් ද වූහ. වැඩි මහලු දියණියන් දෙදෙනා සෝවාන් වී පතිකුලයට ගොස් පින් දහම් කරමින් විසූහ. බාල දියණිය සුමනා පතිකුලයට නොගොස් ගෙදර ම රැඳුණා ය. ඇය පියාගේ පින්කම් වලට සහාය වෙමින් සිට සකෘදාගාමී වී රෝගයකින් මිය ගියා ය. සිටුතුමා විනෝදයට බර වූ සිය පුතු නිවන් මගට ගත්තේ උපක්‍රමයකිනි. පියාගෙන් මුදල් ලබාගන්නට බණ පදයක් මතක තබාගෙන එන්නට ගිය කාල සිටුපුත් එම බණ ම අසා සෝවාන් විය.

පන්සතළිස් වසරක බුද්ධ ජීවිතයේ වසර විසිපහක් ම ගත වූයේ සැවැත් නුවර ය. එයින් දහනව වසරක් ම විසුවේ ජේතවනාරාමයේ ය. ඉතිරි සය වසර පූර්වාරාමයේ ය. උන්වහන්සේ ජේතවනාරාමයෙන් බැහැර වූ අවස්ථාවලදී වන්දනාමාන කිරීම සඳහා සුදුසු වස්තුවක් හා ස්ථානයක් අවශ්‍ය වූ බැවින් බුදුරජාණන් වහන්සේගේ අනුශාසනා පරිදි, ආනන්ද හාමුදුරුවන් වහන්සේගේ මූලිකත්වයෙන් හා කොසොල් රජතුමාගේ සහාය ද ඇතිව ශ්‍රී මහා බෝධි ශාඛාවක් ජේතවනාරාමයෙහි රෝපණය කරනු ලැබී ය. ඒ සඳහා අනේ පිඬු සිටුතුමාගේ පූර්ණ දයකත්වය ලැබිණි. එය ''ආනන්ද බෝධිය'' නමින් හැඳින්විණි.

පින් දහමින් ම දිවි ගෙවූ අනේපිඬු සිටුතුමාගේ ධනය කලකදී පිරිහිණි. එතුමාට ආපසු නොලැබුණු ණය පමණක් කහවණු දහ අට කෝටියක් විය. තවත් දහ අට කෝටියක රන් ගං ඉවුරක නිදන් කර තිබී මුහුදට ගසාගෙන ගියේ ය.

සිටු මැදුරේ දොරටුවට අරක්ගෙන සිටි දෙවියා දන්දීම ප්‍රිය නොකළේ ය. ඔහු ධනයෙන් පිරිහී සිටි සිටුතුමාට දන්දීම නවත්වා ව්‍යාපාර දියුණු කරන් නැයි උපදෙස් දුන්නේ ය. ඒ ඇසූ සිටුතුමා ''ඔබ වගේ කෙනෙකුගේ ආරක්ෂාව මට වුවමනා නැත. වහාම පිටවෙන්නැ'' යි කියා දෙවියා පලවා හැරියේ ය. විමානය අහිමි වූ දෙවියාට තම දුක් ගැනවිල්ල කියන්නට සක්දෙව් රජ ළඟට ම යන්නට සිදුවිය. එහෙත් මහ සිටුතුමාට කරුණු කියන්නට සක් දෙවිඳුවත් එඩිතර වූයේ නැත. අන්තිමට සක් දෙව්රජු දෙවියාට දඬුවම් වශයෙන් ණයකරුවන් සිටුතුමාට ණය ගෙවන්නට පොළඹවන්නටත්, මුහුදට ගිය රන් නැවත ගබඩා වලට යවා සිටුතුමාගෙන් සමාව ගන්නටත් නියම කළේ ය. දෙවියාට විමානය ලැබුණේ ඉන් පසුව ය. එයින් යළිත් එතුමාගේ ආර්ථිකය යහපත් විය. පින් දහම් ද සුපුරුදු ලෙස ම කරගෙන ගියේ ය.

සිටුතුමාගේ ජීවිතයේ අවසන් මොහොතේ දී, සැරියුත් තෙරණුවෝ වැඩමවා, 'අනාථ පිණ්ඩිකෝවාද සූත්‍රය' දේශනා කළහ. ඒ අසා සිටුතුමා මෙබඳු දහමක් මුළු ජීවිතයට ම අසන්නට නොලැබුණේ යැයි ඒ දේශනාවට ප්‍රශංසා කළේ ය. ඒ සතුටින් ම මිය පරලොව ගිය අනේපිඬු සිටුතුමා තුසිත දෙව්ලොව උපන්නේ ය. මුලින් සඳහන් වන්නේ එතුමා එදා ම රෑ දෙවුරම් වෙහෙර වටා යමින් ගැයූ ගීයයි.

**ක්‍රියාකාරකම 11.1**

1. අනේපිඬු සිටුතුමා පිළිබඳව පොත පතින් තවත් තොරතුරු රැස් කර අභ්‍යාස පොතේ සටහන් කරන්න.
2. පාඩමේ ඔබ සිත් ගත් තැනක් චිත්‍රයට නගන්න.
3. අනේපිඬු සිටුතුමා පිළිබඳ ව වාක්‍ය දහයක් ලියන්න.

## ක්‍රියාකාරකම 11.2

හිස්තැනට සුදුසු වරණය තෝරා යටින් ඉරක් අඳින්න.

1. අනේපිඬු සිටුතුමා නමින් ප්‍රසිද්ධියට පත් වූයේ (සුදත්ත/ රජගහනුවර) සිටුතුමා ය.
2. ජේතවනාරාමය ඉදි කිරීම සඳහා භූමිය මිලට ගත්තේ (කොසොල් රජුගෙනි/ ජේත කුමරුගෙනි)
3. ජේතවනාරාමය ඉදි කොට සඟසතු කොට පූජා කිරීම සඳහා වැය වූ මුදල කහවණු (18 කෝටියකි/ 54 කෝටියකි.)
4. අනේපිඬු සිටුතුමා දවසට (තෙවරක්/ දෙවරක්) බුදුරදුන් බැහැ දැකීමට ගියේ ය.
5. ජේතවනාරාමයේ රෝපණය කොට ඇති බෝධිය (ශ්‍රී මහා බෝධිය යි/ ආනන්ද බෝධිය යි).

### ජීවිතයට ඔවදනක්

''කල්‍යාණි මෙව මුඤ්චෙය්‍ය
නහි මුඤ්චෙය්‍ය පාපකං''

යහපත් වචන ම මුවෙන් පිට කරන්න.
අයහපත් වචන පිට නොකරන්න.

# 12 විශාඛා මහෝපාසිකාව

මහනුවර ශ්‍රී සංඝරාජ මහා පිරිවෙණේ පළමු වසර ඉගෙනුම ලබන ගලබඩ චෛතිය පොඩි හාමුදුරුවෝ, පාරිවේණික ශිෂ්‍ය සමිතියේදී ''විශාඛා මහෝපාසිකාව'' මැයින් ඉදිරිපත් කරන ලද කතාව පහත දැක්වේ.

මූලාසනාරූඪ, අති ගෞරවණීය පරිවේනාධිපති හාමුදුරුවන් වහන්සේගෙන් ද, නියෝජ්‍ය පරිවේනාධිපති හාමුදුරුවන් වහන්සේලාගෙන් ද, ආචාර්ය මණ්ඩලයේ හාමුදුරුවන් වහන්සේලා ඇතුළු ගුරු පියවරුන්ගෙන් ද, සහෝදර ශිෂ්‍ය ආයුෂ්මතුන් වහන්සේලාගෙන් ද, මුළු සභාවෙන් ද අවසරයි. මා මේ අවස්ථාවේදී සූදානම් වන්නේ ''විශාඛා මහෝපාසිකාව'' පිළිබඳව කරුණු ස්වල්පයක් ඔබ වෙත ඉදිරිපත් කිරීමට යි.



''අතීතයේ දඹදිව අංග නමින් හැඳින්වුණු ජනපදයක් තිබුණා. එහි ''භද්දිය'' නම් නුවර ප්‍රධාන සිටු තනතුර හෙබවූයේ ''ධනංජය'' සිටුවරයා යි. ඔහුගේ භාර්යාව ''සුමනා'' නමින් හැඳින්වුණු අතර ''විශාඛා'' නම් දියණියක් ද මොවුනට සිටියා.

ධර්ම චාරිකාවේ යෙදෙමින් අප ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ භද්දිය නුවරට වැඩි අවස්ථාවේ, උන්වහන්සේගෙන් ධර්මය ශ්‍රවණය කළ විශාඛා කුමරිය හත් හැවිරිදි වියේදී ම පන්සියයක් යෙහෙළියන් සමග සෝවාන් වුණා.

ක්‍රමයෙන් තරුණ වියට පත් වූ විශාඛාව කේස කල්‍යාණ, මංස කල්‍යාණ, අට්ඨි (දන්ත) කල්‍යාණ, ඡවි කල්‍යාණ, වයඃ කල්‍යාණ යන පංච කල්‍යාණයෙන් දුටුවන් නෙත් සිත් වශී කරන්නට සමත් වුණා. ඒ හා සමානව ම ඇය ගුණ නුවණින් ද සියල්ලන්ගේ සිත් දිනාගත්තා. මේ අතර මගධයේ භද්දිය නුවර විසූ ධනංජය සිටුතුමාට කොසොල් රජතුමාගේ ඉල්ලීම නිසා කොසොල් රටේ සිටුවරයෙකු ලෙස සාකේත නුවර පදිංචියට යන්න වුණා. දැන් විශාඛාව ඉන්නෙ සාකේත නුවර යි.

සැවැත්නුවර මිගාර සිටුතුමාට පූර්ණවර්ධන නම් පුතෙක් හිටියා. ඔහු විවාහයකට කැමති වුණේ නැහැ. මවුපියන්ගේ ඇවිටිල්ල නිසා ම පඤ්ච කල්‍යාණයෙන් යුතු කුමරියක් හමුවුණොත් විවාහවන බව ඔහු කීවා. දැන් මිගාර සිටුතුමාගේ දූතයන් එවැනි කුමරියක් සොයමින් ගම් දනව් පීරනවා. අන්තිමට ඔවුන් සාකේත නුවරටත් පැමිණියා. එදා නැකත් උත්සව දවසක්. දූත පිරිස උත්සව භූමියට වෙලා විමසිල්ලෙන් බලා සිටියා.

එකල කුල කුමරියන්ට නිදහසේ එළියට බහින්න ලැබෙන්නෙ මේ වගේ දවසට විතරයි. විශාඛාවත් යෙහෙළියන් සමඟ උත්සවය බලන්න ගියා. ඔවුන් එතනට ළං වෙන්න පෙර වැස්සක් ඇද හැලුණා. යෙහෙළියන් සියලු දෙනා ම මඩුවක් ඇතුළට දිව්වා. විශාඛාව ආ විදියට ම සෙමින් තෙමි තෙමී ම මඩුවට ගියා. මෙය හොඳින් බලා සිටි දූත පිරිසේ කෙනෙක් කීවා ''අපොයි මෙයා ගත්තු කෙනෙකුට නම් කැඳත් නෑ'' කියල. විශාඛාව ඇහුව ''ඇයි මාමෙ එහෙම කිව්වෙ'' කියල. එවිට බමුණා කිව්ව ඔබේ කම්මැලි ගමන දැකල එහෙම කියවුණා කියල. එවිට විශාඛාව කියනව. ''මාමේ, දුවනකොට අශෝභන හතර දෙනෙක් ඉන්නවා. ඒ තමයි, සර්වාභරණයෙන් සැරසුණු රජතුමා, සරසන ලද මඟුල් ඇතා, පැවිදි ඇත්තන් සහ කාන්තාවන්, මේ අය දිව්වොත් ජනයාගේ නින්දාවට ලක්වෙනවා. අනික් අතට මාමේ, මවුපියන් දූවරුන් හදන්නෙ විකුණන්න තියෙන බඩු වගේ. දුවල වැටිල අතක් පයක් කැඩුණොත් අපට මාපියන්ට බරක් වෙලා ගෙදරට ම නාකි වෙන්න වෙනව, එනිසයි මා නොදිව්වේ'' කියල.

ඇගේ පඤ්ච කල්‍යාණ ලක්ෂණයත්, නුවණත් දැක පැහැදුණු දූත පිරිස සියලු පුවත් මිගාර සිටු තුමාට සැළ කළා. ඉතා ප්‍රීතියට පත් එතුමා දෙපැත්තේ ම කැමැත්තෙන් විවාහය තීන්දු කරගත්තා.

සරණ මංගල්‍යයට පෙර දිනයේ, විශාඛාවගේ පියා, ඒ කියන්නේ ධනංජය සිටුවරයා තම දියණිය වූ විශාඛාවට අගනා අවවාද දහයක් ලබා දුන්නා.

| අවවාද | අදහස් |
|---|---|
| 1. ඇතුළත ගිනි පිටත නො දෙන්න. | 1. ගෙදර දොස් පිටට නොකියන්න. |
| 2. පිටත ගිනි ඇතුළට නො ගන්න. | 2. ගෙදර අය ගැන පිට අය කියන අගුණ පෙරළා ඔවුන්ට නොකියන්න. |
| 3. දෙන අයට දෙන්න. | 3. ඉල්ලාගත් දෙයක් ආපසු දෙන අයට පමණක් දෙන්න. |
| 4. නොදෙන අයට නොදෙන්න. | 4. ආපසු නොදෙන අයට නොදෙන්න. |
| 5. දෙන අයටත්, නොදෙන අයටත් දෙන්න. | 5. දිළින්දන්ට, නෑ හිතමිතුරන්ට දිය හැකි දෙයක් ආපසු බලාපොරොත්තු නැතිව ම දෙන්න. |
| 6. සුවසේ හිඳින්න. | 6. වැඩිහිටියන් එනවිට නොනැගිටිය යුතු තැනක හිඳගන්න. |
| 7. සුවසේ අනුභව කරන්න. | 7. කාටත් බෙදා දී, සැමට ම පසුව, කාටත් ලැබුණු බව දැන අනුභව කරන්න. |
| 8. සුවසේ සැතපෙන්න. | 8. ගෙහි කටයුතු නිම වී, දොරගුළු ලා, පරීක්ෂා කොට සැතපෙන්න. |
| 9. ගිනි පිරිමසින්න. | 9. නැන්දා, මාමා, සැමියා ගිනි සේ සලකා අතපසුවීම්වලින් වළකින්න. |
| 10. ඇතුළත දෙවියන් පුදන්න. | 10. නැන්දා, මාමා, සැමියා දෙවියන් සේ සලකා ගරු කරන්න. |

විශාඛා විවාහ වී සැවැත් නුවරට ගියා. ධනංජය සිටුතුමා ඇයට ගැටලුවක් වුණහොත් විසඳන්න, උගත් බමුණන් අට දෙනෙකුත් ඇය සමග පිටත් කර හැරියා. දැන් ඇය කාගේත් සිත් දිනාගෙන, පියාගේ අවවාද පිළිපදිමින් වාසය කරනවා.

මිගාර සිටුතුමා නිගණ්ඨ ශ්‍රාවකයෙක්. දවසක් ඒ නිවසේ නිගණ්ඨයන් ට දානයක් පැවැත්වුණා. ඒ වෙලාවේ රහතන් වහන්සේලාට වඳින්නැ'යි සිටුතුමා විශාඛාවටත් කියා යැව්වා. ඉක්මනින් ආ ඇය නිගණ්ඨයින් දැක පිළිකුලෙන් ආපසු ගියා. මෙයින් සිටුතුමා කෝපයට පත්වුණත්, ඇය අලුත ආ නිසාත්, ඇගේ පවුලේ තත්ත්වයත් ගැන හිතල ඉවසුවා.

තවත් දවසක් මිගාර සිටුතුමා අහර ගනිමින් සිටිද්දී භික්ෂූන් වහන්සේ නමක් පිඬු පිණිස වැඩියා. ඔහු එය ගණනකට නොගෙන ආහාර ගත්තා. ඔහුට පවන් සලමින් සිටි විශාඛා ''ස්වාමීනි, අපේ මාමණ්ඩි පුරාණය වළඳනව වෙනත් තැනකට වඩින්නැ'' යි උන්වහන්සේට කීවා. පුරාණය කියනව අශූචි වලටත්, ඒ නිසා සිටුතුමාට හොඳට ම තරහ ගියා. විශාඛාව නිවසින් පිටුවහල් කරන්නට තීරණය කළා.

බමුණන් අට දෙනා ගෙන්වා ගැටලුව කීවා ම ඔවුන් විශාඛාවගෙන් එසේ කීවේ මන්දැයි විමසුවා. එවිය ඇය, ''මා කළේ අපහාසයක් නොවේ. මා කීවේ අපේ මාමණ්ඩිය පෙර කළ පින්වල පල භුක්ති විඳින බවයි'' කියා කීවා. එයින් ඇය නිදොස් වුණා. ඒත් මිගාර සිටුතුමාට තවත් ගැටළුවක් තිබුණා. ඒ මංගල දිනයට පෙරදා විශාඛාවට පියා දුන් අවවාද දහය. එය මිගාර සිටුතුමාට ඇසුණත් අදහස වැටහුණේ නැහැ. ඒ නිසා ඔහු එය වැරදි විදියටයි හිතල තිබුණෙ. විශාඛාව එයත් එකින් එක විස්තර කර දුන්නම තමයි මිගාර සිටුතුමාට වැටහුණේ තම ලේලිය කොතරම් නැණවත් ද කියලා.

සිටුතුමා ඇය නිදොස් බව පිළිගත්තා විතරක් නොවෙයි තමා වරද වා සිතීම ගැන සමාවත් ගත්තා. ඇය කෙරෙහි හොඳට ම පැහැදිලා ඇයට තම නිවසට ම තෙරුවන් වැඩමවා පින්දහම් කරන්න අවසර දුන්නා. එහිදී බුදුරජාණන් වහන්සේ දෙසූ බණ අහල මිගාර සිටුතුමා සෝවාන් වුණා. ඉතා ම ප්‍රීතියට පත් එතුමා, මේ මගේ ලේලිය නොවේ, මගේ අම්මා යැ'යි විශාඛාව මවු තනතුරේ තැබුවා. එතැන් පටන් විශාඛාව ''මිගාර මාතා'' නමින් ප්‍රසිද්ධ වුණා.

දැන් විශාඛාව නිතර දෙව්රම් වෙහෙරට යනවා, බණ අහනවා. ඇයට තිබුණා 'මහාලතා පසාදනය' හෙවත් 'මේඛල පළඳනාව' නම් නවකෝටියක් වටින පළඳනාවක්. එය සේවිකාවක් අතට දී බණ අහලා, ආපසු එනවිට සේවිකාවට එය අමතක වුණා. නැවත එය සොයන්න යනවිට අනඳ තෙරුන් ප්‍රවේසම්කර තබා නැවත දුන්නා. මහා සංඝයා අතට ගිය දෙයක් ආපසු ගන්න විශාඛාව කැමති වුණේ නැහැ. එය ආපසු විහාරයට ම පිදුවා ම ''අපට එයින් පලක් නැතැ'' යි අනඳ තෙරුන් පැවසුවා. එසේ නම් එය වැයකොට කුමක් හෝ කළයුතු යැ'යි තීරණය කළ විශාඛා නගරයේ නැගෙනහිර පැත්තෙන් නවකෝටියකට භූමියක් ලබාගෙන තවත් නව කෝටියක් වැයකොට අංග සම්පූර්ණ විහාරයක් ඉදි කෙරෙව්වා. එහි පූජාවටත් නව කෝටියක් වැය වුණා. විසිහත් කෝටියක් වැයකොට තැනූ ඒ ආරාමය නම් සැවැත්නුවර පූර්වාරාමය යි. බුදුරජාණන් වහන්සේ එහි සයවසක් විසුවා.

විශාඛාවට පුතුන් දස දෙනෙකුත්, දූවරුන් දස දෙනෙකුත් සිටියා. වසර එකසිය විස්සක් ආයු වින්ද ඇගේ දරු මුනුබුරු පරපුර හාරසිය විස්සක් සිටියා. ඇය පොඩි දරුවන්ට හරි ම ආදරෙයි. ඇගේ මුනුබුරුමිනිබිරියන් වැඩිපුර හැදුණේ මවුපියන් ළඟ නොවෙයි, ඇගේ ළඟයි. වරක් මුණුබුරෙක් මිය ගියා කියලා, එතුමිය තෙත රෙදි පිටින්, තෙත කෙස් පිටින් සත් දවසක් ම ශෝකයෙන් ගත කළා. ඒ නිමිත්තෙන් බුදුරජාණන් වහන්සේ විශාඛා සූත්‍රය දේශනා කළා.

විශාඛාව හරිම ශ්‍රද්ධාවන්ත යි. දවසට දෙවරක් පන්සලට යනවා. ඒ යන කිසිවිටක හිස් අතින් යන්නෙ නැහැ. පොඩි හාමුදුරුවරු ඇය එනතුරු, මොනවද ගෙනෙන්නේ කියලා, බලා ඉන්නවා.

අනේ පිඬු සිටුතුමාගේ නිවසේ වගේ විශාඛාවගේ නිවසේත් දිනපතා පන්සිය නමකට දානය පිළියෙල වී තිබුණා. දුර පළාත්වල සිට සැවැත් නුවරට වැඩමවන හාමුදුරුවරු කුඩා සාමණේරයන් වහන්සේලා විශාඛාවට භාරදීලා වෙනත් කටයුතුවලට වඩින සිරිතක් තිබුණා. ඇය ඔවුන් ඉතා ආදරයෙන් රැකබලා ගන්නවා.

විශාඛා මිගාර මාතාව, බුදු සසුනේ අග්‍රදායිකාව වගේ ම බුදු සසුනේ මාතාවත් වුණා.

## ක්‍රියාකාරකම 12.1

1. A තීරුවේ ඇති ප්‍රකාශයට ගැළපෙන පිළිතුර B තීරුවෙන් තෝරා යා කරන්න.

| | A | B |
|---|---|---|
| 1. | අගනා අවවාද 10ක් විශාඛාවට ලබා දුන් සිටුතුමා | මිගාර සිටුතුමා |
| 2. | පූර්ණ වර්ධන සිටුතුමාගේ පියා | ධනංජය සිටුතුමා |
| 3. | විශාඛාවගේ මව | මිගාර මාතා |
| 4. | විශාඛාව හැඳින් වූ තවත් නමකි | සුමනා |
| 5. | බුදුරජාණන් වහන්සේ බොහෝ කලක් වැඩ සිටි ආරාමයකි | පූර්වාරාමය |
| 6. | විශාඛාව සසුනට පිදූ ආරාමය | ජේතවනාරාමය |

2. විශාඛාවගේ චරිතයෙන් අපට ලද හැකි ආදර්ශ මොනවාදැ'යි ලියා දක්වන්න.

## ක්‍රියාකාරකම 12.2

1. ධනංජය සිටුතුමා විසින් විශාඛාවට දෙන ලද අවවාද 10 වනපොත් කරන්න.
2. පංච කළ්‍යාණිය නම් කරන්න.
3. දුවන විට අශෝභන සතරදෙනා කවුරු ද?

### ජීවිතයට ඔවදනක්

**"සෙය්‍යො අමිත්තො මතියා උපෙතො"**

නුවණ ඇති සතුරා වුවද යහපත් ය.

# 13 හොඳට නරකට දෙකට ඇසුර ය

ශ්‍රද්ධාවන්ත පින්වත්නි,

මේ වෙලාවට නියමිතව තිබෙන්නෙ ජාතක දේශනාව යි. ජාතක කියල කියන්නෙ අප මහ බෝසතාණන් වහන්සේ පෙරුම් පුරන කාලෙ ගත කළ ජීවිත කතා. ඒ විදියෙ ජාතක කතා පන්සිය පණහක් තිබෙනවා. ඒ අතරින් අද මා ඔබට දේශනා කරන්න තෝරාගත්තෙ ''සත්ති ගුම්බ'' ජාතකය. සත්ති කියන්නෙ ආවුද. ගුම්බ කියන්නෙ පඳුර, නැත්නම් ගොඩ. ආවුද ගොඩක් උඩට වැටුණු ගිරා පැටියෙකුට තැබූ නම තමයි සත්ති ගුම්බ කියන්නෙ. මෙය දෙව්දත් තෙරුන් වහන්සේ ගැන කියවෙන කතාවක්.

## වත්මන් පුවත

දෙව්දත් තෙරුන් වහන්සේ කියන්නේ මහ නපුරු කෙනෙක්. උන්වහන්සේ ළඟ සිටියෙත් වැඩිදෙනෙක් ඒ වගේම පව්ටු නපුරු අය. දෙව්දත්තෙර බුදුහාමුදුරුවන්ට විරුද්ධ ව නොයෙක් පව්ටුකම් කළා. අන්තිමේදී ගිජුකුළු පව්ව මුදුනේ සිට බුදු හාමුදුරුවන්ගේ හිස මතට ගලක් පෙරළුවෙ උන්වහන්සෙ මරන්නයි. මේ තුන්ලෝකෙ කිසිකෙනෙකුට බුදුහාමුදුරුවන් මරන්න බැහැ. ඒ වුනත් එදා ගල් පතුරක් විසිවෙලා ඇවිත් වැදිලා උන්වහන්සේගෙ පාදයේ ලේ ගැලීමක් ඇතිවුණා. ඒ වේදනාවෙන් වැඩ ඉන්නා බුදුහාමුදුරුවන් බලන්න වැල නොකැඩී සෙනඟ එන්න පටන් ගත්තා. එයින් ඒ සෙනසුන ඉතාම අවිවේකී තැනක් වුණා. ඒ නිසා තමන්වහන්සේ, ජනගහණය අඩු මණ්ඩකුච්ඡි ප්‍රදේශයට ගෙනයන්නැයි, භික්ෂූන් වහන්සේලා ට වදාළා. උන්වහන්සේලාත් එසේ කළා. එහිදී ජීවක වෙදුදුරුතුමා උන්වහන්සේ සුවපත් කළා.

එදා හාමුදුරුවරුන් වහන්සේලා අතර ''බලන්න, මේ දෙව්දත් තෙරුන් වහන්සේ පව්ටු පිරිසක් වට කරගෙන පව්ටුකම් කරන හැටි'' යැයි කතාබහක් ඇතිවුණා. එය ඇසූ බුදුහාමුදුරුවෝ ''මහණෙනි, අද පමණක් නොවෙයි,

පෙරත් මේ දෙව්දත් පව්ටු මිනිසුන්ගෙ ඇසුරට වැටිලා පව්ටු කෙනෙක් වුණා'' යැයි වදාරල, හාමුදුරුවරුන්ගේ ඉල්ලීම නිසා මේ ජාතක කතාව දේශනා කළා.

## යටගිය පුවත

පින්වත්නි, එකමත් එක කාලයක අපමහ බෝසතාණන් වහන්සේත් දෙව්දත් තෙරත් එකම ගිරා පවුලක ඉපදිලා හිටියා. ඔවුන්ගෙ කූඩුව තිබුණෙ කන්දක් මුදුනෙ ඉඹුල් ගසක බෙනයක. දවසක් මහ සුළඟක් ඇවිත් ඒ ගස කඩා වැටුණා. සුළඟට හසුවෙලා ගිරා පැටව් දෙන්න කන්දෙ දෙපැත්තට වැටුණා. එක පැත්තක තිබුණෙ හොර ගුහාවක්, එක ගිරා පැටියෙක් වැටුණෙ ඔවුන්ගෙ ආයුධ ගොඩට. හොරු ඒ ගිරා පැටියා සත්තිගුම්බ කියල නම් කරලා ඇතිදැඩි කළා. කන්දෙ අනෙක් පැත්තෙ තිබුණෙ තාපසාරාමයක්. අනෙක් ගිරා පැටිය වැටුණේ එතන මල් ගොඩට. තාපසයො ඒ පැටියට පුෂ්පක කියලා නම තබාගෙන ඇතිදැඩි කළා.



මේ අතරෙ දවසක් පඤ්චාල රටේ රජතුමා පිරිවරත් සමග ඒ කැලේට ගියා දඩයමේ. කාගෙ හෝ ළඟින් සතෙක් පැනල ගියොත් එයාට දඩ ගහනව

කියල ඒ දඩයමේ සම්මුතියක් තිබුණා. එදා හරියට ම රජතුමා ළඟින් මුවෙක් පැනල ගියා. රජතුමාට හරිම ලැජ්ජාව. එතුමා රියදුරත් එක්ක අශ්වරථයෙන් මුවා ලුහුබැන්ද. ඒත් මුවා හමුවුණේ නැහැ. රජතුමා අතරමං වුණා. එතුමාට හරි වෙහෙසයි. රියදුරා ගසක්මුල පලසක් අතුරල දුන්නා. රජතුමා එහි මඳක් ඇලවුණා. එකවරම අමුතු හඬක් ඇහිලා රජතුමාට ඇහැ ඇරුණා. එවිටයි දැක්කෙ එතන හොර ගුහාව. ඒ වෙලාවෙ හොරු හිටියෙ නැහැ. හොරකමේ ගිහිල්ලා. පතිකෝලම්බ කියන මුරකාරයා යි, ගිරව යි විතර යි හිටියේ. ඒ ඇහුණෙ ගිරවගෙ හඬ.

## නපුරු ඇසුරක නපුරුකම

''ඒයි, ඒයි, පතිකෝලම්බ, අන්න, අන්න, කවුදෝ ගහක් මුල මහදවල් නිදි, නළල්පට බැඳලා රන් ආභරණ පැළඳගෙන ඉන්නෙ. රජ කෙනෙක්, ඉර වගේ බබලනවා. ඉක්මන් කරමු, ඔක්කොම බඩු පැහැරගෙන මරල, කොළ අතුවලින් වහල දමමු.'' කියල ගිරව කෑ ගහනවා. අහර පිසිමින් සිටි පතිකෝලම්බ එළියට ඇවිත් බලලා ''ඒයි සත්තිගුම්බ නුඹ දොඩවන්නේ පිස්සුවෙන් ද? රජවරු කියන්නේ ගින්දර වගේ, අපට කිට්ටුවෙන්නවත් පුළුවන් ද?'' කියල ගිරවට බැණ වැදුණා,

මේ කතාබහ ඇහිල රජතුමා කලබල වුණා. ''මිතුරු රියදුර, ගිරවගේ කතාව නම් සුබ නැහැ, අපි ඉක්මනින් වෙන තැනකට යමු.'' කියල එතැනින් පිටවුණා. ඒක දැකල ගිරවා ආයෙත් කෑගහන්න පටන්ගත්තා.

''කෝ, කෝ, මෙතන හිටිය හොරු කොහේ ගිහින් ද ඕන වෙලාවට මුන් නැහැ, අන්න අර පඤ්චාලය පැනල යනවා, දුනු ගනිල්ලා, හෙල්ල ගනිල්ලා, ලුහු බැඳපල්ල, පඤ්චාලයට පණ පිටින් නම් යන්න දෙන්න එපා''. කිය කියා රජු නොපෙනී යන තුරුම සත්තිගුම්බ මොර දුන්නා.

## මෙන්න ආගන්තුක සත්කාරය

රියදුරත් සමග එතැනින් මග හැරගිය රජතුමා කන්දෙ අනෙක් පැත්තට ගියා. එතන තාපසාරාමය. එතනත් තවුසො හිටියෙ නැහැ. ගිරවා විතරයි සිටියේ. තවුසන් ආගන්තුකයන්ට සලකන හැටි දැකල පුරුදු ගිරව පෙරගමන් කරලා රජතුමා සාදරයෙන් පිළිගත්තෙ මෙහෙම යි.

''දේවයන් වහන්ස, ඔබතුමා සැපත් වීම කොතරම් අගේ ද, අපෙත් රජතුමා ඔබයි. ඔබතුමා පැමිණියේ අපේ පිනට, (එන්න, අසුන් ගන්න,) ඔබතුමාට අපෙන් කෙරෙන්න ඕන රාජකාරිය කුමක් ද යි වදාරන්නැ'' යි කීවා.

ඒ කතාව ගැන රජතුමාට පුදුමයි, ඒ වගේම සතුටුයි.

ඊළඟට රජුට කුසගිනි ඇතැයි සිතූ ගිරවා,

''දේවයන් වහන්ස, මෙන්න තිඹිරි ගෙඩි, මොර ගෙඩි, මී ගෙඩි, එරමිනිය ගෙඩි තිබෙනවා. මේවා පුංචි වුණාට රසයි අනුභව කරනු මැනවැ'' යි කියා තවුසන් තමාට දී තිබුණු පළතුරු රජතුමාට පෑවා. ඒ වගේම,

දේවයන් වහන්ස, මේ පැන් හරිම සීතලයි ගිරි කඳුරැවලින් ගෙනා පැන් කැමතිනම් බොනු මැනවැයි'' කියා පැන් තිබෙන තැනත් පෙන්නුවා,

බලන්න, මේ ගිරව තමන්ට හරිහැටි ආගන්තුක සත්කාර කරන්න බැරි වීම නිසා දුක් වෙන හැටි. ඔහු කියනවා,

''දේවයන් වහන්ස, මෙහේ ඉන්න තවුසො පලවැල සොයන්න කැලේට ගිහින්, ඔබතුමා ම නැගිටල පිළිගන්න. ඔබතුමාට මේවා පිළිගන්වන්න අනේ මට අත් දෙකක් නැහැ නේ'' කියලා.

මේ ගිරවා ගැන හොඳට ම පැහැදුණු රජතුමා අනෙක් ගිරවගෙන් තමාට වුණු ඇබැද්දිය ගැන කියල ''ඒ ගිරව හරි නපුරැයි. ඒත් ඔබනම් හරි කරුණාවන්තයි'' කීවම ගිරවා කියනවා;

''දේවයන් වහන්ස, අප දෙන්න එක මවුකුසේ උපන්න, එකම ගසේ වැඩුණු සොහොයුරෝ. සුළඟට අප දෙන්න දෙපැත්තට වැටුණා. ඔහු සොරුන් ළඟ, මා තවුසන් ළඟ, ඔහු අසත්පුරුෂයන් ළඟ; මා සත්පුරුෂයන් ළඟ, අප දෙන්න ඒ දෙපළෙ හැටියට හැඩ ගැසුණා.

එතන තිබෙන්නේ, වධ හිංසාව, බන්ධනය, රැවටිල්ල, කපටිකම, ගම් පැහැරීම, බලහත්කාරකම වගේ දේවල්. ඔහු ඒවා පුරුදු වෙනවා.

මෙතන තිබෙන්නේ, සත්‍යය, ධර්මය, අහිංසාව, සංවරය, ඉන්ද්‍රිය දමනය වගේ දේවල්. දේවයන් වහන්ස, මා ආගන්තුකයින් ආදරයෙන් පිළිගෙන, බීමට පැන්, හිඳගන්නට අසුන් දීල වතාවත් පුරන පිරිසකගෙ ඇකයේ හැදුණෙ.

ඊළඟට පුෂ්පක ගිරවා, ආශ්‍රය කියන එක කෙනෙකුට හොඳට වගේම නරකටත් බලපාන හැටි මෙහෙම කියලා දුන්නා.

**යං යං හි රාජ භජති සතං වා යදි වා අසං,**
**සීලවන්තං විසීලං වා වසං තස්සෙව ගච්ඡති**

දේවයන් වහන්ස, කවුරුන් හෝ කෙනෙක්. සත්පුරුෂයා ය, අසත්පුරුෂයා ය, සිල්වතා ය, දුස්සීලයා ය කියන මේ කුමන විදියෙ කෙනෙකු ඇසුරු කළත්, ඔහුත් ඒ විදියේම කෙනෙක් වෙනව.

**යාදිසං කුරුතෙ මිත්තං යාදිසඤ්චූපසෙවති**
**සොපි තාදිසකො හොති සහවාසො හි තාදිසො**

ඒ වගේම කෙනෙක් කවුරුහරි කෙනෙකු මිතුරු කර ගන්නවා නම්, කෙනෙකු ඇසුරු කරනවා නම්, ඔහුත් ඒ වගේම කෙනෙක් වෙනව. ආශ්‍රයෙ හැටි එහෙමයි.

ඊතලයකට පොවපු විෂ, ඊතල කොපුවේත් තැවරෙනවා වගේ පව්ටු කම් කරන අය ඇසුරු කරන්න ගියොත් පව්ටු කම් නොකරන අයත් ඒ ගොඩටම වැටෙනවා. ඒ නිසා නුවණැත්තො තමනුත්, නොකළ පව්වලට පැටලේ ය කියන බියෙන් පව්ටු මිතුරන්ගෙන් ඈත්වෙනවා.

**පූතිමච්ඡං කුසග්ගෙන යො නරො උපනය්හති,**
**කුසාපි පූති වායන්ති එවං බාලූපසෙවනා.**

(කුසතණ කියන්නෙ කොතරම් ශුද්ධ වස්තුවක් වුණත්) කෙනෙක් කුසතණවලින් කුණු මසක් දවටගෙන ගියොත් කුසතණත් ගඳ ගහනවා. බාලයන් ඇසුරු කිරීමත් ඒ වගේ තමයි.

තගරඤ්ච පලාසෙන යො නරො උපනය්හති,
පත්තාපි සුරභි වායන්ති එවං ධීරූපසෙවනා.

කෙනෙක් කොලයකින් තුවරළා දවටගෙන ගියොත් ඒ කොළයත් සුවඳ හමනවා. නුවණැත්තන් ඇසුරු කිරීමත් ඒ වගෙයි.

ඒ නිසා පින්වතුනි, ඔබගේ පවිටු මිතුරන්ගෙන් ප්‍රවේශම් වෙන්න. කළණ මිතුරන් ම ඇසුරු කරන්න. ඔබ සැමට තිසරණ සරණයි !

### ක්‍රියාකාරකම 13.1

සුදුසු වචන යොදා පහත සඳහන් වැකිවල හිස්තැන් පුරවන්න.

1. බුදුන් වහන්සේට ප්‍රතිකාර කරන ලද්දේ ............................ නම් වෛද්‍යවරයා විසිනි.
2. දෙව්දත් තෙරණුවන් බුදුන් වහන්සේට ගලක් පෙරළන ලද්දේ ...................... පර්වතය මුදුනේ සිට ය.
3. ගිරා පැටව් දෙන්නාගේ වාසස්ථානය වූයේ ........................ ගස් බෙනයක ය.
4. සුළඟින් පාවී ගොස් අවි ආයුධ ගොඩට වැටුණේ ............................ ගිරා පැටවා ය.
5. ගිරා පැටියා ................................ දන්නා පිරිසකගේ ඇකයේ වැඩුණේ ය.
6. බුදුරජාණන් වහන්සේ බලන්න සෙනග පැමිණීම උන්වහන්සේගේ ............................ ට බාධාවක් වුණා.
7. සොර කණ්ඩායමේ මුරකරු ............................ යි.
8. රජුගේ වෙහෙස නිවා ගැනීමට රුක් සෙවණක පළසක් එලන ලද්දේ ............................ විසිනි.
9. රජුට මුලින් ම මුණ ගැසුණේ ............................ නම් ගිරා පෝතකයා ය.
10. යමෙකුගේ යහපත් බව හෝ අයහපත් බව ............................ නිසා සිදු වෙයි.

## ක්‍රියාකාරකම 13.2

1. මේ ජාතක කතාවේ සඳහන් ගාථා අරුත් සහිතව වනපොත් කරන්න.

2. ගිරා පැටියාගේ ආගන්තුක සත්කාරය අගය කරමින් පන්තියේ සංවාදයක් පවත්වන්න. (කාගේත් අදහස් විමසන්න)

### ජීවිතයට ඔවදනක්

**"උදාර චරිතානාංතු
වසුධෛව කුටුම්බකම්"**

උදාර චරිත ඇති අයට මුළු ලොව එකම පවුලකි.

# 14 මව්පියන්ට සැලකීමත් මහණ කමකි
## (සාම ජාතකය)



අද ජාතක දේශනාව සඳහා මා තෝරාගත්තේ මාපිය උපස්ථානය ගැන කියවෙන සාම ජාතකය යි. සෑම දෙනාම සැදැහැයෙන් තැන්පත්ව හොඳින් සවන් දෙන ලෙස කරුණාවෙන් සිහිපත් කරනවා. අපි මුලින්ම මේ ජාතකය දේශනා කරන්නට හේතු වුණු වර්තමාන කථාව අහල බලමු.

පින්වත්නි, සැවැත්නුවර ධනවත් සිටු පවුලක් සිටියා. ඒ පවුලට සිටියේ එකම පුතෙක් පමණයි. බුදුරජාණන් වහන්සේගෙන් බණ අසා පැහැදුණු ඔහුට පැවිදිවෙන්නට සිතුණා. ඒත් දෙමාපියන්ගෙන් අවසර ලැබුණෙ නැහැ. ඔහු සතියක්ම නිරාහාරව උපවාසයක යෙදිලා අමාරුවෙන් අවසර ලබාගෙන ගොස් පැවිදි වුණා. හරිහැටි මහණකම කරන්න ඕනැයි හිතල උන්වහන්සේ ඈත පිටිසර පළාතකට ගිහින් බණ භාවනා කළා. මෙහෙම කලක් ගත වුණා. මව්පියන් වයසට ගියා. බලන්න කියන්න කෙනෙක් නැති නිසා කුඹුරු ඉඩකඩම් භාරදීල හිටපු අයම අයිති කරගත්තා. ගෙදර තිබුණු සියලු දේත් දැසි දස්සන් රැගෙන ගියා. අන්තිමේ දී සිටු දෙමහල්ලන් සිඟමනට වැටුණා.

මේ වනවිට ඒ පුතණුවන් පැවිදි වෙලා වසර දොළහක් විතර ගතවෙලා. ඒත් කිසිම පලයක් ලබලා නෑ. සැවත් නුවර සිට වැඩම කළ වෙනත් හිමි නමකගෙන් දෙමාපියන් පිළිබඳ මේ කණගාටු දායක ආරංචිය උන්වහන්සේ ගේ කණ වැකුණා. හිත්වේදනාව වැඩි කමටම සිවුරු හැරගොස් මව්පියන්ට සලකන්න උන්වහන්සේ තීරණය කළා. සැවැත් නුවරට ගිහින් මුලින් ම බුදුහාමුදුරුවන්ගෙන් අවසරගෙන යන්න සිතුවා. උන්වහන්සේගේ සිත දුටු බුදුරජාණන් වහන්සේ මාතුපෝසක සූත්‍රයෙන් මව්පිය උපස්ථානය ගැන ම එදා දහම් දෙසුවා. එයින් කියවුණේ පැවිදි ව සිටියත් මව්පියන්ට උපස්ථානය කළ යුතු බවයි. බණ අසන ගමන් උන්වහන්සේ ට මෙසේ සිතුණා. මා සිතුවේ ගිහිවෙලා මව්පියන් රැකබලා ගන්නයි. බුදුරජාණන් වහන්සේ පැවිදිව සිටිමින් ම මව්පිය උපස්ථානය කළ හැකි බව වදරනවා. යම් විධියකින් මා බුදුන් නොදැක ගියානම් පැවිද්දෙන් පිරිහෙන්නත් ඉඩ තිබුණා. දැන් මා මහණකමේ ඉඳගෙනම මව්පියෝ දෙදෙනා රැක බලාගන්නවා. මෙහෙම හිතලා උන්වහන්සේ එතැන්පටන් සිඟාගත් ආහාරපානාදියෙන් මව්පියන් පෝෂණය කරන්නට පටන්ගත්තා.

මේ ගැන හරිහැටි නොදත් අනෙක් හාමුදුරුවරු බුදුරජාණන් වහන්සේ හමු වී ස්වාමීනි, අර හාමුදුරුවෝ සැදැහැතියන් දෙන සිවුපසයෙන් ගිහියන් නඩත්තු කරතියි කියා සිටියා. බුදුරජාණන් වහන්සේ උන්වහන්සේ ගෙන්වා මෙය සැබෑදැයි විමසුවා. උන්වහන්සේ එය සැබෑ බව පිළිගත්තා. ඊළගට ඔබ සැලකුවේ කාටදැයි බුදුරජාණන් වහන්සේ ඇසුවා. ස්වාමීනි අසරණව සිටින මගේ මව්පිය දෙදෙනා යැයි උන්වහන්සේ කියා සිටියා. බුදුරජාණන් වහන්සේ එය අසා තුන්වරක් සාධුකාර දීල මහණ, ඔබ මා ගිය මගමයි ගොස් තිබෙන්නේ. මමත් සසර සැරිසරණ කාලේ මේ විදියට මව්පියන් රැක්කෙමි'' යැයි වදළා. ඒ අසා සිටි හාමුදුරුවරු ''අපිත් ඒ කථාව අසනු කැමැත්තෙමු'' යි පැවසුවාම බුදුරජාණන් වහන්සේ මේ ජාතක කථාව දේශනා කළා.

යටගිය දවස බරණැස්පුරට නුදුරු ගංගාවක් දෙපස වැදි ගම්මාන දෙකක් තිබුණා. එක් ගමක නායක ගෙදර දුකුල නම් පුතෙක් සිටියා. අනෙක් ගම් නායක ගෙදර පාරිකා නම් දුවක් සිටියා. මේ දෙදෙනා ම පෙර භවයෙහි බඹලොව සිට පැමිණ මිනිස් ලොව උපන් අයයි. ඒ නිසා තරුණ වයසේදී වත් ඔවුන්ට කම් සැපයෙහි ආශාවක් තිබුණේ නැහැ. වැදි පවුලක උපන්නත් ප්‍රාණඝාත කළේත් නැහැ. එහෙත් පවුල් දෙකෙහි දෙමාපියන් අතර තිබුණු

කතිකාවතක් නිසා දෙදෙනාට ම විවාහ වීමට සිදුවුණා. කම් සැප විඳීමේ ආසාවක් නැති ඒ දෙදෙනා ම ගිහිගෙය හැරගොස් තවුස් පැවිද්දෙන් පැවිදිව හිමාලයේ මිගසම්මත නම් ගඟ අසල තවුස් දම් පිරුවා. ඒ දෙදෙනා ම ඉතා සිල්වත්, ගුණවත්, බ්‍රහ්මලෝකයේදී වගේම කරුණාවෙන් මෛත්‍රියෙන් පිරිල, ඔවුන් ඇසුරෙහි සිටි තිරිසන් සතුන් අතරෙහි පවා නපුරුකම් අඩුවෙලා ගියා.

මේ දෙදෙනාට කර්ම විපාකයක් නිසා ඇස් අන්ධවීමේ අනතුරක් තිබුණා. මේ දුටු සක් දෙව් රජතුමා කවදා හෝ දවසක උපස්ථාන කරන්නට දරුවෙක් බිහිකරන්නැයි ඉල්ලා සිටියා. එයට ඔවුන් කැමති වුණේ ම නැහැ. අන්තිමේදී දෙව් රජුගේ ඉල්ලීම පරිදි දුකූල තාපස තුමා පාරිකා තාපසතුමියගේ නැබ පිරි මැදීමෙන් දරුගැබක් හටගත්තා. දසමසක් ඇවෑමෙන් පුත් කුමරෙක් බිහි වුණා. ඔහු රන්වන් පාටයි. ඒ නිසා ඔහුට සාම යැයි නම තැබුවා.

මව්පියන් වගේම මේ පුංචි කුමාරයත් හරිම සිල්වත්, ගුණවත්. ඒ වගේ ම කරුණා මෛත්‍රිය උතුරාගිය කෙනෙක්. කැලේ සිටිය සිවුපා සත්තු කොච්චර නපුරු වුණත් කුමාරයට හරි හීලයි. සිව්පාවෝයි කුරුල්ලෝයි තමයි ඔහුට සිටි යාළුවෝ. සොළොස් වියේ දී කුමාරයත් තවුසෙක් බවට පත්වුණා. ඒත් දිගටම පලවැල නෙළාගෙන ඇවිත් කුමාරයා කවා පොවා ඇති දැඩි කළේ මව්පියෝ ම යි. මෙහෙම පලවැල නෙලන්න ගිය දවසක හදිසියේ වැස්සක් ඇදහැලුණා. මේ දෙදෙනා ගසකට මුවා වී සිටියා. ඒ ගස මුල තුඹසකුත් තිබුණා. ඔවුන්ගේ ඇඟට වැටී රූරාගිය දියබිඳු ඒ තුඹසේ සිටි නාගයාගේ නාස් පුඩුමතට වැටුණා. කුපිත වූ නාගයා විෂ දුමක් පිටකළා. එයින් දෙදෙනාගේ ම ඇස් අන්ධ වුණා. එයට හේතුව පෙර කර්මයක්, එක් කළෙක මේ පියා වෙදදුරෙක්. ඔහු ඇස් දුර්වල වූ කෙනෙකුට වෙදකම් කළා. පෙනීම ලැබුණා. එහෙත් රෝගියා වෙදකමට මුදල් ගෙවීම මගහැරියා. ඒ නිසා වෙදදුරා බෙහෙතක් දී නැවත ඔහුගේ ඇස් අන්ධ කළා. එය බිරිඳත් අනුමත කළා. දෙදෙනාගේ ම ඇස් අන්ධ වුණේ ඒ කර්මය නිසයි. ඔවුන්ට අසපුවට යන පාර සොයාගන්න බැරිව වනයේ අතරමං වුණා. මව්පියන් පමාවන්නේ ඇයිදැයි සොයන්නට ගිය සාම කුමාරයාට ඒ මේ අත ඇවිදිමින් හඬා වැළපෙන මාපියන් හමුවුණා. දුටු හැටියේ ම කුමාරයා දුකින් හැඬුවත් ඊළඟට ඔහු සිනාසෙන්න පටන්ගත්තා. අප දුකට වැටුණු වෙලාවේ ඔබ සිනාසෙන්නේ ඇයි දැයි මව්පියෝ ඇසුවා. මෙතුවක් කල් ඔබ මාව හදාවඩාගත්තා. දැන් මට පුළුවනි ඔබට පණ තිබෙන තුරු මගේ දෑතින් උපස්ථාන කරන්න. ඒකටයි මම හිනා වුණේ කියලා කුමාරය කිව්වා.

සාම කුමාරයා සැරයැටියක ආධාරයෙන් මවුපියන් අසපුවට කැඳවාගෙන ආවා. එදා සිට ඔහු පලවැල සොයාගෙන අවුත් කවමින් පොවමින් නාවමින් මවුපියන් පෝෂණය කරනවා. දවසක් කුමාරයා පැන් ගෙනෙන්නට ගඟට ගියා. එදා පිළියක් නම් බරණැස් රජතුමා ඒ කැලයට දඩයමේ ඇවිත් හිටියා. තොටුපොළ ළඟ රැක සිටි රජතුමා මුවන් පිරිවරාගෙන එන සාම කුමාරයව දුටුවා. පුදුමයි, මෙහෙම කෙනෙක් කවදාවත් දැකල නැහැ. මිනිහෙක් ද, දෙවියෙක් ද, වෙන කවුරුවත් ද කියලා සැකයි. අල්ලගෙන ම සොයාගන්න ඕන කියලා කුමාරයව වැටෙන්න ඊයක් විද්දා. ඊ විසෙන් කුමාරයා ඇද වැටුණා. මුවන් බියපත්ව සී සී කඩ දිව්වා. කුමාරයා වේදනාවෙන් කියවන්න පටන්ගත්තා. ''මා කුඩාකල පටන් අටසිල් රකින, මෛත්‍රී වඩන කෙනෙක්. මට මේ කැලේ සතුරන් නැහැ. මගේ මසින් කෙනෙකුට වැඩකුත් නැහැ. එහෙම නම් ඇයි මට මෙහෙම සැඟවිලා විද්දේ ?''

ඒ වෙලාවේ බරණැස් රජු එතනට ආවා. ඇවිත් ඔබ කවුරුදැයි හරියට නොදැනැයි මා විද්දේ. ඔබ කාගේ කවුරුදැයි කියන්නැයි කීවා. එවිට සාම කුමාරයා තමා ගැනත් අඳ මවුපියන් ගැනත් සියලු තොරතුරු රජුට කිව්වා. එහෙම කියලා ''මෙතන මා වනයේ වැටුණු බව මව්පියන් දන්නේ නැහැ. මා පමාවෙන කොට ඔවුන් අඬා වැළපේවි. බීමට පැන් නැතුව මාළුන් මෙන් වියළී යාවි. ඇස් අන්ධ වූ දිනයේ පටන් මා ඔවුන් දවසකට දෙවරක් නාවනවා. තුන් වරක් කවනවා. අතපය තෙල්ගානවා. ඒත් දැන් දහවරක් කෑගැසුවත් ඔවුන්ට පැන් ටිකක් දෙන්නේ කවුද? සාත්තු කරන්නේ කවුද? ඒ දෙන්නා ජීවත් වෙන්නේ කොහොම ද'' යි කියමින් කුමාරයා හොඳටම වැළපුණා.

එවිට රජතුමාට මෙහෙම හිතුණා. ''මොහු මෙතන මැරුණොත් මව්පියොත් මැරෙණවා. බ්‍රහ්මචාරී තවුසන් තිදෙනෙක් මැරීමේ වරදට මට අපායේ යන්න සිද්ධවෙනවා.'' එහෙම හිතල කුමාරයට කිව්වා. ඔබ මව්පියන් ගැන හිතල නම් අඬන්න එපා. මා පණ ඇතිතෙක් ඔවුන් රකිනවා කියලා. ඊළඟට රජතුමා අසපුවට ගිහින් තමා අතින් වුණු වරද මව්පියන්ට දැන්නුවා. ඒ දෙදෙනාට ඇති වෙච්ච දුක කියන්න බැරි තරම්. සාම කුමරුන් මෙතුවක් තමන්ට කළ ඇප උපස්ථාන සිහිකරමින් හොඳටම හඬා වැළපුණා. ඒත් රජතුමා ගැන අහිතක් හිතුවේ නැහැ. රජතුමා ඔවුන් සැරයටි වාරුවෙන් සාම කුමරු සිටින තැනට කැන්දගෙන ගියා. මේ වනවිට කුමාරයාට සිහිය නැහැ. මැරුණා වගෙයි. දෙමාපියෝ කුමරුගේ ඇඟ අතගා බලා ගුණකියමින් හඬා වැළපුණා. ඉන් පසු මෑණියන් කුමරුගේ දෙපය ද පියාණන් ඔහුගේ හිස ද උකුළේ තබාගෙන මෙහෙම සත්‍යක්‍රියා කළා. ''මේ සාම කුමාරයා මෙතෙක්

බ්‍රහ්මචාරී වූ බව සත්‍යයක්. ඔහු සත්‍ය වචන කථාකළ බවත්, බොරුවක් නොකී බවත් සත්‍යයක්. ඔහු මව්පියන්ට උපස්ථාන කළ බවත් සත්‍යයක්. ඔහු කුලදෙටුවන් පිදූ බවත් සත්‍යයක්. ඒ සත්‍ය වචනයේ බලයෙන් සාම කුමරුගේ විස නැසේවා. මා විසින් ද, ඔබගේ පියාණන් විසින් ද මෙතෙක් අකුසලයක් නොකළ බවත්, කුසලයක් ම කළ බවත් සත්‍යයක්. ඒ සත්‍ය වචනයේ බලයෙන් කුමරුගේ විස නැසේවායි රෑ එළිවෙනතුරුම මවුපියො දෙදෙනා හඬමින් වැළපෙමින් සත්‍ය ක්‍රියාකළා. ඒ සත්‍ය ක්‍රියාවේ ආනුභාවයෙනුත්, පෙර මවක් වූ බහුසෝදරීනම් දෙව්දුවගේ සත්‍ය ක්‍රියා බලයෙනුත්, වනයේ දෙවියන්ගේ ආනුභාවයෙනුත් සාම කුමාරයාට සිහිය ලැබුණා. එවිට ම මව්පියන්ගේත් ඇස් පෙනෙන්න වුණා. ඉරත් උදා වුණා. අන්තිමේ දී සාම කුමාරයා තමන්ගෙන් වූ වරදට කම්පා වී සිටි රජුට මෙත් වඩා පංචශීලයෙහි පිහිටෙව්වා. අනතුරුව මේ ජාතියේදීම දෙමාපියන්ට උපස්ථාන කළ අයට දෙවියන් පිහිට වූ සැටිත් තමාට ජීවිතය ලැබුණු සැටිත් මව්පියන්ගේ ඇස් ලැබුණු සැටිත් ඔබ සියසින් ම දුටුවේ නොවේ දැයි කියා රජුට අනුශාසනා කොට දස රාජ ධර්මයෙන් රාජ්‍ය කරන ලෙස කියා සමුදී නුවරට පිටත් කර හැරියා. සාම කුමාරයාත් දිවිහිමියෙන් දෙමාපියන්ට උපස්ථාන කොට දස පින් කිරියවත් පුරමින් මෛත්‍රී වඩා බඹලොව උපන්නා.

බුදුරජාණන් වහන්සේ මෙසේ මේ ජාතකය ගෙන හැර දක්වා වද ාරා දෙමාපියන් රැකබලා ගැනීම නම් නුවණැති උත්තමයන් අතර පෙරසිට පැවතගෙන එන උතුම් ගුණයැකැයි දේශනා කළා. දේශනාව අවසානයේ මව්පිය උපස්ථානය කළ හාමුදුරුවෝ සෝවාන් ඵලයට පත් වුණා.

පින්වත්නි, එදා පිළියක් රජතුමා නම් ආනන්ද හාමුදුරුවෝ යි. දිව්‍යාංගනාව වුණේ උප්පලවණ්ණා තෙරණිය යි. සක්දෙව් රජතුමා අනුරුද්ධ මහරහතන් වහන්සේ ය. දුකුල පියාණන් වුණේ කාශ්‍යප මහරහතන් වහන්සේ ය. පාරිකානම් මැණියෝ වුණේ භද්දාකාපිලානි තෙරණිය යි. සාම කුමාරයා නම් අප තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ය.

**ක්‍රියාකාරකම 14.1**

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1. මව්පියන්ට උපස්ථාන කළ භික්‍ෂුවට බුදුන් වහන්සේ දේශනා කළ සූත්‍රය කුමක් ද?
2. සාම කුමරුගේ මවගේ සහ පියාගේ නම් මොනවා ද?

3. සාම කුමරු විසූ වනය අසලින් ගලා ගිය ගඟ කුමක් ද?
4. සාම කුමරු තවුස් වෙස් ගත්තේ කිනම් වයසේ දී ද?
5. සාම කුමරුගේ මව්පියන්ගේ දෙනෙත් අන්ධ වූයේ කෙසේ ද?
6. සාම කුමරුට ඊයකින් විදින ලද්දේ කවුද?
7. සාම කුමරු සිහිසුන් වූ විට යහළු මුව රැළ කළේ කුමක් ද?
8. සිහිසුන් වූ සාම කුමරු නැවත සුවපත් වූයේ කෙසේ ද?
9. මුවන්ට අමතරව සාම කුමරුට සිටින්නට ඇතැයි සිතිය හැකි යහළුවන් කවුරුන් ද?
10. අන්ධ මව්පියන් නැවත සුවපත් වූයේ කෙසේ ද?

## ක්‍රියාකාරකම 14.2

"සාම කුමරු හොඳ ළමයෙකි" හොඳ ළමයෙක් වීමට සාම කුමරුගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ 5 ක් ලියන්න.

## ක්‍රියාකාරකම 14.3

"මව්පිය උපස්ථානය" යන මාතෘකාවෙන් පිරිවෙණේ බිත්ති පුවත්පතට ලිපියක් සකස් කරන්න.

### පුහුණුවට

**ද්වින්නාහං භික්ඛවෙ න සුප්පතිකාරං වදාමි. කතමාහි ද්වීහි? මාතුච්ච පිතුච්ච**

මහණෙනි, උපස්ථාන කොට සෑහීමකට පත් විය නොහැකි දෙදෙනෙක් සිටිති. ඒ මව සහ පියා ය.

- අංගුත්තර නිකාය -

# 15 අප වඩා සිටුවන වැඩිහිටියෝ (තිත්තිර ජාතකය)

ශ්‍රද්ධාවන්ත පින්වතුනි, අද ඔබ මේ සූදානම් වන්නේ වෙනදා වගේම ජාතක දේශනාවකට ඇහුම් කම් දීමටයි. අද මා දේශනාවට තෝරා ගත්තේ තිත්තිර ජාතකය යි. එයින් කියවෙන්නේ වැඩිහිටියන්ට සැලකීම ගැන යි. මව්පියෝ වැඩිහිටියෝ, මව්පියන්ගෙත් මව්පියෝ, ආච්චිලා, සීයලා වැඩිහිටියෝ, ගුරුවරු වැඩිහිටියෝ මේ වාගේ අපි දන්න නොදන්න, හඳුනන නොහඳුනන අපමණ වැඩිහිටියෝ අපේ එදිනෙදා ජීවිතයේදී අපට හමුවෙනවා ඒ වැඩිහිටියෝ තමයි. ලෝකේ හදළ දෙන්නේ, මග පෙන්නල දෙන්නේ, අපව රැක බලාගන්නේත් ඒ වැඩිහිටියෝ තමයි. වැඩිහිටියන් නැතුව අපට ජීවිතයක් නැහැ. මේ කාරණය සිතේ තබාගෙන කවුරුත් ඉතා ඕනෑ කමින් මේ දේශනාවට ඇහුම් කම් දෙනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

## වත්මන් පුවත

අනේපිඬු මහ සිටුතුමා ජේතවනාරාම මහා විහාරය කරවා එය පූජා කිරීමේ උත්සවයට බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට ආරාධනා කළා. බුදුහාමුදුරුවෝ මහා සංඝයා පිරිවරාගෙන රජගහනුවර සිට සැවැත් නුවර බලා වැඩම කළා. මේ සංඝයා අතර ඡබ්බග්ගිය කියලා ටිකක් නොහික්මුණු හාමුදුරුවරු හය නමක් හිටියා. උන්වහන්සේලාට එවැනි ම ගෝල පිරිසකුත් හිටියා.



ඒ ඇත්තෝ අනෙක් සංඝයාට කලින් ඉක්මනින් සැවැත් නුවර ජේතවනාරාමයට ගියා. ගිහින් හොඳ හොඳ කාමර තමන්ගේ ආචාර්ය උපාධ්‍යායන් වහන්සේලාට කල් ඇතිව ම වෙන්කර ගත්තා. බුදුරජාණන්වහන්සේ සමග වැඩම කළ භික්ෂූන් වහන්සේලා කාටත් ආසන පහසුකම් ලැබුණා. සැරියුත් මහ රහතන් වහන්සේ අතර මගදී ලෙඩවෙන, ගමන් අපහසුව ඇති දුර්වල භික්ෂූන් වහන්සේලාටත් ඇප උපස්ථාන කරමින් කාටත් පසුවයි ජේතවනාරාමයට වැඩියේ. ඒ වනවිට ආසන සියල්ල පිරිලා ඉන්න තැනක් තිබුණෙත් නැහැ ඒ නිසා උන්වහන්සේ ගසක් මුල රෑ ගත කළා. අලුයම සක්මන් කරන්න වඩින බුදුරජාණන් වහන්සේට සැරියුත් හාමුදුරුවන් හමුවුණා. ගසක් මුල වැඩ ඉන්නේ ඇයි දැයි ඇසුවාම ආසන ඉතිරි වී නොතිබුණ බව සැරියුත් හාමුදුරුවෝ පැවැසුවා. ඒ වෙලාවෙ බුදුහාමුදුරුවන්ට "දැන් මා ජීවත්ව සිටියදී ම භික්ෂූන් වහන්සේලා ඔවුනොවුන්ට ගෞරවයක් නැතිව, ඔවුනොවුන් කෙරෙහි පිහිට වීමක් නැතිව වාසය කරන්නේ නම් මා පිරිණිවන් පෑවාම මොනවා නොකරත් ද" යි ධර්ම සංවේගයක් ඇති වුණා. පසුදා උදෑසන බුදුරජාණන් වහන්සේ සංඝයා රැස්කරවා සැබෑද, "මහණෙනි, ඡබ්බග්ගිය භික්ෂූන් වහන්සේලා කල් ඇතිව පැමිණ වැඩිහිටි තෙරවරුන්ට සෙනසුන් අහිමි කළාද" යි විමසුවා. ඒ සැබවැයි කීවිට ඡබ්බග්ගිය භික්ෂූන්ට අවවාද කරළා මෙසේ විමසුවා.

මහණෙනි, මූලාසනය මුලින්ම පැන් පිළිගැන්වීම, ආහාරයේ ප්‍රථම භාගය ලැබීමට සුදුස්සා කවුරු ද? එවිට සමහර භික්ෂූන්වහන්සේලා ක්ෂත්‍රිය කුලය වගේ උසස් කුල වල අය යැයි කීවා. සමහර කෙනෙක් ධර්ම ධරයන්, විනය ධරයන් හෝ ධර්ම කථිකයන් වහන්සේලා සුදුසුයැයි කීවා. තවත් කෙනෙක් ප්‍රථම ධ්‍යානාදී ධ්‍යාන ලැබූ අය සුදුසු යැයි කීවා. සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අරහත් ශ්‍රමණයන් හතරදෙනා තමයි මේ සාසනයේ වැදගත් ම සතර දෙනා, ඒ නිසා අග්‍රාසනය අග්‍රපිණ්ඩය ලැබීමට හොඳම සුදුස්සන් මාර්ග ඵල ලාභීන් යැයි බොහෝ දෙනෙක් කීවා. එවිට බුදුරජාණන් වහන්සේ "මහණෙනි මේ තථාගත සාසනයේ අග්‍රාසන, අග්‍රභෝජන, අභිවාදන, පච්චුට්ඨාන (හුනස්නෙන් නැගිටීම), අඤ්ජලිකම්ම (දොහොත් මුදුන් දී වැඳීම), සාමීචිකම්ම (වතාවත් කිරීම) යන මේ සියල්ලට මුලින් ම සුදුසු කම් ලබන්නේ මේ කියන ලද කිසිකෙනෙකුන් නොවේ. මේ සියලු පූජා ගරුසත්කාර කළ යුත්තේ වැඩිහිටි පිළිවෙලට ම යි. සෑම දේකදී ම මුල්තැන ලැබිය යුත්තේ වැඩිහිටි භික්ෂුවට යි. සැරියුත් තෙරුන් වහන්සේ මාගේ අග්‍රශ්‍රාවකයා යි. මා පැවැත් වූ ධර්ම චක්‍රය ඊළඟට පැවැත්වූයේ උන්වහන්සේ ය. මා ළඟට සෙනසුන් ලැබිය යුත්තේ උන්වහන්සේ ය.

එහෙත් ඊයේ රාත්‍රියේ උන්වහන්සේ සෙනසුනක් නැතිව ගසක් මුල ගත කර තිබේ. මේ ශ්‍රමණයන් අතර පමණකුත් නොව තිරිසනුන් අතර තිබුණු ගුණ ධර්මයැකැයි උතුම් ආචාර ධර්මය කැ'' යි වදාරා මේ ජාතක කථාව දේශනා කළ සේක.

## යටගිය පුවත

එකමක් එක කාලයක හිමාලය කඳු පාමුල එක මහා නුග ගසක් ඇසුරු කරගෙන යහලුවන් තිදෙනෙක් වාසය කළා. එනම් තිත්වටුවෙක්, වඳුරෙක් සහ ඇතෙක්. මේ තිදෙනා හොඳ යාලුවන් වුණාට කිසිකෙනෙකුට ගරුකිරීමක් කිසිකෙනෙකුට කීකරු වීමක් කිසිකෙනෙකුට අවනත වීමක් තිබුණේ නැහැ. යහලු කම් කරන වේලාවට යහලු කම් කළා. අනෙක් වෙලාවට එකිනෙකා ගැන සැලකිල්ලක් නැතිව තමන්ට කැමැති විදියට හිටියා.

මෙහෙම කලක් ගතවෙන විට ඔවුන්ට ම හිතුණා අප මෙහෙම විසීම හොඳ නැහැ. අපේ වැඩිහිටියෝ කවුදැයි සොයා ගෙන ඔවුන්ට වැදුම් පිදුම් කරමින් ගරු සරු කරමින් වාසය කරනවනම් ඔහුගේ උපදෙස් අනුව ක්‍රියාකරනවා නම් තමයි හොඳ කියලා හිතුණා. ඒ නිසා තමන් අතරින් වැඩිහිටියා කවුදැයි තෝරා ගන්න තීරණය කළා. ඒකට ඔවුන් අපූරු උපක්‍රමයක් යොදා ගත්තා. ඒක තමයි තමන් වාසය කළ නුගරුක ගැන වැඩිම කළක් දන්නා කෙනා සොයා ගැනීම.

ඇඟපතින් නම් ලොකුම කෙනා ඇතා. ඒ නිසා අනෙක් අය සිතුවේ වැඩිහිටියා වෙන්නේ ඇතා කියලා. ඒ නිසා මුලින් ම අනෙක් දෙදෙනා ඇතාගෙන් ඇසුවා මේ නුග ගස ගැන ඔබ කොතරම් කාලයක සිට දන්නවාද කියා. ඇතා කිව්වා ''මම තරුණ ඇත් පොව්වෙක්ව ඉන්න කාලේ මේ නුග පඳුර උඩින් මම ගියා එවිට මෙය මගේ බඩේ ගෑවෙන නොගෑවෙන තරම් ඇති'' කියලා. ඊළඟට ඇතාත් තිත් වටුවාත් වඳුරු යාලුවාගෙන් ඇහුවා ඔබ කොපමණ කාලයක ඉදන් මේ නුග ගස ගැන දන්නවද කියලා. එවිට වඳුරා කියනවා යහලුවනි, මම වඳුරු පැටියෙකුව ඉන්න කාලේ බිම ඉදගෙන බෙල්ල ඔසවන්නෙත් නැතිව මේ නුග පැලයේ දල්ල කෑ බව මට මතකයි. ඒ තරම් කාලක ඉඳලා මේ ගැන දන්නව'යි කීවා. මේ කථාවෙන් තේරුණේ කඳ විශාල නොවුණාට ඇතාට වඩා වඳුරා වැඩිමහලු බවයි.

තුන්වෙනුව ඇතත් වඳුරාත් එකතුවෙලා වටු යාළුවාගෙන් ඒ ප්‍රශ්න ඇසුවා. බලන්න ඔහු දීපු උත්තරේ. ''යහළුවනි, ඉස්සර අන්න අර පැත්තේ

එක තැනක මහා නුග රුකක් තිබුණා. මම ඒකෙන් ගෙඩියක් කාලා අවුත් වසුරු හෙලුවේ මෙතන. එයින් තමයි මේ නුග රුක හටගත්තේ. ඒ නිසා මම මේ නුග රුක ගැන දන්නේ, මේක පැලවෙන්නටත් කලින් ඉඳලයි කියලා තිත්වටුවා කිව්වා. අන්තිමේ එයින් හෙළදරව් වුණේ තුන්දෙනාගෙන් ම වැඩිහිටියා මේ පුංචි වටු යාළුවා බවයි.

ඒක අහළා ඇතත් වඳුරත් තිත්තිර පණ්ඩිතයන්ට මෙහෙම කීවා. ''යහළුව, ඔබ තමයි අප තුන්දෙනාගෙන් ම වැඩිමහලු කෙනා. ඒ නිසා අප දෙන්නා මෙතැන් පටන් ඔබට සත්කාර ගරුකාර සම්මාන වැඳුම් පිදුම් කරනවා. ඒ වගේම නමස්කාර කිරීම, හුනස්නෙන් නැගිටීම, ඇඳිලිබැඳ වැඳීම, වතාවත් කිරීම ආදියත් කරනවා. එපමණක් නොවෙයි, අපි නිතරම ඔබගේ අවවාද අනුශාසනාවලට අනුව කටයුතු කරනවා. මින් මතු ඔබ අපට අවවාද අනුශාසනා කරන්න'' කියලා.

එතැන් පටන් තිත්තර පණ්ඩිතයාණන් අනෙක් දෙදෙනාට අවවාද අනුශාසනා කළා. තිදෙනා ම සිල් සමාදන් ව වාසය කළා. ඔවුනොවුන් ගරු කරමින් ඇප උපකාර කරමින් ඔවුනොවුන්ට අවනත වෙලා ජීවත්වෙලා මැරී දෙව් ලොව උපන්නා. ඔවුන්ගේ ඒ ප්‍රතිපත්තියට කියනවා **තිත්තිර බ්‍රහ්මචරියාව** කියලා.

බලන්න මහණෙනි. ඒ තිරිසන් සතුන් පවා ඔවුනොවුන්ට ගරු බුහුමන් කරමින් ඔවුනොවුන්ට ම අවනතවෙලා ජීවත් වුණා. නමුත් මේ වගේ මනාව දේශනා කළ සාසනයක පැවිදි වූ ඔබ වහන්සේලා, ඔවුනොවුන් කෙරෙහි ගෞරවයක් නැතිව ඔවුනොවුන්ට අවනත නොවී වාසය කරන්නේ කොහොම ද? ඒ නිසා මහණෙනි, අද මම මෙසේ පණවනවා, මෙතැන් පටන් ඔබවහන්සේලා වැඩිහිටි පිළිවෙළට අනුව වැඳීම, අසුනෙන් නැගිටීම, ඇඳිලිබැඳ ගරු කිරීම, වතාවත් කිරීම කළ යුතුයි.

ඒ වගේම අග්‍රාසනය අග්‍රපිණ්ඩය වැඩිහිටි පිළිවෙළට ලැබිය යුතුයි. මින්මතු කිසිදිනක බාල කෙනෙකු වැඩිහිටියෙකුට හිමි විය යුතු සෙනසුන නොවැළැක්විය යුතුයි. එසේ වැළැක්වුව හොත් දුක්කටාපත්තියක් සිදුවෙනවා'' යැයි විනය නීතියක් ද පනවා වදාරා මේ ගාථාව ද දේශනා කළා.

> **යෙ වද්ධාමපචායන්ති - නරාධම්මස්ස කොවිදා**
> **දිට්ඨෙව ධම්මෙ පාසංසා - සම්පරායෙ ච සුග්ගතිං**

මහණෙනි, ගිහි පැවිදි වේවා තිරිසන් වේවා වැඩිහිටියන්ට පිදීමටත් ගුණ ධර්මයෙහි දක්ෂ කවුරුන් හෝ කෙනෙක් ගුණවත් වැඩිහිටියන්ට වැඳුම් පිදුම් කරනවා නම් ඔවුන් මේ ජීවිතයේ දී ම කාගේත් පැසසුමට ලක්වෙනවා. මරණින් මතු දිව්‍ය මනුෂ්‍යාදී සුගතියෙහි උපදිනවා යැයි වදාරා බුදුරජාණන්වහන්සේ මේ ජාතක කථාව දේශනාව නිමකළා. පින්වත්නි එදා ඇතා වෙලා උපන්නේ මුගලන් මහ රහතන් වහන්සේ ය. වඳුරු ආත්ම භාවයේ ඉපිදිලා සිටියේ සැරියුත් මහ රහතන් වහන්සේ ය. තිත්තිර පණ්ඩිතයන් වුණේ අප මහා බෝසතාණන් වහන්සේ ය.

### ක්‍රියාකාරකම 15.1

පහත සඳහන් වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති කොටුව තුළ යොදන්න.

1. හික්මීමක් නැති භික්ෂූන් වහන්සේලා සැරියුත් තෙරුන්ට නිගරුවන සේ හැසිරුණහ. ☐
2. අනේපිඬු සිටුතුමා විසින් ජේතවනාරාමය ඉදිකරන ලද්දේ විශාලා මහනුවර ය. ☐
3. ඡබ්බග්ගිය යනු බුද්ධ කාලයේ වැඩසිටි නොහික්මුණු භික්ෂු පිරිසකි. ☐
4. සැරියුත් තෙරුන්ට ජේතවනාරාමයට වැඩම කරවීමට ප්‍රමාද වූයේ ගිලන් භික්ෂුවට උපස්ථාන කිරීමට වැඩම වූ නිසාය. ☐
5. බුදු සසුනේ පිළිගත් ක්‍රමය වන්නේ සාමාන්‍ය වයසේ පිළිවෙල ප්‍රධාන කොට සැලකීමයි. ☐
6. නුග ගසේ මුදුන් දල්ල නැබෙහි (බඩේ) ගෑවුණේ වඳුරාගේ ය. ☐
7. බෙල්ල උස් නොකොට නුග පැළයේ දලු කන ලද්දේ වඳුරා විසිනි. ☐
8. සතුන් තිදෙනාගෙන් වැඩිමහල්ලා ලෙස පිළිගෙන ඇත්තේ වටුවා ය. ☐
9. සතුන් තිදෙනා සුවෙන් කල් ගත කොට මරණින් පසු මිනිස් ආත්ම භාව ලැබූහ. ☐
10. එකල වටුවා වූයේ බුදුරජාණන් වහන්සේ ය. ☐

## ක්‍රියාකාරකම 15.2

පහත සඳහන් සුදුසු වචන යොදා ඡේදයේ හිස් තැන් පුරවන්න.

(නොරැවටීමේ, සබඳ, ගුණාංග, නුග, වැඩිහිටියා, ආදර්ශ, නොසිතා, නිහතමානි, කතාවෙන්, තනතුරේ)

තිත්තිර ජාතක කතාවෙන් සැබෑ .................................. කවුද යන්න සොයා බලා ඔහුට වැඩිහිටි .................................. තැබූ අයුරු දැක ගත හැකි විය. එම .................................. වැඩිහිටියන්ට සැලැකීමේ අගය පෙන්වා දී ඇති අතර ම, තවත් වටිනා .................................. කීපයක් පිළිබඳ මතු කර දක්වා ඇත .................................. බව ඉන් ප්‍රධාන එකකි.තම තමන් වැඩිහිටි කොට ...... ............................ එය සොයා බලා නියම වැඩිහිටියා තෝරා ගන්නා ලද්දේ නිහතමානි කම නිසා ය. එමෙන් ම .................................. ගුණය ද මේ කතාවෙන් දක්වා ඇත. සතුන් තිදෙනාම .................................. ගස ගැන ............................ ..... තොරතුරු කියන්නට ඉදිරිපත් වීමෙන් ඒ බව පෙනී යයි. මේ ආකාර ...... ............................ රාශියක් තිත්තිර ජාතක කතාවෙන් හෙළි වේ.

### පැවරුම

ආගතපටිපාටි යනු බෞද්ධ පැවිදි ජීවිතය හා සම්බන්ධ පිළිවෙතකි. මේ ගැන ගුරු හිමියන්ගෙන් තොරතුරු දැනගෙන සටහනක් සකස් කරන්න.

### පුහුණුවට

**අභිවාදනසීලිස්ස - නිච්චං වද්ධාපචායිනො**
**චත්තාරො ධම්මා වඩ්ඩන්ති - ආයු වණ්ණො සුඛං බලං**

නිතර, සිල්වතුන්ට හා වැඩිහිටියන්ට වඳින, සලකන අයට ආයුෂය, වර්ණය, සැපය, බලය යන සතර ගුණයෝ වැඩෙති.

# 16 නමස්කාරය හා සරණාගමනය

## නමස්කාරය

ඕනෑම ආගමික කටයුත්තක් ආරම්භ කිරීමේ දී මුලින් ම සිය ආගමික ශාස්තෘවරයා හෝ අදහන දෙවිවරුන් සිහිපත් කර, එය ඉටු කිරීම සියලු ආගම්වලට පොදු ලක්ෂණයකි. එය ඉෂ්ට දේවතා නමස්කාරය යනුවෙන් හැඳින්වේ. බෞද්ධයන් වන අපි සෑම කටයුත්තකදීම අපේ ශාස්තෘවරයාණන් වන බුදුරජාණන් වහන්සේ සිහිකරමු. බුදුරජාණන් වහන්සේ සිහිකරන්නේ පහත සඳහන් පහත සඳහන් පාඨය තෙවරක් කීමෙනි.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

නමස්කාරය යනු මෙය යි. වන්දනාවෙන් නිසි ඵල ලැබීමට නම් සෑම ගාථාවක ම අදහස ඒ සමග ම සිතේ ඇඳී යා යුතු ය. එම නිසා ඉහත නමස්කාර පාඨයේ අර්ථය හොඳින් නිවැරදිව ඉගෙන ගනිමු.

''ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ ට මාගේ නමස්කාරය වේවා.''

නමස්කාරය යන්නෙහි තේරුම ''වැඳීම'' යන්න යි. පැවිදි උතුමන්ට, මව්පියන්ට, වැඩිහිටියන්ට, පූජනීය වස්තුවලට ගරු බුහුමන් ඇතිව කරන වැඳීම ද නමස්කාරය ලෙස හැඳින්වේ.

## නමස්කාරය තුන් ආකාරය

### 1. උක්කුටිකයෙන් වැඳීම

එක් පාදයක පතුල බිමට සිටින සේ දණහිස මදක් ඔසවා අනෙක් පාදයේ ඇඟිලි තුඩු පමණක් බිමට සිටින සේ දණහිස නමා දොහොත් මුදුනේ තබා වැඳීම.



### 2. පසඟ පිහිටුවා වැඳීම

දෙදණ දෙවැලමිට හා නළල යන පස් තැන (අංග පහ) බිම ගැවෙන සේ තබා මුණින් නැවී කරන වැඳීම.



3. දණ්ඩ නමස්කාරය

මුළු සිරුරම බිම දිගා වන පරිදි මුනින්තලා වී කරන වැඳීම.



මෙයින් වඩා සුදුසු වැඳීම නම් පසඟ පිහිටුවා කරන වැඳීම යි.

මේ කුමන ආකාරයට වැන්දත් නෙළුම් පොහොට්ටුවක් සේ ඇඟිලි එකට බැඳ නළලේ තබා වැඳිය යුතු ය. දෑත් මුව ළඟ හෝ පපුව මත තබා, සිටගෙන වැඳීම නියම නමස්කාරය නොවේ. එය ආචාර කිරීමකි.





නමස්කාරය ආචාර කිරීම

### ක්‍රියාකාරකම 16.1

පහත සඳහන් වැකි නිවැරදි නම් (✓) ලකුණත් වැරදි නම් (✗) ලකුණත් ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

1. නමස්කාරය යනු වැඳීම යි. (..........................)
2. පසඟ පිහිටුවා වැඳීමේ දී මනාව වාඩිවිය යුතු ය. (..........................)
3. ඉෂ්ට දේවතා නමස්කාරය සෑම ආගමක ම ඇත. (..........................)
4. වැඳීමේදී නෙළුම් පොහොට්ටුවක් සේ ඇඟිලි එකට බැඳ දෑත තබා ගත යුතු ය. (..........................)
5. දණ්ඩ නමස්කාරය සුදුසු ම වැඳීම් ක්‍රමය යි.
6. වැඳීමට වඩා ආචාර කිරීම වෙනස්ය. (..........................)
7. පූජනීය වස්තුවලට වැඳීමේදී නමස්කාර පාඨය තෙවරක් කියනු ලැබේ. (..........................)
8. වැඳීම, ආචාර කිරීම වැනි දේ නිවැරදිව කිරීම බෞද්ධයකුගේ ලක්ෂණයකි. (..........................)

**පසු ඉගෙනුමට**

නමස්කාර පාඨය එකක් වුව ද බුදුන් වැඳීම, සිල් දීම, පිරිත් දෙසීම ආදී අවස්ථාවල දී විවිධ ලෙස උච්චාරණය කිරීම සම්ප්‍රදාය යි. ඒ විවිධ උච්චාරණ ක්‍රම හඳුනාගෙන පුහුණුවන්න.

## සරණාගමනය

සරණාගමනය යනු පිහිට ලැබීමට ලංවීම ය. බෞද්ධයින් වන අපට තෙරුවන් හැර පිහිටට වෙනත් කිසිවක් නැත. බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන කෙරෙහි විශ්වාසය සහිතව ගුණ හොඳින් අවබෝධ කරගෙන, පිහිට සලකාගෙන ඇසුරු කිරීම සරණාගමනය යි.

බෞද්ධාගමික වතාවත්වල දී නමස්කාරයෙන් අනතුරු ව සිදු කරන්නේ සරණාගමනය යි.

**බුද්ධං සරණං ගච්ඡාමි**
**ධම්මං සරණං ගච්ඡාමි**
**සංඝං සරණං ගච්ඡාමි**

**දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි**
**දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි**
**දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි**

**තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි**
**තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි**
**තතියම්පි සංඝං සරණං ගච්ඡාමි**

### අර්ථය

**(මම) බුදුන් සරණ යමි**
**(මම) දහම් සරණ යමි**
**(මම) සඟුන් සරණ යමි**

**(මම) දෙවනුව ද බුදුන් සරණ යමි**
**(මම) දෙවනුව ද දහම් සරණ යමි**
**(මම) දෙවනුව ද සඟුන් සරණ යමි**

**(මම) තෙවනුව ද බුදුන් සරණ යමි**
**(මම) තෙවනුව ද දහම් සරණ යමි**
**(මම) තෙවනුව ද සඟුන් සරණ යමි**

මේ ආකාරයට සරණාගමනයෙන් හෙවත් තෙරුවන් සරණ යාමෙන් පසුව කෙනෙක් බුදුසසුනට ඇතුළත් වේ. තෙරුවන් සරණ ගිය ගිහි බෞද්ධයා **''උපාසක''** යන විශේෂ නාමයෙන් ද හැඳින්වේ.

සරණාගමනය හෙවත් තෙරුවන් සරණ යාම සතරාකාරයකින් සිදු කළ හැකි ය.

1. **ජීවිතය පූජා කරමින් තෙරුවන් සරණ යාම.**
   ආත්ම සන්නිර්යාත සරණාගමනය.

2. **දරුවෙකු පියෙකුගෙන් පිහිට පතන්නාක් මෙන් තෙරුවන් සරණ යාම.**
   තත්පරායණතා සරණාගමනය.

3. **සිසුවෙකු ගුරුවරයෙකුගෙන් පිහිට පතන්නාක් මෙන් තෙරුවන් සරණ යාම.**
   ශිෂ්‍යභාවොපගමන සරණාගමනය.

4. **තෙරුවනට ගරු කිරීමෙන් පමණක් තෙරුවන් සරණ යාම.**
   ප්‍රණිපාත සරණාගමනය.

### ක්‍රියාකාරකම 16.2

සුදුසු වචන තෝරා පහත ඡේදයේ හිස්තැන් පුරවන්න.

(සරණ, උපාසක, සසුනට, පැහැදීම, ත්‍රිවිධ, වීමෙන්, විශ්වාස, පරලොව, අවබෝධ, විමුක්තිය)

බුදු .................................. ඇතුළත් .................................. පුද්ගලයාගේ මෙලොව දියුණුව .................................. දියුණුව හා පරම .................................. සාදාගත හැකි ය. ඕනෑම අයෙකු බුදුසසුනට ඇතුළත් වන්නේ .................................. රත්නය සරණ යෑමෙනි. එසේ .................................. ගිය ගිහි පින්වතා .................................. යන නමින් හැඳින්වේ. ඔහු ත්‍රිවිධ රත්නය සරණ ගොස් ඇත්තේ ඒ කෙරෙහි .................................. තබා ගෙන ය. එය මනාව අවබෝධ කරගෙන ය. එම නිසා ඔහු තුළ ඇති තෙරුවන් කෙරෙහි .................................. කිසිදු අයුරකින් වෙනස් නොවේ.

## පුහුණුවට

බුදුසරණ වේවා
සදහම් සරණ වේවා
සඟ සරණ වේවා
මෙතුන් සරණින් ජයම වේවා.

බුද්ධං සරණේ සිරස දරාගෙන
දම්මං සරණේ සිත පහදාගෙන
සංගං සරණේ සිවුරු දරාගෙන
ඉක්ඛයි තුන් සරණේ අදහාගෙන

## ජීවිතයට ඔවදනක්

යහපත් දේ යහපත් ලෙසත්
අයහපත් දේ අයහපත් ලෙසත්
දකින්නේ උසස් අයයි.

# 17 තෙරුවන් වැඳීම



වෙනදා මෙන් මා ආවාස මළුව ඉදිරියට ආවේ සඳරුවන් මල්ලිත් එක්ක ටිකක් සෙල්ලම් කරන්න හිතාගෙන යි.

''ආ..... නන්දක පොඩි නම ටිකක් මෙහෙට ආවනම්.....''

ආවාස ගෙයි දිග හාන්සි පුටුවේ වැඩ හුන් ලොකු හාමුදුරුවෝ මට එහෙම කථා කළේ වෙනදා කතා කරනවාට වඩා වෙනස් විදිහකට යි. සෙල්ලම් කිරීම අමතක කළ මා ඉක්මනට ලොකු හාමුදුරුවන් ළඟට ගියා.

''පොඩි නම දැන් ඉස්සර වගේ දුවල පැනල හරියන්නේ නෑ; සෙල්ලම හොඳ නෑ; දැන් ඔය නම පැවිදි ජීවිතයට ඇතුළත් වුණු කෙනෙක්; ඒ හින්දා පැවිදි ජීවිතයට අවශ්‍ය වත් පිළිවෙත් පුරන්න ඕන.''

''මොනවද ලොකු හාමුදුරුවනේ වත් පිළිවෙත් කියන්නේ?''

මම ලොකු හාමුදුරුවන්ගෙන් විමසුවේ ඒවා ගැන උන්වහන්සේගෙන් දැනගන්නයි.

''තෙරුවන් වන්දනාව, වත පිරිත කීම, විහාර මළුව, බෝ මළුව ඇමදීම වගේ දේවල් තමයි වත් පිළිවෙත් කියන්නෙ''

මේ වත් පිළිවෙත් වලින් මම මුලින් ම ලොකු හාමුදුරුවන්ගෙන් දැන ගැනීමට සිතුවේ **තෙරුවන් වැඳීම** ගැනයි.

''ලොකු හාමුදුරුවනේ, තෙරුවන් වන්දනාව කොහොම ද අපි කරන්න ඕන. මට ටිකක් විස්තර කරල කියල දෙනව ද?''

''ආ..... පොඩි නම, ගිහි පැවිදි කාගෙත් ජීවිතවලට වටිනාම රත්න තුනක් තමයි ත්‍රිවිධ රත්නය, නැත්තම් තෙරුවන් කියන්නෙ. අපේ වත් පිළිවෙත්වල තෙරුවන් වන්දනාවට ප්‍රධාන තැනක් ලැබෙනවා.

**බුද්ධ, ධම්ම, සංඝ** යන තෙරුවන වඳින ගාථා පාඨ තමයි මේවා. පොඩි නමට දැන ගන්න මම ඒවායේ තේරුමත් යොදලා තියෙනවා. ඒ ගාථා පාඨවල තේරුමත් දැනගෙන වඳින එක වඩාත් හොඳයි.

### බුද්ධ රත්නයට වැඳීම

1. **ඉතිපි සො භගවා අරහං, සම්මා සම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී. සත්ථා දෙව මනුස්සානං බුද්ධො භගවා'ති.**

   ඒ භාග්‍යවතුන් වහන්සේ අරහං, නම් ද වන සේක. සම්මා සම්බුද්ධ නම් ද වන සේක. විජ්ජාචරණ සම්පන්න නම් ද වන සේක. සුගත නම් ද වන සේක. ලෝකවිදූ නම් ද වන සේක. අනුත්තර නම් ද වන සේක. පුරිසදම්මසාරථී නම් ද වන සේක. සත්ථා දෙවමනුස්සානං නම් ද වන සේක. බුද්ධ නම් ද වන සේක. භගවා නම් ද වන සේක.

2. බුද්ධං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි

   මාගේ දිවි කෙළවර දක්වා බුදුරදුන් සරණ යමි.

3. යෙ ච බුද්ධා අතීතාච
යෙ ච බුද්ධා අනාගතා
පච්චුප්පන්නා ච යෙ බුද්ධා
අහං වන්දාමි සබ්බදා

අතීතයේ පහළ වී වදාළා වූ ද, අනාගතයේ පහළ වී වදාරන්නා වූ ද, වර්තමානයේ පහළ වී ඇත්තා වූ ද සියලු බුදුවරයන් වහන්සේලා හැම කල්හි මම වඳිමි.

4. නත්ථි මෙ සරණං අඤ්ඤං
බුද්ධො මෙ සරණං වරං
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමංගලං

මට අන් පිහිටක් නොමැත. බුදුරජාණන් වහන්සේ මට උතුම් වූ පිහිටයි. ඒ සත්‍ය වචනය හේතු කොට ගෙන මට ජයක් සෙතක් වේවා.

5. උත්තමංගෙන වන්දෙහං
පාදපංසුවරුත්තමං
බුද්ධෙ යො ඛලිතො දොසො
බුද්ධො ඛමතු තං මමං

දෝෂ රහිත වූ ඒ බුදුරජාණන් වහන්සේගේ ඉතා උතුම් වූ පා දූවිලි හිස් මුදුනින් නමස්කාර කරමි. බුදුන් කෙරෙහි පමාවකින් යම් වරදක් වී නම්, බුදුරජාණන් වහන්සේ මාගේ ඒ වරදට සමාව දෙන සේක්වා.

## ධර්ම රත්නයට වැඳීම

1. **ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී'ති.**

භාග්‍යවතුන් වහන්සේ විසින්, නව ලොවුතුරා දහම මනාකොට වදාරන ලද්දේ ය. ඒ ධර්මය ඇස් ඉදිරියේ දැකිය හැකි ගුණයෙන් යුක්ත ය. මග සිතට

අනතුරුව පල සිත උපදනා බැවින් කල් නොයවා විපාක දෙන්නේ ය. එව බලව යැයි පෙන්විය හැකි ගුණයෙන් යුක්ත ය. තම සිතින් නිතර එළඹ සිටිය හැකි ගුණයෙන් යුක්ත ය. නුවණැති සත්පුරුෂයින් විසින් තම තම නැණ පමණින් දත යුතු ගුණයෙන් යුක්ත ය.

2. ධම්මං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි

මාගේ දිවි කෙළවර දක්වා ධර්මය සරණ යමි.

3. යෙ ච ධම්මා අතීතා ච
යෙ ච ධම්මා අනාගතා
පච්චුප්පන්නා ච යෙ ධම්මා
අහං වන්දාමි සබ්බදා

අතීතයේ යම් ධර්මයක් වී ද, අනාගතයේ යම් ධර්මයක් වන්නේ ද, වර්තමානයේ යම් ධර්මයක් වේ ද සියලු ධර්මයන් සදාකල්හි මම වඳිමි.

4. නත්ථි මෙ සරණං අඤ්ඤං
ධම්මො මෙ සරණං වරං
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමංගලං

මට අන් පිහිටක් නැත. ධර්මය මට උතුම් වූ පිහිට ය. ඒ සත්‍ය වචනය හේතුවෙන් මට ජය, සෙත වේවා.

5. උත්තමංගෙන වන්දෙහං
ධම්මඤ්ච තිවිධං වරං
ධම්මෙ යො ඛලිතො දොසො
ධම්මො ඛමතු තං මමං

දෝෂ රහිත වූ පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ වශයෙන් තුන් ආකාර වූ ඒ උතුම් වූ ශ්‍රී සද්ධර්මය හිස් මුදුනින් නමස්කාර කරමි. ධර්මය කෙරෙහි පමාවකින් වූ යම් වරදක් වේ නම් ධර්මය මාගේ වරදට සමාකරන සේක්වා.

## සංඝරත්නය වැඳීම

1. සුපටිපන්නො භගවතො සාවක සංඝො
උජුපටිපන්නො භගවතො සාවක සංඝො
ඤාය පටිපන්නො භගවතො සාවක සංඝො
සාමීචිපටිපන්නො භගවතො සාවක සංඝො
යදිදං චත්තාරි පුරිස යුගානි අට්ඨ පුරිස පුග්ගලා
එස භගවතො සාවක සංඝො ආහුණෙය්‍යො
පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො
අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති

භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙම මනාව පිළිපන් සේක. ඍජුව පිළිපන් සේක. නිවනට සුදුසුව පිළිපන් සේක. නොයෙක් ගරු බුහුමනට සුදුසුව පිළිපන් සේක. ඒ අෂ්ට ආර්ය පුද්ගල වූ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ආගන්තුකයන් සඳහා පිළියෙල කරන ලද දන් පිළිගැනීමට සුදුසු වන සේක. පූජා පිණිස හෝ මිය ගිය ඇත්තන්ට පින් පිණිස දෙන පඬුරු පිළිගැනීමට සුදුසු වන සේක. කර්ම ඵල අදහා දෙන ප්‍රත්‍ය පිළිගැනීමට සුදුසු වන සේක. දෑත් බැඳ කරන නමස්කාරයට සුදුසුවන සේක. පින් කරනු කැමැත්තෙන් ම උතුම් වූ පින් කෙතක් හා සමාන වන සේක.

2. සංඝං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි

මාගේ දිවි කෙළවර දක්වා සඟුන් සරණ යමි.

3. යෙ ච සංඝා අතීතා ච
යෙ ච සංඝා අනාගතා
පච්චුප්පන්නා ච යෙ සංඝා
අහං වන්දාමි සබ්බදා

අතීතයේ වැඩ හුන්නාවූ ද, අනාගතයේ පහළ වන්නාවූ ද, වර්තමානයේ වැඩ වෙසෙන්නාවූ ද සියලු සංඝයා සියලු කල්හි වඳිමි.

4. නත්ථි මෙ සරණං අඤ්ඤං
සංඝො මෙ සරණං වරං
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමංගලං

මට අන් පිහිටක් නොමැතිය. උතුම් වූ සංඝයා මට පිහිටය. ඒ සත්‍යය වචනය හේතුවෙන් මට ජය මඟුලක් වේවා.

5. උත්තමංගෙන වන්දෙහං
සංඝඤ්ච තිවිධොත්තමං
සංඝෙ යො ඛලිතො දොසො
සංඝො ඛමතු තං මමං

දෝෂ රහිත වූ තුන් ආකාර වූ සංඝයා වහන්සේ මුදුනින් නමස්කාර කරමි. සංඝයා කෙරෙහි පමාවකින් වූ යම් වරදක් ඇත් ද සංඝයා වහන්සේ මාගේ ඒ වරදට සමා කරන සේක්වා.

## ක්‍රියාකාරකම 17.1

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ආරාමික වත් පිළිවෙත් තුනක් නම් කරන්න.
2. තෙරුවන් යනු මොනවා ද?
3. බුදුගුණ කීයද? ඒවා මොනවා ද?
4. දහම් ගුණ කීයද? ඒවා මොනවා ද?
5. සඟගුණ කීයද? ඒවා මොනවා ද?
6. බෞද්ධයින් වන අපට තිබෙන එකම පිහිට කුමක් ද?

## පුහුණුවට

නමාමි බුද්ධං ගුණ සාගරන්තං
සත්තා සදා හොන්තු සුඛී අවෙරා
කායො ජිගුච්ඡො සකලො දුගන්ධො
ගච්ඡන්ති සබ්බෙ මරණං අහං ච

නමාමිං ධම්මං සුගතෙන දෙසිතං
සත්තා සදා හොන්තු සුඛී අවෙරා
කායො ජිගුච්ඡො සකලො දුගන්ධො
ගච්ඡන්ති සබ්බෙ මරණං අහං ච

නමාමි සංඝං මුනිරාජසාවකං
සත්තා සදා හොන්තු සුඛී අවෙරා
කායො ජිගුච්ඡො සකලො දුගන්ධො
ගච්ඡන්ති සබ්බෙ මරණං අහං ච

### ජීවිතයට ඔවදනක්

අත්තානං චෙ පියං ජඤ්ඤා
රක්ඛෙය්‍ය නං සුරක්ඛිතං

තමා තමාට ප්‍රිය නම් තමා
මනාව රැකගන්න.

# 18 පන්සිල්

එක දවසක් මහානාම කියල සාක්‍ය රජ කෙනෙක් බුදුහාමුදුරුවන් හමුවෙන්න ආවා. ඇවිත් උන්වහන්සේට නමස්කාර කරල එකත් පසෙකට වී උන්වහන්සේගෙන් ප්‍රශ්නයක් ඇහුවා.



''බුදුහාමුදුරුවනේ, තෙරුවන් සරණ ගිය උපාසකයා සිල්වතෙක් වන්නේ කොහොමද?

මහානාම රජතුමා ඇසූ ප්‍රශ්නය එය යි. අපේ බුදුහාමුදුරුවෝ ඊට දීපු උත්තරය තමයි...

''රජතුමනි, පන්සිල් සමාදන් වීමෙන් සිල්වතෙක් විය හැකිය'' යන්න.

බුදුහාමුදුරුවො පෙන්නල දුන්න දහමට අනුව ගිහියකු වශයෙන් තෙරුවන් සරණ ගිය සෑම අයකු ම දෙවනුව වැරදි පහකින් ආරක්ෂා විය යුතු ය.

''පන්සිල්'' යනුවෙන් හැඳින්වෙන්නේ ඒ වැරදි පහයි.

අපි ඒ පන්සිල් තේරුමත් සමග ඉගෙන ගනිමු.

## පන්සිල්

පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි
අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි
මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි
සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි

## තේරුම

(මම) පණ නැසීමෙන් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.
(මම) නොදුන් දේ ගැනීමෙන් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.
(මම) කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.
(මම) බොරු කීමෙන් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.
(මම) මදයට හා ප්‍රමාදයට හේතුවන මත්ද්‍රව්‍යවලින් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.

## අවබෝධය

**පණ නැසීම** — තමන්ගේ මෙන් ම අනුන්ගේ ප්‍රාණය දන දන විනාශ කිරීම පණ නැසීමයි.

**නුදුන් දේ ගැනීම** — මෙයින් අදහස් කරන්නේ සොරකමයි. තමන්ට අයත් නොවන හා තමන්ට නුදුන් දෙයක් අවසරයෙන් තොරව ගැනීමයි.

**කාමයෙහි වරදවා හැසිරීම** — සිය අඹු, සිය සැමි ඉක්මවා පර සැමි, පර අඹු සමග කම් සුව විඳීමයි.

| | |
|---|---|
| බොරුකීම | වචනය මූලික කරගෙන අනුන් රැවටීම බොරුවයි. නැති දේ ඇති විදිහටත් ඇති දේ නැති විදිහටත් වෙනස් කර කීමෙන් අනුන් රැවටිය හැක. |
| මත්ද්‍රව්‍ය භාවිතය | මත්වීමට, සිහිය විකල් වීමට (මජ්ජ) හේතුවන හා සියලු කටයුතු අවුල් වී ප්‍රමාදයට (පමාද) හේතු වන විවිධ දියර, කුඩු, දුම් වැනි දේ පාවිච්චි කිරීමයි. |

බුදුසසුනට ඇතුළත් වුණු උපාසකයෙක්, උපාසිකාවක් පන්සිල් රැකීමෙන් ලොවට මහ සෙතක් සලසනවා. තමාගෙන් කිසිවෙකුට බියක් නැතිබව, වෛරයක් නැතිබව, දුක් පීඩාවක් නැතිබව මේ වැරදි පහෙන් වළකිණ උපාසකයා ඔප්පු කරනවා. එයින් ඔහුට හෝ ඇයට සමාජයේ බයක් නැතිව, වෛරයට ලක් නොවී දුක් පීඩා නොවිඳ ඉන්නට ලැබෙනවා. පන්සිල්, ගිහියකුට වටින්නෙ ඒ නිස යි. ගිහියන්ගේ නිත්‍ය සීලය යනුවෙන් ද හඳුන්වන්නේ ඒ නිස යි.

## ක්‍රියාකාරකම 18.1

අර්ථයට සමාන වැකි ඉරකින් යා කරන්න.

| | |
|---|---|
| බුදුහු කරුණු පහදා දුන්හ. | රාහුල හිමි පිරිවණට නොගියේ බොරු හිසේ අමාරුවක් අරගෙනය. |
| බස් කොන්දොස්තර මහතා දුන් ඉතිරි මුදල අඩු ය. | එවිට පස් පවින් වැළකිය හැකි ය. |
| අනුන් රැවටීම හොඳ නෑ | අහිංසක අංගුලිමාල මිනිසුන් මැරුවේ ය. |
| අපි පන්සිල් රකිමු. | මහානාම රජු ප්‍රශ්න කළා. |
| පණ නැසීම පාපයකි. | මත් පැන් පානය කළ නිසා ද? |

# 19 අෂ්ටාංග සීලය හා දස සීලය

සගම සුනීත හිමි,
ශ්‍රී සුධර්මෝදය පිරිවෙන,
බදුපොල,
ගිනිගත්හේන.
20131226

තිසරණ සරණයි!

මා හිතවත් සමන් වෙත. ඔබ එවූ ලිපිය ලැබුණා. එහි ලියා තිබූ ඔබේ තොරතුරු බලා මා සතුටු වුණා. ඔබ මෙවර වාර විභාගයෙන් පළමුවෙනියා වූ නේද? ඇත්තට ම සතුටුයි. මා පාසලේ සිටිද්දී අපි දෙන්නා නේ මාරුවෙන් මාරුවට පළමු වෙනියා වුණේ. ඔබට මතක ද?

ඉතින් සමන්, මගේ තොරතුරු ටිකක් ලියනවා නම්, මම ඉන්නෙ පිරිවෙනේ පළමු වසරේ. ඒ කියන්නේ පාසලේ හත වසර වාගේ. මමත් මෙවර වාර විභාගයෙන් පළමු වෙනියා. මට දැන් පාලි සංස්කෘත භාෂාත් පුළුවන්.

ආ.... අමතක වෙන්න ගියේ ඔබ මගෙන් ප්‍රශ්න ටිකක් අහලා එවලා තිබුණා නේද? "අටසිල්" හා "දසසිල්" ගැන. ඇයි ලබන පෝයට සිල් ගන්නවත් හිතුණා ද? පෝයට සිල් ගන්න එක හොඳයි කියල අපේ ලොකු හාමුදුරුවො නිතරම කියනවා.

ඉතින් සමන් අටසිල් සහ දසසිල් ගැන පිරිවෙනේ හාමුදුරුවෝ අපට හොඳට කියල දීපු තොරතුරු තියනවා. මම ඒවා ඔබට ලියලා එවනවා. පන්සිල් ගිහි බෞද්ධයෙකුගේ නිත්‍ය සීලය කියලනෙ අපි ඉගෙනගෙන තියෙන්නේ. ඒත් නිවන් ලබන්න පිළිවෙත් පුරන කොට පන්සිල් පමණක් සෑහෙන්නෙ නෑ. ඊට වඩා උසස් සිල් රකින්න ඕන. එහෙම උසස් සිල් ක්‍රම දෙකක් තමයි,

## අටසිල් හා දසසිල් කියන්නේ..........

සාමාන්‍යයෙන් ගිහි බෞද්ධයෙකුට ජීවිත කාලය පුරා මේ අටසිල් හා දසසිල් සමාදන් වෙලා ජීවත් වෙන්න අමාරුයි. ඒ නිසා අපේ බෞද්ධයින් හුරුවෙලා ඉන්නෙ පසළොස්වක පෝයට විශේෂයෙන් පන්සලට ගිහින් මේ සිල් සමාදන්වෙලා එහි කාලය ගත කරන්න. සමහර බෞද්ධ පිරිස් මාසේ පෝය හතරට ම අටසිල් හා දසසිල් සමාදන් වෙනවා. මේ ආකාරයෙන් සිල් ගැනීම...........

## පෙහෙවස් සමාදන් වීම

කියල හඳුන්වනවා. ඉතාම ස්වල්ප දෙනෙක් ජීවිතය පුරා මේ සිල් සමාදන්ව ඉන්නවා. ඒ අයට කියන්නෙ,

## බ්‍රහ්මචාරී

ජීවිත ගත කරනව කියල යි. ඒ අයට නිවන් මගේ පිළිවෙත් පුරන්න හරි ලේසියි. ඉස්සරවෙලාම මම දක්වන්නම් අටසිල් කියන්නෙ මොනවද කියල.

### අටසිල්

1. පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි
2. අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
3. අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛාපදං සමාදියාමි
4. මුසාවාද වේරමණී සික්ඛාපදං සමාදියාමි
5. සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
6. විකාල භෝජනා වේරමණී සික්ඛාපදං සමාදියාමි
7. නච්ච ගීත වාදිත විසූක දස්සන මාලා ගන්ධ විලේපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
8. උච්චාසයන මහාසයනා වේරමණී සික්ඛාපදං සමාදියාමි

පන්සිල්වල තිබුණු සිල් හතරකුත් එක්ක තවත් සිල් හතරක් එක් වෙලා අටසිල් සකස් වෙලා තියෙනවා. පන්සිල්වලදී ඉගෙනගත් කරුණුවලට අමතරව එක්වන සිල් ගැන ටිකක් විස්තර ලියන්නම්.

අටසිල්වල තිබෙනව "අබ්‍රහමචරියා වෙරමණී සික්ඛා පදං සමාදියාමි" කියල සිල් පදයක්. පන්සිල්වල මෙය යෙදිල තිබෙන්නෙ "කාමෙසු මිච්ඡාචාරා" කියලයි. ඒ අනුව ගිහි ජීවිතයේදි අයථා ලෙස කාම සේවනය කිරීම එයින් අදහස් කරනවා.

එහෙත් අටසිල් සමාදන්වන උපාසක උපාසිකාවන් කාම සේවනයෙන් සම්පූර්ණයෙන් වැළකී සිටිය යුතු ය. "බ්‍රහ්මචාරී" යනු එයයි.

ඒ වගේ ම අටසිල්වල **"විකාලභොජනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි"** කියලත් සිල් පදයක් තිබෙනවා නේ ද? ඒකෙන් කියවෙන්නේ අවේලාවේ ආහාර ගැනීමෙන් වැළකීම යි. මෙහි "විකාලය" යනුවෙන් අදහස් කරන්නේ පෙරවරු කාලයෙන් පසුවයි. ඉර හැරුණාට පසුව ආහාර ගැනීමෙන් වැලකීමෙන්, රෝග අඩුවීම, දුක් පීඩා අඩුවීම, ශරීරය සැහැල්ලු වීම, ශරීර ශක්තිය, බලය වැඩි වීම, පැවිදි ජීවිතය පහසු කර වීම කියන ආනිසංස පහක් ලැබෙන බව බුදුහාමුදුරුවො වදාරා තිබෙනවා.

අටසිල්වල තිබෙන දිගම සිල් පදය **"නච්ච ගීත වාදිත විසූක දස්සන මාලා ගන්ධ විලෙපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි"** වශයෙන් දැක්වෙන සිල් පදය යි.

නැටුම් ගැයුම් වැයුම් කිරීමෙන් වැළකීම. එවැනි විසුළු දසුන් නැරඹීමෙන් වැළකීම හා මල් ගඳ විලවුන් දැරීම, සැරසීම, අලංකාර වීම ආදියෙන් වැළකීමයි. මේවා සාමාන්‍ය ගිහියන්ගේ දේවල්. අටසිල් සමාදන් වන ගිහියන් දවසකට හෝ මේවායින් ඈත් විය යුතු ය. මේ සික පදය සමාදන් වීම ආශාව දුරු කිරීමට, ඉඳුරන් දමනය කිරීමට හේතු වෙනවා.

**"උච්චාසයන මහාසයනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි"** කියන්නේ අටසිල්වල අවසාන සික පදය.

මෙයින් අදහස් කරන්නේ වඩු රියනකට වඩා උස් ඇඳ පුටු ආදියෙන් හා මහා සුඛෝපභෝගී ඇඳ පුටු පාවිච්චි කිරීමෙන් වැළකී සිටීම යි. සිල්වත් ජීවිතයකට අවශ්‍ය නිහතමානී බව හා චාම් බව රැක ගැනීමට මේ සිල් පදය හොඳයි.

සමන්, ඔබට දැන් තේරෙනව නේද? අටසිල් කියන්නෙ මොනව ද? කියල. ඒත් එක්කම දසසිල් ගැනත් කියලා දෙන්නම්.

## දසසිල්

1. පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
2. අදින්නාදනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
3. අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
4. මුසාවාද වෙරමණී සික්ඛාපදං සමාදියාමි
5. සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
6. විකාල භොජනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
7. නච්ච ගීත වාදිත විසූක දස්සනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
8. මාලා ගන්ධ විලෙපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
9. උච්චාසයන මහාසයනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි
10. ජාතරූප රජත පටිග්ගහණා වෙරමණී සික්ඛාපදං සමාදියාමි

දසසිල්වලදී මූලික වශයෙන් සිදුවෙලා තිබෙන්නේ අටසිල්වල තිබුණ එක සිල් පදයක් මේ විදියට දෙකට බෙදීමයි.

1. නච්ච ගීත වාදිත විසූක දස්සනා වෙරමණී සික්ඛා පදං සමාදියාමි
2. මාලා ගන්ධ විලෙපන ධාරණ මණ්ඩන විභූසනට්ඨාණා වෙරමණී සික්ඛා පදං සමාදියාමි

ඒ වගේම,

''ජාතරූප රජත පටිග්ගහණා වේරමණී සික්ඛාපදං සමාදියාමි''

කියල අලුතින් සිල් පදයක් එකතුවෙලා.

සාමාන්‍යයෙන් මෙහි තේරුම නම් රන් රිදී මසු කහවණු පිළිගැනීමෙන් වැළකීම යන්න යි. ඒ ඒ කාලවලට ඒ ඒ ප්‍රදේශවලට අයත් මුදල් පරිහරණය කිරීමෙන් වැළකීම යනුවෙන් මසු කහවනු යන්න අදට ගැලපෙන සේ තේරුම් ගත යුතු යි. දසසිල් සමාදන් වන ගිහියාට දවසකට හෝ මිල මුදල් පරිහරණය කිරීමේ බර සැහැල්ලු කරගන්නට පුළුවන් වෙනව මේ සිල් පදය රැකීමෙන්.

ඉතින් සමන්, අටසිල් හා දසසිල් ගැන තොරතුරු ඔහොමයි. ඔබ ලබන පෝයට සිල් ගන්නවත් හිතල තිබෙනවානම් මට පුළුවන් මේ ගැන තව විස්තර ලියන්න.

අටසිල් හෝ දසසිල් සමාදන් විය යුත්තේ හාමුදුරු නමකගෙන්. ඒ වුන ාට දසසිල් සමාදන් වුණ උපාසකයෙකුට හෝ උපාසිකාවකට වුව ද අටසිල් හා දසසිල් සමාදන් කරවන්න පුළුවන්. එහෙත් අටසිල් රකින කෙනෙකුට දසසිල් සමාදන් කරවන්න බෑ.

කොහොම වුණත් අටසිල් හෝ දසසිල් සමාදන් වන කෙනෙක් සුදුවතින් සැරසී උතුරු සළුව පොරවාගෙන සිල්වතුන් වෙත ගිහිල්ල මෙන්න මේ පාඨය කියල සිල් ඉල්ලන්න ඕන.

## අටසිල් ඉල්ලීමේ දී

**ඔකාස අහං භන්තෙ, තිසරණෙන සද්ධිං අට්ඨංග සීලං ධම්මං යාචාමි අනුග්ගහං කත්වා සීලං දෙථ මෙ භන්තෙ.**

**තේරුම:**

අවසරයි ස්වාමිනි. මම තිසරණ සහිත අටසිල් ඉල්ලමි. මට අනුකම්පා කොට සිල් දෙනු මැනවි.

### දසසිල් ඉල්ලීමේ දී

**ඔකාස අහං භනෙත තිසරණෙන සදධිං ගහටඨ දස සීලං ධමමං යාචාමි අනුගගහං කතවා සීලං දෙථ මෙ භනෙත**

**තේරුම:**

අවසරයි ස්වාමිනි. මම තිසරණ සහිත ගිහි දසසිල් ඉල්ලමි. මට අනුකම්පා කොට සිල් දෙනු මැනවි.

සිල් සමාදන් කරවන හාමුදුරුවන් වහන්සේ අවසානයේදී සිල් සමාදන් වූ අයට අනුශාසනාවක් කරනවා. ඒ සඳහා භාවිත කරන පාලි පාඨයයි මේ.

**තිසරණෙන සදධිං පඤච සීලං/ අටඨංග සීලං/ ගහටඨ දසසීලං ධමමං සාධුකං සුරකඛිතං කතවා අපපමාදෙන සමපාදෙථ.**

**තේරුම:**

තිසරණ සහිත පන්සිල්/ අටසිල්/ දසසිල් මනාව රැකගෙන අප්‍රමාදීව කටයුතු කරන්න.

### සාමණේර දසසීලය

ආ......... සමන් ඔබ මීට ගොඩක් කලින් එවපු ලිපියක අහල එවල තිබුණ නේද මම මහණ වුණේ සිල් කීයක් සමාදන් වෙලා ද කියලා?

ඔන්න, ඒකට උත්තරයක් දෙන්න දැන් හොඳම වෙලාව. මම සමාදන් වෙලා ආරක්ෂා කරන්නෙත් ඔය දස සීලයමයි. වෙනසකට ඇත්තේ එක් එක් ශික්ෂා පදය සමාදන් වීමේදී "සික්ඛාපදං" යන තැනින් නවත්වා සියලු සිල්පද කියා අවසානයේ දී

"ඉමානි දසසික්ඛාපදානි සමාදියාමි"

යනුවෙන් සමාදන් වීම යි. එයින් සියලු ශික්‍ෂා පද එකට බැඳ තැබීමක් සිදු කෙරේ. ඒ අනුව එක් ශික්‍ෂා පදයක් හෝ කැඩීමෙන් සියලු ශික්‍ෂා පද අහෝසි වී යයි.

ගිහිගෙයින් වෙන් වෙලා පැවිදි බිමට ඇතුළත් වූ අය එම දසසිල් සමාදන් වන විට, ඒකට කියන්නෙ "සාමණේර දසසීලය" කියල යි.

ඉතින් හිතවත් සමන්, මා හිතනව ඔබට දැනගන්න අටසිල් දසසිල් ගැන ගොඩාක් තොරතුරු ලිව්වා කියලා. මේ වාගේ දේවල්, ඕන දෙයක් මගෙන් අහලා එවන්න. මම කියලා දෙන්නම්. අදට නවතිමි.

ඔබට නැවතත් තිසරණ සරණ ප්‍රාර්ථනා කරමි.

මෙයට,
හිතවත්,
සුනීත පොඩිහාමුදුරුවෝ.

**ක්‍රියාකාරකම 19.1**

පහත වාක්‍යවලට අදාළ නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

1. ජාතරූප රජත පටිග්ගහණ සිල්පදය ඇත්තේ (පන්සිල්/ අටසිල්/ දසසිල්) වලය.
2. දසසිල් සමාදන් කරවීමට සුදුසු නොවන්නේ, (හාමුදුරුවන්/ දසසිල් ලාභි උපාසක උපාසිකාවරු/ අටසිල් ලාභි උපාසක උපාසිකාවරු) ය.
3. විකාල භෝජනා සිල් පදය රැකීමෙන් (ආහාර අපහසුතාවලින් වැළකිය හැක./ නිහතමානි විය හැක./ ආශාව මැඩ ගත හැක.)
4. පෙහෙවස් සමාදන් වීම යනු (බ්‍රහ්මචාරි වීමයි/ නිත්‍යසීලය රැකීමයි/ පෝයට සිල් සමාදන් වීමයි)
5. දසසිල් සමාදන් වූ ගිහියෙකුට (හොඳ ගිහි ජීවිතයක් ගත කළ හැක/ හොඳ පැවිදි ජීවිතයක් ගත කළ හැක/ නිවණට අවශ්‍ය පිළිවෙත් පහසුවෙන් රැකිය හැක.)

## පුහුණුවට

**වත්තං න පරිපූරෙන්තො**
**න සීලං පරිපූරති**
**අසුද්ධසීලො දුප්පඤ්ඤො**
**දුක්ඛා න පරිමුච්චති**

වත් පිළිවෙත් නොකරන්නාගේ සීලය නොපිරෙයි. දුසිල්වත් මෝඩයා දුකින් නො මිදේ.

**කිකීව අණ්ඩං චමරී ව වාළධිං**
**පියං ව පුත්තං නයනං ව එකකං**
**තථෙව සීලං අනුරක්ඛමානකා**
**සුපෙසලා හොථ සදා සගාරවා**

කිරලා සිය බිත්තර මෙන් ද සෙමෙර මුවා සිය වලිගය මෙන් ද මව එකම පුතු මෙන් ද එක් ඇසක් ඇත්තා එම ඇස මෙන් ද ගෞරව සහිතව සිල් රකිමින් හැම කල්හි සංවර වව්.

### ජීවිතයට ඔවදනක්

**තමන්ගේ මෝඩ බව**
**තමන්ට වැටහේ ද එයම**
**ඔහුගේ පණ්ඩිත බවේ**
**ලක්ෂණයකි.**

# 20 ආජීව අට්ඨමක සීලය

කරුණාජීව උපාසක මහතා කිසිම කෙනෙකුට කරදරයක් නොවන පරිදි යහපත් ජීවිතයක් ගත කරන කෙනෙක්. ඒ පවුලේ අයත් එහෙම යි. ඔහු කිසිම දිනෙක දන් වේල වරද්දන්නෙ නෑ. විහාරස්ථානයේ සිදුවන පොදු වැඩවලදීත් කාට හෝ කරදරයක් වූ විටකදීත් ඊට සම්බන්ධ වෙලා වැඩ කිරීම කරුණාජීව උපාසක මහතාගේ සිරිතකි.

දිනක් කරුණාජීව මහතා විහාරස්ථානයට පැමිණිලා තෙරුවන් වැඳලා, මල් පහන් ආදිය පූජාකොට අනතුරුව ගියේ ලොකු හාමුදුරුවන් වහන්සේ හමුවෙන්න යි. උන්වහන්සේ වැඳ නමස්කාර කිරීමෙන් අනතුරුව ඔහු ලොකු හාමුදුරුවන්ගෙන් මෙහෙම ඇහුවා. "අවසරයි අපේ හාමුදුරුවනේ මම පන්සිල් රකින කෙනෙක් මට උවමනයි ඒ සීලය තව ටිකක් දියුණු කරගන්න. ඒ වුණාට අපේ හාමුදුරුවනේ පෝය දවසේ අටසිල්, දසසිල්, සමාදන්වෙන්න නම් මට අමාරුයි. පෝය දවසට සමාදන් වන අටසිල් දසසිල් හැරුණුකොට තවත් මොනව හරි සිල් ක්‍රමයක් තියෙනවද සමාදන් වෙන්න."

කරුණාජීව උපාසක මහතා ඇසූ ප්‍රශ්නය ලොකු හාමුදුරුවන්ට හොඳට පැහැදිලි යි. උන්වහන්සේ ඊට පිළිතුරක් දුන්නා.

"ඔව් උපාසක මහත්තයෝ එහෙම සීලයක් තියෙනවා. ඒකට කියන්නේ **ආජීව අට්ඨමක සීලය**" කියලයි. මේ අහන්නකො.....

1. **පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි**
2. **අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි**
3. **කාමෙසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි**
4. **මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි**
5. **පිසුනා වාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි**
6. **ඵරුසා වාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි**

7. **සම්ඵප්පලාපා වේරමණී සික්ඛාපදං සමාදියාමි**
8. **මිච්ඡාජීවා වේරමණී සික්ඛාපදං සමාදියාමි**

## තේරුම

1. පරපණ නැසීමෙන් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.
2. නුදුන් දේ ගැනීමෙන් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.
3. කාමයන් හි වරදවා හැසිරීමෙන් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.
4. බොරුකීමෙන් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.
5. කේලම් කීමෙන් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.
6. පරුෂ වචන කීමෙන් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.
7. නිෂ්ඵල වචන කතා කිරීමෙන් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.
8. වැරදි ජීවිකාවෙන් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.

පන්සිල් හොඳට හුරු පුරුදු කළ සැදැහැවත් බෞද්ධයන් සීලයෙන් වැඩි දියුණු වීමට මේ **ආජීව අට්ඨමක සීලය** සමාදන් වෙනවා.

මෙය ආරක්ෂා කරන්න අටසිල් දසසිල්වලට මෙන් ම ගෙදරින් ඈත්වෙලා පන්සලට පැමිණිය යුතු නෑ. තමාගේ දවසේ වැඩ පිළිවෙළ වෙනස් කර ගත යුතු නෑ. ගෙදර දොරේ වැඩ, රැකියාවේ වැඩ ආදී සියලු කටයුතු කරන අතර ම මෙම සීලය රකින්න පුළුවන්. මෙම සීලයේ තිබෙන විශේෂ දේ නම්,

"වැරදි රැකියාවන්ගෙන් වැළකීමට පොරොන්දු වීමයි"

මේ සීලයට **ආජීව අට්ඨමක සීලය** කියන්නේ ද එම ශික්ෂාපදය අටවෙනි කොට ඇති හින්දයි. ඊට අමතරව පන්සිල්වලට වඩා මෙහි ඇති වෙනස නම් වචනයෙන් කෙරෙන අකුසල් හතරම මෙහි ඇතුළත් ව තිබීම යි. ඒ අනුව මෙම සීලයෙන් කය, වචනය, ජීවන රටාව යන අංග තුනම පිරිසිදු වෙනවා. එවිට සියලු සිල් ආරක්ෂා කළා වෙනවා. ඒ වගේ ම ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන මාර්ගාංග තුන ම මේ සීලයෙන් සම්පූර්ණ වෙනවා.

"ඉතින් අපේ උපාසක මහත්තයට පුළුවන් පන්සිල්වලට අමතරව මේ **ආජීව අටඨමක සීලය** සමාදන්වෙලා රකින්න."

"එහෙමයි අපේ හාමුදුරුවනේ ඒ විදිය හොඳයි. එහෙනම් මට යන්න අවසරයි." ලොකු හාමුදුරුවන්ගේ දෙපා නමැද අවසර ගත් කරුණාජීව උපාසක මහතා සිය නිවස බලා පිටත් වුණා.

### ක්‍රියාකාරකම 20.1

සුදුසු වචන යොදා පහත සඳහන් ඡේදයේ හිස්තැන් පුරවන්න.

(අටසිල්, පන්සිලුත්, ආලෝකය, උදව්, ප්‍රයෝජනවත්, ජීවිතය, ජය, ලස්සන, සීලයයි, ගිහි)

ගිහි ................................ බාධක කම්කටොලු කරදර සහිත ය. බුදුදහමේ ................................ ලබන ගිහියා ඒ බාධක කරදර ................................ ගනිමින් ................................ ජීවිතයක් ගත කරයි. ඊට ඔහුට ගොඩක් ................................ වන්නේ ඔහු රකින ................................ නිත්‍ය සීලය වශයෙන් ................................ අනෙකුත් ................................ . දසසිල් වගේම ආජීව අටඨමක සීලයත් සමාදන් වීම ................................ ජීවිතයට ................................ වේ.

## පුහුණුවට

**සබ්බදා සීල සම්පන්නො**
**පඤ්ඤවා සුසමාහිතො**
**ආරද්ධ විරියො පහිතත්තො**
**ඔඝං තරති දුත්තරං**

හැමදා සිල් රකින, ප්‍රඥාවෙන් යුත්, හිත සංවර කර ගත්, පටන් ගන්නා ලද වීර්යය ඇති තැනැත්තා එතෙර වීමට අපහසු වූ සසර සැඩ පහර තරණය කරයි.

## ජීවිතයට ඔවදනක්

**සිත දමනය කිරීම යහපත් ය**
**දමනය වූ සිත සැප ගෙන දෙයි.**

# 21 වන්දනා ගාථා

අප පැවිදි වූයේ සියලු දුකින් මිදී නිවන් අවබෝධ කරනු පිණිස ය. අපට ඒ සැනසිල්ල උදා කරනු පිණිස බුදුරජාණන් වහන්සේ අසංඛ්‍ය කල්ප ලක්‍ෂ සතරක් දුක් විඳි සේක. අපට උන්වහන්සේට එම ණය ගෙවිය නොහැකි ය. අප දිනකට තෙවරක් බුදුන් වඳින්නේ ඒ වෙනුවෙන් අපගේ ගෞරවය පුදනු පිණිස ය.

බුදුරජාණන් වහන්සේ රහසින්වත් පවු නොකරන, සියලු කෙලෙසුන් නැසූ, ගුණයෙන්, සීලයෙන් ඉතාම පිරිසිදු උත්තමයන් වහන්සේ ය. එබඳු පූජනීය උතුමෙකු වැඳීමෙන් පවා අපගේ දුක්, බිය, රෝග නැති වී සියලු යහපත උදා වේ. මට්ටකුණ්ඩලී කුමරු මෙන් පරලොව සුගතියෙහි උපදී.

එම වන්‍දනාව හරියට ම කෙරෙන්නේ සිත, කය, වචනය යන තිදොර ම ඊට සහභාගී කරගෙන වඳින පුදන විට ය. මල් පහන් සූදානම් කොට පිදීම කයින් කෙරෙන පූජාවයි. ගාථා කියා වැඳීමෙන් ඊට වචනය ද සහභාගී වෙයි. මේ සියල්ල සිතේ පැහැදීමෙන් ශ්‍රද්ධාවෙන් සිදු කරන විට සිතත් ඊට සහභාගී වෙයි.

එකී වන්‍දනාව සඳහා යොදා ගැනෙන ගාථා අපමණ ය. එයින් මූලික වන්‍දනා හා පූජා ගාථා අරුත් සහිත ව නිවැරදි ව කීමට අපි මෙතැන් සිට උගනිමු.

**චෛත්‍ය වන්දනාව :**

වන්‍දාමි චේතියං සබ්බං - සබ්බඨානේසු පතිට්ඨිතං
සාරීරික ධාතු මහා බෝධිං - බුද්ධ රූපං සකලං සදා

භාවය

සියලු තැන පිහිටි සියලු චෛත්‍ය ද, බුදුරජාණන් වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේ ද, මහා බෝධීන් වහන්සේ ද, සියලු බුද්ධ රූප ද සෑම කල්හි වඳිමි.

බෝධි වන්දනාව :

යස්ස මූලෙ නිසින්නොව - සබ්බාරි විජයං අකා
පත්තො සබ්බඤ්ඤුතං සත්ථා - වන්දෙ තං බොධි පාදපං

භාවය

බුදුරජාණන් වහන්සේ යම් බෝධියක් මුල වැඩ හිඳ සියලු කෙලෙස් සතුරන් නැසූ සේක් ද, බුදු බවට පත් වූ සේක් ද, ඒ ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේ මම වඳිමි.

ඉමෙ එතෙ මහා බොධි - ලොකනාථෙන පූජිතා
අහම්පි තෙ නමස්සාමි - බොධි රාජා නමත්ථු තෙ

භාවය

බුදුරජාණන් වහන්සේ විසින් පුදන ලද ඒ බෝධීන් වහන්සේ මම වඳිමි. බෝධි රාජයන් වහන්ස, ඔබ වහන්සේට නමස්කාර වේවා.

සත් සතිය වැඩ හුන් තැන් වන්දනාව :

පඨමං බොධි පල්ලඞ්කං - දුතියඤ්ච අනිමිසං
තතියං චඞ්කමනං සෙට්ඨං - චතුත්ථං රතනාඝරං
පඤ්චමං අජපාලඤ්ච - මුචලින්දෙන ඡට්ඨමං
සත්තමං රාජායතනං - වන්දෙ තං මුනිසෙවිතං

භාවය

පළමු සතිය බෝ මැඩ ද, දෙවැන්න අනිමිස ලෝචන පූජා කළ ස්ථානය ද, තෙවැන්න රුවන් සක්මන ද, සිවුවැන්න රුවන් ගෙය ද, පස්වැන්න අජපල් නුගරුක මුල ද, සවැන්න මුචලින්ද නා දරණ ද, සත්වැන්න රාජායතන කිරිපලු නුගරුක මුල ද යන බුදුරජාණන් වහන්සේ විසින් ඇසුරු කරන ලද සියලු තැන් වඳිමි.

පහන් පූජාව :

සනසාරපපදිතෙතන - දීපෙන තමධංසිනා
තිලොකදීපං සම්බුද්ධං - පූජයාමි තමොනුදං

භාවය

තුන්ලොව පහනක් බඳු වූ මෝහ නමැති අඳුර දුරු කරන්නා වූ ද සම්බුදුරජාණන් වහන්සේ, අඳුර දුරු කරන, කපුරු සුවඳ තෙලින් දල්වන ලද පහනෙන් පුදමි.

සුවඳ දුම් පූජාව :

සුගන්ධිකාය වදනං - අනන්ත ගුණ ගන්ධිනං
සුගන්ධිනාහං ගන්ධෙන - පූජයාමී තථාගතං

භාවය

අනන්ත වූ ගුණ සුවඳින් සුවඳවත් වූ සිරුරින් හා මුහුණින් හෙබි බුදුරජාණන් වහන්සේ මම සුවඳ වර්ගවලින් පුදමි.

මල් පූජාව :

වණ්ණ ගන්ධ ගුණොපෙතං - එතං කුසුම සන්තතිං
පූජයාමී මුනින්දස්ස - සිරිපාද සරොරුහෙ

**භාවය**

පැහැය, සුවඳ යන ගුණයන්ගෙන් යුක්ත වූ මේ මල් සමූහයෙන් බුදුරජාණන් වහන්සේගේ සිරිපා පියුම් පුදමි.

> පූජෙමි බුද්ධං කුසුමෙනනෙන පුඤ්ඤේනමෙතෙන ච හොතු මොක්ඛං
> පුප්ඵං මිලායාති යථා ඉදං මෙ කායො තථා යාති විනාසභාවං

**භාවය**

මේ මලින් බුදුරජාණන් වහන්සේ පුදමි. ඒ පිනෙන් මට නිවන් ලැබේවා. මේ මල් මැළ වී යන්නා සේ මගේ ශරීරය ද විනාශයට පත් වන්නේ ය.

**පැන් පූජාව :**

> අධිවාසෙතු නො භන්තෙ - පානීයං උපනාමිතං
> අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම

**භාවය**

ස්වාමීනි, අප විසින් පිළියෙල කරන ලද, මේ පැන් ඉවසා වදාළ මැනව. උතුම් වූ බුදුරජාණන් වහන්ස, අප කෙරෙහි අනුකම්පාවෙන් එය පිළිගනු මැනව.

**ආහාර පූජාව :**

> අධිවාසෙතු නො භන්තෙ - භොජනං උපනාමිතං
> අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම

**භාවය**

අප විසින් පිළියෙල කරන ලද මේ ආහාර ඉවසා වදාළ මැනවි. උතුම් වූ බුදුරජාණන් වහන්ස, අප කෙරෙහි අනුකම්පාවෙන් එය පිළිගනු මැනවි.

අවුළුපත් පූජාව :

අධිවාසෙතු නො භන්තෙ - ඛජ්ජකං උපනාමිතං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම

භාවය

ස්වාමීනි අප විසින් පිළියෙල කරන ලද මෙ අවුළුපත් ඉවසා වදාළ මැනවි. උතුම් වූ බුදුරජාණන් වහන්ස, අප කෙරෙහි අනුකම්පාවෙන් පිළිගනු මැනවි.

දැහැත් පූජාව :

අධිවාසෙතු නො භන්තෙ - තාම්බූලං උපනාමිතං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම

භාවය

ස්වාමීනි අප විසින් පිළියෙල කරන ලද මේ දැහැත් ඉවසා වදාළ මැනවි, උතුම් වූ බුදුරජාණන් වහන්සේ, අප කෙරෙහි අනුකම්පාවෙන් පිළිගනු මැනවි.

කමා කිරීම :

කායෙන වාචා චිත්තෙන - පමාදෙන මයා කතං
අච්චයං ඛම මෙ භන්තෙ - භූරිපඤ්ඤ තථාගත

භාවය

ස්වාමීනි මහා ප්‍රාඥ වූ බුදුරජාණන් වහන්ස, කයින්, වචනයෙන් හෝ සිතින් මා විසින් පමාවකින් යම් වරදක් කරන ලද ද ඒ වරදට සමා වන සේක්වා.

## පුණ්‍යානුමෝදනා

### දෙවියන්ට පින් දීම :

**එත්තාවතා ච අම්හෙහි – සම්භතං පුඤ්ඤසම්පදං**
**සබ්බෙ දෙවා අනුමොදන්තු – සබ්බ සම්පත්ති සිද්ධියා**

**භාවය**

අප විසින් රැස් කරන ලද මේ පුණ්‍ය සම්පත්තිය සියලු දෙවියෝ අනුමෝදන් වෙත්වා. ඔව්හු අපට සියලු සැප සම්පත් සිද්ධ කර දෙත්වා.

### ඥාතීන්ට පින් දීම :

**ඉදං මෙ ඤාතීනං හොතු – සුඛිතා හොන්තු ඤාතයො**

**භාවය**

මේ පිනෙන් (මියගිය) නෑයෝ සුවපත් වෙත් වා. (අනුන් සඳහා කියවන විට) 'ඉදං මෙ' වෙනුවට 'ඉදං වො' යනුවෙන් යොදන්න.

### ප්‍රාර්ථනාව :

**ඉමිනා පුඤ්ඤකම්මෙන – මා මෙ බාලසමාගමො**
**සතං සමාගමො හොතු – යාව නිබ්බාන පත්තියා**

**භාවය**

මේ පින්කමේ බලයෙන් මා හට අසත්පුරුෂ ආශ්‍රයක් නොවේවා. නිවන් දකිනා තුරු සත්පුරුෂයන්ගේ ම ආශ්‍රය ලැබේවා.

**ඉදං මෙ පුඤ්ඤං ආසවක්ඛයාවහං හොතු සබ්බ දුක්ඛා පමුඤ්චතු**

### භාවය

මේ පින මට නිවන් පිණිස හේතුවේවා. මම සියලු දුකින් මිදෙම්වා.

### ආචාර්ය/ උපාධ්‍යායන් වහන්සේලා කමා කරවා ගැනීම

ආචාර්ය/ උපාධ්‍යායන් වහන්සේලා කමා (ක්‍ෂමා) කරවා ගැනීම ආරාමීය වත්පිළිවෙතේ අනිවාර්ය ලක්ෂණයකි. දිනකට තුන්වාරයක් හෝ දෙ වාරයක් වන්දනා සහ වත පිරිත කියා අවසානයේ සිය ආචාර්ය/ උපාධ්‍යායන් වහන්සේලා ඉදිරියට ගොස් නමස්කාර කොට උන්වහන්සේලාගෙන් සමාව අයැදිය යුතු ය. රාත්‍රී හෝ දහවල් දවස පුරා තමන්ගෙන් යම් වරදක් වුවා නම් ඊට සමාව ඉල්ලීමටයි එලෙස කෙරෙන්නේ. ආචාර්ය/ උපාධ්‍යායන් වහන්සේලා ඉදිරියේ නොසිටින වේලාවන්හිදී උන්වහන්සේලා සිහිකරමින් හෝ මෙලෙස සමාව ගැනීම සිදු කළ යුතුය.

ශිෂ්‍යයා : **ඔකාස ද්වාරත්තයෙන කතං සබ්බං අපරාධං ඛමථ මෙ භන්තෙ.**

ආචාර්යයන් වහන්සේ/ උපාධ්‍යායන් වහන්සේ : **ඛමහං ඛමාමි.**

ශිෂ්‍යයා : **ඔකාස ඛමාමි භන්තෙ.**

### භාවය

ශිෂ්‍යයා : ස්වාමිනි, අවසරයි මා විසින් තුන් දොරින් කරන ලද සියලු වරදට කමා කරනු මැනවි.

ආචාර්යයන් වහන්සේ/ උපාධ්‍යායන් වහන්සේ : යහපති, කමා කරමි.

ශිෂ්‍යයා : අවසරයි ස්වාමිනි, කමා වෙමි.

# 22 සිව්පස පරිභෝගය

පැවිදි ජීවිතය සම්මා ආජීවයකි. නිවැරදි දිවි පැවැත්මකි. ගිහියන්ට දැහැමි ජීවිකාවන් වන වෙළඳාම්, ගොවිතැන් ආදිය පවා පැවිදි ඇත්තන්ට අධාර්මික ය. ඒවා මිථ්‍යා ආජීවයන් ය. පැවිදි වීමෙන් පසු ජීවත් විය යුත්තේ සැදැහැවතුන් පුදදෙන සිවුපසයෙනි.

සිවුපසයට අයත් වන්නේ ගිහිපැවිදි කා හටත් ජීවත්වීමට තිබිය යුතුම මූලික අවශ්‍යතා සතරකි. එනම්,

| | | | |
|---|---|---|---|
| 1. චීවර | සිවුරු | = | ඇඳුම්, පැළඳුම් |
| 2. පිණ්ඩපාත | සැදැහැයෙන් පුදන ආහාර | = | ආහාර, පාන |
| 3. සෙනාසන | සෙනසුන් | = | ගේ, දොර |
| 4. ගිලාන පච්චය | ගිලන්පස | = | බේත් හේත් ආදිය |

යන මේ සතරයි. සැදැහැත්තෝ දහදිය මහන්සියෙන් උපයා සපයාගත් ධනය තමන්වත් හරිහැටි ප්‍රයෝජන නොවිඳ, දූ දරුවන්ටත් අඩුපාඩු එමට තිබිය දී භික්ෂූන් වහන්සේලාට පූජා කරති. සමහර විට ඔවුහු තමන් යන්තමින් යැපෙමින් සංඝයාට ඉතා ප්‍රණීත ලෙස දන් දෙන්නා හ. සමහර විට තමන් නිරාහාරව සිට තම අහර වේල සංඝයාට පුදන අවස්ථා ද තිබේ. ඒ දන් ලබන කිසිවෙක් ඒ බව දන්නේත් නැත.

එසේ දෙන සිවුපසය නොසැලකිල්ලෙන් විනෝදයෙන් පරිහරණය කරනවා නම්, ඒවා තණ්හාවෙන් බදාගෙන, ලාබ ලෝබකමින් ආඩම්බර වී, ඒවායින් මුසපත් වී පරිභෝග කරනවා නම්, එය චාම් වූ පැවිදි ජීවිතයට බරපතල හානියකි. දන් දෙන ඇත්තන්ගේ ශ්‍රද්ධාව, පරිත්‍යාගය, කැපකිරීම ගණන් නොගෙන හැරීමකි. එනිසා ම බුදු සසුනේ පැවිද්දන්ගේ සිවුපස පරිභෝගය සතර ආකාරයකට බෙදා දක්වා තිබේ. එනම්,

| | | |
|---|---|---|
| 1. | ථෙය්‍ය පරිභෝගය | සොරෙන් භුක්තිවිඳීම |
| 2. | ඉණ පරිභෝගය | ණයට භුක්තිවිඳීම |

3. දායජ්ජ පරිභෝගය  උරුමය භුක්තිවිඳීම
4. සාමි පරිභෝගය  අයිති දේ භුක්තිවිඳීම

යනුවෙනි.

### 1. ථෙය්‍ය පරිභෝගය

භික්ෂු සාමණේරයන් වහන්සේලාට මේ සිවුපසය ලැබෙන්නේ බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළ නිසාය. බුදුරජාණන් වහන්සේගේ අරහං ගුණයට ලැබෙන මේ සිවුපසය අයිති උන්වහන්සේට ම යි. උන්වහන්සේ ඒවා පරිභෝග කරන්නට අවසර දුන්නේ දුස්සීලයන්ට නොව සිල්වතුන්ට ය. ''මහණෙනි, චීවරාදි සිවුපසය ප්‍රණීත ලෙස ලබන්නට කැමතිනම් සිල් සපුරන්නැ'' යි ආකංඛෙය්‍ය සූත්‍රයේදී වදාළේ ඒ නිසා ය. එසේම යම් භික්ෂුන් වහන්සේ නමක් දුස්සීලව සැදැහැයෙන් දෙන දානය වළඳනවානම්, ඊට වඩා උන්වහන්සේ ගිනිසිළුවක් සේ රත් වී දිලියෙන යකඩ ගුලි ගිලීම හොඳ යැයි අග්ගික්ඛන්ධොපම සූත්‍රයේදී වදාළ සේක.

සෙය්‍යො අයො ගුළො භුත්තො
තත්තො අග්ගි සිඛූපමො
යං චෙ භුඤ්ජෙය්‍ය දුස්සීලො
රට්ඨපිණ්ඩං අසංයතො

මේ නිසා මහජනයා මේ සිල්වතුන් යයි සිතා පුදන, සිල්වතුන්ට අයිති මේ සිවුපසය කෙනෙක් දුස්සීලව සිට පරිභෝග කිරීම සොරකමකි. එය ථෙය්‍ය පරිභෝග නම්.

### 2. ඉණ පරිභෝගය

සිල්වතුන් වුව ද සිවුපසය පරිභෝග කළ යුත්තේ ප්‍රත්‍යවේක්ෂා කරමිනි. තමන් සැබවින් ම මේවා පරිභෝග කරන්නේ කුමකට දැයි සිතමිනි; ඒවායේ රසයට, සුවයට ගිජු නොවිය යුතු ය. සිවුපසය ලබන තමන් මහා ලාභියෙකුයි උඩගු නොවිය යුතු ය. ''මාපියන්, නෑදැයන්, ගේ දොර ඉඩකඩම් යනාදී සියල්ල අතහැර පැවිදි වූ මා මේ සිවුපසය පරිහරණය කරන්නේ නොකරම බැරි නිසා'' යයි සිතා පරිභෝග කළ යුතු ය.

මේ සිවුපසය තමන් හරිහම්බකරගත් දේ නොවේ. සැදැහැයෙන් පිදූ දෙයකි. ප්‍රත්‍යවේක්ෂා කොට පාවිච්චි කරන විට පවා තමන්ගේ ය යන හැඟීම නො උපදී. ප්‍රත්‍යවේක්ෂා නොකොට තමන්ගේ දේපලක්, ලෙස සළකා පරිභෝග කිරීම ණයට ගැනීම යි. එයින් තමන් දන් දෙන්නන්ට ණයකාරයෙක් වන්නේ ය. එනිසා ප්‍රත්‍යවේක්ෂා නොකොට සිවුපසය පරිභෝග කිරීම ඉණ පරිභෝග නම් වේ.

ප්‍රත්‍යවේක්ෂා නොකොට වැළඳීම හෝ සිවුපසය පරිහරණය කිරීම සුළු කොට තැකිය යුතු ක්‍රියාවන් නොවේ. බරපතල වරදකි. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේගේ උපසම්පදාව නැතිවන පාරාජිකා සතරක් පණවා තිබේ. මේ අතර ප්‍රත්‍යවේක්ෂා නොකොට කෑදරයෙන් ආහාර වළඳන නවක භික්ෂූන් වහන්සේ දක උන්වහන්සේට මෙසේ සිතුණි. ''යම් විදියකින් තවත් පාරාජිකාවක් පණවන්නේ නම්; පස්වන පාරාජිකාව විය යුත්තේ ප්‍රත්‍යවේක්ෂා නොකොට වැළඳීම ය. එහෙත් ආහාර වැනි දේ සත්ත්වයන්ට නිතරම අවශ්‍යවන මූලික අවශ්‍යතා බැවින් එතරම් දරුණු සිකපදයක් පැණවීම නුසුදුසු ය.'' යනුවෙනි. එසේ තීරණය කළ උන්වහන්සේ, ඒ සිවුපසය පරිහරණය කිරීම ප්‍රත්‍යවේක්ෂා කොට, කොතරම් ලජ්ජාශීලීව, කොතරම් සැලකිල්ලෙන් යුතුව කළ යුත්තක් දැයි වටහා දෙනු පිණිස. 'පුත්ත මංස' සූත්‍රය දෙසූ සේක.

මහණකමට මේ සිවුපසය වුනත් බාධාවක්, කරදරයක්, බරක්; ආශාව, මානය, අහංකාරය ඇති කරවන දෙයක්. ඒත් මේවා නැතිව ජීවත් වීමත් අපහසුයි. ජීවත් නොවී මහණකම කරගෙන යා නොහැකියි. ආහාරයක් වළඳන වාරයක් පාසා, සිවුරක් පොරවන වාරයක් පාසා ප්‍රත්‍යවේක්ෂා කළ යුත්තේ මේ නිසයි. එසේ කිරීමෙන් සිවුපසය පුදන ඇත්තන්ට ඇති ණය ගෙවෙනවා. ඒ වාගේම තණ්හාව අඩුවී මානය අඩුවී, සසර ගමනත් කෙටි වෙනවා.

### 3. දායජ්ජ පරිභෝගය

දායජ්ජ  දායාද යනු පිය උරුමය යි. සෝවාන්, සකදාගාමි, අනාගාමී උතුමන් වහන්සේලා බුදුරජාණන් වහන්සේගේ සැබෑ පුත්‍රයෝ යි. එනිසා බුදුරදුන්ගේ සිවුපසයට සැබෑ උරුමක්කාරයෝ ද උන්වහන්සේලා යි. උන්වහන්සේලා මේ සිවුපසය පරිභෝග කිරීම දායජ්ජ පරිභෝගය යි.

### 4. සාමි පරිභෝගය

රහතන් වහන්සේලා තණ්හාව සහමුලින් ම නැසූ උතුමෝ යි. දායකයන් දෙන දානය මහත්ඵල මහානිසංස කිරීමට ඉහළම සුදුස්සෝ යි. උන්වහන්සේලා බුදුරජාණන් වහන්සේ වාගේම සිවුපසයට හිමිකරුවෝ ය. උන්වහන්සේලා සිවුපසය පරිභෝග කිරීම සාමි පරිභෝගය යි.

මේ සතර පරිභෝගයෙන් ථෙය්‍ය පරිභෝගය හා ඉණ පරිභෝගය වැරදියි, පවිටුයි. සිවුපසය පරිභෝග කරන සෑම භික්ෂූන් වහන්සේ නමකගේ ම එකම බලාපොරොත්තුව විය යුත්තේ, උරුමකරුවන් හෝ හිමිකරුවන් වී දායජ්ජ පරිභෝගයෙන් හෝ සාමි පරිභෝගයෙන් සිවුපසය පරිභෝග කිරීමයි.

## ප්‍රත්‍යවේක්ෂා කරන ආකාරය

### චීවර ප්‍රත්‍යවේක්ෂාව

**පටිසංඛා යොනිසො චීවරං පටිසෙවාමි-යාවදෙව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය, ඩංසමකස වාතාතප සිරිංසප සම්ඵස්සානං පටිඝාතාය, යාවදෙව හිරිකොපීන පටිච්ඡාදනත්ථං.**

### අර්ථය

සිහි නුවණින් කරුණු සළකා මෙම සිවුරු පරිහරණය කරමි. එය හුදෙක් සීතල වළ කා ගැනීමට ය. උෂ්ණය වළකා ගැනීමට ය. මැසි මදුරුවන්ගෙන්, සුළඟින්, අව්වෙන් හා පත්තෑ ගෝනුසු ආදී විෂ සහිත සතුන්ගෙන් සිදුවන පීඩා වළක්වා ලනු පිණිස ය. නො වැසුවහොත් ලජ්ජාව නැතිවන ශරීරාවයවයන් වසා ගනු පිණිස ය.

### පිණ්ඩපාත ප්‍රත්‍යවේක්ෂාව

**පටිසංඛා යොනිසො පිණ්ඩපාතං පටිසෙවාමි-නෙව දවාය, න මදාය න මණ්ඩනාය, න විභූසනාය, යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා, යාපනාය, විහිංසූපරතියා, බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණං ච වෙදනං පටිහංඛාමි, නවං ච වෙදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මෙ භවිස්සති, අනවජ්ජතා ච ඵාසුවිහාරොචාති,**

### අර්ථය

සිහි නුවණින් කරුණු සලකා මෙම පිණ්ඩපාතය වළඳිමි. එහෙත් ඒ විනෝදය (ක්‍රීඩා) පිණිස නොවේ. ආරෝග්‍ය මදදිය වඩනු සඳහා ද නොවේ. හැඩවීම සඳහා ද නොවේ. සිරුර පැහැපත් කරගනු සඳහා ද නොවේ. හුදෙක් ශරීරයත් ජීවිතයත් පවත්වා ගනු පිණිස ය. බඩගිනි වේදනා නසනු පිණිස ය. බඹසර රැකීමට උපකාර වනු පිණිස ය. උපන් බඩගිනි වේදනා නසමි. නූපන් බඩගිනි වේදනා ඉපදීම වළක්වමි. පිණ්ඩපාතාහාරයෙන් මාගේ දිවි පැවැත්ම නිවැරදි වන්නේ ය. විහරණයත් පහසු වන්නේ ය.

### සේනාසන ප්‍රත්‍යවේක්ෂාව

**පටිසංඛා යොනිසො සෙනාසනං පටිසෙවාමි. යාවදෙව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය, ඩංසමකසවාතාතප සිරිංසපසම්ඵස්සානං පටිඝාතාය, යාවදෙව උතුපරිස්සය විනොදනං පටිසල්ලානාරාමත්ථං**

### අර්ථය

සිහි නුවණින් කරුණු සලකා මෙම සෙනසුන පරිභෝග කරමි. එය හුදෙක් සීතල හා උෂ්ණ පීඩා දුරු කර ගනු පිණිස ය. මැසි මදුරුවන්ගෙන් සුළඟින් අව්වෙන් වැස්සෙන් සර්පයන්ගෙන් වන පීඩා දුරු කර ගනු පිණිස ය. හුදෙක් දේශගුණය හා කාලගුණය නිසා වන උවදුරු දුරු කරනු පිණිස ය. නොයෙක් අරමුණු කරා යා නො දී සිත එකඟ කර ගනු පිණිස ය.

### ගිලානප්‍රත්‍ය ප්‍රත්‍යවේක්ෂාව

**පටිසංඛා යොනිසො ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පටිසෙවාමි යාවදෙව උප්පන්නානං වෙය්‍යාබාධිකානං වෙදනානං පටිඝාතාය, අබ්‍යාපජ්ඣපරමතායාති**

### අර්ථය

සිහි නුවණින් කරුණු සලකා ගිලන්පස බෙහෙත් ඔසුවග පරිභෝග

කරමි. (වළඳිමි) එය හුදෙක් ශරීරයෙහි උපන් පීඩා හා වේදනාවන් දුරුකරනු පිණිස ය. නීරෝගී බව පරමාර්ථය කරගෙන ය.

## අතීත ප්‍රත්‍යවේක්‍ෂාව

පැවිදි උතුමන් විසින් සිව්පසය පරිභෝග කිරීමේදී ප්‍රත්‍යවේක්‍ෂාවෙන් ම කළ යුතු බව ඉහතින් දක්විණ. එහෙත් යම් අතපසු වීමකින් ඒ ඒ ප්‍රත්‍යය ප්‍රත්‍යවේක්‍ෂා කර පරිභෝග කිරීමට යම් පැවිද්දෙකුට නොහැකි වූවා නම් සිව්පස පරිභෝගයෙන් පසුව ඒ ගැන ප්‍රත්‍යවේක්‍ෂා කළ හැකි ය. අතීත ප්‍රත්‍යවේක්‍ෂා යනුවෙන් හැඳින්වෙන්නේ, එය යි. මේ උදේ සහ සවස වශයෙන් දිනකට දෙවරක් සිදුකිරීම අතීතයේ පටන් පැවත ගෙන එන පිළිවෙලයි. පහත දක්වෙන්නේ අතීත ප්‍රත්‍යවේක්‍ෂාව කරන ආකාරය යි.

### චීවර අතීත ප්‍රත්‍යවේක්‍ෂාව

**මයා පච්චවෙක්ඛිත්වා අජ්ජයං චීවරං පරිභුත්තං, තං යාවදෙව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය, ඩංස මකස වාතාතප සිරිංසප සම්ඵස්සානං පටිඝාතාය, යාවදෙව හිරිකොපීන පටිච්ඡාදනත්ථං**

### අර්ථය

අද මා ප්‍රත්‍යවේක්‍ෂා නොකොට යම් සිවුරක් පරිභෝග කළේ නම් ඒ ශීතල වළකා ගැනීමට ය. උෂ්ණය වළකා ගැනීමට ය. මැසි මදුරුවන්ගෙන්, සුළඟින්, අව්වෙන්, පත්තෑ, ගෝනුසු ආදී විෂ සහිත සතුන්ගෙන් සිදුවන පීඩා වළක්වා ගනු පිණිස ය. නොවැසුවහොත් ලැජ්ජාව නැතිවන ශරීරාවයවයන් වසා ගනු පිණිස ය.

### පිණ්ඩපාත අතීත ප්‍රත්‍යවේක්‍ෂාව

**මයා පච්චවෙක්ඛිත්වා අජ්ජ යො පිණ්ඩපාතො පරිභුත්තො, සො නෙව දවාය, න මදාය න මණ්ඩනාය, න විභූසනාය යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපන-ාය. විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණඤ්ච වෙදනං පටිහංඛාමි, නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරො චාති.**

අර්ථය

අද මා ප්‍රත්‍යවේක්ෂා නොකොට යම් ආහාරයක් වැළඳුවේ නම් ඒ විනෝදය (ක්‍රීඩා) පිණිස නොවේ. පුරුෂ මදදිය වඩනු සඳහා ද නොවේ. හැඩවීම සඳහා ද නොවේ. සිරුර පැහැපත් කරගනු සඳහා ද නොවේ. හුදෙක් ශරීරයත් ජීවිතයත් පවත්වා ගනු පිණිස ය. බඩගිනි වේදනා නසනු පිණිස ය. බඹසර රැකීමට උපකාර වනු පිණිස ය. උපන් බඩගිනි වේදනා නසමි. නූපන් බඩගිනි වේදනා ඉපදීම වළක්වමි. එයින් මාගේ දිවි පැවැත්ම නිවැරදි වන්නේ ය. විහරණය පහසු වන්නේ ය.

සේනාසන අතීත ප්‍රත්‍යවේක්ෂාව

**මයා පච්චවෙක්ඛිත්වා අජ්ජ යං සෙනාසනං පරිභුත්තං, තං යාව දෙව සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය ඩංසමකස වාතාතප සිරිංසප සම්ඵස්සානං පටිඝාතාය, යාවදෙව උතුපරිස්සය විනොදනං පටිසල්ලානාරාමත්ථං**

අර්ථය

අද මා ප්‍රත්‍යවේක්ෂා නොකොට යම් සෙනසුනක් පරිභෝග කළේ නම් ඒ සීතල හා උෂ්ණ පීඩා දුරු කර ගනු පිණිස ය. මැසි මදුරුවන්ගෙන් අව්වෙන් සුළඟින් සර්පයන්ගෙන් වන පීඩා දුරු කර ගනු පිණිස ය. හුදෙක් කාලගුණික, දේශගුණික උවදුරු නසනු පිණිස ය. නොයෙක් අරමුණු කරා යා නොදී සිත එකඟ කර තබාගනු පිණිස ය.

ගිලානප්‍රත්‍යය අතීත ප්‍රත්‍යවේක්ෂාව

**මයා පච්චවෙක්ඛිත්වා අජ්ජ යො ගිලාන පච්චය භෙසජ්ජපරික්ඛාරො පරිභුත්තො සො යාවදෙව උප්පන්නානං වෙය්‍යාබාධිකානං වෙදනානං පටිඝාතාය අබ්‍යාපජ්ජපරමතායානි.**

අර්ථය

අද මා ප්‍රත්‍යවෙක්ෂා නොකොට යම් ගිලන්පස බෙහෙත් ඔසුවග ආදියත්

පරිභෝග කළේ නම් ඒ හුදෙක් ශරීරයෙහි උපන් රෝග පීඩා හා වේදනා නැති කරනු පිණිස ය. නිරෝගි බව පරමාර්ථය කරගෙන ය.

### ක්‍රියාකාරකම 22.1

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. සිවුපසය නම් කරන්න.
2. ගිහි පිරිස ආහාරපානාදී මූලික අවශ්‍යතා සපුරා ගන්නා රැකියා 4ක් ලියන්න.
3. පැවිදි පිරිස සිවුපසය සපුරා ගන්නේ කෙසේ ද?
4. සිවුපස පරිභෝග හතර නම් කරන්න.
5. පැවිද්දා දායජ්ජ පරිභෝගය කරනු ලබන්නේ කුමන තත්වයට පත් වීමෙන් ද?
6. සිවුපස පරිභෝගය ණය වීමක් ලෙස සැලකෙන්නේ කෙසේ ද?
7. සිවුපස පරිභෝගයේ වටිනාම අවස්ථාව වන්නේ කුමක් ද?
8. ථෙය්‍ය පරිභෝගය යනු කුමක් ද?
9. ප්‍රත්‍යවේක්ෂා යන්නෙහි අර්ථය ලියන්න.
10. අතීත ප්‍රත්‍යවේක්ෂාව යන්න කෙටියෙන් හඳුන්වන්න.

**ජීවිතයට ඔවදනක්**

**"ජයං වෙරං පසවති**
**දුක්ඛං සෙති පරාජිතො"**

දිනන්නා පරදින්නා තුළ වෛරය ඇති කරයි. පැරදුණු තැනැත්තා දුකට පත්වෙයි.

# 23 කල්‍යාණ මිත්‍ර සම්පත්තිය සහ පාප මිත්‍ර විපත්තිය (සච්චංකිර ජාතකය)

## කල්‍යාණ මිත්‍ර සම්පත්තිය.

මිත්‍රයා යනු මෛත්‍රී ගුණයෙන් යුක්ත තැනැත්තා ය. මෙලොව පරලොව ආදි වශයෙන් පුද්ගලයාගේ සෑම අංශයක ම දියුණුව බලාපොරොත්තුවෙන් කටයුතු කරන්නේ කල්‍යාණ මිත්‍රයා ය. කල්‍යාණ මිත්‍ර සම්පත්තිය යනු එබඳු මිතුරන්ගේ ඇසුර ලැබීමයි. කල්‍යාණ මිත්‍රයෝ සිව් දෙනෙකි.

1. මිතුරාට උපකාරයක් ම කරන **උපකාරක** මිත්‍රයා
2. සැප දුක් දෙකෙහි ම මිතුරාගේ ළඟ සිටින **සමාන සුඛ දුක්ඛ** මිත්‍රයා
3. මිතුරාට යහපතක් ම කියා දෙන **අත්ථක්ඛායි** මිත්‍රයා
4. මිතුරාට අනුකම්පා කරන **අනුකම්පක** මිත්‍රයා

කල්‍යාණ යනු යහපත යි. ඒ අනුව මේ සෑම මිතුරෙකු ම පුද්ගලයාගේ යහපත වෙනුවෙන් කටයුතු කිරීම විශේෂ ලක්ෂණය යි.

## පාප මිත්‍ර විපත්තිය.

තමන්ටත් අනුන්ටත් අයහපත පිණිස හේතුවන, තිදොරින් සිදුවන ක්‍රියා පව් ය. ඒවා සිදුකරන්නේ පව්කාරයන් ය. එවැනි පව්කාරයන් මිතුරන් වශයෙන් අපේ ඇසුරට පැමිණීම ස්වාභාවික ය. එවැන්නන්ගේ ඇසුර නිසා හැමෝම මෙලොව වශයෙන් විවිධ කරදරවලට පත්වෙති. පීඩා විඳිති. පසු තැවෙති. ඔවුන්ගේ පාප ක්‍රියාවලට හවුල් වීමෙන් දුක් විපාක මෙලොවදී ත් පරලොවදී ත් විඳින්නට සිදු වේ. දිගින් දිගට ම ඔවුන්ගේ ඇසුර ලබන පුද්ගලයා නිවන් සුවය දුරින් ම දුරස් කර ගනී. පාප මිත්‍රයන්ගේ ඇසුර මහා විපත්තියක් ලෙස සැලකෙන්නේ ඒ නිසා ය. පාප මිත්‍රයෝ ද සිවුදෙනෙකි.

1. මිතුරාගෙන් කිසිවක් ගෙන යෑමේ අදහසින් ම ඇසුරු කරන **අඤ්ඤදත්ථුහර** මිත්‍රයා.
2. වචනයෙන් පමණක් සංග්‍රහ කරන **වචීපරම** මිත්‍රයා.
3. මිතුරාගේ වචනය කුමක් වුවත් අනුමත කරන **අනුප්පියභානි** මිත්‍රයා.
4. පරිහානිය සඳහා ම හේතුවන **අපාය සහායක** මිත්‍රයා.

පුද්ගලයා පාපයට ම නැඹුරු කිරීම මේ පාප මිත්‍ර හෙවත් මිත්‍ර ප්‍රතිරූපකයින්ගේ ලක්ෂණය යි.


කලණ මිතුරු ඇසුර සම්පත්තියක් ලෙස සලකා ලංකර ගැනීමටත් පාප මිතුරු ඇසුර විපත්තියක් ලෙස සලකා දුරස් කිරීමටත් අප වගබලා ගත යුතු ය. මේ සඳහා අප අතරට පැමිණෙන සියලු මිතුරන් ගැන පරීක්ෂාකාරීව සොයා බැලීම වැදගත් ය.

කලණ මිතුරු ඇසුර සම්පත්තියක් වන ආකාරයත් පාප මිතුරු ඇසුර විපත්තියක් වන ආකාරයත් ජාතක පොතේ සඳහන් සච්චංකිර ජාතකයෙන් අවබෝධ කරගත හැකි ය.

## සච්චංකිර ජාතකය

බුදුරජාණන් වහන්සේ මේ ජාතක කතාව දේශනා කර ඇත්තේ දේවදත්ත තෙරුන් තමන් වහන්සේට සිදුකළ විවිධ උපද්‍රව නිමිති කරගෙන ය.

පෙර බරණැස් නුවර විසූ බ්‍රහ්මදත්ත නම් රජතුමාට පුතෙක් විය. ඔහු ඉතා නපුරු ය. සැර පරුෂය. කිසිවෙකුටත් නොගසා නොබැණ හෝ කථා කිරීමේ පුරුද්දක් ඔහුට නොවීය. රජගෙදර අයට පමණක් නොව සෙසු මහජනයාට ද මේ කුමාරයා මහත් හිසරදයක් විය. ඒ නිසා ම ඔහු ''දුෂ්ට කුමාර'' යැයි ප්‍රසිද්ධ විය.



දිනක්..... හෙතෙම පිරිවර සමග දියකෙළියට ගඟට ගියේ ය. ඒ මොහොතේ මහ වැස්සක ලකුණු පහළ විය. තම අතවැස්සන් ඇමතූ කුමාරයා 'ඉක්මණින් මා ගඟ මැදට ගෙන ගොස් නාවාගෙන වරෙව්' යයි අණ කළේ ය. ඔහුගෙන් මිදීමට අවස්ථාවක් බලා සිටි සේවකයෝ ගඟ මැදට ගෙන ගොස් ඔහු දියේ ගිල්වා දමා ආපසු නගරයට ගියහ. කුමාරයා කොහිදැයි රජතුමා විමසූ විට 'දේවයන් වහන්ස අපි නොදනිමු. වැස්ස නිසා පිහිනා අපට කලින් එන්නට ඇතැයි සිතා ආවෙමු' යි කීහ. රජතුමා මිනිසුන් යවා පරීක්ෂා කරවී ය. කිසිවෙකුටත් කුමරුන් සොයා ගත නොහැකි විය.

දියේ ගිලුනත් කුමරු මියගියේ නැත. ගඟ දිගේ ගහගෙන යන කුමාරයා පාවෙමින් එන ලී කොටයක් දැක එහි එල්ලී ඒ මත නැගුණේ ය. දැන් හෙතෙම මරණ බියෙන් තැති ගෙන හඬ හඬා යයි. මේ අතර ඒ නුවර විසූ සිටු පුත්‍රයෙක් හතළිස් කෝටියක් ධනය ගං ඉවුරේ නිධන් කොට ඒ ගැන ලෝභයෙන් මිය ගොස් එහිම සර්පයෙකු ව ඉපිද සිටියේ ය. තවත් සිටු පුත්‍රයෙක් තිස් කෝටියක් ධනය නිධන් කොට මිය ගොස් ඒ ගං ඉවුරේ ම මීයෙකු ව ඉපිද සිටියේ ය. එදා එම මහ වැස්සෙන් මේ දෙදෙනා හුන් තැනට ද ගංවතුර අවුත් දෙදෙනා ගසා ගෙන ගියෝ ය. ඉහත කී කොටය අසු වී ඔව්හු ද ඒ මතට ම නැග ගත්හ. මේ අතර ඒ ගඟ අසළ දිඹුල් ගසක ගිරවෙක් ද විය. ඒ ගස ද මුල සේදී ගඟට ඇද වැටිණ. එවිට දියෙන් තෙත බරිත වූ ගිරවා ද පියාඹාගත නොහැකි ව එම කොටය මතට ම නැග ගත්තේ ය. දැන් මේ සියලු දෙනා ගඟේ පාවී යති.

මේ කාලයේ බෝසතාණන් වහන්සේ ද කසී රට බමුණු කුලයක ඉපිද සිටියෝ ය. ගිහිගෙය කලකිරී තවුස් පැවිද්දෙන් පැවිදි වූ එතුමා ඒ ගං ඉවුර අසළ අසපුවක් තනා ගෙන වාසය කර සිටි සේක. එද මහ රෑ භාවනාවේ යෙදී සිටි උන්වහන්සේට මේ කුමාරයාගේ හැඬීම ඇසිණ. කරුණාවෙන් බර ව ගං ඉවුරට ගිය උන්වහන්සේ එම කුමාරයා දැක කොටයෙන් අල්ලා ගොඩට ගත්හ. කොටය මත තවත් සතුන් ඇති බව උන්වහන්සේ දුටුවේ ගොඩට ගත් පසුව ය.

ඒ සියල්ලන් අසපුවට ගෙන ගොස් ගිනි ගොඩක් ගසා ඒ අසළ හිඳුවා උණුසුම් කරවී ය. මිනිසුන්ට වඩා තිරිසන් සතුන් දුර්වල බැවින් පළමු කොට සතුන්ට ගිනි තැපීමට සලස්වා අන්තිමට කුමාරයාට ගිනි තැපීමට දුන්නේ ය. මෙයින් කිපුණු කුමරා මා රාජ කුමාරයෙක් බවවත් නොසළකා පළමු කොට සතුන්ට සැලකුවේ යැයි කියා තවුසාණන් කෙරෙහි වෛර බැඳ ගත්තේ ය.

බෝසතාණන් වහන්සේගේ සත්කාර විඳිමින් කිහිප දිනක් එහි ම රැඳුණු ඒ සිවුදෙනා හොඳින් සුවපත් වූ පසු යන්නට අවසර ඉල්ලූහ. අවසර ලැබිණි. මීයාත් සර්පයාත් තම තමන් සතු ධනයේ ප්‍රමාණය කියා තමන් වසන තැන සළකුණු දන්වා 'ඔබතුමන්ට ධනය වුවමනා වූ විටෙක අප සිටින තැනට පැමිණ නම කියා ඇමතුව මැනව' යි සමු ගෙන ගියහ. ගිරවා ද 'ඔබතුමන්ට ඇල් සහල් වුවමනා වූ විටක මා සිටින තැනට පැමිණ කතා කරනු මැනවි. එවිට මම මගේ නෑයන් සමග ඔබතුමන්ට අවශ්‍ය තරම් ඇල් වී ගෙනවුත් දෙමි' යි කියා සමු ගත්තේ ය. රාජ කුමාරයා වෛරය සිත තබා ගෙන ම' ස්වාමිනි මා රජ වූ කල්හි පැමිණෙනු මැනව. සංග්‍රහ කරමි'යි  සමු ගෙන ගියේ ය.

නොබෝ කලෙකින් තාපසතුමා මේ පිරිස ගැන විමසනු පිණිස පිටත් ව, පළමු ව ගියේ සතුන් තිදෙනා වෙත ය. නම කී සැණින් ඔවුහු පැමිණ වැඳ, 'අප සතු මේ සම්පත්වලින් උවමනා තරමක් රැගෙන යනු මැනවැ' යි දන්වා සිටියහ. තවුසාණෝ ද ඔවුන්ගේ කෘතඥතාව ගැන සතුටු ව 'උවමනා වුවහොත් ගනිමි' යි කියා කිසිවක් නො ගෙන රජකුමරු හමු වීමට නගරය බලා ගියහ.

මේ වන විට බරණැස් රජතුමා මිය පරලොව ගොස් ඉහත කී දුෂ්ට කුමාරයා රජකමට පත් ව සිටියේ ය. තාපසයාණන් වහන්සේ මඟුල් උයනෙහි දිනක් ගත කොට දෙවන දින පිඬු සිඟා ගැනීම පිණිස නගරයට වැඩියහ. ඒ මොහොතේ ඇතු පිටින් නුවර වීථි සංචාරයේ යෙදී සිටි රජකුමරු දුර දී ම

තවුසා දැක හැඳින ගත්තේ ය. තමාට කළ මදි පුංචිකම සිහි කළ හෙතෙම රාජපුරුෂයන් අමතා, 'මේ හොර තවුසා කිසිවක් ඉල්ලන්නට එන්නේ ය. ඔහු පිටිතල හයා බැඳ නුවර හන්දියක් පාසා ගෙන ගොස් තලා හිස ගසා දමව්' යැයි නියෝග කළේ ය.

නියමය පිළිගත් සේවකයන් විසින් එසේ තලා පෙළා ගෙන යද්දී නවතින හැම තැනක දී ම තවුස් තුමා මෙසේ කියයි.

'දියෙහි පා වෙන ලී කොටයක් ගොඩ දැමීම තරම්වත් ඇතැම් අසත්පුරුෂයන්ට කරන උපකාරය නො වටී. මක් නිසා ද යත් දියෙන් ගොඩ ගත් ලී කොටය දරට හෝ ප්‍රයෝජන වන්නේ ය. එහෙත් අසත්පුරුෂයාට කරන උපකාරය එසේ නො වේ. එබඳු කෙනෙක් දියෙන් ගොඩ ගෙන ය, මා මේ දුක් විඳින්නේ'' යනුවෙනි.

මේ කතාව නිතර නිතර කියන විට එසේ කීමේ හේතුව කුමක්දැයි රාජපුරුෂයෝ විමසූහ. එවිට තවුස් තුමා සියලු පුවත් විස්තර කළේ ය. ඒ ඇසූ මිනිස්සු තමාට මෙතරම් උපකාර කළ කෙනෙකුටත් මෙසේ කරන මේ දුෂ්ට රජුගෙන් අපට කිනම් ඵලයක් දැයි කිපී, රජ කුමරු ඇතු පිටින් බිමට ඇද මරා දමා බෝසතුන් නංවා ගෙන ගොස් රජ තනතුරට පත් කර ගත්හ.

බෝසතාණන් වහන්සේ ද දැහැමින් රජ කරන අතර, ඉහත කී සතුන් එකිනෙකා වෙත සහ පිරිවරින් ගියේ ය. පළමුව සර්පයා වෙත ගොස් ඔහු දුන් සතළිස් කෝටියත්, මීයා වෙත ගොස් ඔහු දුන් තිස් කෝටියත් රැගෙන ඔවුන් දෙදෙනා ද කැටුව ගිරවා වෙත ගියේ ය. ගිරවා වහා පැමිණ කොතරම් ඇල් වී වුවමනා දැයි ඇසී ය. වුවමනා වුවහොත් කියමි යි කියා ගිරවා ද කැටුව ගොස් ඔවුන් තිදෙනට විසීමට සුදුසු පරිදි ගෙවල් තනවා දී සියලු සංග්‍රහ ද කළේ ය.

මෙසේ සියලු දෙනා ම සතුටින් සමගියෙන් වාසය කොට මිය පරලොව ගියහ. එදා දුෂ්ට කුමාර ව උපන්නේ දෙව්දත් තෙරුන් ය. සර්පයා සැරියුත් තෙරුන් ය. මීයා මුගලන් තෙරුන් ය. ගිරවා ආනන්ද තෙරුන් ය. දැහැමි තාපසයා වූයේ බුදුරජාණන් වහන්සේ ය.

## ක්‍රියාකාරකම 23.1

පහත සඳහන් වාක්‍ය සඳහා ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. මිතුරාට යහපතක් ම කියා දෙන මිතුරා
   1. උපකාරක ය
   2. අත්ථක්ඛායි ය
   3. සමාන සුඛ දුක්ඛ ය
2. මිතුරාට උපකාරයක් ම කරන මිතුරා
   1. අනුකම්පක ය
   2. උපකාරක ය
   3. අත්ථක්ඛායි ය
3. සැප දුක් දෙකෙහි ම ළඟ සිටින මිතුරා
   1. සමාන සුඛ දුක්ඛ ය
   2. අනුකම්පකය
   3. අත්ථක්ඛායි ය
4. මිතුරාට අනුකම්පා කරන මිතුරා
   1. අත්ථක්ඛායි ය
   2. සමාන සුඛ දුක්ඛ ය
   3. අනුකම්පක ය
5. මිතුරාට වචනයෙන් පමණක් සංග්‍රහ කරන මිතුරා
   1. අනුප්පියභාණි ය
   2. වචීපරම
   3. අඤ්ඤදත්ථුහර ය
6. කිසිවක් රැගෙන යාමේ අදහසින් ඇසුරු කරන මිතුරා
   1. අපාය සහායක ය
   2. අනුප්පියභාණි ය
   3. අඤ්ඤදත්ථුහර ය
7. මිතුරාගේ වචනය අනුමත කරන මිතුරා
   1. අනුප්පියභාණි ය
   2. වචීපරම ය
   3. අඤ්ඤදත්ථුහර ය

8. පරිහාණිය සඳහා ම හේතුවන මිතුරා
   1. වචීපරම ය.
   2. අපාය සහායක ය.
   3. අඤ්ඤදත්ථුහර ය.

## ක්‍රියාකාරකම 23.2

පහත සඳහන් ප්‍රකාශ කවුරුන් විසින් කා හට ප්‍රකාශ කරන ලද්දේ ද?

| | ප්‍රකාශය | කවුරුන් | කා හට |
|---|---|---|---|
| 1 | ඔබතුමන්ට ඇල් සහල් වුවමනා විටක මා සිටින තැනට පැමිණ කතා කරනු මැනවි. | | |
| 2 | දියෙහි පා වෙන ලී කොටයක් ගොඩ දැමීම තරම්වත් ඇතැම් අසත්පුරුෂයන්ට කරන උපකාරය නොවටී. | | |
| 3 | දේවයන් වහන්ස, අපි නොදනිමු. වැස්ස නිසා පිහිනා අපට කලින් එන්නට ඇතැයි සිතා ආවෙමු. | | |
| 4 | මේ හොර තවුසා මගෙන් යම් කිසිවක් ඉල්ලන්නට එන්නේ ය. | | |
| 5 | ඔබතුමන්ට ධනය වුවමනා වූ විටක අප සිටින තැනට පැමිණ නම කියා ඇමතුව මැනව. | | |

## ක්‍රියාකාරකම 23.3

ගිරවා, මීයා, නයා යන සතුන් තුළ පැවති කල්‍යාණ මිත්‍ර ලක්ෂණ තුනක් හා දුෂ්ට කුමාරයා තුළ පැවති පාප මිත්‍ර ලක්ෂණ තුනක් ලියා දක්වන්න.

කල්‍යාණ මිත්‍ර ලක්ෂණ

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................

පාප මිත්‍ර ලක්ෂණ

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................

### පුහුණුවට

සච්චං කිරෙවමාහංසු - නරා එකච්චියා ඉධ
කට්ඨං විප්ලාවිතං සෙය්‍යො - නත්වෙවෙකච්චියා නරො

-සච්චංකිර ජාතකය-

දියෙහි යන දණ්ඩට
පිහිටක් වෙතත් පෙර සිට
දුදනන් හට පිහිට
නොවචි යන බස සැබෑ කළෙ මට

-ගුත්තිල කාව්‍යය-

දියෙහි පාවෙන ලී කොටයක් ගොඩ දැමීම උතුම් වුවත්, ඇතැම් අසත්පුරුෂ මිතුරන්ට උපකාර කිරීම උතුම් නොවේ යැයි ලොව නුවණැත්තන් කියන කතාව සැබෑවකි.

# 24 පැවිදි සුවය සොයා යමු (දසධම්ම සූත්‍රය)

විවිධ කම්කටොලු සහිත ගිහි ජීවිතයෙන් මිදී පැවිදි ජීවිතයට ඇතුළත් වන්නේ පැවිද්ද අභ්‍යවකාශය වැනි සැහැල්ලු සුවදායක තැනක් වන නිසා ය. එසේ ම සාංසාරික සියලු දුක්වලින් මිදී නිවන අවබෝධ කර ගනු පිණිස ය. එය පැවිදි ජීවිතයේ පරමාර්ථය යි. එවැනි බලාපොරොත්තුවකින් පැවිදි වූවත් ඊට විවිධාකාර බාධා පැමිණේ. විටක ඒ ශ්‍රේෂ්ඨ වූ පැවිද්ද පවා අහිමි වන ලාමක ක්‍රියාවලට පැවිද්දා ගොදුරු වෙයි.

ගිහියන් ගේ සේවයට කැප වූ ජීවිතයක් ගත කරද්දී පැවිද්දා නොදැනීම ලාභ ඉපයීම වැනි දේට නැඹුරු වී මසුරු මල ඉපදී පැවිද්ද යනු කුමක්දැයි සහමුලින් ම අමතක වී යාමට ද ඉඩ ඇත.

පැවිදි සුවය සොයා, සසුනට ඇතුළු වුව ද මෙසේ දුකට උරුමකම් කීමට පැවිද්දන්ට සිදු වනුයේ තමන් ගෙවන පැවිදි ජීවිතය පිළිබඳ අවදියෙන්, සිහියෙන් නොසිටින විට ය. සැබෑ පැවිදි පිළිවෙත කෙබඳු විය යුතු දැයි නිතර සිහි කරමින් පැවිදි ජීවිතය ගත කරන්නේ නම් එය සුවදායක, පහසු දිවියක් කරගන්නට පැවිද්දාට හැකි වනු ඇත.

දසධම්ම සූත්‍රයේ දී පෙන්වා දී ඇත්තේ පැවිදි දිවිය සුරක්ෂිත කර ගනු පිණිසත්, අර්ථවත් වනු පිණිසත්, සුවදායක වනු පිණිසත් නිතර නිතර සිහි කළ යුතු (ප්‍රත්‍යවේක්ෂා කළ යුතු) කරුණු දහයකි. දසධම්ම සූත්‍රයත් එහි අර්ථයත් හදාරා එම කරුණු ඉගෙන ගනිමු.

## දසධම්මසුත්තං

**එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං, භගවා එතදවොච - දස ඉමෙ භික්ඛවෙ ධම්මා පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බා, කතමෙ දස?**

1. වෙවණ්ණියම්හි අජ්ඣුපගතොති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං
2. පරපටිබද්ධා මෙ ජීවිකාති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං
3. අඤ්ඤො මෙ ආකප්පො කරණීයොති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං
4. කච්චි නු ඛො මෙ අත්තා සීලතො න උපවදතීති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං
5. කච්චි නු ඛො මං අනුවිච්ච විඤ්ඤූ සබ්‍රහ්මචාරී සීලතො න උපවදන්තීති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං
6. සබ්බෙහි මෙ පියෙහි මනාපෙහි නා නා භාවො විනා භාවොති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං
7. කම්මස්සකොම්හි කම්මදායාදො කම්මයොනි කම්මබන්ධු කම්ම පටිසරණො, යං කම්මං කරිස්සාමි කල්‍යාණං වා පාපකං වා තස්ස දායාදො භවිස්සාමීති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං
8. කථං භූතස්ස මෙ රත්තිං දිවා වීතිපතන්තීති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං
9. කච්චි නු ඛො' හං සුඤ්ඤාගාරෙ අභිරමාමීති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං
10. අත්ථි නු ඛො මෙ උත්තරි මනුස්ස ධම්මා අලමරියඤාණදස්සන විසෙසො අධිගතො, සොහං පච්ඡිමෙ කාලෙ සබ්‍රහ්මචාරීහි පුට්ඨො න මඞ්කුභවිස්සාමීති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං ඉමෙ ඛො භික්ඛවෙ දස ධම්මා පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බාති. ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

## දසධම්ම සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේත නම් රජකුමාරයාගේ උයනෙහි (කරවන ලද) අනාථ පිණ්ඩික මහ සිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක. එකල්හි බුදුරජාණන් වහන්සේ මහණෙනි' යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු 'එසේය ස්වාමීනි' යි භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නාහු ය. භාග්‍යවතුන් වහන්සේ මේ මතු දැක්වෙන ධර්මය වදාළ සේක. මහණෙනි, මේ දස ධර්මයෝ (කරුණු දසය) ගිහි ගෙය හැර පැවිදි වූවහු විසින් නිතර නුවණින් සැලකිය යුත්තාහු ය.
ඒ දස ධර්මයෝ කවරහු ද යත්:

1. මම ගිහියන්ගේ ස්වරූපයෙන් වෙනස් ස්වරූපයකට පැමිණියේ වෙමි යි පැවිද්ද විසින් නැවත නැවත සිහි කළ යුතු ය.
2. මාගේ දිවි පැවැත්ම අනුන් පිළිබඳ අනුන් හා බැඳුණු වූවකැයි පැවිද්දා විසින් නැවත නැවත සිහි කට යුතු ය.
3. මා ගිහියන්ට වෙනස් ආකාරයකින් හැසිරිය යුතු යැයි පැවිද්දා විසින් නැවත නැවත සිහි කට යුතු ය.
4. කෙසේද? මාගේ සීලය නිසා මගේ සිත මට චෝදනා නො නගන්නේ දැයි පැවිද්ද විසින් නැවත නැවත සිහි කට යුතු ය.
5. කෙසේද? සබ්‍රහ්මචාරිහු මා ගැන විමසා, සීලය කරණකොට මට චෝදනා නො කෙරෙත් දැයි පැවිද්ද විසින් නිතර නිතර සිහි කට යුතු ය.
6. මම ප්‍රිය මනාප වූ සියලු දෙයින් වෙන් විය යුතු වෙමි. සියල්ල අත්හළ යුතු වෙමියි පැවිද්ද විසින් නැවත නැවත සිහි කට යුතු ය.
7. ''මම කර්මය තමා අයත් දෙය කොට ඇත්තෙම් යැයි ද කර්මය උරුමය කොට ඇත්තෙම් යැයි ද මම කර්මයෙන් උපන්නෙම් යැයි ද මම කර්මය ඥාති කොට ඇත්තෙම් යැයි ද මම කර්මය පිළිසරණ කොට ඇත්තෙම් යැයි ද යහපත් හෝ අයහපත් හෝ යම් කර්මයක් කරම් ද, මම එහි උරුම කරු වන්නෙම් යැයි'' ද පැවිද්ද විසින් නිතර නිතර සිහි කට යුතු ය.
8. කිමෙක් ද? මගේ රෑ දවාල කුමක් කරමින් ගත වන්නේ දැයි පැවිද්ද විසින් නිතර නිතර සිහි කට යුතු ය.
9. කෙසේද? මම විවේක සෙනසුන්වල විසීමට කැමැත්තෙම් ද යි පැවිද්ද විසින් නිතර නිතර සිහි කට යුතු ය.
10. කෙසේද? මරණාසන්න කාලයේ දී ''ඔබ සාමාන්‍ය මිනිස් ගුණ ඉක්මවා ගිය ධ්‍යාන මාර්ග ඵලාදියක් ලබා ඇත්ද'' යි සබ්‍රහ්මචාරින් විචාළ කල්හි දුර්මුඛ නොවී කියන්නට යම් කිසිවක් තිබේ දැයි පැවිද්ද විසින් නිතර නිතර සිහි කට යුතු ය.

මහණෙනි, මේ ධර්මයෝ දස දෙන පැවිද්දන් විසින් නිතර නිතර මෙනෙහි කළ යුත්තාහු ය.

භාග්‍යවතුන් වහන්සේ මේ දේශනාව මෙසේ වදාළ සේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම දේශනාව අසා සතුටු වූහ.

## ක්‍රියාකාරකම 24.1

සුදුසු වචන යොදා හිස් තැන් පුරවන්න.

(විවිධාකාර, ගිහියන්, අනුන්, සීලය, සබ්‍රහ්මචාරීහු, මරණාසන්න, දයාදය, ශූන්‍යාගාරයෙහි, ඇවතුම් පැවතුම්, රැය දවාල, උත්තරීතර, පිළිසරණ)

1. මම ................................ ස්වරූපයෙන් වෙනස් ස්වරූපයකට පැමිණියේ වෙමි යි පැවිද්ද විසින් නැවත නැවත සිහි කළ යුතු ය.
2. මාගේ ජීවිකාව ................................ පිළිබඳ වූවකැයි පැවිද්ද විසින් නැවත නැවත සිහි කට යුතු ය.
3. මා ගිහියන්ට වෙනස් ................................ ඇත්තේ යැයි පැවිද්ද විසින් නැවත නැවත සිහි කට යුතු ය.
4. කිමෙක් ද? මාගේ ................................ නිසා මට මගෙන් ම චෝදනා නො නැගෙන්නේ දැයි පැවිද්ද විසින් නැවත නැවත සිහි කට යුතු ය.
5. කිමෙක් ද? ................................ මා ගැන විමසා මගේ සීලය ගැන චෝදනා නො කරත්ද'' යි සියල්ල වෙනස්වන සුලුයැයි පැවිද්ද විසින් නැවත නැවත සිහි කට යුතු ය.
6. මට ප්‍රිය මනාප වූ ................................ වූ සියල්ල වෙනස්වන සුලුයැයි පැවිද්ද විසින් නැවත නැවත සිහි කට යුතු ය.
7. මම කර්මය උරුම කොට ඇත්තෙමි යැයි ද මම කර්මය ............................ කොට ඇත්තෙමි යැයි ද මම කර්මයෙන් උපන්නෙමි යැයි ද මම කර්මය ඥාති කොට ඇත්තෙමි යැයි ද මම කර්මය ................................ කොට ඇත්තෙමි යැයි ද යහපත් හෝ අයහපත් හෝ යම් කර්මයක් කරම් ද, එහි උරුමකරු වන්නෙමි යැයි ද පැවිද්ද විසින් නිතර නිතර සිහි කට යුතු ය.
8. කිමෙක් ද? මගේ ................................ කුමක් කරමින් ගත වන්නේ දැයි පැවිද්ද විසින් නිතර නිතර සිහි කට යුතු ය.
9. කිමෙක් ද ? මම ................................ සිත් අලවා වාසය කරම් දැයි පැවිද්ද විසින් නිතර නිතර සිහි කට යුතු ය.
10. කිමෙක් ද? ............................ කාලයේ දී ඔබ යම්කිසි ............................ ධර්මයක් ලබා ඇත්දැයි සබ්‍රහ්මචාරින් විචාළ කල්හි දුර්මුඛ නොවන්නට යම්කිසිවක් තිබේ දැයි පැවිද්ද විසින් නිතර නිතර සිහි කටයුතු යුතු ය.

### ක්‍රියාකාරකම 24.2

පැවිදි ජීවිතයේ සැහැල්ලුවත් ගිහි ජීවිතයේ කම්කටොලු ස්වාභාවයත් ගැන ඔබට හිතෙන ආකාරයට කරුණු 5 බැගින් ලියා දක්වන්න.

| පැවිදි ජීවිතය | ගිහි ජීවිතය |
|---|---|
| 1 | 1 |
| 2 | 2 |
| 3 | 3 |
| 4 | 4 |
| 5 | 5 |

### පුහුණුවට

**සම්බාධොයං ඝරාවාසො**
**රජස්සායතනං ඉති**
**අබ්භොකාසොව පබ්බජ්ජා**
**ඉති දිස්වාන පබ්බජි**

### ජීවිතයට ඔවදනක්

**"සුදස්සං වජ්ජං අඤ්ඤෙසං**
**අත්තනො පන දුද්දසං"**

අනුන්ගේ දොස් දැකීම පහසු ය.
තමාගේ දොස් දැකීම අපහසු ය.

# 25 උතුම් පින් කෙතට බැඳෙන නියර (හෙරණසිඛ)

''හෙරණසිඛ'' පොළොන්නරු යුගයේ සකස් වුණු විනය ග්‍රන්ථයකි. එදා සිට මේ දක්වාම එය සාමණේර විනය ග්‍රන්ථයක් ලෙස භාවිත කෙරේ. හෙරණසිඛ විනිස නමින් මෙයට විවරණ ග්‍රන්ථයක් ද ඇත. වත් පිළිවෙත් ආදී තවත් බොහෝ කරුණු එහි තිබේ.

සාමණේර යන්නේ තේරුම ''ශ්‍රමණ පුත්‍රයා'' යනු ය. සාමණේර අවදිය භික්ෂූන් වහන්සේ නමක් වීමට පුහුණු වන කාලයයි. උන්වහන්සේට භික්ෂුභාවය ලැබෙන්නේ උපසම්පදා වීමෙන් පසුව ය.

සාමණේර නමක් පුහුණු විය යුතු අංග තුනක් තිබේ. එනම්, දස සීලය, වත පිළිවෙත හා සේඛියා ය. උපසම්පදාව ලැබෙන්නේ මේ අංග තුනෙන් ම හොඳින් හික්මුණු සාමණේරයන් වහන්සේට ය. පිළිගත් සාසනික ක්‍රමය එය යි.

විනය පිටකයට අයත් මහාවග්ග පාලියේ සාමණේරයන් හික්මිය යුතු ශික්ෂාපද සඳහන් වේ. එහි සිල් වශයෙන් දැක්වෙන්නේ ශික්ෂාපද දහයකි. ඊට අමතර ව තවත් ශික්ෂාපද දහයක් ද පණවා තිබේ. එයින් පහක් සාමණේර භාවය නැතිවන පාරාජිකා දහයට ඇතුළත්වන අතර, අනෙක් ශික්ෂාපද පහ දස දඬුවම් අතරට වැටේ. මේ හෙරණසිඛ සකස් වී තිබෙන්නේ ඒ මහාවග්ග පාලියේ එන පිළිවෙලට ය. ඒ අනුව ඉහත දැක් වූ ශික්ෂාපද විස්ස (20) දසසිල්, දසසිඛ, දස පරිජි, දස නාසනා, දස දඬුවම් යනුවෙන් පණස් ආකාරයකින් මෙහි බෙදා දක්වා තිබේ.

උප සපන් වී භික්ෂුභාවයේ හිමිකම ලබා සඟ සසුන හොබවනු කැමති සාමණේරයන් වහන්සේලා මේ පණස් ආකාරයට ම සාදරයෙන් ගෞරවයෙන් හික්මිය යුත්තේ ය.

## හෙරණහට දසසිල් දසසිඛ දසපරිජි දසනාසනා දස දඬුවම්වත් නම්;

**හෙරණහට දසසිල් නම් කවර යත්;** පණිවායෙන් දුරු වීම, අයිනාදනින් දුරු වීම, අබ්‍රම්සරින් දුරු වීම, මුසවායෙන් දුරු වීම, රහමෙරින් දුරු වීම, විකල් බොජුනෙන් දුරු වීම, නටනු, ගයනු, වයනු, විසුළුදස්නෙන් දුරු වීම, මල් ගඳවිලවුන් ඇ දැරීමෙන් දුරු වීම, උසසුන් මහ අස්නෙන් දුරු වීම, රන් රිදී, මසු කහවණු පිළිගැන්මෙන් දුරු වීම, යන මේ හෙරණහට දසසිල් නම් වේ.

හෙරණහට දසසිඛ නම් කවර යත්; මේ දසසිල් මැ හික්මිය යුතු බැවින් දසසිඛ නම් වේ.

**හෙරණහට දසපරිජි නම් කවර යත්;** දූන දූන සතක්හු දිවි ගැලවුව පරිජි වේ. දූන දූන දනා අයත් දාහූ වැලයකුදු සොර සිතින් ගත පරිජි වේ. දූන දූන තිරිසන්ගිය මාගමක හා ද මෙවුන්දම් සෙවිය පරිජි වේ. දූන දූන සිනාමුසුබසිනුදු මුසවා කිව පරිජි වේ. දූන දූන පිනිබිඳක් සා ද රා ටිකක් පුව පරිජි වේ. බුදුරුවන් හි අයුණු කිව පරිජි වේ. දමුරුවන්හි අයුණු කිව පරිජි වේ. සඟුරුවන්හි අයුණු කිව පරිජි වේ. පුවතක් මෙහෙණක හා ද මෙවුන්දම් සෙවිය පරිජි වේ. අනියත මිසදිටු ගත පරිජි වේ, යන මේ හෙරණහට දසපරිජි නම් වේ.

**හෙරණහට දසනාසනා නම් කවර යත්;** මේ දසපරිජි මැ දසනාසනා නම් වේ. මෙහි පසෙක් ලිඞ්ගනාසනා යි, පසෙක් සබ්බනාසනා යි.

**පස් ලිඞ්ගනාසනා නම් කවර යත්;** ''දූන දූන සතක්හු දිවි ගැලවුව, දූන දූන අයත් දාහූ වැලයකුදු සොරසිතින් ගත, දූන දූන තිරිසන්ගිය මාගමක හා ද මෙවුන්දම් සෙවිය, දූන දූන සිනාමුසු බසිනුදු මුසවා කිව, දූන දූන පිනිබිඳක් සා ද රාටිකක් පුව යන මේ පස් ලිඞ්ගනාසනා නම් වේ''

**පස් සබ්බනාසනා නම් කවර යත්;** බුදුවරුන්හි අයුණු කිව, දමුරුවන්හි අයුණු කිව, සඟුරුවන්හි අයුණු කිව, පුවතක් මෙහෙණක හා ද මෙවුන්දම් සෙවිය, අනියත මිසදිටු ගත යන මේ පස් සබ්බනාසනා නම් වේ.

**හෙරණසහට දසදඬුවම්වත් නම් කවර යත්;** විකල් බොජුන, නටනු ගයනු, වයනු විසුළුදස්න, මල්ගඳවිලවුන් ඈ දැරීම උසසුන් මහඅස්නේ හිඳීම, රන්රිදී මසුකහවණු පිළිගැන්ම, පැවිද්දන් ලබන ලාභයෙන් පිරිහෙළීම, පැවිද්දන්ට උපද්‍රව සඳහා පියෝ කිරීම, පැවිද්දන් ලග්නා අවසින් නෙරනට පියෝ කිරීම. පැවිද්දන්ට ආකෝසා පරිකෝසා බිණීම, පැවිද්දන් පැවිද්දන් කෙරෙහි බිඳුවීම යන මේ හෙරණසහට දසදඬුවම් වත් නම් වේ. මෙහි පසෙක් වැලිදඬුවම් වෙති. පසෙක් සඟරමින් නෙරනා වෙති.

**වැලිදඬුවම් වත් පස නම් කවර යත්;** විකල් බොජුන, නටනු ගයනු වයනු විසුළුදස්න, මල්ගඳ විලවුන් ඈ දැරීම උසසුන්මහඅස්නේ හිඳීම, රන් රිදී මසු කහවණු පිළිගැන්ම, යන මේ පස වැලි දඬුවම් වත් නම් වේ.

**සඟරමින් නෙරනාවත් පස නම් කවර යත්;** ''භික්ඛූනං අලාභාය පරිසක්කති, භික්ඛූනං අනත්ථාය පරිසක්කති, භික්ඛූනං අවාසාය පරිසක්කති, භික්ඛූනං අක්කොසති පරිභාසති'' භික්ඛූ භික්ඛූහි භෙදෙති'' යන මේ පස සඟරමින් නෙරනාවත් නම් වේ.

හෙරණසික නිමි.

## හෙරණසික පිළිබඳ විස්තර

### දස සිල් හා දස සිඛ:

බුදුරජාණන් වහන්සේ විසින් සාමණේරයන් වහන්සේ සඳහා අනුදන වදාළ ශික්ෂා පද දහය සාමණේර දස සීලය යි. මේ දස සිල් ම හික්මවිය යුතු හෙයින් දස සිඛ නම් වේ.

### දස ශික්ෂා පද නම්:

1. පණිවායෙන් දුරුවීම
   තමන් විසින් හෝ අනුන් ලවා සතුන් මැරීමෙන් වැළකීම යි.

2. අයිනාදනින් දුරු වීම
   නුදුන් අන්සතු වස්තුව සොර සිතින් ගැනීමෙන් හෝ ගැන්වීමෙන් හෝ වැළකීම යි.

3. අබ්‍රම්සරින් දුරු වීම
මෛථුන්දමින් වැළකීම යි.

4. මුසාවාදයෙන් දුරු වීම
බොරු කීමෙන් වැළකීම යි.

5. රහමෙරින් දුරු වීම
මත්වීමට හා සිත අවුල් වී ප්‍රමාදයට හේතු වන මත්වන දේ පානයෙන් වැළකීම යි.

6. විකල් බොජුනෙන් දුරු වීම
පෙරවරුවේ පමණක් පාවිච්චි කළ යුතු (යාවකාලික) ආහාරයන් පස්වරුවේ හෝ රාත්‍රියේ වැළඳීමෙන් වැළකීම යි.

7. නටනු ගයනු වයනු විසුළු දස්නෙන් දුරු වීම
තමා නැටීමෙන්, තමා වැයීමෙන්, තමා ගැයීමෙන් හා ඒ නැටුම් ගැයුම් වැයුම් ආදී විකාර දැකීමෙන් වැලකී සිටීම යි.

8. මල් ගඳ විලවුන් අෑ දැරීමෙන් දුරු වීම
මල් පැළඳීම ය සුවඳ විලවුන් ගැල්වීම ය යන මේ ආදියෙන් ශරීරය සැරසීම, සුවඳවත් කිරීම පැහැපත් කිරීම ආදියෙන් වැළකීම යි.

9. උසසුන් මහ අස්නෙන් දුරු වීම
වඩුරියනට වඩා උස් අසුන් හා සුවපහසු දික් ලොම් පලස් ඇතිරූ අසුන් හෝ සුඛෝපභෝගී ලෙස සැකසූ (කුෂන් කළ) අසුන් පරිභෝග කිරීමෙන් වැළකීම යි.

10. රන් රිදී මසු කහවණු පිළිගැනීමෙන් දුරු වීම
රත්රන්, රිදී, මස්ස හෙවත් මුද්‍රා සලකුණු යොදා මිල නියම කළ කාසි හෝ පත්‍ර ද, කහවණු හෙවත් රන්, රිදී, තඹ එක්කොට රූප යොදා කළ කාසි ද පිළිගැනීමෙන් වැළකීම යි.

### දස පරිජි හෙවත් දස නාසනාඃ

''මෙ දසපරිජි නම් කෙසේ වී ද යත්, යම් හේතුයෙකින් මෙ සස්නෙන් පරදවා ද සස්නෙන් ච්‍යුත කෙරේ ද සදහමින් දුරු කෙරේ ද ශක්‍රාත්මභාවයකින් බ්‍රහ්මාත්භාවයකින් ච්‍යුත වූවක්හු වැනි කෙරේ ද එබැවින් මෙදස පරිජි නම් වී,'' යනුවෙන් හෙරණසිඛෙ හි සඳහන් දස පාරාජිකාවන්හි අර්ථය පැහැදිලි කොට ඇත. ඒ අනුව සසුනෙන් පැරදීම, ශ්‍රමණ භාවය අහෝසි වීම පරිජි හෙවත් පාරාජිකා යන්නෙහි අර්ථය වන්නේ ය. සාමණේර පැවිද්දකු පාරාජිකා විය හැකි කරුණු දහයක් මෙහි විස්තර වේ.

### එනම්ඃ

දැන දැන, මරණ සිතින් කවර සතකුගේ හෝ දිවි තොර කෙරේ ද තමාට අයත් නැති නූල් පොටක් තරම් දෙයක් හෝ සොර සිතින් ගනී ද මෛථුන සේවනය කරයි ද බොරු කියයි ද මත්වන දේ පානය කරයි ද බුදුරජාණන් වහන්සේගේ නුගුණ කියයි ද සදහම්හි නුගුණ කියයි ද ශ්‍රාවක සංඝයාගේ නුගුණ කියයි ද මිසදිටු ගත්තේ වේ ද යටත් පිරිසෙයින් මෙ හෙණක සමග වත් මෙවුන් දම් සේවනය කෙරේ ද, එම සාමණේර තෙම පාරාජිකා වේ. දශ නාශනා නමින් හැඳින්වෙන්නේ ද මේ දස පාරාජිකාව ම ය.

### නාසනාඞග දසයඃ

1. පස් ලිඞග නාසනා
2. පස් සබ්බ නාසනා

වශයෙන් දෙපරිදි වේ.

### 1. පස් ලිඞග නාසනා

ලිංග යනු ශ්‍රමණ වේශය හෙවත් පැවිදි ස්වරූපය යි. නාසනා යනු අහෝසි කිරීම යි. ඒ අනුව ලිංග නාසනා යනු සිවුරු හැරවීම හෙවත් උපැවිදි කිරීම ය. පස් ලිඞග නාසනා නම්..... ප්‍රාණඝාතය අදත්තා දානය මෛථුන සේ වනය මුසාවාදය හා සුරාපානය වේ. මේ කරුණු පහ සාමණේර දස සීලයේ මුල් ශික්ෂා පද පහ ම ය. මෙම ශික්ෂා පද පහෙන් එකකුදු කඩ කළ හොත් සරණාගමනයේ සිට සියලු සාමණේර සීලය බිඳ වැටේ. එයින් ම ආචාර්ය

උපාධ්‍යායවරුන් ද අහිමි වේ. කලින් ලබා තිබූ සෙනසුන ද අහිමි වේ. ඉන්පසු එම හෙරණ හට ඉතිරි වන්නේ ශ්‍රමණ ලිංගය හෙවත් පැවිදි වේශය පමණි. එබැවින් වරදක් කළ අයකු විසින් තමා එම වරද කළ බව එකෙණෙහි ම පිළිග න්නේ නම් සිවුරු ඉවත් නො කර සරණාගමනයෙහි පිහිටුවිය යුතු ය. උප ාධ්‍යායවරුන් ද හිමි කර දිය යුතු ය. එම වරද වහා ම නො පිළිගන්නේ නම් සිවුරු හරවා යැවිය යුතු ය. පසු ව හෝ වරද පිළිගෙන හික්මී නැවත පැවිද්ද ඉල්ලා ආයේ නම් පැවිදි කළ හැකි ය.

## 2. පස් සබ්බ නාසනා

සබ්බ නාසනා පහ නම්ඃ බුදුරජාණන් වහන්සේට නින්දා අපහාස කිරීම, ධර්මයට නින්දා අපහාස කිරීම, සංඝයාට නින්දා අපහාස කිරීම, යටත් පිරිසෙයින් මෛහෙණක සමග හෝ මෛථුන සේවනය කිරීම හා මිසදිටු ගැනීම ය. මුල් පාරාජිකා පහට වඩා මෙම කරුණු පහෙන් පාරාජිකා වීම බරපතල වේ. මෙම කරුණෙකින් පාරාජිකා වූ විටෙක උපැවිදි කිරීම අනිවාර්ය වේ. ලිංග නාසනාවල දී උපැවිදි කොට වැලි දඬුවම් දී අවවාද කොට නැවත පැවිදි කළ හැකි ය.

**දස දඬුවම් වත්ඃ**

සාමණේරවරුන් සඳහා නියම කර ඇති ලිංග නාසනා, සබ්බ නාසනා, වැලි දඬුවම් හා සංඝාරාමයෙන් නෙරපීම වැනි දඬුවම් ක්‍රමවල පරමාර්ථ වී ඇත්තේ පුද්ගලයා යහමඟට ගැනීම ය. එහි දී වරද කළ විට පැවිද්දකු වශයෙන් ඇති සියලු හිමිකම් අහිමි කිරීම දඬුවම් වන අතර වරද පිළිගත් පසු නැවත හිමිකම් ලබාදීම ස්වභාවය යි.

වරද කළ සාමණේරවරුන්ට දඬුවම් දිය යුතු කරුණු දහයක් වේ. ඒ දස දඬුවම් වත් නමි.

**එම දස දඬුවම් වත් මෙසේ යඃ**

විකල් බොජුන නටනු, ගයනු, වයනු, විසුළු දස්න, මල් ගඳ විලවුන් ඈ දැරීම, උසසුන් මහ අස්නේ හිඳීම රන් රිදී, මසු කහවණු පිළිගැන්ම, පැවිද්දන්

ලබන ලාභයෙන් පිරිහෙළීම පැවිද්දන්ට උපද්‍රව සඳහා ක්‍රියා කිරීම පැවිද්දන් වාසය කරන ආවාසයෙන් නෙරපීමට ක්‍රියා කිරීම, පැවිද්දන්ට ආක්‍රෝශ පරිභව කිරීම පැවිද්දන් පැවිද්දන් කෙරෙහි බිඳුවීම යන මේ හෙරණ හට දස දඬුවම් වත් නම් වේ. මෙයින් වත් පහක් වැලි දඬුවම් ය. වත් පහක් සංඝාරාමයෙන් නෙරපන කරුණු ය.

**වැලි දඬුවම් පසඃ**

විකල් බොජුන නටනු,ගයනු, වයනු, විසුළු දස්න, මල් ගඳ විලවුන් ඈ දැරීම, උසසුන් මහ අස්නේ හිඳීම රන් රිදී, මසු කහවණු පිළිගැනීම.

මේ පස වැලි දඬුවම් වත් නම් වේ.

**සඟරමින් නෙරනා වත් පසඃ**

**''භික්ඛූනං අලාභාය පරිසක්කති - භික්ඛූනං අනත්ථාය පරිසක්කති - භික්ඛූනං අවාසාය පරිසක්කති - භික්ඛූනං අක්කොසති - පරිභාසති - භික්ඛූ භික්ඛූහි භෙදෙති''**

**එනම්ඃ**

භික්ෂූන්ට අලාභ කිරීමට උත්සාහ කිරීම, භික්ෂූන්ට අනර්ථ කිරීමට උත්සාහ කිරීම, භික්ෂූන්ගේ වාසස්ථානයෙන් නෙරපීමට උත්සාහ කිරීම, භික්ෂූන්ට නින්දා අපහාස කිරීම, භික්ෂූන් භික්ෂූන් හා බිඳවීම යන මේවා යි.

භික්ෂූන්ට අලාභ කිරීම් ආදී ඉහත දක්වූ වැරදි කරන සාමණේරවරුන්ට දිය යුතු දඬුවම් කුමක්දැයි විචාළ කල්හි 'අනුජානාමි භික්ඛවෙ ආවරණං කාතුං' යයි බුදුරජාණන් වහන්සේ අනුදන වදාළහ. මෙහි ආවරණය යනු වරද කළ සාමණේරවරුන්ට ආචාර්ය උපාධ්‍යායන් වහන්සේගේ ආවාසයෙන් හා තමන්ගේ ආවාසයෙන් ද නෙරපීම. ය. සාමණේරවරුන් අතින් සිදු වන වැරදි වෙන වෙන ම නො සලකා කීපයක් එක්කොට එක් දඬුවමක් නියම කළ හැකි ය.

## ක්‍රියාකාරකම 25.1

සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. බුදුරජාණන් වහන්සේට නින්දා අපහාස කිරීම.
   1. දස පරිජි නම් වේ.
   2. සබ්බ නාසනා නම් වේ.
   3. දස දඬුවම් නම් වේ.

2. සඟරමින් නෙරනාවත්වලට අයත් වන්නකි,
   1. භික්ෂූන්ට අනර්ථ කිරීමට උත්සාහ ගැනීම.
   2. ධර්මයට නින්දා අපහාස කිරීම.
   3. බුදුරජාණන් වහන්සේට නින්දා අපහාස කිරීම.

3. අයිනාදනින් දුරුවීම යනු,
   1. බොරුකීමෙන් වැළකීමයි.
   2. සොරකමින් වැළකීමයි.
   3. සතුන් මැරීමෙන් වැළකීමයි.

4. වැලි දඬුවම්වලට අයත් නොවන්නකි.
   1. විකල් බොජුන.
   2. විසුළු දස්න.
   3. ප්‍රාණඝාතය.

5. සාමණේර පැවිද්දෙන් ආවාසයෙන් නෙරපීමට හේතුවන වරදකි.
   1. භික්ෂූන් භික්ෂූන් හා බිඳවීම.
   2. විකල් බොජුන.
   3. මල් ගඳ විලවුන් ඇ දැරීම.

6. සාමණේර පැවිද්දෙන් උපැවිදි කරවීමට හේතු නොවන්නක් වන්නේ,
   1. බුදුන් වහන්සේට නින්දා අපහාස කිරීම.
   2. ප්‍රාණඝාතය.
   3. අදත්තාදානය.

7. ආචාර්ය උපාධ්‍යායවරුන් හා වැඩසිටින සෙනසුන පවා පැවිද්දෙකුට අහිමි වන්නේ,
   1. පස් සබ්බ නාසනා යටතේ ය.
   2. පස් ලිංග නාසනා යටතේ ය.
   3. වැලි දඬුවම් යටතේ ය.

8. භික්ෂූන්ට අලාභ කිරීමට උත්සාහ කිරීම.
   1. ලිංග නාසනා සඳහා හේතු වේ.
   2. වැලි දඬුවම් විඳීමට හේතු වේ.
   3. ආවාසයෙන් නෙරපීමට හේතු වේ.

### ක්‍රියාකාරකම 25.2

1. සාමණේර නමක් හික්මිය යුතු අංශ තුන නම් කරන්න.

2. දසසිල්වලට අමතර ව සෙඛියාවලියෙහි දැක්වෙන ශික්ෂාපද දහය මොනවා ද?

3. සාමණේර සීලය පනස් ආකාරයකට බෙදෙන හැටි කියන්න.

### පුහුණුවට

**සබ්බදා සීලසම්පන්නො**
**පඤ්ඤවා සුසමාහිතො**
**ආරද්ධ විරියො පහිතත්තො**
**ඕඝං තරති දුත්තරං**

හැමදා සිල් රැකීම, ප්‍රඥාවන්ත වීම, හිත එක්තැන් කර ගැනීම, ආරම්භ කරන ලද උත්සාහය ඇතිවීම දුෂ්කර වූ සසර සැඩ පහර තරණය කිරීමට හේතු ය.

# 26 වළාකුලෙන් මිදෙන හෙරණ සඳ (බාල සික්ඛා)

බාල සික්ඛා යනු සාමණේරයන් වහන්සේලා හික්මවීම සඳහා ම සකස් වූ කුඩා ග්‍රන්ථයකි. ඒ බව **"සීලාදිවිවරං ගන්ධං"** (ගන්ධං යනු ග්‍රන්ථය යි) යනා දී ආරම්භක ගාථාවෙන් ම පැවසේ. එහි දී සීලය, ආරම්භය හෙවත් ප්‍රවේශය කරගත් සාමණේරයන් සඳහා ම වූ "බාල සික්ඛා" නම් ග්‍රන්ථය තුනුරුවන් වැඳ කෙටියෙන් පවසන බව කියයි. එතැන් සිට දහතුන් වන ගාථාව දක්වා සඳහන් වන්නේ හෙරණ සිබෙහි එන සීලය පිළිබඳ විස්තරය ම ය. එහි එන සීලය පිළිබඳ පනස් ආකාර භේදය ම මෙහි ගාථා මගින් දැක්වේ. දහ හතරවන ගාථාවේ සිට විසි පස්වන ගාථාව දක්වා සඳහන් වන්නේ දස ශීලයෙහි සෑම ශික්ෂා පදයක් ම බිඳීමට හේතුවන අංග කොපමණ ද යන කාරණ යයි. විසි හය වන ගාථාවේ සිට විසි නව වන ගාථාව දක්වා වත් පිළිවෙත් ගැන කියවේ. තිස් වන ගාථාවේ සිට තිස් තුන්වන ගාථාව දක්වා කුදු මහත් සියලු කටයුතු වලදී ගුරුවරයාගෙන් විමසා අවසර ගෙන ක්‍රියකළ යුතු ආකාරය ගැන උපදෙස් දෙයි. තිස් හතරවන ගාථාවේ සිට හතළිස් එක්වන ගාථාව දක්වා සිල් නොපිරිමේ ආදීනව සහ සිල් බිඳුණු සැණින් පිළියම් කළ යුතු බවත් එසේ නොකළොත් සිදුවන හානිය ගැනත් විස්තර කෙරේ. අවසානයේ දී "දෙසිතා දස ධම්මෙන" ආදී ගාථාවෙන් පැවසෙන්නේ වැරදි කාරණා දහයක් පිළිඳව පනවන ලද සාමණේර සිල් දහයෙන් එකක් හෝ බිඳුණ හොත් අනෙක් සියල්ල ම බිඳෙන බව ය.

මෙම ග්‍රන්ථය සාමණේර බණ දහම් පොතට ම ඇතුළත් වූවකි. මෙතෙක් කරන ලද්දේ එය වන පොත් කිරීම පමණි. මෙහි ඒවා අර්ථ සහිත ව දක්වනු ලැබේ. මේ ගාථා අර්ථ සහිතව වන පොත් කිරීමෙන් සාමණේරයන් වහන්සේලාට සිල් රැකීම හා වත්පිළිවෙත් කිරීම පිළිබඳ මනා මගපෙන්වීමක් සිදුවෙයි. එසේ ම මෙයින් කර්ම, කර්ම ඵල පිළිබඳව ද දැනුමක් ලැබෙයි. විශේෂයෙන් ඒවා වන පොත් කර තිබීම භික්ෂු ජීවිතයට සැමදා උපකාර වන්නේ ය. එහි මුල් කොටසේ එන කරුණු හෙරණසිබ පාඩමේ ඇතුලත් ව ඇත. ශික්‍ෂාපද පිළිබඳ අංග ඇතුළත් පහත සඳහන් ගාථා පිළිබඳ අවබෝධයක් ලබමු.

## බාල සික්ඛා - හෙරණසික

1. **සීලාදිවිවරං ගන්ථං බාලසික්ඛං සමාසතො**
   **වක්ඛාමි සාමණෙරානං වන්දිත්වා රතනත්තයං**

   තුනුරුවන් වැඳ සීලය මුල් දෙරටුව කොට ඇති, බාල සික්ඛා නම් ග්‍රන්ථය සාමණේරන්ට සැකෙවින් පවසමි.

## ශික්ෂා පද පිළිබඳ සම්පූර්ණ විය යුතු අංග

2. **අඞ්ගානි තෙසං සීලානං පවක්ඛාමි ඉතො පරං**
   **තං සුණිත්වාන සීලානි පාලෙතබ්බා සද්’දරා**

   මෙතැන් පටන් ඒ සිකපද බිඳීමට සම්පූර්ණ විය යුතු අංග පවසන්නෙමි. ඒවා අසා ඉතා ආදරයෙන් සැම කල්හි සාදරයෙන් සිල් රැකිය යුත්තේ ය.

3. **පාණො භවෙ පාණ සඤ්ඤී වධක චිත්ත මුපක්කමො**
   **තෙන ජීවිත නාසො ච අඞ්ගා පඤ්ච වධස්සි’මෙ**

   ප්‍රාණියෙකු වීම ය, ප්‍රාණියෙකු බව දැනීම ය, මැරීමේ අදහස ය, මැරීමට උපක්‍රම කිරීම ය, එම උපක්‍රමයෙන් පණ නැසීම ය යනුවෙන් ප්‍රාණඝාතය සැපිරීමේ අංග පහකි.

4. **මනුස්ස භණ්ඩං තථා සඤ්ඤි ථෙය්‍ය චිත්තමුපක්කමො**
   **තෙනෙ’ව භණ්ඩ හරණං පඤ්ච අඞ්ගානි ථෙනිනො**

   මනුෂ්‍යයෙකුගේ දෙයක් වීම ය, ඒ බව දැන සිටීම ය, සොරකම් කිරීමේ අදහස ය, ඒ සඳහා උපක්‍රම යෙදීම ය, ඒ උපක්‍රමයෙන් ම ඒ බඩු පැහැර ගැනීම ය යනුවෙන් සොරකමට අංග පසකි.

5. **අජ්ඣාචරිය වත්ථුඤ්ච තත්ථ සෙවන මානසං**
   **මග්ගෙන මග්ග භජනං තීණි අබ්‍රහ්මචාරිනො**

මෛථුන සේවනයට අදාළ කෙනෙකු වීමය. සේවනය කිරීමේ අදහස තිබීම ය. ලිංගයෙන් ලිංගය ප්‍රවේශ කිරීමය යනුවෙන් අබ්‍රහ්මචරියාවේ අංග තුනකි.

6. **වත්ථුනො විතථඤ්චෙව විසංවාදන මානසං**
**වායාමතා පරිඤ්ඤාණං මුසාවාදස්ස චාතුරො**

අසත්‍යයක් වීම ය, රැවටීමේ අදහස ය, කීමෙන් රැවටීමට වෑයම් කිරීම ය, අසන්නා එය සැබෑයැයි පිළිගැනීම ය යනුවෙන් මුසාවාදයට අංග සතරකි.

7. **සුරා භවෙ පාතුකාමො අජ්ඣොහරණ යොගතා**
**තෙනෙ'ව අජ්ඣොහරණං සුරාපානස්ස චාතුරො**

මත් කරවන දෙයක් වීමය, බී මත්වනු කැමැත්තය, පානයට උපක්‍රම යෙදීමය, පානය කිරීමය යනුවෙන් සුරාපානය ට අංග සතරකි.

8. **විකාලතා ආහරණං අජ්ඣොහරණ යොගතා**
**විමුත්තත්තං අකාලස්ස අඞ්ගානි චතුරො සියුං**

විකාලය හෙවත් ඉර හැරුණු වේලාවේ ය. යාවකාලි (පෙරවරුවේ වැළඳිය යුතු) ආහාරයක් වීම ය. වැළඳීමට උපක්‍රම යෙදීම ය. එය වැළඳීම ය. යනුවෙන් විකාල භෝජනයට අංග සතරකි.

9. **නච්චාදිතා දස්සනතා තප්පුරෙක්ඛා තථෙ'ව ච**
**නච්චාදීනං දස්සනස්ස අඞ්ගා තීණි භවන්ති තෙ**

නැටුම්, ගැයුම් ආදියක් වීම ය, ඒවා දැකීම ය, ඇසීම ය, ඒවාම අරමුණු කොට සිටීම ය, යනුවෙන් නැටුම් ගැයුම් වැයුම් පිළිබඳ සික පදයට අංග තුනකි.

10. **මාලාදිතා ධාරණතා තප්පුරෙක්ඛා තථෙ'ව ච**
**මාලාදීනං ධාරණස්ස අඞ්ගා තීණි භවන්ති තෙ**

මල්, සුවඳ විලවුන් ආදියක් වීම ය. සිරුරේ පැළඳීම ය, තැවරීම ය, හැඩ වැඩ වීමේ සුවඳවත් වීමේ අදහසින් ඒවා දැරීම ය යනුවෙන් මල් ගඳ විලවුන් දැරීම පිළිබඳ අංග තුනකි.

11. **අකප්පියා සන්ථරණා අතිරෙකප්පමාණතා**
**සයනාසනතා තස්මිං උච්චාසනස්ස චාතුරො**

අකැප වීම ය. සුව පහසු ලෙස සකස් කළ හෝ සුව පහසු ඇතිරිලි යෙදූ ඒවා වීම ය. පමණට වඩා උස් වීම ය. සයන හෝ ආසන වීම ය. යනුවෙන් උසසුන් මහ අසුන් පරිභෝගය පිළිබඳ අංග සතරකි.

12. **හෙමාදිතා ගහණතා - අත්ත උද්දිස්සතා සියුං**
**සුවණ්ණ රජතාදීනං - ගාහ ගාහාපනාදිකා**
**හෙමාදීනං ගහණස්ස - අංගානි චතුරො සියුං**

රන්, මිල මුදල් ආදියක් වීම ය. එය තමන් සඳහා ම ගැනීම ය. තමා ම පිළිගැනීම හෝ අනුන් ලවා ගැන්වීම ය. යනුවෙන් රන් මසු කහවණු පිළිගැනීම පිළිබඳ අංග සතරකි.

13. **ආණත්ති පන සීලෙසු වුත්තා චතු පදෙසු පි**
**පාණඝාතෙ ධනාහාරෙ නච්චගීතෙ පරිග්ගහෙ**

ඒ දස සීලයෙන් ප්‍රාණඝාතය, අදත්තාදනය, නැටුම්, ගැයුම්, වැයුම්, විසුළු දැකුම් ය, රන්මසු, කහවණු පිළිගැනීම ය. යන ශික්ෂා පද සතරේ දී අණ කිරීමෙන් වුවද වරද සිදු වේ යයි කියන ලදී.

## වත් පිළිවෙත්

14. **පූරෙන්තො න ච වෙ වත්තං තස්ස සීලං න පූරති**
**වත්ත කිච්චං පවක්ඛාමි වත්තුකාමා සුණාථ මෙ**

කෙනෙකු වත් නොපුරන්නේ නම් ඔහුගේ සීලය ද නො පිරේ. එහෙයින් කළයුතු වත් පවසන්නෙමි, වත් පුරනු කැමැත්තෝ මට සවන් දෙත්වා.

15. **ගරූනං උපනිස්සාය දන්තකට්ඨොදකං දදෙ**
**පාදොදකං පාද පීඨං පාද කඨලිකං ඨපෙ**
**සීතං උණ්හොදකං චාපි ගරූනං දිවසං දදෙ**

අතවැසි සාමණේරයන් විසින් ගුරුවරුන් සඳහා දිනපතා දැහැටි හා දිය සැපයිය යුතුය. පා දෝනා දිය ද, පා පුටුව ද, පා උලනා ගල ද, තැබිය යුතු ය. දිනපතා ගුරුවරුනට උණුදිය හා ඇල් දිය සැපයිය යුතු ය.

16. **චෙතියඞ්ගන වත්තඤ්ච බොධියඞ්ගන වත්තකං**
**ආගන්තුකස්ස වත්තඤ්ච වත්තඤ්ච ගමිකස්ස ච**

තවද, සෑමළු වත, බෝමළු වත, ආගන්තුක වත හා ගමිකවත ද කළ යුත්තේ ය.

17. **ගිලානෙපි ච වත්තඤ්ච ගිලානුපට්ඨානෙ කරෙ**
**කුටි වත්තං වච්ච වත්තං වත්තං ජන්තාඝරෙ කරෙ**
**පස්සාවෙ'පි ච වත්තඤ්ච වත්තං කොට්ඨාලයෙ කරෙ**

තවද, ගිලන්වත හා ගිලන් උපස්ථානය ද කළ යුතු ය, වසන කුටියේ වත ද, කැසිකිළි වත ද, ගිනිහල් ගේ වත ද, වැසිකිළි වත ද, ගබඩාගෙයි වත ද, කළ යුතු ය.

## ගුරුන්ගෙන් විමසා කළ යුතු දේ

18. **චීවර රජනෙ චා'පි රඞ්ග පාකෙ ච ධොවනෙ**
**පරික්ඛාරග්ගහණෙ දිනෙන සබ්බත්ථා'පුච්ඡනං කරෙ**

සිවුරු පඬු පෙවීමේ දී පඬු උණු කිරීමේ දී සිවුරු සේදීමේ දී ද පිරිකරක් ගැනීමෙහි දී මෙන් ම දීමෙහි දී ද යන හැම දෙයක දී ම ගුරුවරයාණන් වහන්සේගෙන් විමසා කළ යුතු ය.

19. **නිස්සීම ගමනෙ ගාමෙ අරඤ්ඤෙ දෙසකෙ ගතෙ**
**නඛච්ඡෙදාදි කම්මෙසු සබ්බත්ථා'පුච්ඡනං කරෙ**

විහාර සීමාවෙන් පිටත යාමේදී, ගමට හෝ වන පෙදෙසකට යාමේදී ද නිය කැපීම් ආදී කටයුත්තෙහි දී පවා සැම විටම ගුරුන් විමසිය යුතු ය.

20. **උද්දෙස ගහණෙ චා'පි පරිපුච්ඡා'ගහණෙ'පි ච**
**සජ්ඣායෙ උද්දිසාපෙනෙත සබ්බත්‍ථා'පුච්ඡනං කරෙ**

ඉගෙන ගැනීමේ දී, ගැටළු විමසීමේ දී ද පාඩම් සජ්ඣායනා කිරීමේ දී, අනුන්ට පාඩම් කරවීමේ දී ද යන සැම විටම ගුරුවරුන්ගෙන් විමසා කළ යුතු ය.

21. **කවාටෙ විවටෙ ථකනෙ වාතපානෙ තථෙ'ව ච**
**දීපුජ්ජලන උජ්ඣාපෙ සබ්බත්‍ථා'පුච්ඡනං කරෙ**

දොර කවුළු, වා කවුළු ඇරීමෙහි දී ද, වැසීමේ දී ද, පහන් දැල්වීමේ දී ද නිවීමේ දී ද යන සැම දෙයකදී ම ගුරුන්ගෙන් අසා කළ යුතු ය.

## සිල් රැකිය යුතු අන්දම

22. **යො ගවං න විජානාති න සො රක්ඛති ගො ගණං**
**එවං සීලං අජානන්තො කිං සො රක්ඛෙය්‍ය සංවරං**

යම් ගොපල්ලෙක් ගවයන්ගේ ප්‍රමාණය හා තොරතුරු නොදන්නේ නම් හෙතෙම ගවයන් හරිහැටි නොරකින්නේ ය. එසේම සිල් නොහඳුනන්නා සිල් රකී ද? නැත.

23. **වත්තං න පරිපූරෙන්තො න සීලං පරිපූරති**
**අසුද්ධ සීලො දුප්පඤ්ඤො දුක්ඛා න පරිමුච්චති**

වත් පිළිවෙත් නොපුරන්නා සීලය ද නොපුරන්නේ ය. අපිරිසිදු සිල් ඇති අනුවණයා, සසර දුකින් නොමිදේ.

24. **සත වස්සා පි පබ්බජ්ජා සික්ඛන්තො පිටකත්තයං**
**ඔවාදං නානු වත්තෙන්තො නිරයං සො'පපජ්ජති**

කෙනෙකුගේ පැවිද්දෙන් සියවසක් ගතවූවත් මුළු ත්‍රිපිටකය ම ප්‍රගුණ කර ඇතත් ගුරුන්ගේ අවවාද නොපිළිපදී නම් හෙතෙම නිරයෙහි උපදින්නේ ය.

25. **සද්ධාය දින්නං යං දනං දුස්සීලො පරිභුඤ්ජති**
**තතෝ ලොහගුළො භුත්තො සෙය්‍යො අග්ගිසිඛූපමො**

යමෙක් සැදැහැතියෙන් දෙන දනය දුස්සීලව වළඳයි ද, රත් වූ ගිනිසිළුවක් සේ ගිනියම් වූ ලෝහ ගුලියක් ගිලීම ඊට වඩා යහපතකි.

26. **තස්මා හි භින්න සීලෙන සාමණෙරෙන සීඝතො**
**පතිට්ඨාතබ්බං සීලස්මිං සප්පදට්ඨො'ව මාණවො**

එහෙයින් සිල් බිඳුණු සාමණේරයන් වහන්සේ විසින් සර්පයෙකු දෂ්ට කළ මිනිසෙකු වහා පිළියම් කරගන්නා සේ එකෙණෙහි ම නැවත සීලයෙහි පිහිටිය යුතු ය.

27. **න පතිට්ඨති සීලස්මිං යාවතා තෙන යොගිනා**
**කප්පියම්පි න ඛාතබ්බං හෙට්ඨා භික්ඛු න තාවතා**

ඒ භික්ෂූන් වහන්සේ නැවත සීලයෙහි පිහිටන තුරු අඩුම තරමින් භික්ෂූන්ට කැපකළ දෙයක් වත් නොවැළඳිය යුතු ය.

28. **තස්මා එකො අලජ්ජිපි දුස්සීලො අසමාහිතො**
**අලජ්ජී සත සහස්සානි කරොතී'ති පකාසිතො**

මෙසේ දුස්සීල වූ සන්සුන් නොකළ සිත් ඇති එක් අලජ්ජියෙක් අලජ්ජීන් ලක්ෂයක් තනන්නේ යයි කියන ලදී.

29. **දෙසිතා දස ධම්මෙන දස පාරාජිකා ඉමෙ**
**තෙන චෙ භිජ්ජති එකො අඤ්ඤමඤ්ඤං පභිජ්ජතෙ'ති.**

දසබල ධර්මයෙන් සමන්විත බුදුරජාණන් වහන්සේ විසින් මේ දස පාරාජිකාව (සාමණේරයන් සඳහා) වදරන ලදී. එයින් එකක් හෝ බිඳීමෙන් අනෙක් සියල්ල එකිනෙක බිඳී යන්නේ ය.

## ක්‍රියාකාරකම 26.1

1. විකාල භෝජන වරද සිදුවීමට අවශ්‍ය අංග හතර මොනවා ද?

2. වත් පිළිවෙත් නොපිරීමෙන් සිදුවන හානිය කවරාකාර ද?

3. සිල් පද එකක් හෝ බිඳුණොත් නැවත සිල් අලුත් කර ගත යුතුය. එසේ කළ යුත්තේ ඇයි.

### ජීවිතයට ඔවදනක්

"අත්තානං උපමං කත්වා
න හනෙය්‍ය න ඝාතයෙ"

තමා උපමා කොට අනුන් නොමරන්නේ ය.
නොමරවන්නේ ය.

# 27 සැලසුම් කරගෙන දවස ගෙවමු (දින චරියාව)

ඕනෑම සාර්ථක ජීවිතයක ප්‍රධාන ලක්ෂණය වන්නේ කලට, වේලාවට සිය කටයුතු කිරීම යි. ගිහිගෙයින් නික්ම සසුනට ඇතුළත් ව පිළිවෙත් පුරන පැවිදි උතුමන්ලාගේ ජීවිතය ද වඩ වඩාත් සාර්ථක කර ගැනීම සඳහා අතීතයේ පටන් දෛනික වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත. දිනචරියාව යනු එය යි.

දිනචරියාවෙන් කෙරෙන්නේ පැවිදි ජීවිතය ක්‍රමවත් හැඩගැස්මකට යෙ ාමු කිරීම යි. එයින් බාහිර අරමුණු කරා ඇදී යන සිත පාලනය කර පැවිදි ජීවිතයේ අරමුණුවල ම රඳවා තබයි. එදිනෙදා වැඩකටයුතු පහසු කරව යි.

වර්තමානයේ කාලසටහන යනුවෙන් ව්‍යවහාර කරන්නේ මේ දිනචරියාව ම ය. බුදුරජාණන් වහන්සේ පවා දිනචරියාවකට, කාලසටහනකට අනුව දිනය වෙන් කරගෙන කටයුතු කර ඇති බව දක්නට ඇත. එය ද ආදර්ශයට ගෙන සෑම පැවිදි උතුමෙකු ම දිනචරියාව ඒ ආකාරයෙන් ම අනුගමනය කිරීමට උත්සාහවත් විය යුතු ය.

## පුරාණ දිනචරියාව

සැදෑහැයෙන් සසුන් වන් කුල දරුවන් විසින් අරුණට පළමු ව දැහැටි වළඳා, මළුපෙත්මං හැමද නිමවා පැන් පෙරහා තබා විවේකස්ථානයෙක හිඳ සිල් බැලීමෙන් විවේක වත් සැපයීමෙන් තුන් පැයක් යවා, ගෙඩිය ගැසූ කලැ 'සතං හත්‍ථී සතං අස්සා' යනාදීන් සිහි කරමින් දාගැප් මහාබෝයට එළඹැ වත් සපයා පිදිය හැකි වතක් ඇත පුදා 'ඉතිපි සො භගවා' යනාදීන් නව අරහාදී බුදු ගුණ සිහි කොටැ අන්‍යවිහිත නො වැ වැඳ එක විට මැ ආපුච්ඡා කොටැ ගෙන නැඟී සිටැ පිළිවෙලින් පත්කඩ තබා වැඳ ගෙනැ ලිත බලා අවච්ඡායාව පොහෝ කළ දවස බුඩවෂීය කිය ලූ කලැ

**"තස්ස පාසාදිකං හොති පත්තචීවර ධාරණං**
**පබ්බජ්ජා සඵලා තස්ස යස්ස සීලං සුනිම්මලං"**

යනාදීන් සිහි කොටැ පාසිවුරු ධරවැ කමටහන් ගෙනැ ගමට වදනා කලැ ආචාර්‍ය්‍ය උපාධ්‍යායනට නුදුරු වැ නො ළං වැ ගොස් සිවුරු හඳනා තැනැ හැමැද පාත්‍රය මුදා දීලා කැටුවැ ගොස් ගමට වැද ස්ත්‍රී පුරුෂ ඇත්, අස්, රථ, පාබල සෙනඟ නොයෙක් දික් නො බලා සේඛියාහි කී සෙයින් සිඟා ගෙනැ කැටුවැ නික්මැ පාත්‍රය හා සඟල සිවුර දෙ අතින් අල්වා ගෙනැ කමටහන් මෙනෙහි කරනුවන් විසින් වෙහෙරට අවුත් සිවුරු වස පිසැ තබා හිඳිනා අසුන් පනවා පත් සලා පා දොවා පැන් මලා දැහැටි දඬු එළවා දී තමාගෙ පාත්‍ර පර්‍ය්‍යාපන්නයෙන් අනුනට දන් දීලා කිසිවක් උන් නො ගතහොත් බත් සරලුවක් වත් දන් දීලා ඇසෙන සේ පස්විකා ගෙන සේඛියාහි කී සෙයින් අහර කිස නිමවා, පිළිවෙලින් වැඩිමහලු තැන්ගේ පාත්‍ර සෝදා වත් සපයා බොජුන්හල හැමැද ගුරුන්ට වත් දක්වා, ඉක්බිති ගුරුන් හා බුදුන් වැඳ ගෙන විවේකස්ථානයක හිඳ අතීත පස්විකුම් පස් විකා සිල් බලා මෙත් කොටැ ගෙනැ පැයක් විතරකින් අඬ ගසා ලූ කලැ පොත කියවා පත ලියවා අසන පිරුවහන දෙය වනපොත් කොටැ විදර්ශනා ධූරයෙහි යෙදෙන්නවුන් විසින් වෙන වෙනමැ හිඳ තමහට නියම පෙළ වන පොත් දීලා අසා ගෙන වේලා ඇතහොත් වනපොත් කොටැ ලා රෑ වන්නට පැයක දී ගෙමළු හැමැන්ද යුතු.

වත් පැමිණියන් විසින් ගිනි එළවා පහන් පුදා බණ සලසා ආරාධනා කොටැ පයට පැන් එළවා පිළිවෙලින් හිඳ බණ අසා පිරිත් බැණැ ගෙන, ගුරුන්ට වත් දක්වා විචාළමනා සැක ඇත විචාරාගෙනැ පුහුණුවන් ඇත පිරිවහා, සේඛියා චතුපාරිශුද්ධිසීලය පිරිවහාගෙනැ තමන් සැතැපෙන ගෙහි වැඩිමහල්ලන් ඇත වත් සපයා වැඳ අවකාශ ගෙන සැතපෙන අස්නේ හිඳ පස්විකා ගෙනැ සතර කමටහන් මෙනෙහි කොටැ අලුයම නැගෙමි යන සිතින් නිද්‍රොපගතව අලුයම නැගී පස්විකාගෙනැ සතර කමටහන් මෙනෙහි කොටැ රතන සූත්‍රයෙන් පිරිත් බැණැ මෙත් කොට ගෙනැ අරුණට පළමු වත්සැපයීමෙන් පළමු කී සෙයින් ම කරනුවන් විසින් දෙවේලෙහි සෙත් පිරිත් සංවේග වස්තු අට, අශුභ, මරණසති සිහිකරනුවන් විසින් එක්වන් දස ධම්ම සූත්‍රය මෙනෙහි කිරීමෙන් ඡන්දාදීන් අපායෙහි ගෙනැ හැරැ සිටවූවාක් මෙන් නො කොටැ ඔවුනොවුන්ගේ දුටු වරද කීමෙන් මෛත්‍රාවචීකර්මය පුරා

''යො පන භික්ඛු ධම්මානු ධම්ම පටිපන්නො විහරති සාමීචි පටිපන්නො අනු ධම්මචාරී සො තථාගතං සක්කරොති ගරු කරොති මානෙති පූජෙති පරමාය පූජාය පටිපත්ති පූජාය'' යි වදාළ අවවාද සිත තබා ගෙනැ බුදුන් මෙසේ ප්‍රතිපත්ති පූජායෙන් පුදනුවන් විසින් මෙකී දිනචර්යාව කෙළේ ඇද්ද යි විචාළ කලැ කළවුන් විසින් මුවෙන් නොබිණීමෙන් හා වුවමනා කිසි කටයුත්තකට කාරණා කියාලීමෙන් හා වැරැද්දකට වැලි ලාස්සක් ගෙනහැර මලුයෙහි ලා එක්වන් දිනචර්යාව පසස්නන් විසින් සබ්‍රහ්මසරුන්ගේ සිවුරු ගෙත්තම් කිරීම් පාත්‍ර පිසීම් ආදී කුදු මහත් කටයුත්තෙහි සමර්ථවැ ඉදිසිත් ඇතිවැ වැඩිමහල්ලන්ට සුවච වැ මොළොක්වැ පාපිස්නා බිස්සක් සෙයින් මන් නැති වැ සතර පසයෙහි ලද දෙයකින් සතුටුවැ අල්පකෘත්‍යය ඇතිව පරිෂ්කාර දොළසකින් වඩා නො ගැන්මෙන් ස්වකීය පැවතුම් ඇතිවැ සන්හුන් ඉඳුරන් ඇති වැ මුහුකළ නුවණින් යුක්තවැ කායගව් වචීගව් නැති වැ කුලයා කෙරෙහි ද ගණයා කෙරෙහි ද නො ඇලී කුඩා වුවත් පාපයකුදු නො කොටැ මෙසේ ප්‍රතිපත්ති පූජායෙන් පුදනුවන් විසින් ලොවී ලොව්තුරා සැපත් සිද්ධ කට යුතුයි.

### දින චරියාවේ සරල අදහස

ශ්‍රද්ධාවෙන් සාසනයෙහි පැවිදි වූ කුල පුත්‍රයන් විසින් අරුණ නැගෙන්නට පෙර දත් මැද මුව දොවා මළු පියගැට පෙළ ආදිය හැමද නිම කොට පැන් පෙරා තබා විවේක තැනක හිදගෙන තමාගේ සිල් බිඳී ඇද්දයි බැලීමෙන් අනතුරුව විවේකයෙන් තුන් පැයක් (ඉංග්‍රීසි පැය එකයි විනාඩි 12 ක්) ගත කොට ගෙඩිය ගැසූ කල

> **සතං හත්ථී සතං අස්ස සතං අස්සතරී රථා**
> **සතං කඤ්ඤාසහස්සානි ආමුත්තමණි කුණ්ඩලා**
> **එකස්ස පදවීතිහාරස්ස කලං නාග්ඝන්ති සොළසිං**

"ලක්ෂයක් ඇතුන් ද ලක්ෂයක් අශ්වයන් ද ලක්ෂයක් අශ්ව තරයන් (කොටළුවාට දාව උපන් අගනා අශ්වයන්) ද රථ ලක්ෂයක් රථ ද මිණිකොඬොල් අබරණින් සැරසුණු කන්‍යාවන් ලක්ෂයක් ද යමෙකුට ලැබුණත්, ඒවා ලැබීම බුදුන් වඳින්නට යාමට තබන පියවරක සොළොස්වෙනි කලාවෙන් කලාවක් තරම් වත් නොවටී"

යනාදී දහම් සිහිකරමින් දාගැබ, මහාබෝධිය වෙත එළඹ, වතාවත් කොට පිදිය හැකි දෙයක් වේනම් පුදා, ඉතිපිසො භගවා යනාදී වශයෙන් නව අරහා දී බුදුගුණ සිහි කොට, අන් අතකට සිත යා නොදී වැඳගෙන සියල්ලන් එකටම අවසරගෙන නැගී සිට, අවච්ඡායාව හෙවත් එදින ඉර උදාව පමා වීම හෝ නොවීම ද (අවසන් වරට) පොහොය කළ දවස ද බුද්ධ වර්ෂය (මාස දින) ද ප්‍රකාශ කිරීමෙන් පසු :

**"යමෙකුගේ සීලය ඉතා පිරිසිදු නම් ඔහුගේ පා සිවුරු දැරීම් ආදි ඉරියවු ප්‍රසන්න ය. ඔහුගේ පැවිද්ද සඵල ය"**

යනාදී දහම් සිහි කොට, පාත්‍රය හා තුන් සිවුරු දරාගෙන, පිඬු පිණිස යාමේ දී සිහි කළ යුතු කමටහනක් ලබා ගෙන, ගමට පිවිසෙන කල ආචාර්ය උපාධ්‍යායන් වහන්සේලාට ඉතා නුදුරින් ද නොලං ව ද ගොස්, ගමට පිවි සෙන්නට සිවුරු පොරවන තැන හැමද දී පාත්‍රය ද ථවිකයෙන් මුදා දී උන්වහන්සේලා සමඟම ගොස් ගමට පිවිස ස්ත්‍රීන් පුරුෂයන් ඇත් අස් රථ පාබල සෙනඟ ආදී නොයෙක් දේ දෙස නොබලා සේඛියාවන්හි කී ආකාරයෙන් පිඬුසිඟා ගෙන, උන්වහන්සේලා සමග ම ගමෙන් නික්ම පාත්‍රය හා දෙපට සිවුර දෙ අතින් අල්ලාගෙන කමටහන් මෙනෙහි කරමින් වෙහෙරට පැමිණ, සිවුරු දණ්ඩ පිස එහි සිවුරු තබා, වැඩ හිඳිනා අසුන් පනවා දූවිලි පිසලා, පා සොදාගෙන දිය බඳුන සහ දැහැටි දඬු ගුරුන්ට සපයා දී තමාගේ පාත්‍රයට ලැබුණු දෙයින් අනුනටත් දන් දීලා ඔවුන් කිසිවක් නොගත හොත් බත් හැන්දක් වත් දන් දීලා ඇසෙන සේ ප්‍රත්‍යාවේක්ෂා කොට සේඛියාවල කී ආකාරයෙන් අහර කිස නිමවා පිළිවලින් වැඩි මහලු ඇත්තන්ගේ පාත්‍ර සේදීම් ආදී වතාවත් කොට දන් හල හැම ද ගුරුවරුන්ගේ ද වතාවත් කොට අනතුරුව ගුරුවරුන් සමඟ ම බුදුන් වැඳ ගෙන විවේකස්ථානයක හිඳ ප්‍රත්‍යවේක්ෂාකොට සිල් බිඳී ඇද්දැයි බලා මෙත් වඩා, පැයකින් පමණ අඬගැසූ කල ගුරුන් වෙත ගොස් කියවන පොත් කියවා ලියන පත් ලියවා අසන පාඩම් කරන දේ වන පොත් කොට විදර්ශනා ධුරයෙහි හික්මෙන ඇත්තන් නම් වෙන වෙනම හිඳගෙන තමහට නියමිත පෙළ දහම් පාඩම් දීලා පාඩම් අසාගෙන වේලාව තිබේනම් ඒවා වන පොත් කොට රෑ වන්නට පැයකට පෙර ගෙ මළු හැමදිය යුතු ය.

ඒ ඒ වත් නියමිත අය විසින් ගිනි දල්වා ගෙන අවුත් පහන් පූජා කොට, බණ දෙසුමට අවශ්‍ය දේ පිළියෙල කොට බණ දෙසන ඇත්තන්ට ආරාධනා කොට පා දෙවීමට පැන් සපයා වැඩි මහලු පිළිවෙලින් පෙළට හිඳගෙන බණ අසා, පිරිත් කියාගෙන, ගුරුවරුන්ට අවශ්‍ය වතාවත් කොට සැක සහිත කරුණු ඇතොත් විමසා දනගෙන, මතකයෙන් ප්‍රගුණකරන්නට තිබෙන දේ හඬනගා පාඩම් කියා සේඛියා සහ චතුපාරිශුද්ධි ශීලය ද පාඩම් කියා, තමන් සැතපෙන ආවාසයෙහි වැඩිමහලු ඇත්තන් ඇතොත් වතාවත් කොට වැඳ අවසර ගෙන සැතපෙන අසුනේ හිඳ ගෙන අතීත ප්‍රත්‍යවේක්ෂා කොට සතර කමටහන් මෙනෙහි කොට අලුයම පිබිදෙමි යන සිතින් නින්දට යා යුත්තේ ය.

අලුයම නැගිට නැවත ප්‍රත්‍යවේක්ෂා කොට සතර කමටහන් මෙනෙහි කොට රතන සූත්‍රයෙන් පිරිත් කියා ගෙන මෙත් වඩා, අරුණ නැගන්නට පෙර පළමු කී ආකාරයෙන් ම වතාවත් කළ යුතුය. ඔවුන් විසින් උදේ සවස යන දෙවේලෙහි ම කරණීයමෙත්ත සූත්‍රය, සංවේග වස්තු අට, අසුභානුස්සතිය, මරණානුස්සතිය සිහිකරන අතර ම සියලු දෙනා එක්ව දසධම්ම සූත්‍රය මෙනෙහි කළ යුතු ය. එසේ ම ඡන්දාදියෙන් අගතියට වැටී, වරද කරන්නන් අපායට යන්නට ඉඩ හැර නොසිට, ඔවුනොවුන්ගේ දුටු වරද දක්වීමෙන් මෙත්තා වචී කර්මය පුරන්නේ ය.

"යම් භික්ෂුවක් ධර්මයට අනුව පිළිපදිමින් ඔවුනොවුන්ගේ වත් පිළිවෙත් සපුරමින් සුහද ව ධර්මානුකූල ව හැසිරේ නම් උන්වහන්සේ එමගින් බුදුරජාණන්වහන්සේට උතුම් ම පූජාව වන ප්‍රතිපත්ති පූජාවෙන් සත්කාර කළා වන්නේ ය, ගරු කළා වන්නේ ය, වැඳුම් පිදුම් කළා වන්නේ යැ"යි වදාළ අවවාද සිත තබාගෙන මෙසේ ප්‍රතිපත්ති පූජාවෙන් බුදුන් පුදන්නන් විය යුතු ය. ගුරුවරුන් ඔවුන්ගෙන් මෙකී දින චරියා ව නිසි පරිදි ඉටු කළේ දැයි විමසූ විට ඉටු කළ ඇත්තන් විසින් නිහඬව සිටීම ද කෙනෙකුට කියයුතු දෙයක් වේ නම් එය පැවසී ම ද කළ යුතු අතර වැරැද්දක් සිදුවීනම් ඊට දඬුවම් ලෙස වැලි ලාස්සක් ගෙනවුත් මළුවෙහි දැමිය යුතු ය. මේ දින චරියාවට එකාමෙන් ගරුකරන සියල්ලන් විසින්, එකට මහණ දම් පුරන ඇත්තන්ගේ සිවුරු මැසීම් පාත්‍රා පිසීම් ආදී ලොකු කුඩා සැම කටයුත්තෙහි දක්ෂ විය යුතුය. එඩිතර සිත් ඇතිව වැඩි මහල්ලන්ට කීකරුව මෘදු මොලොක් සිත් ඇතිව පාපිස්නා බිස්සක් මෙන් මානයෙන් තොර විය යුතු ය. සිවු පස අතුරෙන් ලද දෙයකින්

සතුටුව වැඩි වැඩ නැතිව පිරිකර දොළහකට වඩා පාවිච්චියට නොගෙන තමන්ගේ අල්පේච්ඡ ඵක ගෙන යුතුව සන්සුන් ඉඳුරන් ඇතිව මෝරාගිය නුවණින් යුතුව කයින් හෝ වචනයෙන් උඩගුකම් නැතිව, ගිහි පවුල් සමග හෝ කණ්ඩායම් පිරිස් සමග ඇලීම් ගැලීම් වලින් තොරව, කුඩා පාපයක් වත් නොකොට මෙසේ ප්‍රතිපත්ති පූජාවෙන් පුදමින් ක්‍රියා කොට දෙව් මිනිස් යන ලෞකික සැප හා නිවන නැමැති ලෝකොත්තර සැපත් සිද්ධ කරගත යුත්තේ ය.

### ක්‍රියාකාරකම 27.1

පුරාණ දිනචරියාවේ සඳහන් පැවිදි උතුමෙකුගේ දෛනික චර්යා පිළිවෙල අංක යටතේ ලේඛනගත කරන්න.

උදා : හිරු උදාවට පෙර අවදි වී දැහැටි වැළඳීම.

### ක්‍රියාකාරකම 27.2

පුරාණ දින චරියාවේ එන අපට නුපුරුදු විශේෂ දේ පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කරන්න.

### ක්‍රියාකාරකම 27.3

බුදුරජාණන් වහන්සේගේ දිනචරියාව සැකසී තිබූ ආකාර පොත පත ඇසුරෙන් සොයා සටහනක් පිළියෙල කරන්න.

# 28 බුදුගුණ මෙනෙහි කොට ශ්‍රද්ධාව උපදවා ගනිමු

## බුද්ධානුස්සති භාවනාව

අප දැන් සූදානම් වන්නේ බුද්ධානුස්සති භාවනාව කිරීමට යි. සමථ, විපස්සනා යනුවෙන් භාවනා ක්‍රම දෙකක් අපේ බුදුපියාණන් වහන්සේ අපට උගන්නලා තියෙනවා. එයින් බුද්ධානුස්සති භාවනාව අයත් වන්නේ සමථ භාවනාවට යි. සමථ කියන්නේ සිත සන්සුන් කිරීම යි. **"චිත්තං සමෙතීති සමථො"** කියල එය තෝරා තියෙනවා. ඒ අනුව බුද්ධානුස්සති භාවනාව කරන අපගේ සිත සන්සුන් වෙනවා. සාමාන්‍යයෙන් අපේ සිත් නිතර ම නොසන්සුන්වයි පවතින්නේ. අපේ සිත රූපවලට දුවනවා. ශබ්දවලට දුවනවා. අපට ගඳ, සුවඳ දැනෙනවා. කයට පහස දැනෙනවා. හිතට එක එක සිතිවිලි එනවා. මේ ගතිය තමයි හිත නොසන්සුන් කියන්නේ. වඳුරෝ, රිලව්, දැකල තියෙනවානේ. උන් කොච්චරවත් දුවනවා, පනිනවා, පිට කහනවා, විරිත්තනවා, කිසි ම තැන්පත්කමක් නැහැ. අපේ හිතත් එහෙම යි.

ඉතිං අපි අපේ සිත සන්සුන් කරගන්නට උත්සාහ කරන්නට ඕනා. අපි මිනිස්සුනේ, අපි බෞද්ධයෝ නේ, ඔක්කෝටමත් වඩා අපි හාමුදුරුවරුනේ. හිත සන්සුන් වුනොත් තමයි කය සන්සුන් වෙන්නේ. වචනය සන්සුන් වෙන්නේ. හිත සන්සුන් වුනොත් තමයි හිතේ ඇතිවන ආශාවල් පාලනය කරගන්නට පුළුවන් වෙන්නේ. කේන්ති යාම නවත්ත ගන්නට පුළුවන් වෙන්නේ. අනුන්ට හිංසා, පීඩා නොකර ඉන්ට, හොරකම් නොකර ඉන්ට පුළුවන් වෙන්නේ. කොටින් ම අපි හොඳ වෙන්නේ හිත සන්සුන් වුනොත්.

අපේ සිත සන්සුන් කර ගැනීමට භාවනා ක්‍රම හතළිහක් බුදුපියාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා. ඒවාට කියනවා කමටහන් කියල. ඒ අනුව අද අපේ කමටහන තමයි, බුද්ධානුස්සතිය. නැතිනම් බුදුගුණ මෙනෙහි කිරීම.

අපි බෞද්ධයන් වශයෙන්, විශේෂයෙන් හාමුදුරුවරුන් වශයෙන් අපේ බුදුපියාණන් වහන්සේගේ ගුණ දැනගෙන ඉන්ට ඕන. බුදුපියාණන් වහන්සේ කවුද කියලා දැන ගන්නට, දැකගන්නට පුළුවන් වෙන්නෙත් බුදුගුණ දැන ගැනීම තුළින් ම යි. භික්ෂූන් වහන්සේලා වන අපේ මුල් ම ගුරුතුමාණන් වහන්සේ උන්වහන්සේ යි. අපේ මුල් ම අනුශාසකයන් වහන්සේ ත් උන්වහන්සේ ම යි.

අපේ කරේ සිවුරු පටිය බැඳලා මහණ කළේ බුදුපියාණන් වහන්සේගේ නියමයෙන් ම යි. අපට යහපත් මිනිසුන් ලෙස ජීවත් වෙන්නට කියලා ඉගැන්නුවෙත් උන්වහන්සේ ම යි. එහෙම බැලුවත් අපේ බුදුපියාණන් වහන්සේ කවුද කියල අපි හඳුනාගන්නට ඕනා. උන්වහන්සේගේ ගුණ දැනගන්නට, දැනගන්නට තමයි අප තුළ උන්වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව, ගෞරවය, විශ්වාසය ඇති වෙන්නේ. ශ්‍රද්ධාව අප තුළ පිහිටියහොත් තමයි අපට මේ මහණකමේ ඉන්ට පුළුවන්, සුවච කීකරු ශිෂ්‍ය නමලා වෙන්ට පුළුවන්.

බුද්ධානුස්සති භාවනාව වඩන්නේ පහත සඳහන් පියවර ක්‍රමයට යි.

### පියවර 1

බුදුපිළිම වහන්සේ තුළින් ජීවමාන බුදුපියාණන් වහන්සේ මනසින් දකින්නට, දැක දැක ඉන්නට, නමස්කාරය කිරීමට හැකි වීම පිණිස පිළිම වහන්සේගේ සිරසේ සිට පාදාන්තය දක්වා කොටස් වශයෙන් මෙනෙහි කරමු. තෙවරක් බුදු පිළිමය දෙස ඇසින් බලාගෙන මෙනෙහි කරන්න. තෙවරක් ඇස වසාගෙන මනසින් මතක් කරගෙන මෙනෙහි කරන්න.

1. බුදුපියාණන් වහන්සේගේ සිරස
2. බුදුපියාණන් වහන්සේගේ නළල
3. බුදුපියාණන් වහන්සේගේ මුහුණ
4. බුදුපියාණන් වහන්සේගේ උරහිස
5. බුදුපියාණන් වහන්සේගේ දෑත
6. බුදුපියාණන් වහන්සේගේ පපුව
7. බුදුපියාණන් වහන්සේගේ දණහිස
8. බුදුපියාණන් වහන්සේගේ සිරිපතුල

පිළිම වහන්සේ නමක් ඉදිරියේ මෙම මෙනෙහි කිරීම සිදු කළ යුතු ය.

### පියවර 2

බුදුපිළිම වහන්සේ දෙස බලාගෙන "ඒ භාග්‍යයෙන් යුක්ත වූ සියලු කෙලෙසුන් නසා ලූ, ගුරූපදේශ නොමැතිව චතුරාර්‍ය සත්‍යය අවබෝධ කළා වූ බුදුපියාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා" යන තේරුම හිතාගෙන නමස්කාරය කීම.

### පියවර 3

(පා ඇඟිලි හා දෙදණ බිම තබා කය කෙළින් තබා ඉඳගෙන) බුදුරදුන් දෙස බලාගෙන "බුද්ධරත්නයට මාගේ නමස්කාරය වේවා'යි පසුව කියා, පසඟ පිහිටුවා වඳින්න.

(යළිත් ඉඳගෙන) බුදුරදුන් දෙස බලාගෙන "ධර්ම රත්නයට මාගේ නමස්කාරය වේවා'යි කියා, පසඟ පිහිටුවා වඳින්න.

(යළිත් ඉඳගෙන) බුදුරදුන් දෙස බලාගෙන "සංඝ රත්නයට මාගේ නමස්කාරය වේවා'යි කියා, පසඟ පිහිටුවා වඳින්න.

### පියවර 4

ජීවමාන බුදුරජාණන් වහන්සේ මතක් කරගෙන උන්වහන්සේගේ ගුණ තේරුම් සහිතව සජ්ඣායනා කරන්න.

**සො භගවා :** භාග්‍යවත් වූ බුදුපියාණන් වහන්සේ

**ඉතිපි අරහං :** ලෝභ (ඇලීම), දෝස (ගැටීම), මෝහ (අනවබෝධය) ආදී සියලු කෙලෙසුන් දුරු කළ හෙයින් බුදුපියාණන් වහන්සේ අරහං නම් වන සේක.

**ඉතිපි සම්මා සම්බුද්ධො :** දුක්ඛ, සමුදය, නිරෝධ, මග්ග යන චතුරාර්‍ය සත්‍ය ධර්මය ගුරුපදේශ නොමැති ව මනාව අවබෝධ කළ හෙයින් මේ බුදුපියාණන් වහන්සේ සම්මා සම්බුද්ධ නම් වන සේක.

**ඉතිපි විජ්ජාචරණ සම්පන්නො :** අනිත්‍ය, දුක, අනාත්ම යන විපස්සනා ඤාණ ආදියෙන් හා සීලාදී උතුම් හැසිරීම් වලින් යුක්ත වූ හෙයින් මේ බුදුපියාණන් වහන්සේ විජ්ජාචරණ සම්පන්න නම් වන සේක.

**ඉතිපි සුගතො :** සීල, සමාධි, පඤ්ඤා යන කෙළසුන් නැති කිරීමේ මාර්ගයෙහි මනාව ගමන්ගත් හෙයින් මේ බුදුපියාණන් වහන්සේ සුගත නම් වන සේක.

**ඉතිපි ලෝකවිදූ :** රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන පංච උපාදානස්ඛන්ධ ලෝකය හා කාම, රූප, අරූප යන ත්‍රිවිධ ලෝකයත් මනාව අවබෝධ කරගත් හෙයින් මේ බුදුපියාණන් වහන්සේ ලෝකවිදූ නම් වන සේක.

**ඉතිපි අනුත්තරෝ පුරිසදම්මසාරථී :** පුද්ගලයන් දමනය කිරීමෙහි උත්තරීතර වූ හෙයින් මේ බුදුපියාණන් වහන්සේ අනුත්තරෝ පුරිසදම්මසාරථී නම් වන සේක.

**ඉතිපි සත්ථා දේවමනුස්සානං :** කෙලෙසුන් නැසීම පිණිස, නිවනින් සැනසීම පිණිස දෙව් මිනිසුන්ට අනුශාසනා කළ හෙයින් මේ බුදුපියාණන් වහන්සේ සත්ථා දේවමනුස්සානං නම් වන සේක.

**ඉතිපි බුද්ධො :** චතුරාර්යය සත්‍ය ධර්මය තමන් වහන්සේ අවබෝධ කරගෙන අන්‍යයන්ටත් අවබෝධ කර වූ හෙයින් මේ බුදුපියාණන් වහන්සේ බුද්ධ නම් වන සේක.

**ඉතිපි භගවා :** ලොව සියල්ලන්ට ම වඩා භාග්‍යයෙන් යුක්ත වූ හෙයින් මේ බුදුපියාණන් වහන්සේ භගවා නම් වන සේක.

### ක්‍රියාකාරකම 28.1

පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

1. බුදු දහමේ භාවනා ක්‍රම කීයක් උගන්වා තිබේද? ඒ මොනවා ද?

2. සමථ යන්නෙහි තේරුම ලියන්න.
3. අප තුළ ශ්‍රද්ධාව වැඩෙන්නේ කෙසේ ද?
4. සිතේ හට ගන්නා නරක සිතිවිලි හඳුන්වන්නේ කෙසේ ද?
5. බුද්ධානුස්සති යන්නෙහි තේරුම ලියන්න.
6. මේ පාඩමේ දැක්වෙන ආකාරයට නොසන්සුන් සිත උපමා කර ඇත්තේ කාගේ හැසිරීම්වලට ද?
7. සමථ භාවනාව වඩන ක්‍රම කීයක් තිබේ ද?
8. සිත සන්සුන් කර ගැනීමෙන් ලැබෙන වාසි 4 ක් ලියන්න.

**ක්‍රියාකාරකම 28.2**

ඒ සහ බී කොටසේ කරුණු, සම්බන්ධතා අනුව ඉරකින් යා කරන්න.

| | ඒ | බී |
|---|---|---|
| 1. | භාග්‍යයෙන් යුක්ත වූ | අරහං |
| 2. | පංචස්කන්ධය නැමැති ලෝකය මනාව අවබෝධ කර ගත්හ. | සම්මාසම්බුද්ධ |
| 3. | දෙවිමිනිසුන්ට අනුශාසනා කළ සේක. | විජ්ජාචරණ සම්පන්න |
| 4. | සියලු කෙලෙසුන් නසාලූ සේක. | සුගත |
| 5. | චතුරාර්ය සත්‍යය තමන් අවබෝධ කරගෙන අනුන්ටත් අවබෝධ කර වූහ. | ලෝකවිදූ |
| 6. | කෙලෙස් නැති කිරීමේ මාර්ගයේ මනාව ගමන් ගත් සේක. | සත්ථා<br>පුරිසදම්ම සාරථී |
| 7. | විද්‍යා හා චරණ ගුණවලින් පිරිපුන් සේක. | බුද්ධ |
| 8. | නොදැමුණු පුද්ගලයන් දමනය කළ සේක. | භගවා |

# 29 මෙත් වඩා සිත් වඩමු

## මෛත්‍රී භාවනාව.

එදා පිරිවෙනේ මාසික භාවනා දිනය යි. පළමු වසරේ සිසුන්ට මෛත්‍රී භාවනාව ගැන අවබෝධයක් හා පුහුණුවක් ලබාදීම එම භාවනා දිනයට යොදා ගෙන තිබුණි. එම කාර්යය සඳහා සුදුසු භාවනානුයෝගී භික්ෂූන් වහන්සේ නමකට ආරාධනා කරන ලදි. පළමු වසරේ සිසුන් ද සහභාගී කරගෙන එම කාර්යය උන්වහන්සේ ඉටු කළ ආකාරයයි මේ !

යෝගී හිමි : මේ කුඩා නමලා හා ගිහි දරුවන් අද ඉගෙන ගන්න බලාපොරොත්තු වන්නේ කුමන භාවනාවක් ද?

ශිෂ්‍ය හිමි නමක් : අපේ ත්‍රිපිටක ධර්මය විෂය භාර හාමුදුරුවන් වදාළේ මෛත්‍රී භාවනාව කියලා.

යෝගී හිමි : කුමක් ද මේ මෛත්‍රිය කියන්නේ? සතුරු මිතුරු හැමදෙනා කෙරෙහි මිතුරු බව පැතිර වීම යි. ඒ වගේ ම

1. අනුන්ට සැප ඇති වෙනවාට කැමති බව
2. අනුන්ට යහපතක් වෙනවාට කැමති බව
3. අනුන් දියුණු වෙනවාට කැමති බව
4. අනුන්ට දුක් නොවෙනවාට කැමති බව

ඉතින් මේ පොඩි අය මේ කියපු කාරණාවලට කැමති ද අකමැති ද?

ශිෂ්‍ය භික්ෂු නමලා : කැමතියි හාමුදුරුවනේ,

යෝගී හිමි : එහෙනම් ඔය ඇත්තන් තුළ මෛත්‍රිය තියෙනවා කියලා සතුටු වෙන්න පුළුවන්. මෛත්‍රිය කියන්නේ

චෛතසිකයක්. සිතුවිල්ලක්. මෙබඳු චෛතසික 52 ක් තියෙනවා. එයින් මෛත්‍රිය "අදෙස" නමින් දැක්වෙනවා. දැන් අපි බලමු භාවනාව කියන්නේ කුමක් ද කියලා.

ශිෂ්‍ය හිමි නමක් : මං අහල තියෙන විදියට භාවනාව කියන්නේ වඩනවා කියන එකයි. මෛත්‍රී භාවනාව කියන්නේ අන්‍යයන් වෙනුවෙන් මුලින් කියපු මිතුරුබව, කැමති බව නැවත නැවත පැතිරවීම.

යෝගී හිමි : තමන්ගේ හිතෙන් අන්‍යයන්ට නිතර නිතර සෙත් පැතීම කියන්ටත් පුළුවනි. මේ මෛත්‍රිය යි. තව කරුණු තුනකු යි බ්‍රහ්ම විහරණ නමින් භාවනා පොත්වල දක්වලා තියෙනවා. කරුණා, මුදිතා, උපේක්ඛා යන තුන තමයි ඒ. ඒවත් මෛත්‍රිය වගේ ම වඩන්නට නියම කරල තියෙන්නේ. අනුන්ගේ සැපතට, දියුණුවට අකමැති අයත් මිනිසුන් අතර සිටිනවා ද?

ශිෂ්‍ය හිමි නමක් : එහෙමයි ඉන්නවා. මං හිතනවා හාමුදුරුවනේ ඒ අයගේ ස්වභාවය ඊර්ෂ්‍යාව කියලා.

යෝගී හිමි : හොඳයි. අනුන්ගේ දියුණුවට අකමැති අය ඊර්ෂ්‍යාකාරයෝ තමා. ඔය ඇත්තෝ අනුන්ගේ සැප කැමති අය මිසක් ඊර්ෂ්‍යා කරන අය නෙවෙයි නේ. තමන්ගේ අඹුදරු ආදීන්ගේ සැපයට කැමති බව මෛත්‍රිය ලෙසින් ගන්නට පුළුවන් ද?

ශිෂ්‍ය හිමි නමක් : ඇයි බැරි. ඒත් අනුන්නේ.

වෙනත් ශිෂ්‍ය හිමි නමක් : මං නං හිතන්නේ තමන්ගේ අය නිසා ඔවුන්ගේ සැප කැමතිවීම මෛත්‍රිය වෙන්ට බැහැ කියලා.

යෝගී හිමි : හරි හරි මේ නම පැවසුවා හරි. ඒ මෛත්‍රිය නොව මෛත්‍රියේ මුහුණුවර ඇති රාගය යි. එය මෛත්‍රියට විරුද්ධ ධර්මයක්. වැඩිය යුත්තක් නොව දුරු කළ යුත්තකි. සැබෑ මෛත්‍රිය කියන්නේ කුඩා වූ හෝ ඇල්මක් නැතුව අනුන්ගේ යහපත කැමති බවයි. එහෙනම් ඔබලා සැබෑ මෛත්‍රිය ඇති අය වෙන්නට ඕනෑ. කාට ද පාඩම් තියෙන්නේ කරණීය මෙත්ත සූත්‍රයේ තියෙන "මාතා යථා..." ආදි ගාථාව?

ශිෂ්‍ය හිමි නමක් : මාතා යථා නියං පුත්තං<br>ආයුසා එක පුත්තමනුරක්ඛෙ<br>එවම්පි සබ්බ භූතෙසු<br>මානසං භාවයෙ අපරිමාණං

යෝගී හිමි : හොඳයි. හොඳයි. මේකේ තේරුම මං කියා දෙන්නම්. දරුවාගේ යහපත පිණිස තමාගේ ජීවිතය වුව ද පරිත්‍යාග කරන්නා වූ එක් දරුවකු ඇති මවක් ඒ දරුවාට ඇති හිතවත් බව බඳු වූ මෛත්‍රිය සියලු සත්ත්වයන් වෙත පැවැත්විය යුතු ය. දරුවන් කෙරෙහි ඇති මව්වරුන්ගේ ආදරය, හිතවත් බව කොච්චර ද කියලා ඔබලත් දන්නවානේ. මෛත්‍රිය යන වචනයට සමාන වචනයක් මෙහි කියවෙනවා. ඒ මොකක් ද?

ශිෂ්‍ය හිමි නමක් : මං හිතනවා "හිතවත් බව" කියන වචනය කියලා. එතකොට මෛත්‍රිය වඩනවා කියන්නේ පවුලේ අයට වගේ ම අන්‍ය වූ සියලු සත්ත්වයන්, මිනිසුන්, දේවල් ආදියට හිතවත් බව වඩනවා කියන එක ද?

යෝගී හිමි : හරියට හරි, ඒක එහෙම ම තමා මේ තමයි අවංක මෛත්‍රිය. අප වැඩිය යුත්තේ අවංක මෛත්‍රිය යි. අවංක මෛත්‍රිය වැඩුවහොත් එයට ලක්වන අය සුවපත් විය යුතුම යි. ලෙඩෙකුට අවංකව මෙත් වඩත හොත් ඒ ලෙඩාට සුවයක් ලැබිය යුතු ම යි. ඔබේ පන්තියේ, ඔබේ

පිරිවෙනේ ඔබේ ගමේ, වසන අයගේ සමගිය, සමාදනය ඇති වන්නේ දිගට පවතින්නේත් අවංක මෛත්‍රිය වඩන්නේ නම් පමණයි. ඔබලා අහල ඇතිනේ මෙත්තා සහගත කාය කම්ම. මෙත්තා සහගත වචී කම්ම මෙත්තා සහගත මනොකම්ම කියලා තුනක්. අනුන්ට උදව් උපකාර ඇප උපස්ථාන කරන විට හිතවත්ව ම කරන්නට ඕන. ඒ තමයි මෛත්‍රී සහගත කාය කර්‍මය. ප්‍රිය සහගත වචන, හිතවත් වචන, මෙත්තා සහගත වචීකර්ම. අනුන් සුවපත් වේවා'යි හිතින් හිතවත් බව, මෛත්‍රිය වැඩීම මෛත්‍රී සහගත මනෝකර්ම.

ශිෂ්‍ය හිමි නමක් : මං දැනගන්නට කැමතියි හාමුදුරුවනේ මෛත්‍රී භාවනාව වඩන්නේ කොහොම ද කියලා. මොන ඉරියව්වෙන් ද මෛත්‍රිය වඩන්නේ කියලා ?

යෝගී හිමි : මෛත්‍රී සිතිවිල්ල පැතිරවීමේ දී භාවිත කරන වචනවල තේරුම දැනගෙන සිය බසින් ම භාවනා කිරීම වැදගත් ය කියන කාරණය මතක තබා ගැනීම හොඳයි. ඉඳීම, සිටීම, යෑම, ඇලවී සිටීම කියන සතර ඉරියව්වෙන් පහසු එකකින් භාවනා කිරීම සුදුසුයි. ද්වේෂයේ හා නො ඉවසිල්ලේ ද, වෛරයේ ද ආදීනව මෙනෙහි කිරීමත්, මෛත්‍රියේ අනිශංසත් සළකා මෛත්‍රී භාවනාව කිරීම හොඳයි.

පළමුව තමාට මෛත්‍රිය වැඩීම යි සුදුසු, ඊළඟටයි හිතවන්ත හිතවතුන්, මධ්‍යස්ථයන්, අහිතවතුන්, සියලු සත්ත්වයින් වෙනුවෙන් මෛත්‍රී වැඩිය යුත්තේ, ප්‍රදේශ වශයෙන්, දිසා වශයෙන් බෙදා ගෙනත් මෙත් වඩන්න පුළුවන්.

ශිෂ්‍ය හිමි නමක් : අපේ හාමුදුරුවනේ අපි දැන් මෛත්‍රී භාවනාව වඩන්න පටන් ගතහොත් හොඳයිනේ.

| | | |
|---|---|---|
| යෝගී හිමි | : | හොඳයි, හොඳයි. අපි එහෙනම් මෛත්‍රී වැඩීමට පටන් ගනිමු. පහසු විදිහට හැම දෙනා ම වාඩිවෙන්නකෝ. දෑත් දෑස පියාගන්නකෝ. මා කියවන කොට මේ නමලා මෙනෙහි කරන්න. |

පළමුව තමන්ගේ හිස, කඳ පා මතක් කරගෙන මෛත්‍රී වඩමු. "සුවපත් වේවා" යන වචනය පමණක් යොදා ගෙන ඉදිරි පසින් පහළට මෛත්‍රී සිතුවිලි පතුරුවන්න.

1. හිස සුවපත් වේවා! කඳ සුවපත් වේවා! පා සුවපත් වේවා! (තෙවරක්)
2. මෙතැන සිටින හිතවත්තු සුවපත් වෙත්වා
   මෙතැන සිටින මධ්‍යස්ථයෝ සුවපත් වෙත්වා!
   මෙතැන සිටින අහිතවත්තු සුවපත් වෙත්වා!
3. පන්සලේ / පිරිවෙනේ සිටින......
4. ගෙදර සිටින.......
5. පවුලේ සිටින.....
6. ගමේ සිටින......
7. ප්‍රදේශයේ සිටින.......
8. පළාතේ සිටින........
9. රටේ සිටින.......
10. ලොවේ සිටින.......

මෙම වාක්‍ය පාඩම් කරගෙන මෙහි තේරුම හිතාගෙන දවසට දෙතුන් වරක් මෙත් වඩන්න.

| | | |
|---|---|---|
| ශිෂ්‍ය හිමි නමක් | : | අප පාඩම් කරලා තියෙන මෙත්තානිසංස සූත්‍රයේ තියෙන්නේ මෛත්‍රියේ ආනිසංස කියලා මං අහලා තියෙනවා. අපි කැමතියි හාමුදුරුවනේ ඒවා දැනගන්නට. |
| යෝගී හිමි | : | හොඳයි, හොඳයි ඒවා දැනගැනීම ඔබ සියලු දෙනාට ම වැදගත්. එහි ආනිසංස 11 ක් දැක්වෙනවා |

1. ගෙරවීම්, දත් හැපීම්, කෙඳිරීම්, දෙඩවීම් ආදියෙන් තොරව සැප සේ නින්ද යෑම (සුඛං සුපති)

2. කෙඳිරීම්, ඇනුම් ඇරීම, ඇඟමැලි කැඩීම් ආදියෙන් තොරව සැප සේ නින්දෙන් පිබිදීම (සුඛං පටිබුජ්ඣති)

3. සර්පයන්ට, ඇතුන්ට, සොරුන්ට, සතුරන්ට හසුවීම් ආදී නපුරු හීන නොපෙනීම (න පාපකං සුපිනං පස්සති)

4. සෑම මිනිසෙකුට ම ප්‍රියයකු වීම (මනුස්සානං පියො හොති)

5. සෑම අමනුෂ්‍යයකුට ම ප්‍රිය වීම (අමනුස්සානං පියො හොති)

6. දෙවියන් විසින් ආරක්ෂා කරනු ලැබීම (දෙවතා රක්ඛන්ති)

7. ගින්නෙන්, විසෙන්, ආයුධ වලින් අනතුරු නොවීම (නාස්ස අග්ගි වා විසං වා සත්ථං වා ඛමති)

8. වහා සිත සමාධියට පැමිණීම (තුවටං චිත්තං සමාධියති)

9. මුහුණේ පැහැය බැබැළීම (මුඛවණ්ණො විප්පසීදති)

10. නුමුළාව කළුරිය කිරීමට ලැබීම (අසම්මුළ්හො කාලං කරොති)

11. මෛත්‍රී ධ්‍යානය උපදවා ගත් තැනැත්තා හට ඒ ජාතියේ දී ම රහත්විය නොහැකි නම් මරණින් මතු බඹලොවට යා හැකිවීම. (උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලෝකූපගෝ හෝති)

ශිෂ්‍ය හිමි නමක් : මෛත්‍රී භාවනාව ගැන දැන ගත යුතු තවත් කරුණු තියෙනවා ද කියලා මං අහන්න කැමතියි හාමුදුරුවනේ.

යෝගී හිමි : ඔව්, මෛත්‍රී භාවනාව ගැන දැන ගත යුතු දේවල් තව ගොඩක් තියෙනවා. ඒ වුනාට මේ පොඩිනමලා මුලින් කියපු දේවල් ටික දැනගත්තම හොඳටම ඇති.

## ක්‍රියාකාරකම 29.1

පහත සඳහන් වැකිවලින් කියවෙන අදහස් නිවැරදිනම් (✓) ලකුණත් වැරදිනම් (✗) ලකුණත් ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

1. අනුන්ගේ දියුණුවට අකමැති වීම ඊර්ෂ්‍යාව නම් වේ. (........)

2. මෛත්‍රියට සමාන අදහසකි හිතවත් බව. (........)

3. තම අඹුදරුවන් කෙරෙහි ඇල්ම මෛත්‍රිය යි. (........)

4. අදෝස යන්නෙහි විරුද්ධ අර්ථය වෛරය යන්නයි. (........)

5. මවක් තම එකම පුතුට දක්වන ආදරය මෙන් මෛත්‍රිය පැතිරිය යුතුය. (........)

6. සිත සමාධිගත වීම මෛත්‍රී කිරීමේ ආනිසංසයක් නොවේ. (........)

7. මෛත්‍රිය වැඩීමේදී පළමුව මෛත්‍රී කළ යුත්තේ තමන්ට ම ය. (........)

8. කරණීය මෙත්ත සූත්‍රයේ දී මෛත්‍රී කළ යුතු අය කවුද යන්න දක්වා ඇත. (........)

9. මෛත්‍රිය වැඩීමේ දී තම නිවස බඩු භාණ්ඩ ආදිය ගැන පළමුව මෙනෙහි කළ යුතු ය. (........)

10. මුහුණේ පැහැය ලැබෙන්නේ ද මෛත්‍රී කිරීමේ ආනිසංසයක් ලෙස යි. (........)